* තව දුරටත්ඉදිරියේදී ලෝක බැංකු ආධාර යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වන අලි හානි අවම කිරීම සඳහා විදුලි වැට ඉදි කිරීමටද සැලසුම් කර ඇත.

* විදුලි වැට නඩත්තු කටයුතු සඳහා "ගජ මිතුරෝ" වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින් ප්‍රජාවගේ සහාය ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ඉ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා

(மாண்புமிகு சஜித் பிரேமதாஸ)

(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. වල් අලි හානි මඟින් සිදු වන වගා හානිවලට පැහැදිලි, විධිමත් වැඩසටහනක් ඉදිරිපත් කරලා නැහැ. විශේෂයෙන්ම මම අහන්න කැමැතියි ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන්, වගා හානි සඳහා පැහැදිලි වැඩසටහනක් ඉදිරිපත් කරන්නට, විශේෂයෙන්ම වන්දි ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඔබතුමන්ලා කටයුතු කරනවාද කියලා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)

(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, මේක මදක් පැහැදිලි කළොත් හොඳයි. වල් අලි තර්ජනය නිසා මිනිසුන්ට වන හානි කියන එක දිගින් දිගටම පැවැති කාරණාවක්. අපි මේක ක්‍රමක්‍රමයෙන් අඩු කර ගෙන ඇවිල්ලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, 2005 ඉඳලා සිද්ධ

වෙච්ච ජීවිත හානි ප්‍රමාණය බැලුවොත්, 2005 ජීවිත හානි 77ක්, 2006 දී 79ක්, 2007 දී 72ක්, 2008 දී 71ක් වනවා. 2009 වන කොට ජීවිත හානි 50කට අඩු කර තිබෙනවා. මා මේ පෙන්නුවේ ජීවිත හානිවලට සම්බන්ධවයි. වගා හානි සහ අනෙකුත් කටයුතුත් යම් කිසි ආකාරයකට අඩු කර ගෙන යනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා අහපු ප්‍රශ්නයට කෙටියෙන් උත්තර දෙන්න. වගා හානි පිළිබඳව ඇහුවේ. ඒකට උත්තරයක් දෙන්න.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
හැබැයි මේකට තව දුරටත් ස්ථිර විසඳුමක් අවශ්‍ය නිසා ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා නැවතත් වාර්තාවක් ඉල්ලලා තිබෙනවා තව දුරටත් එම හානි අවම කිරීම සහ ඒවාට වන්දි ලබා දීම සම්බන්ධව. ඒ වාර්තාව ලබා දීමේ වගකීම මටයි පවරලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහපු ප්‍රශ්නයට නොවෙයි උත්තර දුන්නේ. මම ඇහුවේ වගා හානිවලට වන්දි ලබා දීමේ වැඩසටහනක් ඔබතුමා ක්‍රියාත්මක කරනවාද, නැද්ද කියන එකයි.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
පැහැදිලිවම.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ වාර්තාව එන්න එපායැ.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මේ කියන්නේ ඒක තමයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කොච්චරක් දෙනවාද?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
අද සවස 2.00ට ඒ කමිටුව මුලින්ම රැස් වනවා ගරු කථානායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආ, අද සවස 2.00ට.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ්ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
අපි බලාපොරොත්තු වනවා, රැස්වීම් වාර හතරක් තුළ ඒ වාර්තාව ගරු අමාත්‍යතුමාට ලබා දීලා මේ සම්බන්ධව තවත් විධිමත් පියවර ගන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා, විදුලි වැට නඩත්තු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කනගාටුවෙන් වුවත් කියන්නට ඕනෑ, විදුලි වැට නඩත්තු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ඔබතුමාට ලියා දුන් උත්තරය ගැන මම සෑහීමකට පත් වන්නේ නැති බව. ගරු නියෝජ්‍ය ඇමතිතුමාම දන්නවා, විදුලි වැටවල් නඩත්තු කරන්නට විධිමත් වැඩසටහනක් නැති බව. ඔබතුමන්ලා විදුලි වැටවල් නඩත්තු කරන්න ගන්න ක්‍රියා මාර්ගය මොකක්ද?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීතුමා සෑහීමකට පත් වුණේ නැති වුණාට කරන්න දෙයක් නැහැ. ඉතා පැහැදිලිව ඒ සඳහා තමයි ගජ මිතුරෝ සංවිධානය පිහිටුවා ගමත්, නිලධාරිනුත් එකතු කර මේ වැට සියලු දෙනාගේ වග කීමක් හැටියට පවරා අපි කටයුතු කර ගෙන යන්නේ. මන්ත්‍රීතුමා සෑහීමට පත් නොවුණාට හරි යන්නේ නැහැ. ඒ නිසා තමයි තව දුරටත් මේ ගැන සොයා බලන්න කටයුතු කරන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මරණවලට වන්දි ගෙවන ප්‍රමාණය රුපියල් 1,00,000ක්, 75,000ක්, 50,000ක්, 20,000ක් වශයෙන් ඒ අනුකූලව ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. නමුත් ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිගන්නවාද, මරණ සඳහා ලබා දී තිබෙන්නේ රුපියල් 30,000ක් බව.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
නැහැ. මම පිළිගන්නේ නැහැ. ගෘහ මූලිකයකුට දෙන ගණනත්, ගෘහ මූලිකයකු නොවන අයට දෙන ගණනත් ඉතා පැහැදිලිව සඳහන් කළා. ඒක රජයේ අනුමත දීමනාව. ගරු කථානායකතුමනි, ඒ පිළිබඳවත් තවදුරටත් අපේ කමිටුව තුළින් අපි සලකා බලනවා. අද සවස 2.00ට කමිටුව රැස් වනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. මම සාක්ෂි ඉදිරිපත් කළොත් ගරු නියෝජ්‍ය ඇමතිතුමා නියමිත වන්දි මුදල ලබා දෙනවාද?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ්ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඉදිරිපත් කරන්න. ඉදිරිපත් කළොත් ඒ ගැන සොයා බලන්න, ඒ වග කිව යුත්තන්ට අවශ්‍ය කටයුතු කරන්න, නියමිත වන්දිය ලබා දෙන්න අපි සූදානමින් ඉන්නවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා වැඩි විස්තර සඳහා උපදේශක කාරක සභාවට සහභාගි වන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒවා cancel කරනවා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මන්ත්‍රීතුමා නිකම් මත ප්‍රකාශ කරන්නේ නැතිව ඉදිරිපත් කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අදත් උපදේශක කාරක සභා cancel කර තිබෙන්නේ.

ප්‍රමුඛ බැංකුවේ තැන්පත්කරුවෝ : තැන්පතු ආපසු ලබා දීම

பிரமுக வங்கி வைப்பாளர்கள் : வைப்புகளை மீளளித்தல்

PRAMUKA BANK DEPOSITORS : REPAYMENT OF DEPOSITS

0108/'10

3. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ප්‍රමුඛ බැංකුවේ මුදල් තැන්පත් කළ පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) ඔවුන් විසින් තැන්පත් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එම මුදල් ආපසු ලබා දීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් ලබා දී ඇති නියෝගයන් සහ මුදල් ප්‍රමාණයන් කවරේද;

(ii) මෙම තැන්පත්කරුවන් අතුරින් රුපියල් ලක්ෂය බැගින් ආපසු ලැබුණු තැන්පත්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වයස අවුරුදු 60 ඉක්ම වූ තැන්පත්කරුවන් වෙත ආපසු ලබා දුන් මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එසේ මුදල් ලබා දුන් අයගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් තැන්පත්කරුවෙකුට ආපසු ලබා දුන් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

නිති, තිට්ටමිටල් අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) ප්‍රමුඛ වංකියිල් පණම් වෛප්පිලිට්ට නපර්කළින් පෙයර්කළ් යාවෙ එන්පතෙයුම්,

(ii) අවර්කළ් වෛප්පිලිට්ට පණත්තොකෙ එව්වළවු එන්පතෙයුම්

අවර් ඉච්සපෙයිල් කුරිප්පිටුවාරා?

(ආ) (i) අප්පණත්තිනෙ මීළළිත්තල් තොටර්පාක මත්තිය වංකියිනාල් වළංකප්පට්ටුළ්ළ කට්ටළෙකළුම්, නිතිත් තොකෙයුම් යාවෙ එන්පතෙයුම්,

(ii) ඉව්වෛප්පාළර්කළුළ් රූපා ඔරු ඉලට්සම් වීතම් මීළක් කිටෙක්කප් පෙට්ර වෛප්පාළර්කළින් පෙයර්, මුකවරි යාතු එන්පතෙයුම් අවර් කුරිප්පිටුවාරා?

(இ) (i) 60 වයතුක්කු මේර්පට්ට වෛප්පාළර්කළුක්කු මීළළිප්පුච් චෙය්යප්පට්ට පණත්තොකෙ එව්වළවු එන්පතෙයුම්,

(ii) අව්වාරු පණම් මීළළිප්පුච් චෙය්යප්පට්ටවර්කළින් එණ්ණික්කෙ යාතු එන්පතෙයුම්,

(iii) ඔව්වෝර් වෛප්පාළරුක්කුම් මීළළිප්පුච් චෙය්යප් පට්ට පණත්තොකෙ තනිත්තනියාක එව්වළවු එන්පතෙයුම්

අවර් ඉච්සපෙයිල් අරිවිප්පාරා?

(ஈ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Finance and Planning:

(a) Will he submit to this House -

(i) the names of the persons who deposited money in Pramuka Bank; and

(ii) the amount of money deposited by them?

(c) Will he state -

(i) the directives of the Central Bank requesting the payback of the aforesaid amounts of money and the amounts of money so paid back; and

(ii) out of the above-mentioned depositors, the names and addresses of the depositors who have been paid back one hundred thousand rupees each?

(d) Will he state in this House -

(i) the amount of money paid back to the depositors who are above 60 years of age;

(ii) the number of persons who have been paid back their money as mentioned above; and

(iii) the amount of money paid back to each depositor, separately ?

(e) If not, why?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 1988 අංක 30 දරන බැංකු පනතේ 77 වගන්තිය ප්‍රකාර ගනුදෙනුකරුවන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීමට බැංකුව බැඳී සිටින බැවින් නම් සහ ලිපිනයන් හෙළි කිරීම යෝග්‍ය නොවේ.

(ii) ගනුදෙනුකරුවන් විසින් 2007.12.03 දින දක්වා රුපියල් 3,088,837,573.65ක් තැන්පත් කර ඇත.

(ආ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තැන්පතු ආපසු ගෙවීම සඳහා මුදල් ලබා දී නැත.

2006 අංක 46 දරන බැංකු (සංශෝධන) පනතෙහි 76ක වගන්තියේ 3වන උප වගන්තියේ (ඇ) ඡේදය අනුව ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවයද ඇතිව මහ බැංකුව විසින් සකස් කර 2007.12.03 දින ප්‍රසිද්ධියට පත් කළ නැවත මුදල් ගෙවීමේ යෝජනා ක්‍රමයෙහි පිටපතක් ඇමුණුම 1 වශයෙන් ඉදිරිපත් කර ඇත.

ගරු කථානායකතුමනි, නියෝග දීර්ඝ වශයෙනුයි සඳහන් වන්නේ. එය ඇමුණුම් අංක 1හි සඳහන් වනවා. නාම ලේඛනය ඇමුණුම් අංක II හි සඳහන් වනවා. ඇමුණුම් **සභාගත*** කරමි.

(ii) ඉහත අ(i) හි පිළිතුර අදාළ වේ.

(ඇ) (i) වයස අවුරුදු 60 ඉක්මවූ තැන්පත්කරුවන් වෙත ආපසු ලබා දුන් මුදල් ප්‍රමාණය රුපියල් 161,327,429.86කි.

(ii) එසේ මුදල් ලබා දුන් තැන්පත්කරුවන්ගේ සංඛ්‍යාව 307කි.

(iii) එක් එක් තැන්පත්කරු වෙත ආපසු ලබා දුන් මුදල් ප්‍රමාණයන් ඇමුණුම II වශයෙන් ඉදිරිපත් කර ඇත. එය විශාල නාම ලේඛනයක්. එය කියවන එක මේ සභාවේ ප්‍රායෝගික වන්නේ නැහැ.

(ඈ) පැන නොනඟී.

-

සභාමේසය මත තබන ලද ඇමුණුම්:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள்
Annexes tabled:



ශ්‍රී ලංකා මහ බැංකුව

පැහැර හැරී ප්‍රමුඛ සේවිංග්ස් ඇන්ඩ් ඩිවලොප්මන්ට් බැංක් ලිමිටඩ් හි ණය හිමියන් සහ තැන්පත්කරුවන්ගේ වගකීම් ශ්‍රී ලංකා සේවිංග්ස් බැංකුව මගින් පියවීම සඳහා වන යෝජනා ක්‍රමය

2006 අංක 46 දරන බැංකු පනතින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ 76 ඊ (3 ඒ) වගන්තියට අනුකූලව එකඟ දමන ලද ප්‍රමුඛ ඉන්වස්ත්මන්ට් බැන්ක් ලිමිටඩ්හි (මින් පසු ප්‍රමුඛ බැංකුව ලෙස සඳහන් වන) ණය හිමියන් හා තැන්පතුකරුවන්ගේ වගකීම් පියවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ස්ථායීතා කාර්යාංශය විසින් සකසන ලද යෝජනා ක්‍රමය පහත දැක්වේ.

මෙම යෝජනා ක්‍රමයේ "වගකීම්" යනුවෙන් අදහස් වන්නේ, නියමුම තැන්පත්, මූල්‍ය ණයකුරු බිල්පත්, ප්‍රමුඛ ආයෝජන බැඳුම්කර, ප්‍රමුඛ බැඳුම්කර (2001), ප්‍රමුඛ බැංකුවේ මූල්‍ය ණයකුරුවන්ගෙ බිල්පත්, ප්‍රමුඛ බැංකුවට වෙනත් බැංකු හා මුදල් වෙළඳපොළ ණයකරුවන්ගෙ ණය ශේෂයන් සඳහා අදාළ වූ ණය හිමියන් කෙරෙහි ඇති ණය, අත්තිකාරම් හා වෙනත් වගකීම් ය.

මෙම යෝජනා ක්‍රමයේ "ආයෝජකයින්" යනුවෙන් අදහස් වන්නේ මූල්‍ය ණයකුරුවන්ගේ බිල්පත්, ප්‍රමුඛ ආයෝජන බැඳුම්කර, ප්‍රමුඛ බැඳුම්කර (2001)" යනාදියෙහි මූල්‍ය ආයෝජනය කොට ඇති අය, අත්තිකාරම් බැංකු වෙතෙහි වීමසීම් සහ මූල්‍ය ණයකරුවන්ගේ ණය හිමියන් කෙරෙහිය වේ.

කිසි ගෙවීමක් කිරීමට හෝ ආයෝජනයකු සඳහා හෝ වෙනත් මූල්‍ය පහසුකමක් ප්‍රමුඛ බැංකුවන් ලබා ඇති විටක හෝ ප්‍රමුඛ බැංකුව වෙත අත්පිට ගුණ වගකීමක් ඇති විටක හෝ එහි විවිධකම එම තැන්පතු හිමියාට හෝ ආයෝජනයාට හෝ ගුණ වගකීම්වලින් අඩු කරනු ලැබේ.

මෙම කොන්දේසි යටතේ සහනය වගකීම් පියවීම, ප්‍රමුඛ බැංකුව සතුව තිබූ දුර්වලීම් වික්කිණීම් ප්‍රමාණය හා අඩුවන වත්කම් ඉහළම් මත සිදු කරනු ඇත.

1. ප්‍රමුඛ බැංකුවේ සාමාන්‍ය මුදල්කරුවන්ගේ (ආයතන හා ආයෝජකයන් හැර) තැන්පතු හිමියන්ගේ ආපසු ගෙවීම්

i. කිසියම් තනි මුදල්කරුවෙකුගේ අවුරුදු තනවක් තැන්පතු මුදල් ගැනුම් බැඳීම්වල අදහස් කරන්නේ රුපියල් එක්ලක්ෂයක (රු.100,000) උපරිමයකට හෝ එම මුදල් ප්‍රමාණයේ ලබාදීම් සඳහා ප්‍රමුඛ බැංකුව විසින් පත්‍ර දැන්වීම් වල පළ කරනු ලැබූ මිති දින සිට වහ කියක් (මාස 6 කි) ගත වූ පසු ඒ අයුරු ගෙවිය යුතු ය.

ii. (අ) ඉහත (i) යටතේ රු. 100,000 දක්වා එක මුදල්කරු ආපසු ලබා ගෙවනු ලැබීම් සඳහා 2002 ඔක්තෝබර් 25 වන දින සිට ඉහත මුදල් ලබා ගැනීම් දිනය දක්වා එකී කාලපරිච්ඡේදය සඳහා වාර්ෂික 5½ ක පොළු වාරිකයක් ගණනය කිරීමෙන් අනුව අනුමාන්‍ය එම පොළිය ද ඒ අයුරු ගෙවිය යුතු ය.

(ආ) ඉහත (i) හි සඳහන් ආකාරයට ගෙවීම යුතු මුදල් මෙම යෝජනා ක්‍රමය ප්‍රවර්තනය වූ දින සිට වසර එකක් දක්වා ශ්‍රී ලංකා ප්‍රේවන්ත්ස් බැංකුවේ (එවා) ඉතිරිවී තබා ගැනීමට එකඟ වන පක්ෂයන්ට එම කාල පරිච්ඡේදය අවසානයේ එම මුදල් ගෙවිය යුතු දිනය දක්වා වන කාල පරිච්ඡේදය සඳහා එම මුදලට වාර්ෂික 7½ ක අනුපාතයක් ද්‍රව්‍ය වාර්ෂික පොළිය ගණනය කිරීමෙන් ඔබ්බේ ඒ අයුරු ගෙවිය යුතු ය.



2002 ඔක්තෝබර් 25 දිනට නියමිත මුදල් | ප්‍රතිශෝධනගත කරන ලද පරිණත කාලය

2006 අංක 46 දරන බැංකු පනත මගින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ 76 ඝ (3 ඒ) උප වගන්තිය ප්‍රකාරව මෙම යෝජනා ක්‍රමයට අනුකූලව වගකීම් පියවා ගැනීම් සිදුවන බවත් ශ්‍රී ලංකා ප්‍රේවන්ත්ස් බැංක් ලිමිටඩ් වෙත පවරා ඇති ප්‍රමුඛ බැංකුවේ වගකීම් අහෝසි වනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව.
ජනාධිපති මාවත, කොළඹ 01.

Monday December 03 2007 Pg iii

CENTRAL BANK OF SRI LANKA

Scheme for Meeting the Claims of Creditors and Depositors on Liabilities of Defaulted Pramuka Savings and Development Bank Ltd. by Sri Lanka Savings Bank Ltd.

The undermentioned scheme has been formulated by the Monetary Board of the Central Bank of Sri Lanka in terms of Section 76M (3C) of the Banking Act No. 30 of 1988 as amended by Banking (Amendment) Act No. 46 of 2006, upon a review of the business of the defaulted Pramuka Savings and Development Bank Ltd. (hereinafter referred to as the PSDB).

"Liabilities" for the purposes of this scheme shall mean liabilities arising out all deposits, Money Market Bills, Pramuka Investment Bonds, Pramuka Bonds (2001), amounts due to other banks and Money Market Borrowings of the PSDB.

"Investors" for the purpose of this scheme shall mean holders of Money Market Bills, Pramuka Investment Bonds, Pramuka Bonds (2001), amounts due to other banks and Money Market Borrowings.

Where a depositor or an investor has taken a loan or other facility from the PSDB or has any other dues to the PSDB, the sum payable to such depositor or investor in repayment of his deposit or investment, shall be the value of the deposit or investment less the amount receivable from him on such loan, facility or any other due.

Settlement of liabilities under this scheme shall be limited to the availability of liquid assets of the defaulted PSDB and the recovery of non-performing assets of the PSDB.

1. Meeting the claims of individual depositors (excluding corporate and institutional depositors and investors) on deposit liabilities of PSDB.

i. The principal sum of deposits, up to a maximum of Rs. 100,000/= or the amount of the deposit of an individual whichever is less, shall be paid to all depositors who are individuals who wish to withdraw such sum immediately, after six (06) months, from the first date of publication of this scheme in the newspapers.

ii. (a) In respect of depositors who withdraw the principal sum up to Rs. 100,000/= in terms of (i) above, interest calculated at the rate of five (5) per cent per annum or the one year Treasury Bill yield rate whichever is less, shall be accrued in respect of the sum so withdrawn for the period between 25th October 2002 and the date of withdrawal.

(b) Depositors who agree to retain the amounts payable in terms of (i) above with Sri Lanka Savings Bank Ltd. (SLSB) for a period of two (02) years from the first date of publication of this scheme in the newspapers shall be paid such amounts after the expiry of the said period and interest shall be accrued at seven (7) per cent per annum or the one year Treasury Bill yield rate, whichever is less, for the period between 25th October 2002 and the date of payment of such amounts.

(c) Interest accrued in respect of depositors indicated in (a) and (b) above shall be paid later, as per a scheme to be formulated by SLSB, taking into consideration the amount of recovery of loans of defaulted PSDB.

(d) The principal amount of deposits in excess of Rs. 100,000/= remaining after payments are made in terms of item 1. i above shall be considered for repayment as shown in **the chart given below.** Interest on such excess shall accrue annually from the date of expiry of six (06) months from the first date of publication of this scheme in the newspapers at the rate of five (5) percent per annum or the one year Treasury Bill yield rate whichever is less.

Sri Lanka Savinga Bank

The amount of money paid back to the depositors who are above 60 years of age-

No of depositiors	full amount
,01	49,952.32
,02	250,000.00
,03	44,760.00
,04	100,000.00
,05	2,544.00
,06	130,000.00
,07	47,995.00
,08	355,393.88
,09	884,500.00
,10	600,000.00
,11	800,000.00
,12	2,760,000.00
,13	483,513.00
,14	394,408.57
,15	1,554,869.93
,16	390,014.00
,17	6,674,044.00
,18	113,505.04
,19	932,599.14
,20	2,000,000.00
,21	127,014.00
,22	669,228.00
,23	303,221.00
,24	437,629.10
,25	2,544.00
,26	404,827.33
,27	880,000.00
,28	404,827.33
,29	141,889.86
,30	7,500.00
,31	336,419.00
,32	729,710.00
,33	908,200.00
,34	242,398.00
,35	358,387.08
,36	350,000.00
,37	401,431.00
,38	631,732.00
,39	890,000.00
,40	631,371.43
,41	1,250,242.29
,42	662,737.00
,43	995,355.46
,44	578,425.00
,45	113,505.24
Sub Total C/F	30,426,693.00

Pa

Sri Lanka Savinga Bank

The amount of money paid back to the depositors who are above 60 years of age-

B/F	52,877,649.11
,96	666,515.21
,97	15,446.95
,98	42,527.18
,99	400,000.00
,100	517,252.00
,101	456,572.53
,102	166,661.83
,103	2,438,460.00
,104	166,661.83
,105	1,249,454.01
,106	659,724.97
,107	15,446.95
,108	40,500.00
,109	640,000.00
,110	468,976.66
,111	403,817.96
,112	498,532.45
,113	707,460.68
,114	1,895,620.05
,115	437,569.82
,116	50,000.00
,117	2,052,440.00
,118	853,731.00
,119	273,551.00
,120	204,905.00
,121	2,051,824.43
,122	536,828.40
,123	438,161.18
,124	406,011.29
,125	337,139.45
,126	384,045.89
,127	134,000.00
,128	50,032.08
,129	200,000.00
,130	96,934.85
,131	25,000.00
,132	207,946.33
,133	2,595,380.00
,134	434,336.19
,135	150,000.00
,136	150,000.00
,137	287,458.26
,138	440,004.00
,139	1,000,000.00
,140	716,032.00
,141	1,073,585.00
,142	101,240.40
,143	318,341.00
,144	126,087.32
,145	101,710.97
,146	954,627.54
,147	352,699.41
Sub Total C/F	81,868,903.18

Page

Sri Lanka Savinga Bank

The amount of money paid back to the depositors who are above 60 years of age-

B/F	30,426,693.00
,46	155,397.24
,47	309,129.00
,48	2,055,910.00
,49	1,442,077.39
,50	155,397.24
,51	50,000.00
,52	1,646,139.61
,53	901,786.84
,54	98,435.00
,55	27,553.83
,56	174,287.00
,57	31,258.00
,58	716,188.03
,59	275,688.78
,60	100,000.00
,61	163,134.64
,62	356,610.00
,63	33,419.29
,64	300,000.00
,65	235,000.00
,66	620,998.62
,67	166,672.00
,68	35,000.00
,69	4,290,073.00
,70	170,600.00
,71	98,113.87
,72	109,700.00
,73	415,421.15
,74	50,000.00
,75	9,220.00
,76	119,021.66
,77	294,004.46
,78	313,785.38
,79	193,343.36
,80	364,157.87
,81	5,894.42
,82	243,994.50
,83	104,857.00
,84	934,500.00
,85	400,000.00
,86	35,000.00
,87	100,000.00
,88	800,000.00
,89	633,393.00
,90	473,330.92
,91	498,532.45
,92	700,000.00
,93	895,614.52
,94	85,169.70
,95	63,146.34
Sub Total C/F	52,877,649.11

Pg

Sri Lanka Savinga Bank

The amount of money paid back to the depositors who are above 60 years of age-

B/F	81,868,903.18
,148	429,422.00
,149	15,997.55
,150	297,105.50
,151	140,131.40
,152	2,814.50
,153	126,804.47
,154	100,000.00
,155	87,033.44
,156	50,000.00
,157	460,000.00
,158	552,988.69
,159	588,281.00
,160	150,000.00
,161	110,685.00
,162	416,126.98
,163	250,000.00
,164	358,961.62
,165	200,000.00
,166	75,000.00
,167	74,087.00
,168	22,600.52
,169	4,526.99
,170	127,001.27
,171	250,000.00
,172	527,795.89
,173	354,229.00
,174	1,673.64
,175	1,384,900.00
,176	50,000.00
,177	103,813.70
,178	50,000.00
,179	896,066.57
,180	500,000.00
,181	772,747.50
,182	121,299.97
,183	620,376.37
,184	159,192.39
,185	16,487.00
,186	513,268.02
,187	14,681.82
,188	169,269.72
,189	118,902.30
,190	200,000.00
,191	68,093.12
,192	2,128,396.17
,193	200,000.00
,194	7,000,000.00
,195	30,350.00
,196	350,000.00
,197	429,738.35
,198	406,011.29
,199	279,762.00
,200	672,778.00
Sub Total C/F	104,898,303.93

Page C

Sri Lanka Savinga Bank
The amount of money paid back to the depositors who are above 60 years of age-

B/F	104,898,303.93
,201	225,875.00
,202	558,250.00
,203	666,700.00
,204	100,000.00
,205	341,152.27
,206	333,239.82
,207	217,164.16
,208	75,000.00
,209	150,000.00
,210	200,000.00
,211	289,380.00
,212	400,000.00
,213	442,933.86
,214	527,435.14
,215	250,000.00
,216	64,497.36
,217	300,000.00
,218	179,408.00
,219	100,000.00
,220	1,734,749.18
,221	175,500.00
,222	331,900.00
,223	300,000.00
,224	51,495.81
,225	636,597.01
,226	2,265,100.00
,227	488,448.83
,228	1,262,560.81
,229	164,975.00
,230	300,969.00
,231	202,252.00
,232	16,368.60
,233	150,000.00
,234	452,524.86
,235	443,750.00
,236	50,000.00
,237	430,000.00
,238	1,800,000.00
,239	800,000.00
,240	600,000.00
,241	32,825.00
,242	476,824.24
,243	54,471.00
,244	483,596.00
,245	105,060.85
,246	608,725.83
,247	105,250.61
,248	1,076,226.00
,249	150,000.00
,250	113,189.40
,251	264,445.00
,252	35,593.00
,253	221,690.41
,254	1,000,000.00
Sub Total C/F	127,704,427.98

Pa

Sri Lanka Savinga Bank
The amount of money paid back to the depositors who are above 60 years of age-

B/F	127,704,427.98
,255	654,954.00
,256	405,643.02
,257	4,985,676.00
,258	779,476.07
,259	350,283.00
,260	575,000.00
,261	219,100.00
,262	68,298.27
,263	912,645.00
,264	426,437.00
,265	61,856.37
,266	397,530.00
,267	200,500.00
,268	200,000.00
,269	604,417.87
,270	126,189.00
,271	510,797.55
,272	20,000.00
,273	971,406.61
,274	833,396.96
,275	318,000.00
,276	76,102.03
,277	400,000.00
,278	100,000.00
,279	927,880.00
,280	12,343,367.95
,281	402,272.02
,282	140,876.22
,283	500,000.00
,284	120,721.33
,285	185,000.00
,286	100,000.00
,287	375,000.00
,288	100,000.00
,289	975,428.60
,290	151,009.24
,291	67,500.00
,292	20,882.09
,293	260,231.68
,294	250,705.21
,295	144,617.50
,296	150,000.00
,297	225,000.00
,298	29,102.00
,299	171,628.19
,300	340,000.00
,301	100,000.00
,302	208,129.00
,303	100,651.50
,304	346,614.00
,305	366,578.69
,306	317,500.00
,307	4,597.91
Grand Total	161,927,429.86

Pag

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රශ්නයක් නොවෙයි. ඉස්සෙල්ලා මා කියන්න කැමැතියි, ඒ නාම ලේඛනය ලබා ගැනීමට පාර්ලිමේන්තුව විධියට අපට අයිතියක් තිබෙනවාය කියලා. අපි ඒ නම් කොහේවත් ගිහින් දමන්නේ නැහැ. ඔබතුමා ඒක කියවන්න වුවමනා නැහැ. තැන්පත්කරුවන්ගේ නාම ලේඛනය ලබා ගන්න මේ ප්‍රශ්නය අපි මීට පෙරත් අහලා තිබෙනවා. ඒ නම් ටික අපට ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, ඒ නම් ටික ලබා දෙන්නය කියලා. අපි මෙය ප්‍රසිද්ධ කරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුව ඉල්ලන කොට එම ලේඛන දෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නීත්‍යානුකූලව, ඒ විධියට කටයුතු කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ඒක දෙනවා නේද? ඒක දෙන්න පුළුවන් නේද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මෙය, බැංකුවල තිබෙන රහස්‍යභාවය සම්බන්ධයෙන් මතු වන ප්‍රශ්නයක්. ගරු කථානායකතුමාගේ නියෝගයක් තිබෙනවා නම් අපට දෙන්න පුළුවන්. මා හිතන හැටියට මෙය බැංකු ක්‍රියාවලියට හොඳ නැහැ. ඔබතුමාගේ ඒ ප්‍රශ්නය සාධාරණ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ගැන සොයා බලා අවශ්‍ය උපදෙස් දෙන්නම්. ඊ ළඟට තමුන්නාන්සේගේ ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මීට කලින් පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහලා ඒ විස්තර ටික අපි ළඟ තිබෙනවා. ඒකයි අපි ඔබතුමාට කිව්වේ. ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අපට ඒ නාම ලේඛනය ලබා දෙන්න කටයුතු කරන්නය කියලා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
යම් කිසි කෙනකුට, ගරු කථානායකතුමනි, -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, තමුන්නාන්සේගේ ප්‍රශ්නය අහන්න.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
යම් කිසි කෙනකුට අවශ්‍ය නම් ඔහුට පුළුවන් බැංකුවට ගිහින් ඒ ගැන විමසා තොරතුරු ලබා ගන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ඔබතුමාගෙන් පළමුවෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර එය ලබා දෙන්න කටයුතු කරන්නය කියලා. ඒ වාගේම පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. මේ නඩු තීන්දුව අනුව මුදල් ලබා දුන්නු පුද්ගලයන්ගේ ප්‍රමාණයට අමතරව තවත් පුද්ගලයන් කොපමණ ප්‍රමාණයකට ඔබතුමන්ලා ආපසු මුදල් ලබා දීලා තිබෙනවාද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
එය අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. එය දීර්ඝ පිළිතුරක් සැපයිය යුතු ප්‍රශ්නයක්. තමුන්නාන්සේ ඒකට වෙනම ප්‍රශ්නයක් අහන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයට අදාළව පැහැදිලිව අතුරු ප්‍රශ්නය අහනවා නම් පැහැදිලි උත්තරයක් දෙන්න පුළුවන්. වක්‍රාකාරයෙන් හිතේ තිබෙන දේවල් ඇහුවාම උත්තර දෙන්න බැහැ නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයම -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, බොහොම පැහැදිලියි මගේ ප්‍රශ්නය. මම ආපහු කියන්නම්. ගරු කථානායකතුමනි, මේක අතුරු ප්‍රශ්නයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමාට අවශ්‍ය නම් පිළිතුරු ලබා දෙන්නත්, ලබා නොදී ඉන්නත් පුළුවන්. ඒ හින්දා කරුණාකර -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ප්‍රශ්නය බොහොම පැහැදිලියි. නඩු තීන්දුවට පිටස්තරව වෙනත් පුද්ගලයන්ට මුදල් ලබා දීලා තිබෙනවාද, නැද්ද කියන එක ගැන විස්තරයකුයි මම ඇහුවේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ලබා දීලා තිබෙනවාද, නැද්ද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, මෙයට පිළිතුරක් ලබා ගත යුතුව තිබුණා නම් ඒ කොටසත් මේ ප්‍රශ්නයට ඇතුළු කරන්න තිබුණා. මේ ප්‍රශ්නය හාත්පසින්ම වෙනස් ප්‍රශ්නයක්. ඒ ගැන සොයා බලා පිළිතුරු දෙන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, වචන 150කින් ප්‍රශ්නය අහන්න කියලා තිබෙන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ ගැන සොයා බලා පිළිතුරු දෙන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයට වචන 150යි. අතුරු ප්‍රශ්නවලදී වචන 300ක විතර ප්‍රශ්න අහනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
සොයා බලා පිළිතුරු සපයන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහන්න පුළුවන් වන්නේ වචන 150කින් විතරයි. වචන 500කින් ප්‍රශ්නයක් අහන්න පුළුවන් නම් මම ඒ ගැනත් අහනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. මෙයට අදාළව අවශ්‍ය තොරතුරු -

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයේ වචන 150ක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරු දිය හැකිද, බැරිද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒකට ලෙහෙසියෙන්ම පිළිතුරු ලබා දිය හැකියි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ ගැන සොයා බලා පිළිතුරු දෙන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ගැන සොයා බලා පිළිතුරු ලබා දෙයි. දෙ වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඊට අමතරව මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඉතිරි අය වෙනුවෙන් නැවත මේ මුදල් ලබා දෙන වැඩ පිළිවෙළක් සම්බන්ධව යම් කිසි කාල සීමාවක් ඔබතුමන්ලා තීරණය කර තිබෙනවාද කියා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ වෙනුවෙන් ගන්නා වූ ක්‍රියා මාර්ගයන් පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඔබතුමාට මා දෙන්නම්. ඒ ඒ අංශ මුදල් තැන්පත්කරුවන්ගේ ප්‍රමාණයන් අනුව ගන්නා පියවරයන් පිළිබඳව ඇමුණුම් අංක 01හි සඳහන් වනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නියෝජ්‍ය ඇමතිතුමා, කාල වකවානුවක් තිබෙනවාද මේ ප්‍රමුඛ බැංකුවේ තැන්පත්කරුවන්ගේ මුදල් ගෙවීම සඳහා. කාල වකවානුවක් ගැනයි මම ඇහුවේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
කාල වකවානුවක් තවම තීරණය කරලා නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි. තුන්වන අතුරු ප්‍රශ්නය. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු දයාසිරි ජයසේකර මහතා අහපු ප්‍රශ්නයට අදාළව මම කියන්නේ බැංකුව බංකොලොත් වෙලා තිබෙන නිසා බැංකු පනත මේකට වලංගු වන්නේ නැහැ කියලායි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක මේ ප්‍රශ්නයට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. මේකට අදාළව තුන් වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා. මයික් එක දමලා නැහැ.

ගරු කථානායකතුමනි, මේ බැංකු පනත වලංගු වන්නේ ක්‍රියාශීලී ගිණුම්වලටයි. නමුත් අද මේ බැංකුව බංකොලොත් වෙලා තිබෙනවා. ඒ නිසා බැංකු පනත මේකට වලංගු නැහැ. දැන් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට ලෙහෙසියෙන් උත්තර දෙන්න පුළුවන්. ගරු ඇමතිතුමා උත්තර දෙන්නේ නැත්තේ මේ අයට ආණ්ඩුවෙන් සල්ලි දීලා නැති නිසායි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඔබතුමා ඔය කියන ප්‍රශ්නයත් මේ ප්‍රශ්නයට අදාළ නැහැ. ඔබතුමා කියන්නේ බැංකු පනත පිළිබඳ කාරණයක්. ඒක මේ අහලා තිබෙන ප්‍රශ්නයට අදාළ එකක් නොවෙයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. අදාළ නැත.

ලුනාව කළපුව ප්‍රවර්ධන ව්‍යාපෘතිය : විදේශ ණය සහ ආධාර

லுனாவ கடனீரோரி மேம்பாட்டுக் கருத்திட்டம்: வெளிநாட்டுக் கடன் மற்றும் உதவிகள்

LUNAWA LAGOON DEVELOPMENT PROJECT: FOREIGN LOANS AND GRANTS

0292/10

04. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලුනාව කළපුව ප්‍රවර්ධන මුළු ව්‍යාපෘතියටම ලැබුණු මුළු විදේශ ණය වටිනාකම කොපමණද?

(ii) උක්ත ව්‍යාපෘති සඳහා ණය වශයෙන් නොවන විදේශ ආධාර ලැබුණේ නම් එහි මුළු වටිනාකම කොපමණද;

(iii) ලැබුණු මුදලින් වැඩ නිම කිරීම සඳහා වියදම් කළ මුළු මුදල කොපමණද;

(iv) සැලසුම් කළ ව්‍යාපෘතියකට අනුව වැඩ අවසන් නොකරන ලද දෑ කවරේද;

(v) වැඩ අවසන් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම් ඒ මන්ද?

நீர் வழங்கல், வடிகாலைமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) லுனாவ கடனீரோரி மேம்பாட்டு முழுக் கருத்திட்டத்துக்குமாகக் கிடைக்கப் பெற்ற மொத்த வெளிநாட்டுக் கடன்களின் பெறுமதி எவ்வளவு என்பதையும்,

(ii) மேற்படி கருத்திட்டத்திற்காக கடன் அல்லாத வெளிநாட்டு உதவிகள் கிடைக்கப் பெற்றிருக்குமானால் அதன் மொத்தப் பெறுமதி எவ்வளவு என்பதையும்,

(iii) கிடைக்கப் பெற்ற நிதியில் பணிகளை நிறைவு செய்வதற்காக செலவு செய்த மொத்த நிதி எவ்வளவு என்பதையும்,

(iv) திட்டமிடப்பட்ட கருத்திட்டத்திற்கமைய பணிகள் நிறைவு செய்யப்படாத துறைகள் யாவை என்பதையும்,

(v) பணிகள் நிறைவு செய்யப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Drainage:

(a) Will he inform this House-

(i) of the total value of the foreign loans received for the entire Lunawa Lagoon Development Project;

(ii) if foreign aid, not in the form of loans, was received for the aforesaid project, the value of the amount received in that manner;

(iii) out of the amount of money received, the amount of money spent for the completion of work;

(iv) the types of work that have not been completed according to a planned project; and

(v) the reasons for not completing the work ?

(b) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

(අ) (i) ජපන් යෙන් මිලියන 6,906 (6,906,000,000- හයසිය අනූකෝටි හැටලක්ෂයයි)

(ii) නැත.

(iii) වැඩ නිම කළ ව්‍යාපෘතිවල වටිනාකම ජපන් යෙන් 6,336,171,276 (හයසිය තිස්තුන්කෝටි හැට එක්ලක්ෂ හැත්තෑ එක්දහස් දෙසිය හැත්තෑහයයි.)

(iv) ලුනාව උතුරු ද්‍රෝණියේ (රත්මලාන විජය හවුස් ඉදිරිපිට ඇති ඇළ මාර්ගය) N-1-1-4 උප ද්විතියික ඇළ මාර්ගයේ මීටර 15ක පමණ කොටසක් සහ ලුනාව දකුණු ද්‍රෝණියේ (ලක්ෂපතිය ජුබිලි පාරේ) S-2-3 ද්විතියික ඇළ මාර්ගයේ මීටර් 25ක පමණ කොටසක වැඩ අවසන් කිරීමට නොහැකි විය. ඒවායේ කටයුතු ද ඉදිරි කාලයේ දී ඉටු කිරීමට නියමිතය.

වැඩිදියුණු කරන ලද ජනාවාසයන්හි යටිතල පහසුකම් සැපයීම සියයට 25ක් පමණ ඉතිරිව ඇත.

ඇළ මාර්ග හා කළපුව ඇතුළත් වන ව්‍යාපෘති බල ප්‍රදේශයේ නිවාස සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබා දීම සියයට 30ක් පමණ ඉතිරිව ඇත.

(v) ඉඩම් අත් කර ගැනීමේදී මිනුම් කටයුතු ප්‍රමාද වීම නිසා සහ ඉතාම සුළුතරයක් (බලපෑමට ලක් වූ සියලු දෙනාගෙන් සියයට 0.5ක් පමණ) විසින් අත් පත් කර ගැනීමට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ගයන්ට අවතීර්ණ වීම හේතුවෙන් සමස්ත ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාදයට ලක් විය. එබැවින් ඊට අනුරූපිතව ඉදි කිරීම් කටයුතු සැලසුම් කළ කාල වකවානු තුළ සම්පූර්ණ කර ගත නොහැකි විය.

තවද, දුම්රිය දෙපාර්තමේන්තුව සතුව තිබූ වැඩිදියුණු කිරීම සඳහා හඳුනා ගත් ජනාවාසයන්හි ඉඩම්වල අයිතිය ව්‍යාපෘතිය වෙත පැවරීම ප්‍රමාද වීම නිසාද අදාළ ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය ආරම්භ කිරීම සැලසුම් කාල වකවානු තුළ ක්‍රියාත්මක කළ නොහැකි විය.

(ආ) අදාළ නොවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් නාගරික සංවර්ධන අමාත්‍යවරයා හැටියට කටයුතු කරමින් විශේෂයෙන්ම මේ කාරණාවට මැදිහත් වෙච්ච නිසාම එතුමාට මේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ලුනාව කළපුව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රධාන ගැටලුව මෝය කට පුළුල් කිරීම පිළිබඳ ප්‍රශ්නයයි. අනිකුත් අතුරු කාරණාත් වැදගත් තමයි. නමුත් අර ඒ ව්‍යාපෘතියේ මෝය කට පළල් කිරීමේ කොටස සම්පූර්ණ කර තිබෙනවාද, නැද්ද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ලුනාව ව්‍යාපෘතියේ මූලික අරමුණ ලුනාව මෝය කට සංවර්ධනය කිරීම පමණක් නොවෙයි. දෙහිවල-ගල්කිස්ස නගර සභා ප්‍රදේශයේ මුහුදු බඩ සෑම ප්‍රදේශයකම ඇළ මාර්ගවල් සංවර්ධනය කර දී ජල බැස්මට හවුල් වීම, එතැනින් එහාට රත්මලාන බල ප්‍රදේශයේ සම්පූර්ණ ජල බැස්ම ඇති කර දීම, මිය ගිය ලුනාව කළපුව යළි ප්‍රාණවත් කිරීම, ඒ සඳහා මෝය කට යම් කිසි මට්ටමකට විවෘත කොට ජලය උතුරා යෑමට අවශ්‍ය විධිවිධාන ඇති කිරීමත් කළ යුතුව තිබෙනවා. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා දන්නවා ඇති, අපි මෝය කටේ සංවර්ධන කටයුතු කරලා මොරටුව නගර සභා කාර්යාලයේ පරිගණක සංඥාවක් මෝය කටේ සිට හැතැප්ම එකක්, එකහමාරක් විතර දුරින් සවි කර තිබෙන බව. මුහුදු ජල මට්ටම ඉහළ යාමේදී එය පාලනය කර ගැනීමට අවශ්‍ය වෙස මෝය කට සංවර්ධනය කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා දන්නවා, ලුනාව ව්‍යාපෘතියේ නිවාස 2000ක් පමණ සාදා තිබෙන බව. මුළු රටම අඳෝනා දුන්, පසු ගිය දා ඇද හැළුණු මහා වර්ෂාවෙන් රත්මලාන සිට ලුනාව දක්වා කිසිදු ගෙයක් යට වුණේ නැහැ, මේ සංවර්ධනය නිසා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මගේ ඊ ළඟ අතුරු ප්‍රශ්නය මෙයයි. එතුමා සඳහන් කළ වැඩ නිම නොකළ කොටස් අවසන් කිරීම සඳහා සැලසුම් කර තිබෙන කාල සීමාව කොපමණද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

දෙසැම්බර් 31වන දා වන විට මේ වැඩ කටයුතු සියල්ල හමාර කරනවා.

දේශීය හා විදේශීය ණය : විස්තර
உள்ளூர் மற்றும் வெளிநாட்டுக் கடன்கள்: விபரம்
LOCAL AND FOREIGN LOANS : DETAILS

0035/'10

6. ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) වර්ෂ 2010 අප්‍රේල් 30 වැනි දිනට රජය මගින් ගෙවීමට නියමිත දේශීය හා විදේශීය ණය මුදල් ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් ද ඇතුළුව) කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 සිට 2009 දක්වා වර්ෂවලදී රජය මගින් ලබා ගන්නා ලද සම්පූර්ණ ණය මුදල් ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් ද ඇතුළුව);

(ii) ඉහත සඳහන් වර්ෂවලට අදාළව ණය වාරික හා පොලී වශයෙන් දේශීය හා විදේශීය ණය

වෙනුවෙන් රජය විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය; කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

නිති, තිට්ටමිටල් අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) 2010, ඒප්බිරල් 30ඇම් තිකතියිලුල්ලවාරු අරසාංකත්තිනාල් සෙලුත්තප්පට වේණ්ඩිය මොත්ත උල්ලූර් මර්රුම් වෙලිනාට්ටුක් කටන්කලින් (තිරෙසේරි උණ්ඩියල්කල් උට්පට) තොකෙයිනෙ වෙව්වේරාක අවර් ඉච්චපෙයිල් කුරිප්පිටුවාරා?

(ආ) (i) 2005, 2006, 2007, 2008 මර්රුම් 2009 ආම් ආණ්ඩුකල් ඔව්වොන්රිලුම් අරසාංකත්තිනාල් පෙරප්පට්ටුල්ල මොත්තක් කටන්කල් (තිරෙසේරි උණ්ඩියල්කල් උට්පට) එව්වලවෙන්පතෙයුම්,

(ii) මේර්පඩි ඔව්වොරු වරුටත්තිලුම් අරසාංකත්තිනාල් උල්ලූර් මර්රුම් වෙලිනාට්ටු කටන්කලුක්කාක වට්ටියාරකවුම් තවණෙක් කට්ටණංකලාරකවුම් සෙලුත්තප්පට්ටුල්ල තොකෙයිනෙයුම්

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Finance and Planning:

(a) Will he state the total amount of loans (including the Treasury Bills) that should be paid by the government as at 30th April 2010 indicating local and foreign loans separately?

(b) Will he inform this House -

(i) the total amount of loans (including Treasury Bills) that has been borrowed by the government in each of the years during the period from 2005 to 2009?

(ii) separately, the amount that was paid by the government as interest and loan installments for local and foreign loans in each of the aforesaid years?

(c) If not, why?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) 2010 අප්‍රේල් මස 30 වැනි දිනට නොපිය වූ රාජ්‍ය ණය දත්තයන් දැනට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සතුව ඇත. ඒ නිසා මාර්තු මස අවසානය දක්වා නොපිය වූ ණය විස්තර ඉදිරිපත් කරනවා.

2010 මාර්තු මස අවසානයේ පැවැති නොපිය වූ රාජ්‍ය ණය (තාවකාලික දත්ත)

විදේශ	=	රු. මිලියන 1,770,365
දේශීය	=	රු. මිලියන 2,476,155
මුළු ණය	=	රු. මිලියන 4,246,520

(ආ) (i) 2005 සිට 2009 දක්වා වර්ෂවලදී රජය මගින් ලබා ගන්නා ලද සම්පූර්ණ ණය මුදල් ප්‍රමාණය : (භාණ්ඩාගාර බිල්පත් ද ඇතුළුව)

ණය දළ රැස් කිරීම්

(රු. මිලියන)

වර්ෂය	විදේශ	දේශීය	මුළු එකතුව
2005	75,180	326,951	402,131
2006	97,697	411,341	509,038
2007	181,227	397,302	578,529
2008	129,650	573,009	702,659
2009(අ)	355,786	643,850	999,636

(අ) තාවකාලික

මූලාශ්‍රය : මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(ii) ඉහත සඳහන් වර්ෂවලට අදාළව ණය වාරික හා පොළී වශයෙන් දේශීය හා විදේශීය ණය වෙනුවෙන් රජය විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය:

(රු. මිලියන)

	ප්‍රාග්ධන ආපසු ගෙවීම්			පොළී ගෙවීම්		
වසර	දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	එකතුව
2005	203,347	21,360	224,707	113,164	6,995	120,159
2006	247,536	45,989	293,525	133,788	16,990	150,778
2007	253,719	64,114	317,833	161,370	21,311	182,681
2008	258,720	121,609	380,329	182,198	20,277	212,475
2009(අ)	401,296	114,716	516,012	273,978	35,698	309,676

(අ) තාවකාලික

මූලාශ්‍රය : මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(ඇ) පැන නොනඟී.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. මෙම ණය ප්‍රමාණයට එච්එස්බීසී බැංකුවෙන් ගත් ණය මුදලත් ඇතුළත් වී තිබෙනවා. ඒකෙන් සියයට අටහමාරේ පොලියට ණය අරගෙන තිබෙන්නේ. ඒ මුදල -රුපියල් කෝටි 550ක්- මේ ණය බරතාවට එකතු වෙලා තිබෙනවා. මම හිතන්නේ එච්එස්බීසී ආයතනයෙන් ණය ගන්නේ නැතුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හෝ ලෝක බැංකුවෙන් ණය ගත්තා නම් කෝටි 75ක් යන්නේ නැහැ කියායි. මේ අධික පොලී ප්‍රමාණයට වග කියන්න අවශ්‍ය වන්නේ කවුද? මොකද, ජනතාවටයි මෙවැනි මුදලක් ගෙවන්න වෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර එපා. ප්‍රශ්නය අහන්න.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

එච්එස්බීසී බැංකුවෙන් ගත්ත ණය ප්‍රමාණය පිළිබඳ වගකීම ගැන තමයි, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නය අහන්නේ. ඇත්ත වශයෙන්ම එය මේ ප්‍රශ්නයට අදාළ වන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
[බාධා කිරීමක්] - කවුද වග කියන්නේ කියලා. දැන් කෝටි 550ක් ගෙවන්නේ නැතිව, කෝටි 75ක් ගෙවන්න තියෙන එකට කෝටි 550ක් ගෙව්වාම කෝටි 475ක් වැඩියෙන් ගෙවලා තියෙනවා. මේකෙන් සීනි මිල රුපියල් සියයකින් අඩු කරන්න පුළුවන්. සීනි කර්මාන්තය දියුණු කරන්න -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අදාළ ප්‍රශ්නයට සම්බන්ධව අතුරු ප්‍රශ්නයක් අහන්න. හොඳයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, දේශීය, විදේශීය ණය ප්‍රමාණය පිළිබඳවයි ප්‍රශ්නය තියෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
එම නිසා ඒ වගකීම පිළිබඳව සහ සවිස්තරාත්මක කරුණු අදාළ නොවන බව කියන්න කැමැතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අලුතින් අහන්න. තුන්වැනි අතුරු ප්‍රශ්නය.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවේ නැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. නිදහස ලබා ගත් දවසේ සිට 2005 ජනවාරි මාසයේ 1 වැනි දා වන තුරු අපි කෝටි එක්ලක්ෂ හැත්තෑ අටදහස් හාරසියයක් ණය අරගෙන තිබෙනවා. 2005 ජනවාරි මාසයේ සිට 2010 අප්‍රේල් මාසයේ 30වැනි දා වන තුරු කෝටි හාරලක්ෂ අනූපන්දහස් අටසියයක් ණය අරගෙන තිබෙනවා. මේ සියයට 250ක වැඩි වීමක් ඇති වෙලා තිබෙන්නේ අවුරුදු 4ක් තුළයි. [බාධා කිරීම්] නැහැ. ණය ප්‍රමාණය දීලා තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඒකට අදාළ හේතු වෙනම ප්‍රශ්නයකින් ඇහුවොත් අපට පිළිතුරු දෙන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න ඇහුවොත් හොඳට පිළිතුරු දෙයි. ප්‍රශ්නයට අදාළව -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන්වැනි අතුරු ප්‍රශ්නය වශයෙන් මා අහන්න බලාපොරොත්තු වන්නේ මේකයි. දැන් මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. ණය සහ පොලී ප්‍රමාණය වෙනුවෙන් කෝටි 84,000ක් ගෙවනවා. රටේ ආදායම කෝටි 83,200යි. ඉතින් ආදායමට වැඩිය කොහොමද -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. බලන්න, ප්‍රශ්නයට අදාළද කියලා?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අදාළ නැහැ. අපි ලබා ගන්නා ඒ සියලුම මුදල් ජාතික සංවර්ධනය වෙනුවෙන් වැඩි, -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ පිළිතුර ප්‍රමාණවත් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ පිළිබඳව ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, වැඩි ආදායම් ලබා ගැනීම සඳහා තමයි ඒ මුදල් ආයෝජනය කරලා තිබෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ සම්බන්ධයෙන් පැන නඟින ප්‍රශ්නයක් වෙන්න ඕනෑ. අලුතෙන් හිතලා අහන්න බැහැ. හොඳයි, ඔබතුමා වාඩි වෙන්න. [බාධා කිරීම්] වෙන දවසක අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම වෙන දවසක අහන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7-0082/'10-(1), ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිර්මල කොතලාවල මහතා (මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Highways)
ගරු කථානායකතුමනි, මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා

සිටිනවා. ගරු කථානායකතුමනි, වැඩි දුර පැහැදිලි කිරීමක් ගරු මන්ත්‍රීතුමාගෙන් අවශ්‍යයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්ඩලික සජිත් ප්‍රේමදාස)
(The Hon. Sajith Premadasa)
ඇමැතිතුමා, කොපමණ කාලයක් ද?

ගරු නිර්මල කොතලාවල මහතා
(මාණ්ඩලික නිර්මල කොත්තලාවල)
(The Hon. Nirmala Kotalawala)
සති 2යි. [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩලික දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු මර්වින් සිල්වා ඇමතිතුමා උත්තර දෙන්න නැඟිට්ටා.

කථානායකතුමා
(සභානායකයා)
(Mr. Speaker)
සති 2යි. [බාධා කිරීමක්]

ගරු නිර්මල කොතලාවල මහතා
(මාණ්ඩලික නිර්මල කොත්තලාවල)
(The Hon. Nirmala Kotalawala)
අදාළ ග්‍රාම සේවක වසම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්ඩලික ඌරුප්පිනා ඔරුවා)
(An Hon. Member)
ගරු මර්වින් සිල්වා ඇමතිතුමාගෙන් ඇහුවා නම් උත්තර දෙනවා.

කථානායකතුමා
(සභානායකයා)
(Mr. Speaker)
සභාවෙන් පිටත දී උත්තර ගන්න. [බාධා කිරීමක්] තමුන්නාන්සේ වාඩි වෙන්න. කලබල වෙනවා නේ.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා (මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික(කලානිති) මේර්වින් සිල්වා - නෙටුඤ්ඡාලෙකළ් ප්‍රතිඅමාත්‍යවරයා)
(The Hon. (Dr.) Mervyn Silva - Deputy Minister of Highways)
මම කලබල වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මාරුවක් සඳහා සභාව නියෝග කරන ලදී.
Question ordered to stand down.

කථානායකතුමා
(සභානායකයා)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8-293/10-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්ඩලික සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික පිරේමලාල් ජයසේකර - මින්වලු, එරිසක්ති පිරතී අමෛච්චර්)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මාරුවක් සඳහා සභාව නියෝග කරන ලදී.
Question ordered to stand down.

හදිසි ගංවතුර තත්ත්වය නිසා අවතැන් වූවන් : සහන
திடீர் வெள்ள நிலைமையினால் இடம்பெயர்ந்தோர்: நிவாரணம்
PERSONS DISPLACED DUE TO FLASH FLOODS : RELIEF

0306/'10

9. ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩලික දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පසු ගිය දිනවල ඇතිවූ හදිසි ගංවතුර තත්ත්වයෙන් අවතැන් වූවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එය බල පෑ එක් එක් දිස්ත්‍රික්කය අනුව අවතැන් වූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් දිස්ත්‍රික්කයේ හානියට පත් වූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) එම අවතැන් වූවන් සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(v) ඔවුන්ගේ නිවාස සෑදීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය හා වෙන් කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) අවතැන් වූවන් සඳහා දැනට ලබා දී තිබෙන නිවාස සංඛ්‍යාව කොපමණද;

(vii) එම නිවාස සංඛ්‍යාව වැඩි කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම් ඒ මන්ද?

අනර්ත්ත මුකාමෙත්තුව අමෛච්චරෙක් කේට්ට විනා :

(අ) (i) කඩන්ත තිනංකළිල් ඒර්පට්ට තිඪීර් වෙළ්ළ නිලෙමෙයිනාල් ඉඩම්පෙයර්න්තවර්කළින් එණ්ණික්කෙ එව්වළවෙන්පතෙයුම්,

(ii) ඉත්තාක්කත්තුක්කු උළ්ළාන ඔව්වොරු මාවට්ටත්තිලුම් ඉඩම්පෙයර්න්තවර්කළින් එණ්ණික්කෙයුම් වෙව්වේරාක එව්වළවෙන්පතෙයුම්,

(iii) ඔව්වොරු මාවට්ටත්තිලුම් චේතමටෛන්ත වීටුකළින් එණ්ණික්කෙ එව්වළවෙන්පතෙයුම්,

(iv) මේර්පටි ඉඩම්පෙයර්න්තවර්කළුක්කාක ඔදුක්කිය නිතිත් තොකෙ එව්වළවු එන්පතෙයුම්,

(v) ඉවර්කළතු වීටුකළෛ කට්ටුවතර්කුත් තේවෛයාන නිතිත්තොකෙයුම් ඔදුක්කිය නිතිත්තොකෙයුම් එව්වළවෙන්පතෙයුම්,

(vi) இடம்பெயர்ந்தவர்களுக்காக தற்போது வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்,

(vii) அவ்வீடுகளின் எண்ணிக்கையை அதிகரிப்பதற்குத் தேவையான நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்,

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management :

(a) Will he state -

(i) the number of persons who were displaced due to the flash floods that occurred recently;

(ii) the names of the districts affected by the floods and the number of people who were displaced in each of the aforesaid districts separately;

(iii) the number of houses damaged in each of the aforesaid districts separately;

(iv) the amount of money allocated for the displaced persons;

(v) the amount of money required to build their houses and the amount of money allocated for that purpose;

(vi) the number of houses that have been given to the displaced persons by now; and

(vii) whether steps will be taken to increase the number of such houses?

(b) If not, why?

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)

(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)

(The Hon. A.H.M. Fowzie - Minister of Disaster Management)

(a) (i) 4516 families
16685 people

(ii)

District	No.of affected people	No.of displaced people
1. Colombo	167,820	1,035
2. Gampaha	208,716	14,413
3. Kalutara	88,687	666
4. Galle	114,385	427
5. Putlam	8,658	144
6. Ratnapura	14,052	-
7. Matara	26,028	-
8. Kurunegala	1,001	-
Total	629,347	16,685

(iii)

District	Full damaged	Partially damaged
1. Colombo	28	561
2. Gampaha	119	717
3. Kalutara	198	659
4. Ratnapura	60	274
5. Matara	202	91
6. Galle	359	1,232
7. Putlam	4	86
8. Kurunegala	13	42
Total	983	3,662

Sub total - 4645

(iV)

District	Reserved allocation for District Secretariat up to 15.07.2010 (Rs.)
1.Colombo	22,000,000
2.Gampaha	12,400,000
3.Kalutara	18,664,876
4. Ratnapura	2,500,000
5.Matara	5,860,000
6.Galle	25,000,000
7.Putlam	1,000,000
8.Kurunegala	213,860
Total	87,638,736

(V) Estimated cost - Rs.109,539,031 /=
Released amount - Rs. 56,390,945 /=
Money to be released - Rs. 53,660,087 /=

(Vi) There is no provision to give houses for the houses that are being damaged. But we only support them to put up houses. According to the law, they are entitled to Rs. 50,000 if a house is fully damaged. If it is partially damaged it is estimated, and that amount of money is given.

(Vii) Does not arise.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. මෙම නිවාස සංඛ්‍යාව සඳහා අවශ්‍ය වන රුපියල් මිලියන 109ක මුදල ඔබතුමා කොපමණ කාල වකවානුවක් ඇතුළතද ලබා දෙන්න බලාපොරොත්තු වන්නේ? දැනට ලබා දීලා තිබෙන්නේ මිලියන 56යි.

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

ඉතිරි මුදල අපි අදියර වශයෙන්, අදියර තුනකදී ලබා දෙනවා. පළමුවන අදියරේ රුපියල් 20,000යි. දෙවන අදියරේ රුපියල් 15,000යි. තුන්වන අදියරේ රුපියල් 15,000යි. රුපියල් 50,000ක් ඒ විධියට දෙනවා. පළමුවන අදියරයේ රුපියල් 20,000 වියදම් කළාට පස්සේ දෙවන අදියරයේ රුපියල් 15,000ක් දෙනවා. ඒ 15,000 වියදම් කළාට පස්සේ ඉතිරි 15,000 ලබා දෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය. දැන් කොළඹ නගරයේ දිගින් දිගටම ගංවතුර ප්‍රශ්නය තිබෙනවා. ඔබතුමා ඒක දන්නවා. මෙයට ප්‍රධානම හේතුව වෙලා තිබුණේ ඇළ මාර්ග පිරිසිදු නොකිරීමයි. [බාධා කිරීමක්] ඒ වාගේම අනවසර නිවාස ඉදි කිරීමේ ප්‍රශ්නය තිබෙනවා. අපේ ගරු මර්වින් සිල්වා මැතිතුමාත් සමහර ප්‍රදේශවල අනවසර විධියට ඉදි කළා. [බාධා කිරීමක්] ඒක නිසා තමයි එතුමා ටිකක් හයියෙන් කෑ ගහන්නේ. [බාධා කිරීමක්] මම ඔබතුමාගෙන් ගෞරවයෙන් අහන්නේ, විශේෂයෙන්ම ගම්පහ සහ කොළඹ ප්‍රදේශවල ගංවතුර තත්ත්වයක් නැවත ඇති නොවීම සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් ඔබතුමා දැනට ආරම්භ කරලා තිබෙනවාද?

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

ඇත්ත වශයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන්, ඒ වාගේම SLRDC සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ඇළ මාර්ග ඔක්කෝම වාගේ දැන් පිරිසිදු කරලා තිබෙනවා. එය අපේ අමාත්‍යාංශයට අයිති නැති වැඩක්. ඒ වුණත් කොළඹ දිස්ත්‍රික්කයේ ඇළ මාර්ග සේරම දැන් පිරිසිදු කරලා තිබෙනවා. දැන් වැස්සොත් යට වෙයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. අපි තවදුරටත් ඇළ මාර්ග සුද්ධ කරනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගම්පහ දිස්ත්‍රික්කය?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න අංක තුන.

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
අපි ගම්පහ දිස්ත්‍රික්කයේත් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය නොවෙයි. තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම දෙවන අතුරු ප්‍රශ්නය ඇසුවේ නැහැ. ගම්පහ දිස්ත්‍රික්කය කියලා විතරයි මම කිව්වේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ අධිවේගී මාර්ගය ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුර ප්‍රශ්නයට ප්‍රධාන හේතුවක් බවට පරිසර විද්‍යාඥයෝ කරුණු දක්වලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්න බලාපොරොත්තු වනවාද? ඒ සම්බන්ධයෙන් ගන්න වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඒ සම්බන්ධව වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒක ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ අනුව මම බලාපොරොත්තු වනවා, ඊ ළඟ වැස්සේදී ඒ පළාතත් යට නොවී ආරක්ෂා කර ගන්න පුළුවන් වෙයි කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 11- 0036/'10-(2), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය දෙවන වර ඉදිරිපත් කරලා තිබෙන්නේ. මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

විතාරන්දෙනිය - රණසිංගහම මාර්ගය: වෙන් කළ මුදල
விதாரந்தெனிய-ரணசிங்ஹகம வீதி: நிதி ஒதுக்கீடு
VITHARANDENIYA-RANASINGHEGAMA ROAD: MONEY ALLOCATED

0121/10

12. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය – **(1)** :

(අ) දැනට වර්ෂ 2½කට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, විතාරන්දෙනිය උතුර ග්‍රාම නිලධාරී වසමට අයත්, විතාරන්දෙනියේ සිට ඉහලගොඩ හරහා රණසිංහගම දක්වා මාර්ගයේ කිලෝමීටර් 1ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ගැලවී, වළවල් හැරී, සම්පූර්ණයෙන්ම අබලන් තත්ත්වයට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදි කිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබා ගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

නෙදුංජ්සාලෙකළ් අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) இற்றைக்கு $2^1/_2$ வருடங்களுக்கு முன்னர் கொங்கிரீட் இட்டு செப்பனிடப்பட்ட அம்பாந்தோட்டை மாவட்டத்தின் தங்காலை பிரதேச செயலாளர் பிரிவின் விதாரந்தெனிய வடக்கு கிராம உத்தியோகத்தர் பிரிவுக்குட்பட்ட விதாரந்தெனியவிலிருந்து இஹலகொடை ஊடாக ரணசிங்ஹகம வரையிலான வீதியின் 1 கிலோ மீற்றர் தூரம் தற்போது கொங்கிரீட் உடைந்து குன்றும் குழியுமாக முழுமையாகச் சேதமடைந்த நிலையிலிருப்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீதியை அபிவிருத்தி செய்வதற்காக ஒதுக்கப்பட்டிருந்த நிதி எவ்வளவு என்பதையும்,

(ii) நிர்மாணப் பணிகளுக்காக நிதி விடுவிக்கும்போது உரிய நியமங்களுக்கமைய பணிகள் நிறைவு

செய்யப்பட்டுள்ளமைக்கான விதப்புரைகள் தொழில்நுட்ப உத்தியோகத்தர்களிடமிருந்து பெறப்பட்டுள்ளதா என்பதையும்,

(iii) மேற்படி வீதியை நிர்மாணிப்பதற்கான பணக் கொடுப்பனவுகளின்போது வேறு எந்த நிறுவனங்களிடமிருந்து விதப்புரைகள் பெறப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) மேற்படி வீதி நிர்மாணிப்பு தொடர்பாக முறையான விசாரணையொன்றை நடத்துவதற்கும் அவ்வீதியை சீரான நிலைக்கு கொண்டுவருவதற்கும் அவர் நடவடிக்கை எடுப்பாரா?

(ஈ) இன்றேல், என்?

asked the Minister of Highways:

(a) Is he aware that in the one kilometre stretch of the road to Ranasinghegama from Vitharandeniya via Ihalagoda in the Vitharandeniya North Grama Niladhari Division in the Tangalle Divisional Secretary's Division of the Hambantota District, which was constructed by laying concrete about $2^1/_2$ years ago, concrete has scaled off and it is in a dilapidated condition by now?

(b) Will he inform this House -

(i) the financial provisions allocated for the development of the said road ;

(ii) whether recommendations of technical officers have been obtained to the effect that the work had been completed as per the standards in releasing money for constructions;

(iii) from what other institutions recommendations were obtained in making payments for the constructions of the said road?

(c) Will he take action to conduct a proper inquiry in this respect and restore it?

(d) If not, why?

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) මෝවින් සිල්වා)
(The Hon. (Dr.) Mervyn Silva)
ගරු කථානායකතුමනි, මහා මාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුර ලබා දෙනවා.

මෙතුමාගෙන් හරි කරදරයි. බොරුවට ප්‍රශ්න අහනවා.

(අ) මාර්ගය අබලන්ව පවතින බව වාර්තා වී නොතිබුණි. මෙම මාර්ගය ඉදි කර වසර 04ක් ඉක්මවා ඇත. මාර්ගයේ වළවල් හෑරී නොමැති අතර, තැනිත් තැන ගල් මතු වී, ඒ ගල් ඔබලාගේ උදවියගේ ඇතැම් අය ප්‍රයෝජනය සඳහා ගන්නා ලද බවත්, දෙපස විශාල ගස් අතර කොන්ක්‍රීට් තට්ටුවේ ඉරි තැළීම් දක්නට ඇත. [බාධා කිරීම්]

(ආ) (i) රුපියල් 1,632,538,34 යි. එනම් රුපියල් දහසයලක්ෂ තිස්දෙදහස් පන්සිය තිස්හතයි, ශත තිස්හතරයි. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
කවුද ඕවා ලියලා දුන්නේ?

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) මෝවින් සිල්වා)
(The Hon. (Dr.) Mervyn Silva)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]
මම කනගාටු වනවා, උසාවි ගිහිල්ලා ඇවිල්ලා -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමාට පිළිතුරු දෙන්න අවස්ථාව දෙන්න. නැක්නම් අනවශ්‍ය වචන පාවිච්චි වෙනවා.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) මෝවින් සිල්වා)
(The Hon. (Dr.) Mervyn Silva)
එතුමා කාටවත් මුදල් ගෙවන්න උසාවියකට ගියාද දන්නේ නැහැ. බර පැන ගෙවන්න ගියාද? උසාවියේ නඩුවකට පෙනී ඉඳලා, ගණනක් ගෙවන්න ගියාද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ආචාර්ය මර්වින් සිල්වා ඇමතිතුමා -

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) මෝවින් සිල්වා)
(The Hon. (Dr.) Mervyn Silva)
එහෙමයි, කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ අහන කෙනාට වඩා ආචාර්යවරයෙක්. ඒ නිසා ඒ විධියට පිළිතුරු දෙන්න.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) මෝවින් සිල්වා)
(The Hon. (Dr.) Mervyn Silva)
බලන්න කෝ, මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]
මිනිස්සු අහන ඒවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙටියෙන් පිළිතුරු දෙන්න.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) මෝවින් සිල්වා)
(The Hon. (Dr.) Mervyn Silva)
කථානායකතුමනි, එතුමන්ලා වාගේ අයට කථා කරන්න ඕනෑ අනාචාර්ය විධියටයි. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා තමුන්නාන්සේ -

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
එතුමා මගේ යාළුවා. එතුමාට පොඩි හිතේ අමාරුවක් තිබෙනවා මා එක්ක. ඒකයි ඒ. එතුමාගේ සම්බන්ධය දෙදරලා ගිහිල්ලා තිබෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නවලට එවැනි උත්තර දෙන්න අවශ්‍ය නැහැ.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
බලන්න, මේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා හිට ගෙන නේ ඉන්නේ. ඔබතුමා හිට ගෙන ඉන්න කොට මට දුකයි. ඔබතුමා වාඩි වෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා මොන ප්‍රශ්නයටද දැන් උත්තර දෙන්නේ?

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
මතකත් නැහැ. මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කෑ ගහනවා.

(ආ) (ii) ඔව්. තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරිවරයාගේ නිර්දේශය ලබා ඇත.

(iii) හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලබා ගෙන ඇත.

(ඇ) ඔව්.

(ඈ) පැන නොනඟී.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි ඔබතුමාත් වර්තමාන ජනාධිපතිවරයාත් නියෝජනය කරන දිස්ත්‍රික්කයක අබලන් වුණු මාර්ගයක් පිළිබඳව මේ උත්තරීතර සභාවේ ප්‍රශ්නයක් ඇහුවාම, ඒක හාස්‍යයට ලක් කිරීමේ උත්තරයක් එතුමා ලබා දීම ගැන මම කනගාටු වනවා.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
මම උත්තර දෙන්නම්. ඔබතුමා අහන මේ ප්‍රශ්නවල කිසි වටිනාකමක් නැත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉපදුණු අපි, එදා තිබුණු තත්ත්වය හා බලන විට අද ඉතාම උසස් තත්ත්වයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කය පවතිනු ඇත. ඔබ එහි ගොස් පොඩි කාලයක් බව මම දන්වන අතර, අපි පෙකණි වැල කැපුවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේදී බවත් කරුණාවෙන් හිතේ තබා ගන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙකයි. මා අහන්න කැමැතියි විශේෂයෙන් ඉහළගොඩ -[බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්නේත් නැහැ. උත්තර දෙන්න ඉඩ දෙන්නේත් නැහැ.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ඒක තමයි. බලන්න කෝ කැතයි නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ මාර්ගය මේ වන විට සම්පූර්ණයෙන්ම අබලන් වෙලා තිබෙනවා.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
නැත. මම ඇසින් දැක ඇත.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ මාර්ගය සම්පූර්ණයෙන්ම අබලන් වෙලා තියෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. තමුන්නාන්සේලා දෙන්නාම ගිහිල්ලා ඒ පාර බලන්න කෝ. [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ රටේ මහ ජන මුදල්වලින් පාරක් ඉදි කරලා ඒක අබලන් වුණාම ඒක පිළිසකර කරන්නට බැරි මහා මාර්ග අමාත්‍යාංශක්ද මේ රටේ තිබෙන්නේ?

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
එහෙම දෙයක් සිදු වී නැත. මා එය ඇසින් දැක ඇත.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේලා මේ අහන ප්‍රශ්නය තේරුම් අරගෙන උත්තර දෙනවා නම් -

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
තේරුම් අරගෙනයි කියන්නේ. එහෙම අබලන් වී නැත. මෙය මුසාවක් බව තරයේ ප්‍රකාශ කරමි. එහෙම අබලන් වී ඇත්නම් එය - [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සත්‍ය හෝ අසත්‍ය වේවා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පිළිතුර පිළිගන්න. ඊට පස්සේ නැවත වරක් එතුමාත් එක්ක ගිහිල්ලා බලන්න.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ පිළිතුර පිළිගන්නේ නැති නම් අප දෙදෙනාම ලබන සතියේ දිනයක් යොදා ගෙන ඒ පාර බැලීමට යමු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම එතුමාගේ පිළිතුර පිළිගන්නේ නැහැ. මෙතුමා අසත්‍ය පිළිතුරක් ලබා දෙන්නේ. ඒ නිසා මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මෙම මාර්ගය නැවත වරක් පිළිසකර කරන්න කොපමණ කාලයක් ගත වෙනවාද?

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ගරු මන්ත්‍රීතුමනි, මම පිළිගන්නේ නැති වුණත් මෙම මාර්ගය අබලන් වී ඇති බව ඔබතුමා කියන්නෙහි නම් මා ඉපදුණු ප්‍රදේශය නිසා, අපේ රාජපක්ෂවරුන්ගේ භූමිය නිසා මා එහි ගොස් පරීක්ෂා කර බලා එය ඉතා ඉක්මනින් පිළිසකර කරන බව තරයේ ප්‍රකාශ කරමි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කොපමණ කාලයක් ගන්නවාද?

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
කාලය පිළිබඳව කියන්න මා ඉංජිනේරුවෙක් නොවෙමි. මා ගල් අතුරන කෙනෙකුත් නොවෙමි. මගේ ඉංජිනේරු මහත්වරුන්ගෙන් අසා මතු කාලයේදී එයට උත්තර දෙමි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි. හැන්සාඩ් වාර්තාව ජනතාව කියෙව්වොත් බොහොම සතුටු වෙයි.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ඒකට මගේ කිසිම භයක් සැකක් නැති බව තරයේ ප්‍රකාශ කරමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේලා පොඩ්ඩක් ගැලරිය පැත්ත බලලා කථා කළොත් හොඳයි.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
එහෙමයි. දැන් මා කිව්වේ වැදගත් වචන නේ, ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13-0294/'10-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මෙම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සේවක අර්ථසාධක අරමුදල: දායක මුදල්
ஊழியர் சேமலாப நிதியம்: பங்களிப்புத் தொகை
EMPLOYEES' PROVIDENT FUND: CONTRIBUTIONS

0307/'10

14. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2004 සිට 2009 දක්වා සේවක අර්ථසාධක අරමුදලට එකතු වූ මුදල් ප්‍රමාණයන්, එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ වර්ෂයන් සඳහා දායක ගෙවීම් ප්‍රමාණය කොපමණද;

(iii) දායක ගිණුම් හිමියන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) දායක ලැබීම්වලට වඩා දායක ගෙවීම්වල වැඩිවීමක් දක්නට ලැබේද;

(v) එසේ නම් ඒ සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම් ඒ මන්ද?

தொழில் உறவுகள், விளைவுப்பெருக்க மேம்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2004ஆம் ஆண்டிலிருந்து 2009ஆம் ஆண்டு வரை ஊழியர் சேமலாப நிதியத்தில் ஒன்று சேர்ந்துள்ள பணத்தொகை ஒவ்வொரு ஆண்டிலும் வெவ்வேறாக எவ்வளவு என்பதையும்,

(ii) அந்தந்த ஆண்டுகளுக்குரிய பங்களிப்புத் தொகை எவ்வளவு என்பதையும்,

(iii) பங்களிப்புக் கணக்கு உரிமையாளர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iv) பங்களிப்புத் தொகை பெறுகைகளை விட பங்களிப்புத் தொகை கொடுப்பனவுகளில் அதிகரிப்பு காணப்படுகின்றதா என்பதையும்,

(v) ஆமெனின், அதற்காக எடுக்கும் நடவடிக்கைகள் எவையென்பதையும்,

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour Relations and Productivity Improvement:

(a) Will he state -

(i) the amounts received by the Employees' Provident Fund in each year from 2004 to 2009, separately;

(ii) the amount of contributory payments made in each year;

(iii) the number of contributory account holders;

(b) whether an increase in contributory payments over the contributory receipts is witnessed; and

(c) if so, the measures that will be taken in that respect?

(d) If not, why?

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) වර්ෂ 2004 සිට 2009 දක්වා සේවක අර්ථසාධක අරමුදලට එකතු වූ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

වර්ෂය	එකතු වූ මුදල (රුපියල්)
2004	23,828,600,707.48
2005	27,795,109,920.80
2006	33,809,076,631.71
2007	40,998,895,019.21
2008	46,916,034,350.19
2009	48,722,468,234.55

(ii) ඒ ඒ වර්ෂයන් සඳහා දායක ගෙවීම් ප්‍රමාණය පහත පරිදි වේ.

වර්ෂය	දායක මුදල් ගෙවීම් ප්‍රමාණය රුපියල්)
2004	16,388,703,810.59
2005	16,857,523,825.31
2006	17,432,434,097,07
2007	21,460,398,631.19
2008	25,544,692,611.92
2009	31,046,831,018.63

(iii) දායක ගිණුම් හිමියන්ගේ සංඛ්‍යාව පහතින් දක්වා ඇත.

වර්ෂය	දායක ගිණුම් හිමියන්ගේ සංඛ්‍යාව (දළ වශයෙන්)
2004	1,973,601
2005	2,002,652
2006	2,073,427
2007	2,181,001
2008	2,152,701
2009	2,051,795

(iv) දායක මුදල් ලැබීම්වලට වඩා දායක මුදල් ගෙවීම් ප්‍රමාණයෙහි වැඩිවීමක් නොමැත.

(v) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු අමාත්‍යතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. දායක ගෙවීම් සංඛ්‍යාවෙහි වැඩිවීමක් දක්නට නොලැබෙන්නේ ඇයි? ඒක වැඩි වෙලා නැත්තේ ඇයි කියලා මම අහන්න කැමැතියි.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඒකට පොඩි ප්‍රශ්නයක් පැන නැහලා තිබෙනවා. අධිකරණ තීන්දුවක් නිසා සමහර ඒවාට උසාවි යන්න බැරි වෙලා තිබෙනවා. ඒ කාරණය නිවැරදි කර ගන්න පාර්ලිමේන්තුවට පනතක් ඉදිරිපත් කිරීමට අපි දැන් කටයුතු කරලා තිබෙනවා. [බාධා කිරීමක්] මම ඒක බලා ගෙන ආවේ නැහැ. තමුන්නාන්සේ ඒ ගැන අහලා තිබුණා නම් මට ඒකත් බලා ගෙන එන්න තිබුණා. නමුත් ඒ කටයුත්ත මේ සංශෝධනයෙන් පසුව සම්පූර්ණ වනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ ඔය වැඩ පිළිවෙළ අවසන් වන්න කොච්චර කාලයක් ගත වෙයිද?

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මාස තුනක් පමණ ගත වෙයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. දෙවන වටය. ප්‍රශ්න අංක 5 - 0346/'10 - (1), ගරු මොහමඩ් අස්ලම් මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු මොහමඩ් අස්ලම් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10 - 0347/'10 - (1), ගරු මොහමඩ් අස්ලම් මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු මොහමඩ් අස්ලම් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15 - 0348/'10 - (1), ගරු මොහමඩ් අස්ලම් මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු මොහමඩ් අස්ලම් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ළඟට ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මුහුණ පා සිටින ප්‍රශ්න
பல்கலைக்கழக ஆசிரியர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்
PROBLEMS FACED BY UNIVERSITY TEACHERS

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අපේ රටේ ජාතික සංවර්ධනය වෙනුවෙන් දායක කර ගත යුතු, බුද්ධිමය ශ්‍රම සම්පතේ වැදගත්ම කොටසක් වන විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මුහුණ පා සිටින ප්‍රශ්න කිහිපයක් පිළිබඳ මෙම ගරු සභාවේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. අපේ රටේ බුද්ධිමය ක්ෂේත්‍රයේ, පර්යේෂණ ක්ෂේත්‍රයේ මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේද සුවිශාල කාර්ය භාරයක් ඉටු කරනු ලබන විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මේ වන විටත් වෘත්තීය ක්ෂේත්‍රයේ ගැටලු ගණනාවකට මුහුණ දී සිටින අතර, ඒවා පිළිබඳව රජයේ නිසි අවධානය යොමු වී නැහැ. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට වෘත්තීය ගරුත්වයක් සහිතව සිය සේවය පවත්වාගෙන යාම සඳහා ඔවුන්ගේ වැටුප් මට්ටම ඉහළ නැංවිය යුතුව තිබෙනවා. නමුත් දිගින් දිගටම ඒ පිළිබඳව ලබා දී ඇති පොරොන්දු කඩ කර තිබෙන අතර, මෙම තත්ත්වය තුළ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇතුළු බුද්ධිමතුන් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයෙන් ඉවත් වී වෙනත් රැකියාවලට යාමේ ප්‍රවණතාවක් ඇති වී තිබෙනවා. ඒ වාගේම තවත් විශාල පිරිසක් රට හැර යනවා. මෙය අපේ රටේ අධ්‍යාපනයට මෙන්ම සංවර්ධන ක්‍රියාවලියටත් ඉතාම අහිතකර බලපෑමක් ඇති කරන බව අවිවාදිතයි.

ආණ්ඩුවේ නිල ප්‍රතිපත්ති ලේඛනය ලෙස ඉදිරිපත් කළ "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" තුළ ශ්‍රී ලංකාව ලෝකයේ දැනුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන බව පවසා තිබෙනවා. එහි මෙසේ සඳහන් වෙනවා. "විදේශගත වී ලෝක පරිමාණයේ විශිෂ්ටයින් බවට පත්ව සිටින අපේ බුද්ධිමතුන්ගේ ආයෝජන, දැනුම හා සේවාවන් ලබා ගැනීම සඳහා ප්‍රතිබුද්ධිගලනය සඳහා ක්‍රියා මාර්ගයක් හඳුන්වා දෙනු ඇත." ප්‍රතිබුද්ධිගලනය යනු මේ වන විටත් විදේශගත වී සිටින බුද්ධිමතුන් යළි මෙරටට ගෙන්වා ගැනීමයි. ඊට පෙර කළ යුතු ප්‍රමුඛතම කාර්ය වන්නේ දැනට අපේ රටේ සිටින බුද්ධිමතුන් රට හැර යාම නවත්වා ගැනීමයි; ඒ සඳහා ඔවුන්ගේ වෘත්තීය ගරුත්වය හා වෘත්තීය අයිතීන් සුරක්ෂිත කර තෘප්තිමත් සේවාවක නිරත වීමේ අවස්ථාව ඔවුන්ට ලබා දීමයි. නමුත් මේ වන විටත් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් පොරොන්දු දේශපාලනය තුළ අතර මං කර ඔවුන්ට සිය සේවය පිළිබඳ අතෘප්තියක් ඇති කරවන බව පෙනෙන්නට තිබෙනවා.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ඉහළ අධ්‍යාපන සුදුසුකම් ඇති මුත් ඔවුන්ගේ වැටුප් තල ඊට සරිලන සේ සකස් කර නැහැ. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් වැඩි වීමේ වේගය පාසල් ගුරුවරුන්ගේ වැටුප් වැඩි වීමේ වේගය හා සංසන්දනය කරන විටද ඉතා අඩු අගයක පවතිනවා. 1996 දී වැටුපෙන් සියයට 30ක අධ්‍යයන දීමනාවක් ලබා දීමේ තීරණයෙන් පසුව විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා වැටුප් වැඩි වීමක් සිදු වී නැහැ. 2006 වසරේ පොදු රජයේ සේවකයින් සඳහා වන චක්‍රලේඛය යටතේ මෙම සියයට 30 දීමනාව සියයට 25 දක්වා අඩු කර මූලික වැටුපට එකතු කරනු ලැබුවා. එය සියලුම රජයේ සේවකයින් සඳහා ලබා දුන් අවස්ථාවක් වන අතර ඉතා දිගු කලකින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් උදෙසා විශේෂ වැටුප් වැඩි වීමක් සිදු කර නැහැ.

නමුත් සමාන්තර අධ්‍යාපන සුදුසුකම් සහිත අනෙකුත් රජයේ සේවා සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුපට වඩා වැඩි වැටුපක් හිමි වනවා. උදාහරණයක් ලෙස ප්‍රථම උපාධිය ලබා ආධුනික කථිකාචාර්යවරයකු වන අයකුට ලැබෙන වැටුප වන රුපියල් 26,900ක වැටුප මෙන් දෙගුණයක් පමණ එම සුදුසුකමම සහිත රජයේ ඇතැම් ආයතනවල සේවය කරන නිලධාරීන්ට ලැබෙනවා. අනෙක් වැටුප් තලවලද තත්ත්වය එසේමයි. බොහෝ රාජ්‍ය සේවා අංශවල උසස් අධ්‍යාපනය ලද අයගේ වැටුප් තල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකුගේ වැටුප මෙන් තුන් ගුණයකට ආසන්න වේ. මේ තත්ත්වය තුළ උපාධි පාඨමාලාවල සිටින දක්ෂතම බුද්ධිමතුන් විශ්වවිද්‍යාලවල රඳවා ගැනීම දුෂ්කර වී ඇත. ඔවුන්ට රජයේ හෝ පෞද්ගලික අංශයේ වෙනත් රැකියාවකට යාමෙන් හෝ විදේශ ගතවීමෙන් ඊට වඩා වැඩි වැටුපක් හිමි කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. මේ නිසා එක් පැත්තකින් රටේ බුද්ධිමය ශ්‍රම සම්පත රටට අහිමි වන අතර අනෙක් අතින් අප රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මක බවද බිඳ වැටේ. දැන් සරසවි පද්ධතිය තුළ ප්‍රධාන ප්‍රශ්නයක් ලෙස තිබෙන උග්‍ර ආචාර්ය හිඟයට මෙම තත්ත්වයද ප්‍රමුඛ බලපෑමක් සිදු කර තිබෙනවා. මේ තත්ත්වය හමුවේ අපේ රටේ ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය බිඳ වැටීමේ අවදානම පිළිබඳව මම මෙම ගරු සභාවේ අවධානය යොමු කරවනවා.

දැන් කාලයක සිට වැටුප් වැඩි වීමක් සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වෘත්තීය සමිති සම්මේලනය ආණ්ඩුවෙන් විවිධ ඉල්ලීම් කර ඇතත් ඔවුන්ට ලබා දුන් පොරොන්දු සියල්ල කඩ කර තිබෙන බව ඔවුන් පවසනවා. මෙම ප්‍රශ්නය පිළිබඳව 2008 ජනවාරි මස 31වැනි දා ගරු ජනාධිපතිතුමා සමඟ අරලිය ගහ මන්දිරයේදී පැවැත් වූ සාකච්ඡාවේදී, මාස තුනක් තුළ මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට පොරොන්දු වී තිබෙනවා. නමුත් එතැන් සිට මාස 30ක් පමණ ගත වී ඇතත් තවමත් කිසිදු විසඳුමක් ලබා දී නැහැ. පසුව 2009 මාර්තු මාසයේ 24වැනි දා විශ්වවිද්‍යාල ආචාර්ය, විධායක, කාර්මික හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සංශෝධන පිළිබඳ යෝජනා එතැන් සිට මසක් තුළ ඉදිරිපත් කරන බව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ලිඛිතව දැනුම් දී තිබෙනවා. නමුත් වසර එකහමාරක් පමණ ගත වූ මුත් තවමත් ඒ පිළිබඳ කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. මේ ප්‍රශ්නය පිළිබඳව 2009 දෙසැම්බර් මස 9වැනි දා -ජනාධිපතිවරණය පවත්වන වකවානුවේ- ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවැත් වුණා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා, ජාතික වැටුප් හා සංඛ්‍යා ලේඛන කොමිසමේ සම සභාපතිවරයා සහ මහ භාණ්ඩාගාරයේ නිලධාරීන් මෙම සාකච්ඡාවට සහභාගි වී තිබෙනවා. එහිදී මෙම ප්‍රශ්නයට කඩිනම් පිළිතුරක් ලබා දීමට එකඟ වී තිබුණත් මේ වන තුරුත් ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැහැ.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල කාර්ය භාරයක් ඉටු කරන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට මේ ආකාරයට බොරු පොරොන්දු ලබා දෙමින් දිගින් දිගටම රැවටීම පිළිබඳව ඔවුන් දැඩි කනස්සල්ලට හා අපේක්ෂා භංගත්වයට පත්ව තිබෙනවා. මේ ප්‍රශ්නවලට පිළිතුරක් වහාම ලබා දීමට අසමත් වුවහොත් මෙම තත්ත්වය විශ්වවිද්‍යාල පද්ධතියේ බිඳ වැටීම දක්වා ඉදිරියට යා හැකියි.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මුහුණ පා සිටින මෙකී ප්‍රශ්න පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරන අතරම පහත ප්‍රශ්නවලට ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමන්ගේ පිළිතුරු අපේක්ෂා කරනවා.

1. විශ්වවිද්‍යාල පද්ධතියේ ආචාර්යවරුන් සඳහා වැටුප් සංශෝධනයක් කිරීමට තීරණයක් ගෙන තිබේද?
2. එවැනි තීරණයක් ගෙන තිබේ නම් එය ක්‍රියාත්මක වන කාල රාමුව ඔබතුමා මෙම ගරු සභාවට දැනුම් දෙන්නේද?
3. 2009 මාර්තු 24වැනි දා වැටුප් සංශෝධන යෝජනා මසක් තුළ ඉදිරිපත් කිරීමට ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව දී තිබෙන පොරොන්දුව ක්‍රියාත්මක නොවීමට හේතුව කුමක්ද?
4. එම ප්‍රමාදය පිළිබඳව අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද?
5. 2009 දෙසැම්බර් 09වන දින පැවැති සාකච්ඡාවේදී එකඟ වූ සියයට 25ක අතුරු අධ්‍යයන දීමනාව ලබා දීමට පියවර ගන්නේ කවදාද?
6. මේ සඳහා අවශ්‍ය මුදල් සම්මත කර ගැනීමට මේ වන විටත් ගෙන ඇති පියවර කවරේද?

උක්ත ප්‍රශ්න පිළිබඳව ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි බලාපොරොත්තු වනවා. එමෙන්ම විශ්වවිද්‍යාල අධ්‍යාපනය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට බාධාවක්ව පවතින මෙම ප්‍රශ්න විසඳීම කෙරෙහි මෙම ගරු සභාවේ දැඩි අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටිනවා. ස්තුතියි ගරු කථානායකතුමනි.

ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)

(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)

(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය මේ ගරු සභාව හමුවේ තබා ඒ කෙරෙහි අවධානය යොමු කිරීම පිළිබඳව ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වනවා. මේ කාරණය ඇත්ත ගරු කථානායකතුමනි. විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ වැටුප් තිබෙන්නේ ඉතාම අඩු මට්ටමක. ඒ නිසාම විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු, විශේෂයෙන් ඉතාම ඉහළ මට්ටමේ පිළිගැනීමක් තිබෙන දක්ෂ ආචාර්යවරු, මහාචාර්යවරු රඳවා ගන්න විශාල අපහසුතාවක් අපට තිබෙනවා. අපේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරු, මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු අතිවිශාල ප්‍රමාණයකට ලෝකයේ ඕනෑම තැනකට ගිහිල්ලා මෙහේ වාගේ හත් අට ගුණයක වැටුපකට රස්සාවක් කරන්න පුළුවන්කම තිබුණත්, හැබැයි මේ අය ගරු කථානායකතුමනි, අඩු වැටුපක් යටතේ අදත් අපි ළඟ සේවය කරනවා. ඒ නිසා මම පළමුවෙන්ම මේ දුෂ්කරතා මධ්‍යයේ අපේ රට වෙනුවෙන්, අපේ දරුවන් වෙනුවෙන් වැඩ කරන මේ ආචාර්ය, මහාචාර්යවරුන්ට මගේ ගෞරවය, මාගේ ආචාරය, මගේ ස්තුතිය පිරිනමන්නට කැමැතියි.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේම, අතිගරු ජනාධිපතිතුමා මේ ආචාර්යවරුන්ගේ ප්‍රශ්නයට වරක් නොවෙයි දෙ වරක්ම ඇහුම් කන් දුන්නා. එතුමා කිව්වා වාගේම, ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, වැටුප් හා තනතුරු කොමිසමේ නිලධාරීනුත් එක්ක මේ ප්‍රශ්නයට ඇහුම් කන් දුන්නා. මේ ප්‍රශ්නය විසඳීම සඳහා ඉතා ඉක්මන් -කඩිනම්- පියවර ගන්නය කියා අදාළ ආයතනවලට දැනුම් දුන්නා. මේ ප්‍රශ්නය ඉතාම බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන්නේ ගරු කථානායකතුමනි, මේ සියලු රාජ්‍ය ආයතනවල සේවකයන්ගේ ගොඩේ මේ අපේ කථිකාචාර්යවරුන් තියා ගෙන ඉන්න නිසායි. මේකට අප වග කියන්නට ඕනෑ. අප පසු ගිය සුමානයේ වැටුප් හා තනතුරු කොමිසම, මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා එක්ක අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත රැස්වීම් වාර කිහිපයක් තිබ්බා. ගරු කථානායකතුමනි, මේ රැස්වීම්වලට විටින් විට අප විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයේ ගරු සභාපතිතුමාත්, ලේකම්තුමාත් ගෙන්වුවා. ගෙන්වා මේ ප්‍රශ්නය ගැන කථා කළා. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට මා කියන්නට කැමැතියි, මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ මේ නිසායි කියලා. අපේ රටේ

වැටුප් හදා තිබෙන ක්‍රමය අනුව 1:4 අනුපාතයට එක වෙලාවකට රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හදනවා. මේක 1:6 අනුපාතයට ගේනවා. සමහර විට 1:8 අනුපාතයට ගේනවා. ඇත්තටම මේ වැටුප් ක්‍රමය අද හරිගස්සා තිබෙන්නේ 1:4 අනුපාතයටයි. අඩුම වැටුප ලබන කෙනාගේ වැටුප මෙන් හතර ගුණයක් වැටුප ලබන කෙනා. මේක තමයි පදනම. ඒ අනුව උසාවිවල විනිශ්චයකාරවරු, කථිකාචාර්යවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ලිපිකරුවෝ මේ වාගේ එක එක ශ්‍රේණි හදා තිබෙනවා. ඒකේ වරදක් නොවෙයි. හැබැයි විශ්වවිද්‍යාල ඇතුළේ අපත් කාලයක් තිස්සේ කර ගෙන ගිය වරදක් තමයි ගරු කථානායකතුමනි, අනධ්‍යයන කාර්ය මණ්ඩලය මේ අධ්‍යයන කාර්ය මණ්ඩලයත් එක්ක පටලවා ගැනීම. මා ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගෙන් ඉල්ලන්න කැමැතියි, - ඔබතුමන්ලාට විශ්වවිද්‍යාල තුළ විශාල ශක්තියක් තිබෙනවා.- මේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් මේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙන් කර ගන්න මට උදව් කරන්න කියලා. මේක වෙන් කර ගන්න ඕනෑ. කථිකාචාර්යවරුන්ගේ පඩි වැඩි කරන ගණුනේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයත් ඒක ඉල්ලනවා නම් වැරදියි. ඒ වාගේම අනධ්‍යයන කාර්ය මණ්ඩලයට දෙන යම් යම් වරප්‍රසාද එක ආයතනයේ වැඩ කිරීම වූ පලියට ආචාර්යවරු ඉල්ලනවා නම් ඒකත් වැරදියි. සාමාන්‍ය රාජ්‍ය සේවයෙන් මේ කථිකාචාර්යවරු, මහාචාර්යවරු, ආචාර්යවරු වෙන ශ්‍රේණියකට අයින් කර ගත්තොත් අපට මේ අයගේ පඩිය වැඩි කරන්න පුළුවන්. කිසිම ගැටලුවක් වන්නේ නැහැ. මොකද, අනෙක් ආයතනවල මේ ගැටලුව එන්නේ නැහැ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. අද රුපියල් 20,750 මූලික වැටුපක ඉන්න ආධුනික -පහළම ශ්‍රේණියේ- කථිකාචාර්යවරයාගේ වැටුප අප හිතන්නේ රුපියල් 72,000ට ගෙන යන්නයි. ඒ වාගේම රුපියල් 57,755 මූලික වැටුපක ඉන්න ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයාගේ වැටුප අප හිතන්නේ රුපියල් 200,000කට ගෙන යන්නයි. මේ සම්බන්ධයෙන් අපි වැඩ කර ගෙන යනවා. එය කිරීමේදී තිබෙන ප්‍රධානම බාධකය තමයි අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් කථිකාචාර්යවරුන් ඇතුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙන් කර ගැනීම. එහෙම වෙන් කරලා අර ගෙන වෙනම ඒ අය දිහා බලලා මේක හදන්න ඕනෑ. එහෙම කළේ නැත්නම් ඔබතුමා කියනවා වාගේම ඒ කථිකාචාර්යවරුන් තියා ගන්න බැහැ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා අපට උපදෙස් දීලා තිබෙනවා මේක හදලා ඉක්මනින් දෙන්න කියලා. ඔබතුමාට කියන්න කැමැතියි අපි ඉක්මනින් අවශ්‍ය කටයුතු කර ගෙන යන බව.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඊ ළඟ ප්‍රශ්නයට කියන්න තිබෙන දේ මේකයි. වෙනත් ආයතනවල අය වැටුප් ඉල්ලන එක තාවකාලිකව මහ හරින්න ඇත්තටම අප මෙතෙක් කල් කරලා තිබෙන්නේ අධ්‍යයන දීමනාවක් කියලා එකක් දෙන එකයි. ඒක තමයි ඔය සියයට 25කින් වැඩි කරන්න, සියයට 50කින් වැඩි කරන්න කියලා කියන්නේ. ගරු කථානායකතුමනි, අප හිතුවේ මේ අසත්‍යය කරන්න ඕනෑ නැහැ කියලායි. ඒ නිසා අප ඒ ආචාර්යවරුන් එක්ක කථා කළා.

ගරු කථානායකතුමනි, ලෝකයේ අනෙක් රටවල තත්ත්වය මොකක්ද? පසු ගිය කාලයේ ඉන්දියාවේ කථිකාචාර්යවරුන්ගේ පඩි සියයට 70කින් වැඩි කළා. කවුරුවත් ඒකට විරුද්ධ වුණේ නැහැ. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කවුරුවත් ඇවිල්ලා අපටත් දෙන්න කියලා කිව්වේ නැහැ. රජයේ සේවයෙන්, සංස්ථා සේවයෙන් නැඟිටිටේ නැහැ. ඒ බුද්ධිමතුන්, ඒ උගතුන් තියා ගන්න ඒ වාගේ දේවල් කරනවා. ඒ නිසා අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙන් කරලා ගන්න ඕනෑ. ඒ සඳහා අද මමත්, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, අපේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා හා ලේඛකාධිකාරීතුමාත්, අපේ අතිරේක ලේකම්තුමාත්, ඒ වාගේම ආචාර්ය සංගමයේ සභාපති හා ලේකම්තුමාත් එකට එකතු වෙලා දැන් වැඩ කර ගෙන යනවා. මේක අභියෝගයක් තමයි. මේක විශ්වවිද්‍යාල ඇතුළේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රශ්න මතු වන හේතුවක් තමයි. මේකට උදව් කරන්න. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ අද රටෙන් පිට ඉන්න, මෙහේ ප්‍රමාණවත් වැටුපක් නොලැබෙන නිසා රටෙන් පිට ඉන්න ආචාර්යවරුන් නැවත මේ රටට ගෙන්වා ගන්න අවශ්‍ය විධියේ ආකර්ෂණීය වැටුපකට ඒ වැටුප් ප්‍රමාණයන් ගෙන යන්න අතිගරු ජනාධිපතිතුමා අපට උපදෙස් දීලා තිබෙනවා. අපි ඒ වෙනුවෙන් කටයුතු කර ගෙන යනවා. මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම ගැන ඔබතුමාට නැවතත් බොහොම ස්තුතියි ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බොහොම ස්තුතියි. මී ළඟට වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය, ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා.

වරප්‍රසාද: උපදේශක කාරක සභාවලට සහභාගි වීමට ඉඩ නොදීම
சிறப்புரிமை: ஆலோசனைக் குழுக்களில் கலந்துகொள்ள அனுமதிக்காமை
PRIVILEGE: PRECLUDING PARTICIPATION AT CONSULTATIVE COMMITTEES

ගරු ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා
(மாண்புமிகு ஜெனரல் சரத் பொன்சேக்கா)
(The Hon. General Sarath Fonseka)

ගරු කථානායකතුමනි, මාගේ වරප්‍රසාද ප්‍රශ්නය යොමු කිරීමට අවසර දීම පිළිබඳව පළමුව ඔබතුමාට ස්තුතිය පළ කරමි. පසු ගිය ජූලි 16වන දින පෙ. ව. 9.30ට සෞඛ්‍ය අමාත්‍යාංශ උපදේශක කාරක සභාව සහ ප. ව. 2.30ට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ උපදේශක කාරක සභාව පාර්ලිමේන්තු සංකීර්ණයේදී රැස් වන බව මා හට දැනුම් දී තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ඊට සහභාගි වීමට මා සූදානම් වුවද එදින හමුදාපතිවරයා විසින් අවසර දී නැති බව දක්වමින් මාහට අදාළ උපදේශක කාරක සභාවන්ට සහභාගි වීම හමුදා නිලධාරීන් විසින් වළක්වන ලදී. ගරු කථානායකතුමනි, ගරු අධිකරණය විසින්ම ඉතා පැහැදිලි ලෙස අවධාරණය කර ඇත්තේ මා අධිකරණ භාරයේ සිටින අතර හමුදාව කළ යුත්තේ ආරක්ෂාව සැපයීම පමණක් බවයි. අධිකරණය විසින් මා පාර්ලිමේන්තු කාරක සභා සැසි වාර සඳහා සහභාගි කර විය යුතු බව නියෝග කර තිබියදීත් මෙම අසාධාරණය මා හට සිදු වී ඇත. ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස මා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවන්ට සහභාගි වීම හමුදාපතිවරයාට හෝ හමුදා නිලධාරීන්ට වැළැක්විය නොහැකිය. එසේ කිරීම මාගේ වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් මෙන්ම මේ ගරු පාර්ලිමේන්තුවටම කරන ලද අපහාසයකි. අධිකරණ නියෝග නොතකා හැරීමකි. මෙහි ඇති සුවිශේෂී කරුණ වන්නේ බන්ධනාගාර නිලධාරීන් පවා මා පාර්ලිමේන්තුවට ගෙන ඒමට සූදානම්ව සිටියදී මා හට ඇති පාර්ලිමේන්තු කමිටු සඳහා සහභාගි වීමේ අයිතිය උදුරා ගැනීමයි. එමෙන්ම එදින උදැසනම පාර්ලිමේන්තු මහ ලේකම්තුමාගෙන් මා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට සහභාගි කරවන ලෙස දන්වන ලිපි ද ලබා ගෙන තිබුණි. බන්ධනාගාරය යටතේ සිටින මා පාර්ලිමේන්තුවට යැවීමට එම නිලධාරීන් සූදානම්ව සිටියදී හමුදාපතිවරයා අවසර දී නැති බව දක්වමින් මා හට උපදේශක කාරක සභා රැස්වීම සඳහා සහභාගි වීමට ඉඩ නොදීම මාගේ වරප්‍රසාද උල්ලංඝනය වීමකි. මීට පෙර ද මෙවැනි අවස්ථා නිර්මාණය වී මාගේ වරප්‍රසාද උල්ලංඝනය වූ විට ඔබතුමා ද මා පාර්ලිමේන්තුවට සහභාගි කරවීම වෙනුවෙන් මැදිහත් වූ බව සිහිපත් කරමි. හමුදාපතිවරයා හා අදාළ නිලධාරීන් පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව හමුවට කැඳවා මා හට සිදු වෙමින් තිබෙන අසාධාරණය විසඳීමට මැදිහත් වන ලෙස ඉල්ලා සිටිමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. එය වරප්‍රසාද කමිටුවට ඉදිරිපත් කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්ඩලික අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් එතුමාගේ ප්‍රශ්නය එතුමා ඉදිරිපත් කළා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමාගේ ඒ ප්‍රශ්නය -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක මම බලාගන්නම්. බලා ඒකට අවශ්‍ය පියවර ගන්නම්. එතුමා ඒ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කළා. තව කාටවත් ඒ පිළිබඳව කථා කරන්න බැහැ. [බාධා කිරීමක්] මම දන්නවා. එය කියවා බලා තමයි අවසර දුන්නේ. ඒ අනුව අපි අවශ්‍ය කටයුතු කරලා දෙනවා. ඒ පිළිබඳව ආපසු කථා කරන්න තමුන්නාන්සේට අයිතියක් නැහැ. [බාධා කිරීම්] ප්‍රධාන කටයුතු ආරම්භයේදී, පනත් කෙටුම්පත් හා යෝජනා -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා - [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේට කථාවක් පවත්වන්න ඉඩ දෙන්න බැහැ. එතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළා. මා ඒ ගැන සොයා බලා අවශ්‍ය පියවර වහාම ගන්නම්. බොහොම ස්තුතියි. [බාධා කිරීම්] එතුමා පැහැදිලිව කිව්වා. ඒක අපටත් තේරෙනවා. ඒ ගැන අවශ්‍ය පියවර ගන්නම්. [බාධා කිරීම්]

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
நீதித்துறை (திருத்தம்) சட்டமூலம்
JUDICATURE (AMENDMENT) BILL

"1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අධිකරණ අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2010 අගෝස්තු 03 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදි.

නීති අමෙච්චරින් சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2010 ஆகஸ்ட் 03 செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva, on behalf of the Minister of Justice; to be read a Second time upon
Tuesday, 03rd August, 2010 and to be printed.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2010 අගෝස්තු මස 03 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ආසියානු, ජපන්, ශ්‍රී ලංකා හා ඇමෙරිකා, ජර්මන් සමාජයීය ආර්ථික හා මානව සම්පත් සංවර්ධන ජාත්‍යන්තර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஆசிய, ஜப்பான், இலங்கை, ஐக்கிய அமெரிக்கா, ஜேர்மனி ஆகிய நாடுகளின் சமூக, பொருளாதார மற்றும் மனிதவள அபிவிருத்திக்கான சர்வதேச மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
JAPAN, SRI LANKA, U.S.A. AND GERMAN SOCIO ECON AND HUMAN RESOURCES DEVELOPMENT INTERNATIONAL FOUNDATION, ASIA (INCORPORATION) BILL

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආසියානු, ජපන්, ශ්‍රී ලංකා හා ඇමෙරිකා, ජර්මන් සමාජයීය ආර්ථික හා මානව සම්පත් සංවර්ධන ජාත්‍යන්තර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත විදේශ කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி வெளிநாட்டலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of External Affairs for report.

කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

கொடசர பியங்கல ரஜமகா விஹாரஸ்த அபிவிருத்திச் சபை (கூட்டிணைத்தல்) சட்டமூலம்

KOTASARA PIYANGALA RAJAMAHA VIHARASTHA DEVELOPMENT SOCIETY (INCORPORATION) BILL

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற் காகச் சாட்டப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs for report.

රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

இராமகிருஷ்ண சாரதா மிஷன் (இலங்கைக் கிளை) (கூட்டிணைத்தல்) சட்டமூலம்

RAMAKRISHNA SARADA MISSION (LANKA BRANCH) (INCORPORATION) BILL

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

Mr. Speaker, I move,

"That leave be granted to introduce a Bill to incorporate Ramakrishna Sarada Mission (Lanka Branch)."

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs for report.

ටී.බී. ඒකනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ரி. பி. ஏக்கநாயக்க மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

T.B. EKANAYAKE FOUNDATIO (INCORPORATION) BILL

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickremasinghe)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ටී.බී. ඒකනායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයෙන්, ඒකමතිකව සම්මත විය.

ඉදිරිපත් කිරීමට නියමිත දිනය ගැසට් නිවේදනයෙන් නියම කරන ලදී.

විනා විවාදයෙන්, ඒකමතිකව සම්මත විය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයෙන්, ඒකමතිකව සම්මත විය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයෙන්, ඒකමතිකව සම්මත විය.

අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

அனுராதபுரம் ஸ்ரீ புஷ்பதான அபிவிருத்தி ஸ்தாபனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

ANURADHAPURA SRI PUSHPADANA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා

(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)

(The Hon. (Dr.) Sarath Weerasekara)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා

(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)

(The Hon. Alhaj A.H.M. Azwer)

විසින් ස්ථිර කරන ලදී.

ஆமோதித்தார்.

Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයෙන්, ඒකමතිකව සම්මත විය.

ඉදිරිපත් කිරීමට නියමිත දිනය ගැසට් නිවේදනයෙන් නියම කරන ලදී.

*විනා විවාදයෙන්, ඒකමතිකව සම්මත විය

රාජ්‍ය නිලධාරින්ට 1898 වර්ෂයේ සිට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීම නියත වශයෙන්ම හිමි වුණා. රජයේ නිලධාරියා මිය ගිය වහාම ඔහුගේ භාර්යාවට සහ අනත්දරුවන්ට වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගත හැකි වුණා. ඒ නිසා එම පවුලේ අනාගතය සුරක්ෂිත වුණා. වඩාත් වැදගත් වන්නේ මෙම හිමිකම රාජ්‍ය නිලධාරියාගේ නොව ඔහුගේ භාර්යාවගේ සහ දරුවන්ගේ හිමිකමක් වීමයි. එම හිමිකම අවසන් කැමැත්තෙන් හෝ වෙනත් ක්‍රමයකින් බාහිර පාර්ශ්වයකට පැවරිය නොහැකියි. රාජ්‍ය සේවකයකු එකම එක් දිනක් සේවය කර තිබුණත් ඔහුගේ ඇවෑමෙන් භාර්යාවට හා දරුවන්ට මෙම විශ්‍රාම වැටුප් හිමිකම් ලැබෙනවා. අනෙකුත් කරුණුවලදී මෙන් වසර 10ක සේවා කාලයක් සපුරා තිබීම හෝ සේවය ස්ථිර කොට තිබීම අවශ්‍යම වන්නේ නැහැ. රාජ්‍ය නිලධාරියා විවාහ වී සිටියේ නම් ඔහුගේ ඇවෑමෙන් භාර්යාවට හා දරුවන්ට මෙම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම නියත වශයෙන්ම හිමි වනවා.

අද වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ භුක්ති විඳින වැන්දඹු සහ අනත්දරුවන් 1,20,000කට ආසන්න ප්‍රමාණයක් අප රට තුළ ජීවත් වෙනවා. ඔවුන් සියලු දෙනාගේම රජයේ සේවයේ නියුතු වී සිටි තම ස්වාමි පුරුෂයා හෝ තම භාර්යාව මිය ගොස් ඇති අතර ඔවුන් වෙනුවෙන් කලත්‍රයාට මේ විශ්‍රාම වැටුප් දීමනා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලබනවා. මුල් කාලයේදී රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පමණක් ක්‍රියාත්මක වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය 1983 වර්ෂයේ සිට රාජ්‍ය සේවයේ නියුතු කාන්තාවන් අරමුණු කර ගෙනත් ක්‍රියාත්මක වුණා. අප කවුරුත් දන්නා පරිදි නිදහසෙන් පසුව කාන්තාවන් වැඩි වැඩියෙන් අධ්‍යාපනයට යොමු වුණා. ඔවුන් රාජ්‍ය සේවයට වැඩි වැඩියෙන් එකතු වුණා. මේ නිසා 1980 දශකය ආරම්භ වන විට රජයේ සේවයේ නියුතු කාන්තාවගෙන්ද තම කලත්‍රයා සහ දරුවන් යැපෙන තත්ත්වයක් විද්‍යමාන වුණා. මෙම කරුණු සලකා 1983 දී වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයත් නීතිගත කෙරුණා. ඒ නිසා අද රජයේ සේවයේ නියුතු පිරිමි පාර්ශ්වය වෙනුවෙන් පමණක් නොව, රජයේ සේවයේ නියුතු කාන්තාවන් වෙනුවෙන් ද මෙම ප්‍රතිලාභ ක්‍රමය එක හා සමානව ක්‍රියාත්මක වෙනවා. මෙම ප්‍රතිලාභ 1970 සිට සන්නද්ධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් ද, 1952 සිට පළාත් පාලන නිලධාරින් වෙනුවෙන් ද, 2008 වසරේ සිට රජයේ ආධාර ලබන උපකෘත සහ පෞද්ගලික පාඨශාලා ගුරුවර ගුරුවරියන් දක්වා ද ව්‍යාප්ත කොට තිබෙනවා. එපමණක් නොව රට රැක ගැනීම, ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා නිත්‍ය හමුදා සාමාජිකයින් හා සමානවම වැදගත් කාර්ය භාරයක් ඉටු කළ ස්වේච්ඡා බල සේනා සාමාජික, සාමාජිකාවන් වෙනුවෙන් ද මෙම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රතිලාභ හිමි කර දීමට අපේ රජයට හැකි වූ බව මා ඉතා නිහතමානීව ප්‍රකාශ කරනවා. මෙහි සරල අදහස මෙවැනි වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකමක් නොතිබුණු, 1981 සිට මේ දක්වා මිය ගිය ස්වේච්ඡා බල සේනා සාමාජිකයින්ගේ භාර්යාවන්ට සහ අනත්දරුවන්ට හිඟ මුදල් සහිතව වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමට හැකි වීමයි.

අද යෝජිත මෙම පනත් සංශෝධන තුළින් වැන්දඹු පුරුෂ සහ අනත්දරුවන්ට මෙතෙක් ලබා ගත නොහැකි වූ ප්‍රතිලාභ තවදුරටත් හිමි කර දීමට මා බලාපොරොත්තු වනවා. එපමණක් ද නොව, මෙම පනත්වල පැවැති අඩු පාඩුකම් හේතුවෙන් අහිමි වී තිබුණු ප්‍රතිලාභ යළිත් ලබා දීමට අඩිතාලම දමනවා. එමෙන්ම වඩාත් කාර්යක්ෂම වූ රාජ්‍ය සේවයක් පවත්වා ගැනීමටත්, ඔවුන්ගේ අනත්දරුවන්ගේ අනාගතය තවත් ශක්තිමත් කිරීමටත් හැකි වන පරිදි යෝජිත සංශෝධනයන් මා ඔබ වෙත කෙටියෙන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

පළමු සංශෝධනය වන්නේ ත්‍රස්තවාදී හේතු සහ ස්වාභාවික ආපදා මත මිය යන වයස අවුරුදු 55 දක්වා හෝ ඇතැම් විට ඊට වැඩි කාලයක්, ගෙවන වැටුප පදනම් කොට ගෙන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප ලබා ගැනීමේ හැකියාව ඇති කිරීමයි.

පනතේ විධිවිධානයන්ට අනුව යම් රාජ්‍ය නිලධාරියකු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ රාජ්‍ය සේවයේ සිටියදී මිය යන අවස්ථාවකදී ඔහුට හිමි වූ වැටුප මත වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගණන් බැලෙනවා. කෙසේ වෙතත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/88 අනුව ත්‍රස්තවාදී හේතු හෝ සුනාමි වැනි ස්වාභාවික ආපදා යටතේ මිය ගිය රාජ්‍ය නිලධාරීන්ගේ අර්ථලාභීන් වෙනුවෙන් වයස අවුරුදු 55 සපිරෙන දිනය දක්වා වැටුප් වර්ධක සහිතව වැටුප් ගෙවනවා. මෙම වැටුපත් සමඟම නිලධාරියා මිය ගිය දිනයේ සිට භාර්යාව හා අනත්දරුවන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්ද ගෙවනු ලබනවා. වැටුප නවතින විට සැබවින්ම වැන්දඹුවට හිමි වන්නේ ස්වාමියා මිය ගිය අවස්ථාවේදී ගෙවූ වැටුප මත පදනම් වූ විශ්‍රාම වැටුපක් පමණි. මෙහි සරල අදහස මිය ගිය තම ස්වාමියා වෙනුවෙන් ගෙවන වැටුප නවතින විට භාර්යාවට හා දරුවන්ට ලැබෙන ආදායම සියයට 66කින් අඩු වීමයි. එනම්, වැඩි ආදායම් අවශ්‍ය වන විට ලැබෙන ප්‍රතිලාභය අඩු වීමයි. මෙම කරුණු සලකා බලා දැනට ගෙවන විශ්‍රාම වැටුප් තම ස්වාමියාට අවසන් වරට ගෙවූ වැටුප් මත සංශෝධනය කිරීමට මේ පනත් සංශෝධනය තුළින් මා යෝජනා කරනවා. විශේෂයෙන්ම සන්නද්ධ හමුදා සාමාජිකයන්ට, පොලිස් නිලධාරින්ට පමණක් නොව ත්‍රස්තවාදී හේතු මත මිය ගිය රජයේ අනිකුත් නිලධාරීන්ගේ අඹු දරුවන්ටද එම සහන හිමි වීම යෝජනා කරනවා. විශේෂයෙන්ම 1989 කාල සීමාව තුළ බල පැවැත්වූ රටේ භීෂණ වාතාවරණය තුළ මිය ගිය ඇතැම් රාජ්‍ය නිලධාරීන්ට වයස අවුරුදු 55 වන තෙක් ගෙවූ වැටුප මේ වන විට වයස සපිරීම හේතුවෙන් නවතා ඇති බැවින් එම විශ්‍රාම වැටුප වැඩි කර දීම මෙම පනත් සංශෝධනයෙන් බලාපොරොත්තු වනවා.

02. ත්‍රස්තවාදී හේතු සහ ස්වාභාවික ආපදා මත මිය යන රජයේ සේවයේ නියුතු අනියම් හා තාවකාලික තනතුරු දරන නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි වන්නේ නැහැ. නමුත් එවැනි හේතුවක් මත ඔවුන් මිය ගියේ නම් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තත්ත්වයේ ලා සලකා මරණ පාරිතෝෂිකයක් ගෙවීමේ විධිවිධාන පසු ගිය කාලයේ සලසා තිබුණා. නමුත් අනිකුත් රාජ්‍ය නිලධාරීන්ට හිමි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ මොවුන්ට හිමි වූයේ නැහැ. මෙම ප්‍රතිලාභ හිමි නොවූ ස්වේච්ඡා බලසේනා සාමාජිකයන්ට ප්‍රතිලාභ හිමි කර දුන් සේම ත්‍රස්තවාදී හේතු මත මිය ගිය රාජ්‍ය සේවයේ නියුතු අනියම් හා තාවකාලික නිලධාරීන්ගේ භාර්යාවන්ටද වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි කර දීම මේ පනත් සංශෝධනයේ තවත් වැදගත් පරමාර්ථයක් බව කිව යුතුයි.

03. පසු ගිය කාලයේදී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කරන ලද ව්‍යවස්ථා සංශෝධනයන්ට අනුව අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කථානායකතුමා, ගරු විපක්ෂ නායකතුමා, ගරු කැබිනට් ඇමතිවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම් හා මහජන සම්බන්ධතා නිලධාරීන්ටද ඔවුන් වසර පහක සේවය සපුරා ඇත්තේ නම් මාසික විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබී තිබෙනවා. විශ්‍රාම වැටුප් හිමි නමුත් ඔවුන්ගේ ඇවෑමෙන් මෙම ලේකම්වරුන්ගේ භාර්යාවන් සහ අනත්දරුවන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි වූයේ නැහැ. එම අඩුව සම්පූර්ණ කිරීමත්, එම වැන්දඹු හා අනත්දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමත් මෙම පනත් සංශෝධනයේ තවත් අරමුණක් වී තිබෙනවා.

04. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම්ලාභීන් ප්‍රධාන කාණ්ඩ කීපයක් වේ. එනම් වැන්දඹුව හෝ වැන්දඹු පුරුෂයා, අනත්දරුවා, ආබාධිත අනත්දරුවා වශයෙනි. මෙම පනතේ විධිවිධානයන්ට අනුව අවුරුදු 26ට අඩු දරුවන්ට ප්‍රතිලාභ හිමි වනවා. මෙහිදී වයස අවුරුදු 26ට අඩු රැකියා විරහිත පිරිමි දරුවන්ට ප්‍රතිලාභ හිමි වන අතර වයස අවුරුදු 26ට අඩු අවිවාහක රැකියා විරහිත ගැහැනු දරුවන්ටද ප්‍රතිලාභ හිමි වනවා. වඩා

[ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා]

හොඳින් බැලූ විට මෙම අර්ථ කථනයේ විෂමතාවක් පවතිනවා. එනම් වයස අවුරුදු 26 දක්වා ගැහැනු දරුවෙක් නම් විවාහය මත මෙකී ප්‍රතිඵලය අහිමි වීමයි. මෙය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලුවක්. ඒ කියන්නේ ගරු කථානායකතුමනි, ගැහැනු ළමයෙක් නම්, ඇය යම් විධියකින් විවාහක නම් ඇයට මේ සහනය ලැබෙන්නේ නැහැ. නමුත් මේ සංශෝධනය මඟින් ඒ විෂමතාව නැති කර තිබෙනවා. ගැහැනු පිරිමි භේදයක් නැතිව, අවුරුදු 26ට අඩු සියලුම අයට අනත්දරුවන් වශයෙන් මේ ප්‍රතිලාභ ලැබෙනවා. නව සංශෝධනයට අනුව එම විෂමතාව ඉවත් කර තිබෙනවා. මෙම පනත් සංශෝධනය තුළින් තවත් සහන සලසා තිබෙනවා.

05. යම් නිලධාරියකු විශ්‍රාම ලැබීමෙන් අනතුරුව විවාහ වුවහොත් ඔහුගේ ඇවෑමෙන් භාර්යාව සහ අනත්දරුවන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි වන්නේ නැහැ. නමුත් අප දන්නා පරිදි පසු ගිය කාලයේදී රජයේ ඇතැම් දෙපාර්තමේන්තු වසා දැමීමක් සිදු වුණා. ඒ නිසා තනතුරු අහෝසි වීම මත එම නිලධාරීන් විශ්‍රාම ගන්වනු ලැබුවා. මෙම කරුණු සැලකිල්ලට ගෙන රජයේ අවශ්‍යතාව මත රජයේ දෙපාර්තමේන්තු වසා ඇත්තේ නම් ද තනතුරු අහෝසි වීම මත විශ්‍රාම ගන්වා ඇත්තේ නම් ද ඔවුන් අවුරුදු 55 වන තෙක් විවාහවුවත් දායක මුදල් අය කොට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි ගැන්වීමට මෙම පනත් සංශෝධනයෙන් යෝජනා කෙරෙනවා.

06. 1998 මුල් පනතේ විධිවිධානයන්ට අනුව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත රජයේ සේවයේ පත් වීමක් ලැබූ සැණින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ලැබෙනවා. එම හිමිකම ලබා ගැනීමට සේවා කාලය බලපෑවේ නැහැ. නමුත් මෙම පනතට 1981 දී සිදු කළ සංශෝධනයකට අනුව යම් රාජ්‍ය නිලධාරියකුට විශ්‍රාම වැටුප් අහිමි වුවහොත් ඒ හේතුව මත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අයිතිවාසිකමද අහිමි වනවා. එනම් ඉල්ලා අස් වීම, සේවයෙන් පහ කිරීම සහ තනතුරු අත්හැර යාම වැනි හේතූන් මත විශ්‍රාම වැටුප් මෙන්ම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපද අහිමි වුණා. මෙය බලවත් අසාධාරණයක්. ස්වාමියා කළ වරදට භාර්යාව සහ අසරණ දරුවන් වග කිව යුතු යයි මා විශ්වාස කරන්නේ නැහැ. සමහර විට ස්වාමී පුරුෂයාගේ වරදක් නිසා ඔහු සේවයෙන් ඉවත් කළොත්, එහෙම නැත්නම් යම් විධියකින් ඔහු සේවය අත් හැර දමා ගියොත් එය භාර්යාව සහ දරුවන්ට දඬුවම් දීමක් වෙනවා. ඒ නිසා ඒ අයට සහනයක් ලබා දීම සඳහා මෙම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප ඒ භාර්යාවටත්, දරුවන්ටත් ලැබෙනවා. මේ නිසා විශ්‍රාම වැටුප් සහිත සේවා කාලය වසර 10ක් සපුරා ඇත්නම් විශ්‍රාම වැටුප් අහිමි තත්ත්වයෙන් රජයේ සේවය හැර යන නිලධාරීන්ගේ කලත්‍රයාට සහ දරුවන්ට වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීමේ ප්‍රතිපාදන මෙම සංශෝධන පනතින් සලසා තිබෙනවා.

මෙම පනත් සංශෝධනයන්හි තවත් වැදගත් කාරණයක් වන්නේ, ස්වකීය ස්වාමිපුරුෂයාගේ ඇවෑමෙන් පසු විශ්‍රාම වැටුපක් ලබමින් සිටි වැන්දඹුවක් නැවත විවාහ වූ විට එකී විශ්‍රාම වැටුපෙන් භාගයක් ලැබීමට ඇයට හිමිකම් සලසා දීමයි. විශේෂයෙන් යුද්ධය නිසා තම ස්වාමිපුරුෂයා අහිමි වූ තරුණ බිරින්දෑවරුන්ට යළි විවාහ ජීවිතයට ඇතුළු වීමටත්, ඒ සමඟම විශ්‍රාම වැටුපෙන් අඩක් ලැබීමටත් මෙම පනත සංශෝධනය තුළින් අවස්ථාව ලැබෙනවා. මා හිතනවා, පසු ගිය කාලයේ සිදු වුණු ත්‍රස්තවාදී ක්‍රියා නිසා ජීවිතක්ෂයට පත් වෙච්ච, විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්ගේ භාර්යාවන් මේ ප්‍රශ්නයට මුහුණ දී සිටියා කියලා. ඒ තරුණ බිරින්දෑවරුන්ට විවාහ වීමට අපහසුතාවක් ඇති වෙලා තිබුණා, ඔවුන්ට මෙම විශ්‍රාම වැටුප අහිමි වන නිසා. නමුත් මෙයින් ඒකට සහනයක් ලැබී තිබෙනවා. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පතෙහි ඇති සියලුම සංශෝධනයන් වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතටද එක සේ බලපාන ලෙස පනත් දෙකම සංශෝධනය කිරීමට මා යෝජනා කොට තිබෙනවා. මෙම පනත්හි සංශෝධනයන් සමඟ මීට ආනුෂංගික පනත් වන සන්නද්ධ හමුදා, වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත් සම්බන්ධයෙන් මවිසින් නිකුත් කරන ගැසට් නිවේදනයකින් අදාළ හිමිකම සියලු හමුදා සාමාජිකයන් වෙතද ලබා දීමට ක්‍රියා කරන බව ගරු සභාවට දැනුම් දීමට කැමැතියි. මීට අමතරව මෙම සංශෝධිත පනතින් ඇමතිවරයාට රෙගුලාසි පැනවීමේ බලය ලබා දීමටද යෝජනා කර තිබෙනවා. ඇතැම් තීරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා මෙවැනි රෙගුලාසි පැනවීමක් අවශ්‍ය වේ යයි මා සිතනවා. උදාහරණයක් වශයෙන් ආබාධිත අනත් දරුවන්ට හිමිකම් ප්‍රදානය කිරීමේදී ඔවුන්ගේ විවාහක, අවිවාහක බව, පවුලේ ආදායම, වෛද්‍ය මණ්ඩල නිර්දේශයක් කොපමණ කාලයකට ලබා ගන්නේද යන ගැටලු පැන නැඟී තිබෙනවා. මෙවැනි ගැටලු, රෙගුලාසි පැනවීම තුළින් විසඳා ගැනීමට හැකි වේ යයි මා සිතනවා. මෙම පනත සංශෝධනය සඳහා පසු ගිය අවුරුදු හතරක කාල සීමාවක් තුළ අමාත්‍යවරුන් කිහිප දෙනෙක්ම වෙහෙස වී ක්‍රියා කළා. එකිනෙකට වෙනස් කරුණු හතක් සංශෝධනයන් වශයෙන් ගෙන ඒමේදී විවිධ නෛතික ගැටලු මතු වුණා. එම සියලු පරිපාලන ගැටලු විසඳා මෙම පනත් සංශෝධනයට කටයුතු සැලසූ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ඒ වාගේම මේ කටයුතු සම්පාදනය කළ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු සියලු දෙනාටමත් ස්තුතිවන්ත වෙමින් අද මේ පනත මේ සභාවට මා ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ. භා. 2.42]

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු කථානායකතුමනි, මෙම වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම පළමුවෙන්ම කියන්න කැමැතියි, මේක ඉතාමත්ම වැදගත් කාලෝචිත පනත් කෙටුම්පතක්ය කියන එක. ඒ වාගේම මේ පනත් කෙටුම්පතින් හුඟක්ම බලාපොරොත්තු වන්නේ කාන්තාවන්ට මෙතෙක් සමාජයෙන් වූ අසාධාරණයක් නිවැරදි කිරීමයි. විශේෂයෙන්ම - සමාජයේ හුඟක් අය දන්නේ නැහැ- අද ශ්‍රී දළ දා මාළිගාවේ දියවඩන නිළමේ පදවියට පත් කිරීමේදීත් කාන්තා ප්‍රාදේශීය ලේකම්වරියන්ට ඡන්ද බලයක් නැහැ. ප්‍රාදේශීය ලේකම්වරුන්ට විතරයි ඡන්ද බලය තිබෙන්නේ. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ පවුලේ වැඩිමහල් පිරිමි දරුවාට ඉඩම හිමි වෙනවා. නමුත් පවුලේ වැඩිමහල් දරුවා ගැහැනු කෙනෙක් නම් ඒ ඉඩම හිමි වෙන්නේ නැහැ.

තුන්වැනි කරුණ, අවුරුදු 26ට වැඩි කාන්තාවක් විවාහ වුණොත් මේ විශ්‍රාම වැටුප් අහිමි වෙනවා. නමුත් දරුවන් ඉන්නවා නම් නැවත බැන්දත් ඒක අහිමි වෙන්නේ නැහැ. ඒ නිසා මේක ඉතාමත්ම කාලෝචිත පනත් කෙටුම්පතක්. මෙම පනත් කෙටුම්පත ගෙන ඒම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වනවා. මේ සම්බන්ධයෙන් අතීතය දිහා බලන කොට මට මතක් වෙනවා, ගරු අමරසිරි දොඩන්ගොඩ ඇමතිතුමාගේ කාලයේ තමයි මේ කටයුතු ආරම්භ කළේ කියලා. ඊට පසුව හිටපු අමාත්‍යවරු බොහෝ දෙනෙක් මේ සම්බන්ධයෙන් ක්‍රියා කළා.

මටත් සුළු කාලයක් මේ සම්බන්ධව කටයුතු කිරීමට අවස්ථාව ලැබුණා. අප දන්නා පරිදි එක්ලක්ෂ විසිදාහක් පමණ පිරිසක් මෙයින් ප්‍රයෝජන ලබනවා.

විශේෂයෙන්ම පසු ගිය කාලයේදී ත්‍රස්තවාදය නිසා මිය ගිය හමුදා සොල්දාදුවන්ගේ පවුල්වලට, ස්වේච්ඡා බල කායේ පවුල්වලට මෙයින් විශාල සහනයක් ලබා දෙනවා. ඒ වාගේම අප දන්නවා, රජයේ වසා දැමූ ආයතන වන විදුලි බල දෙපාර්තමේන්තුව, වරාය කොමිෂන් සභාව, මහා මාර්ග දෙපාර්තමේන්තුව සහ අළෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේත් වැඩ කරපු නිලධාරීන්ටත් යම් කිසි සාධාරණත්වයක් දැන් ඉෂ්ට වන බව.

ත්‍රස්ත්‍රවාදයෙන් මිය ගිය පවුල්වල අය පසු ගිය වකවානුවේදී බොහොම දුක්බිත ජීවිතයක් තමයි ගත කළේ ගරු කථානායකතුමනි. සරත් අමුණුපිටිය විනිශ්චයකාරතුමා ඝාතනය වුණාට පස්සේ, එතුමා අවුරුදු 60ක් සේවයේ යෙදුණු හැටියට සලකා එතුමාගේ විශ්‍රාම වැටුප සකස් කරලා දෙන්න කියලා එම මැතිනිය කීප විටක්ම ඉල්ලීම් කළා මට හොඳට මතකයි. එතැනදීත් මේ කටයුත්ත ගැන කථා කරලා තිබෙනවා. අද මේ ක්‍රමය තුළින් එවැනි පීඩනයකට පත් අයටත් විශාල සහනයක් ලබා දෙනවා. ඒ වාගේම රජයේ සිටින අනියම් හා තාවකාලික සේවකයන්ටත් මෙයින් සහනයක් ලබා දෙනවා. ඒකත් අපි අගය කරනවා. එක්සත් ජාතික පක්ෂය වශයෙන් මෙම පනත් කෙටුම්පත සම්මත කිරීමට අපි සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා.

ඒ වාගේම අපි අමතක නොකළ යුතු දෙයක් තමයි, අද ලංකාවේ විශාලතම ව්‍යාපෘතිය වෙලා තිබෙන්නේ විශ්‍රාම වැටුප් අංශය කියන එක. ආරක්ෂක කටයුතුවලට, අධ්‍යාපන කටයුතුවලට දරන පිරිවැයට වඩා අපි විශ්‍රාම වැටුප් සඳහා වියදම් කරනවා. ජනගහනයෙන් සියයට 40කින් එක් කෙනෙක් විශ්‍රාම වැටුප්ලාභියෙක්. 2000 අවුරුද්දේදී විශ්‍රාම වැටුප්ලාභීන් හිටියේ තුන්ලක්ෂ හැත්තෑඑක්දහස් හත්සිය හැත්තෑදෙකයි. එදා විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය වුණ සම්පූර්ණ මුදල බිලියන 20.4යි. 2010 අවුරුද්දේදී මෙය භාරලක්ෂ පනස්හතරදාහක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ සඳහා බිලියන 103ක් වැනි අතිවිශාල මුදල් සම්භාරයක් වියදම් කරනවා. ගරු අමාත්‍යතුමනි, විශ්‍රාම වැටුප් ලබන අයගේ සුබසිද්ධිය සඳහා මේ අසීමිත මුදල් සම්භාරය යොදන්නේ කොහොමද කියලා භාණ්ඩාගාරයේ ලේකම්තුමා සමඟ අපි කථා කළා, මට මතකයි. බිලියන 103ක් වැනි මුදලක් අපට හරි විධියට පාලනය කරන්න පුළුවන් නම්, if it can be invested somewhere, the beneficiaries would be the pensioners. ඒ ගැන අධ්‍යයනයක් කළා. ඒක තවමත් කර ගෙන යනවා ඇති කියලා මම විශ්වාස කරනවා. ඒ ගැනත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

විශ්‍රාම වැටුප් අංශයට ඉස්සර කිව්වේ සයිබීරියාව කියලායි. කවුරුවත් එතැනට ගියේ නැහැ. අද විශ්‍රාම වැටුප් අංශයේ විශාල වෙනසක් ඇති වෙලා තිබෙනවා. විශ්‍රාම වැටුප් අංශයේ Front-Office Concept කියලා අපි හඳුපු දේ ඉදිරියට අරගෙන ගිහින් තිබෙනවා, e-pension අරගෙන තිබෙනවා. ඉදිරි ගමන යන්න ඒවා ලොකු දේවල් කියලායි මම කියන්නේ. මගේ යුතුකමක් තිබෙනවා, අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ඒ සම්බන්ධයෙන් ස්තුති කරන්න. පසු ගිය අවුරුදු කීපය තුළ විශ්‍රාම වැටුප් අංශයේ විශාල වෙනසක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා විශ්‍රාම වැටුප් ලබන්නන්ට ඒ වැඩ කටයුතු කර ගන්න අද පහසුවක් වෙලා තිබෙනවා. විශ්‍රාම වැටුප් ලබන අය බොහොම අමාරුවෙන් ජීවත් වුණේ. ඒ නිසා මම ඔබතුමාගෙන් එක ඉල්ලීමක් කරනවා. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව විශ්‍රාම වැටුප් ලබන අයට මෙම මුදල් සම්භාරය ඉතාම ඉක්මනින් ලබා දෙන්න. ඒ සඳහා ඔබතුමා කටයුතු කරනවා ඇතැයි මම විශ්වාස කරනවා. ඒක ඔබතුමාට වඩා භාණ්ඩාගාරයේ කාර්ය භාරයක්. ඒ වාගේම විශ්‍රාම වැටුප් ලබන අනෙක් අය සම්බන්ධයෙන් අනුකම්පා කරලා හැකි තාක් ඉක්මනින් ඒ අයටත් යම් කිසි සහනයක් දීමට පියවර ගන්නා ලෙස මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මෙම පනත් කෙටුම්පතට අපේ සම්පූර්ණ සහාය පළ කරන බවත් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 2.48]

ගරු ලලිත් දිසානායක මහතා (තාක්ෂණ හා පර්යේෂණ නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லலித் திசாநாயக்க - தொழில்நுட்பவியல், ஆராய்ச்சி பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Technology and Research)

ගරු කථානායකතුමනි, ඇත්තෙන්ම දොළොස්ලක්ෂයක පමණ රාජ්‍ය සේවකයන් ප්‍රමාණයක් නඩත්තු කරන රජයක් හැටියට වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් ආඥාපනතට මෙවැනි සංශෝධනයන් ගෙන ඒම -

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER left the Chair, and MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු ලලිත් දිසානායක මහතා

(மாண்புமிகு லலித் திசாநாயக்க)

(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ රාජ්‍ය සේවකයන්ගේ ප්‍රමාණය අඩු කරන්නට නැත්නම් විදේශීය රටවල්වල මූල්‍ය ආයතනවල බලපෑම් මත රාජ්‍ය සේවය අහෝසි කරන්නට, රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප අඩු කරන්නට තීන්දු තීරණ ගත් කාල වකවානු තිබුණා. නමුත් මේ රටට පහළ වූ නායකයකු වන මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තනය යටතේ ඒවා වෙනස් කරලා අද මේ රටේ රාජ්‍ය සේවකයන් ප්‍රමාණය දොළොස්ලක්ෂයකට පමණ ඉහළ නංවලා රාජ්‍ය සේවයේ ප්‍රතිශතය සියයට 5 සිට සියයට 8 දක්වා වැඩි කරලා තිබෙනවා. රජයේ සමස්ත ආදායම වන රුපියල් බිලියන 817ක් පමණ වන මුදලින් රාජ්‍ය සේවකයන් නඩත්තු කරන්න රුපියල් බිලියන 297ක් ගෙවන, ඒ වාගේම විශ්‍රාම වැටුප් වශයෙන් රුපියල් බිලියන 93ක් ගෙවන -මුළු රාජ්‍ය ආදායමෙන් සියයට 40ක් රාජ්‍ය සේවකයන් සහ විශ්‍රාම ලැබූ රාජ්‍ය සේවකයන් වෙනුවෙන් ගෙවීමට කටයුතු කරන- රජයක රාජ්‍ය පරිපාලන අමාත්‍යාවරයා මෙවැනි පනත් කෙටුම්පතක් ගෙන ඒම පිළිබඳව ඇත්තෙන්ම අපි සතුටු වෙනවා. විශේෂයෙන්ම මෙවැනි පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම තුළින් මේ රටේ ත්‍රස්තවාදය පැවැති පසු ගිය කාල සීමාව තුළ විශේෂ සේවාවක් ඉටු කළ ත්‍රිවිධ හමුදාව පොලීසිය වැනි අංශවල සේවකයන් වෙනුවෙන් විශාල සේවාවක් ඉටු වෙනවාය කියා මම හිතනවා.

මගේ දෙමවුපියන් ගුරුවරු. විශ්‍රාම වැටුපක් ලැබූ දෙමවුපියන් සිටින කෙනෙකු හැටියට මම සතුටු වෙනවා. මොකද, විශ්‍රාම වැටුප නිසා තමයි ඇත්ත වශයෙන්ම අපි උසස් අධ්‍යාපනය

[ගරු ලලිත් දිසානායක මහතා]

ලැබුවේ. මගේ පියා විශ්‍රාම ගියාට පස්සේ ඔහුගේ විශ්‍රාම වැටුප මිය යන තුරු ලැබුණා. ගුරුවරියක වන මගේ මව ඒ විශ්‍රාම වැටුප ගත්තේ කොච්චර සතුටකින්ද කියලා මා දන්නවා. ඇත්තෙන්ම ඒ විශ්‍රාම වැටුප නිසා තිබුණ ශක්තිය මම දැක්කා. ඒ විශ්‍රාම වැටුපෙන් වන සේවය මම දැක්කා. ඒ නිසා විශේෂයෙන්ම මෙම පනතට ගෙනෙන සංශෝධන අපි ඉතාම වැදගත් කොට සලකනවා.

විශේෂයෙන්ම ත්‍රස්තවාදී හේතූන් මත, ස්වාභාවික ආපදා මත මිය යන රාජ්‍ය නිලධාරීන්ට ඔවුන්ගේ වයස අවුරුදු 55 දක්වා වැටුප ගෙවන හෙයින්, එදිනට හිමි වැටුප මතම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප ලබා ගැනීමේ හැකියාව මේ එක් සංශෝධනයක් මඟින් ඇති කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක ඉතාමත් වැදගත් වෙනවා. රාජ්‍ය සේවකයා කවර අවස්ථාවක මිය ගියත් ඔහු විශ්‍රාම යන අවස්ථාව දක්වා ලබන වැටුප් වැඩි කිරීම්, ඒ වාගේම ඔහුට හිමි වන වැටුප් වර්ධකයන් මේ සියල්ල විශ්‍රාම වැටුපට එකතු වීම මෙම සංශෝධනය නිසා සිදු වෙනවා. ඔහු මිය යන අවස්ථාවේ තිබුණු වැටුපට සම්බන්ධ කරලා මේ ගෙවීම කළා නම් ඔහු විශ්‍රාම යෑමට අවුරුදු 20කට හෝ 25කට පෙර මිය ගියොත් අවුරුදු 55න් විශ්‍රාම යන තෙක් ලැබීමට නියමිත වැටුප් වර්ධකයන් ලබා ගන්න බැරි වෙනවා. නමුත් මේ සංශෝධන නිසා යම් කෙනෙකු මිය ගියහොත්, ඒ අදාළ පුද්ගලයාගෙන් නඩත්තු වන අයට, වැන්දඹු බිරිඳට, වැන්දඹු පුරුෂයාට, එහෙමත් නැත්නම් ඒ දරුවන්ට ඒ අයිතිවාසිකම ලබා ගන්න හිමිකමක් ලැබෙනවා. ඒ නිසා අපට සන්තෝෂ වෙන්න පුළුවන්.

ඒ වාගේම අනික් දේ තමයි, රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් වරප්‍රසාදය ලබා ගන්න හිමිකම තිබුණේ, දායකත්වය දරන්න පුළුවන්කම ලැබුණේ රජයේ ස්ථිර සේවකයන්ට පමණයි. රජයේ ස්ථිර සේවකයන්ට අමතරව රජයේ අනියම් සේවකයකුගේ වැන්දඹුවකට හා දරුවන්ට විශ්‍රාම වැටුප් වරප්‍රසාදය වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පතින් ලබා දීලා තිබෙනවා. එහෙම නම් මේක ඉතා වැදගත්. මොකද, රාජ්‍ය සේවකයා ගැන හිතන ගමන්, රාජ්‍ය සේවකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන ගමන්, රජයේ ස්ථිර සේවකයාට හිමි විශ්‍රාම වැටුප් වරප්‍රසාදය, අනියම් පදනම මත යම් කිසි සේවකයකු සේවයේ නියුක්ත වනවා නම් ඔහුට හා ඔහුගෙන් යැපෙන්නන්ටත් මේ නව සංශෝධනය යටතේ ලබා ගන්නට හැකියාව, අයිතිය අපේ ගරු ඇමතිතුමා ඇති කරලා තිබෙනවා. අපි ඒ ගැන සතුටු වන්න ඕනෑ. ඒ වාගේම ගරු අමාත්‍යතුමාට අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ. රජයක් හැටියට ඒක ඉතාම වැදගත් වනවා. මොකද, යම් යම් කාල වකවානුවල අපේ රාජ්‍ය සේවකයන් අඩු කරන්න තීන්දු කරලා තිබුණා; රාජ්‍ය සේවයේ වරප්‍රසාද කප්පාදු කරලා තිබුණා; විශ්‍රාම වැටුප නැති කරලා තිබුණා. මේවා මහින්ද චින්තනය යටතේ නැවත වතාවක් ඇති කරලා තිබෙනවා. මම හිතන්නේ ලෝකයේ රටවල් අතරින් තමන්ට ලැබෙන මුළු රාජ්‍ය ආදායමෙන් සියයට 47ක් රාජ්‍ය අංශයේ සේවකයන් සහ විශ්‍රාමිකයින් නඩත්තු කරන්න අපේ රට වියදම් කරනවා කිව්වොත් ඒක විශාල වෙනසක්. නමුත් අපි ඒ ගැන රජයක් හැටියට සතුටු වන්න ඕනෑ. ඒක ශුභසාධන වැඩ පිළිවෙළක් හැටියට විතරක් නොවෙයි, රාජ්‍ය අංශය ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළක් හැටියටයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. රජය වෙනුවෙන් කටයුතු කරන, ඒ රජයේ සේවකයාගෙන් යැපෙන්නන්ගේ -නඩත්තු වන අයවලුන්ගේ- ආරක්ෂාව වෙනුවෙන් මෙවැනි කාලීන සංශෝධනයක් ගෙන ඒම ඉතා වැදගත් වනවා කියා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තවත් දෙයක් තමයි, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයේ නිශ්චිතව සඳහන්කරනු ලැබූ නිලධරයකුගේ වැන්දඹුව සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම. මේකත් ඉතා වැදගත්. මොකද, ඒ වරප්‍රසාදය මෙතෙක් හිමි නොවුණ අයටත් මේ යටතේ එය ලැබෙනවා. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පතේ 4 වන පිටුවේ ඒ ගැන මෙසේ සඳහන් වනවා:

"(ආ) වසර පහක සේවා කාලය සම්පූර්ණ කිරීම මත විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන නිලධරයකුගේ වැන්දඹුවක, ..."

කලින් එවැනි අයට විශ්‍රාම වැටුප් හිමිකම තිබුණේ නැහැ. නමුත් මේ නව සංශෝධනය යටතේ එවැනි අයටත් එය හිමි වෙනවා. ඒ ගැන 4 වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"(අ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට " උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති; සහ

(ආ) වසර පහක සේවා කාලය සම්පූර්ණ කිරීම මත විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන නිලධරයකුගේ වැන්දඹුවක, ..."

එතකොට නව සංශෝධනය තුළින් ඒ නිලධාරීන්ගේත් කලත්‍රයන්ට හා දරුවන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලැබෙනවා. එය ඉතා වැදගත්. මොකද, රජයක රෙගුලාසි යටතේ රජයේ ස්ථිර සේවයේ විශ්‍රාම වැටුප් හිමිකම ලබන සේවකයකුට වාගේම, ඒ කාල සීමාව සම්පූර්ණ නොකළ, අවුරුදු පහක සේවා කාලයක් සම්පූර්ණ කළ රජයේ සේවකයකුගේ කලත්‍රයාටත් විශ්‍රාම වැටුප් අයිතිවාසිකම ලබා ගන්න අවස්ථාව මේ නව සංශෝධනය යටතේ ලබා දීම ඉතාම වැදගත් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තවත් වැදගත්ම දෙයක් තිබෙනවා. යම් අවස්ථාවක සේවකයන් විසින් ඔවුන්ගේ සේවය අත්හැර යනවා. එහෙම නැත්නම් ඔවුන් යම් වංචාවකට හසු වෙලා ඔවුන්ව සේවයෙන් පහ කරනවා. එවැනි අවස්ථාවකට මුහුණ දුන්නු, එවැනි තත්ත්වයකට පත් වුණු සේවකයකු කළ වරද මම හිතන්නේ ඔහුගේ දරුවන්ට අදාළ කර නොගත යුතුයි. අන්න ඒ සඳහා කාලීන සංශෝධනයක් අපේ ගරු අමාත්‍යතුමා ගෙනැල්ලා තිබෙනවා. මේක අපි අගය කරන්න ඕනෑ. රජයේ සේවකයා වැරැද්දක් කළොත් ඔහුගෙන් යැපෙන්නන්ට දඬුවම් කිරීමේ අවස්ථාව පනත යටතේ තිබුණා. රජයේ සේවකයන් හැටියට වරප්‍රසාද අහිමි වන කොට ඔහුගෙන් යැපෙන්නන්ටත් ඒ අයිතිවාසිකම නැති වෙලා ගියා. නමුත් නව සංශෝධනය යටතේ රජයේ සේවකයා රට හැර ගියත්, එහෙම නැත්නම් ඔහු යම් කිසි දඬුවමකට ලක් වුණත්, අදාළ ප්‍රතිලාභය කලත්‍රයාට හා දරුවන්ට ලබා ගැනීමේ හැකියාව ඇති කරලා තිබෙන එක ඉතාම අගය කළ යුතු දෙයක්. ඒක තමයි විය යුත්තේ. ඇත්ත වශයෙන්ම අපි රජයේ සේවකයා දිහාත් බලන්න ඕනෑ. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පතින් මූලික වශයෙන් රජයේ සේවකයා දිහා බලලා තිබෙනවා. ඔහුගේ සේවා කාලය තුළ ඒ විශ්‍රාම වැටුප් ගණනය කිරීමට අදාළව කටයුතු කරනවා. ඒ වාගේම ඔහු සේවය අත්හැර යන අවස්ථාවේදී, නැත්නම් ඔහුගේ සේවය නැති වන අවස්ථාවකදී ඔහුගෙන් නඩත්තු වන අයගේ ඒ අයිතිවාසිකම ආරක්ෂා කරන්න නව සංශෝධනයෙන් වැදගත්කමක් ලබා දීලා තිබෙනවා. අපි ඒක ඉතාම අගය කරන්නට ඕනෑ.

ඒ වාගේම අවුරුදු 26 දක්වා පිරිමි අයකුට විතරක් විශ්‍රාම වැටුප ලබා ගන්න මුලින් තිබුණු අයිතිවාසිකම, ගැහැනු දරුවාටත් -විවාහ වුණත්- අවුරුදු 26 දක්වා දීර්ඝ කිරීම ඉතාම වැදගත් වෙනවා. මොකද හේතුව විවාහය කියන සංසිද්ධිය පමණක් සලකා බලා ඒ නීතිය අනුව මේ තත්ත්වය තිබුණා නම් ඇත්තෙන්ම ඒ වරප්‍රසාදය ඒ ගැහැනු දරුවාට අයිති වන්නේ නැහැ. එහෙම නම් ඒ භේදය පැත්තකින් තබලා, ගැහැනු දරුවාටත් අවුරුදු 26 දක්වා ඒ වරප්‍රසාදය භුක්ති විඳීමේ අයිතිය ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි ඒක ඉතාම අගය කරන්න ඕනෑ.

ප්‍රධාන ප්‍රඥප්තියේ, 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ

අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 22 වැනි වගන්තිය කෙරෙහි මා අවධානය යොමු කරවනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාලීනව මේ පනත ගැන කොපමණ පුළුල්ව බලා තිබෙනවාද කියන එක අපට ඒ 22වැනි වගන්තිය දිහා බැලුවාම පෙනෙනවා. මොකද, දරුවා නඩත්තු කිරීම පැහැර හැරීමක් කරනවා නම්, ඒ කියන්නේ මේ පනත යටතේ විශ්‍රාම වැටුපක් ලබන වැන්දඹු පුරුෂයෙකු, ඔහු මිය ගිය විට මේ පනත යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට අයිතිවාසිකම ලබන දරුවකු අතහැර දමා ගිහිල්ලා තිබෙනවා නම් මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයාට බලතල දීලා තිබෙනවා, ඒ වැටුපෙන් අදාළ දරුවාගේ නඩත්තුව කර ගෙන යාම සඳහා ගෙවීමක් කරන්න ඔහුට නියම කරන්න පුළුවන් බවට.

ඉතාම වැදගත් පනතකට, ඒ පනත ශක්තිමත් කරන්න, ඉතාම වැදගත් වූ තවත් සංශෝධන ගෙනැවිත් තිබෙනවා. වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ බලාපොරොත්තුව ඒකයි. ඒ සේවකයාගෙන් නඩත්තු වන, ඔහුගෙන් යම් දෙයක් බලාපොරොත්තු වන, ඉදිරි නඩත්තුවක් බලාපොරොත්තු වන අයගේ අනාගතය ශක්තිමත් කිරීමට එදා ඒ පනතේ 22 වැනි වගන්තියෙන් අධ්‍යක්ෂකට බලයක් ලබා දීලා තිබෙන්නේ මොකද? ඒ අය වෙනුවෙන්, ඒ ඇප වන්නන් වෙනුවෙන් නියමාකාරයෙන් කටයුතු කරන්නයි ඒ බලය දීලා තිබෙන්නේ. එහෙම නම් අද ඉතාම කාලෝචිතව අපේ ගරු අමාත්‍යතුමා, ඒ වාගේම අපේ නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා, මෙවැනි සංශෝධනයන් ගෙනාවේ මේ පනතේ මූලික පරමාර්ථය තවත් ශක්තිමත් කරන්නයි.

ඒ වාගේම මේ පනත තුළින් රටේ ආරක්ෂා විය යුතු රාජ්‍ය සේවය, ඒ වාගේම විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ යම් අසාධාරණයකට ලක් වුණු නැත්නම් තම ස්වාමිපුරුෂයන්, භාර්යාවන් අහිමි වුණු තත්ත්වයට පත් වුණු ඒ කලත්‍රයන්ගේ සුභසිද්ධිය සඳහා ඇති කළ මේ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත ඉතාම අගය කිරීමක් හැටියට මා දකින අතරම, විවිධ අවලාද, විවිධ ප්‍රශ්න රාජ්‍ය සේවය ගැන යෙදෙන මොහොතකදී අපේ ගරු ඇමතිතුමන්, නියෝජ්‍ය ඇමතිතුමන් රජයක් හැටියට මේ ඉදිරිපත් කළ සංශෝධනයන් ගැන අප ඉතාම සතුටු වනවා. ඒ වාගේම එය අගය කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

Hon. Deputy Chairman of Committees, I thank you very much for giving me this opportunity to participate in this Debate. We, the TNA, fully appreciate and support these Amendments. I want to request the Hon. Minister to consider the possibility of continuing the pension paid to an orphan, if it happens to be a lady, throughout her lifetime. Now, the pension is paid till her 26th year.

At this juncture, I also wish to bring to the notice of this House, the plight of the foreign pensioners. The pension due to the foreigners has been stopped from January this year. The Director-General of Pensions has issued Circular No. 16 of 2009. According to that Circular, a foreign pensioner has to open a special account at the Queen's Branch of the People's Bank, if he wants the pension paid continuously. The pension due to him is his own money. He can afford to do anything with that money and he has got the freedom to open any account in any bank.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

Hon. Member, I do not want to disturb you. But, since you raised this matter that day at the Consultative Committee - some temporary remedial measures were also discussed that day - I would like to say that we are now trying to take the temporary remedial measures while also trying to implement the new Circular. So, immediate steps have been taken to temporarily implement the remedial measures that we discussed at the Consultative Committee.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

Why can you not allow the foreign pensioners to continue to take the pension the way they were drawing it before the issue of this Circular? What is the difficulty?

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

Hon. Member, the only thing is, as we discussed the other day, there are instances where the present system had been misused by people. That is why a new system was introduced. But, we agreed that there was a delay on the part of the Department of Pensions and we said that temporary measures would be taken to see that the delay would not be there anymore.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

You cannot expect a foreign pensioner to open an account in a particular bank. That is his freedom; you cannot ask him to open an account only in a particular bank. If he has a bank account and the pension goes to that bank account, why can that procedure not continue? So, I am asking the Hon. Minister to consider the possibility of allowing these pensioners to draw their pensions from their chosen banks without asking them to open a special account at the Queen's Branch of the People's Bank because until such time, they are not being paid their pension. I want the Hon. Minister to reconsider this; I want the Director-General of Pensions to cancel Circular No. 16 of 2009. With the introduction of this system, according to the Circular, he is compelling a person to open a special account at the Queen's Branch of the People's Bank, Colombo 10. As a pensioner, a person is entitled to draw his pension from the bank he chooses. Why does this Circular say that he should open a special account at the Queen's Branch of the People's Bank? They will have to take several steps -

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

The Circular says that they can open an account in any Government bank. It does not specifically say that it should be at the Queen's Branch of the People's Bank.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
No, no. I have got the Circular here.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
That is the information I got from the Director-General of Pensions.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
It states the following under "Payment of pension through approved special bank account": "The special account may be opened only at People's Bank - Queen's Branch. Facilities are available for pensioners to open this bank account having arrived in Sri Lanka or while overseas". So, it specifies that you have to open this account at the Queen's Branch of the People's Bank. You are interfering with the freedom of a pensioner. He can keep his money in any bank he chooses. So, I want the Director-General of Pensions to cancel that Circular and allow them to continue to draw the pension the way they were drawing it earlier.

Thank you.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Hon. Member, the original Circular that was issued, which stated that the particular account should be opened at the Queen's Branch of the People's Bank, has been amended and now they can open an account in any Government bank. That is the present position. - [*Interruption.*] No, I am only explaining the present position. Now, they can open an account in any Government bank.

[අ. භා. 3.08]

ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් ආඥාපනත සංශෝධනය කිරීම පිළිබඳව වචන කිහිපයක් කථා කිරීමට ලැබීම ගැන මා සන්තෝෂ වනවා. මේ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් ආඥාපනත අවුරුදු 112ක් පමණ පැරණි පනතක්; සුද්දන්ගේ කාලයේ ගෙනා පනතක්. රජයේ සේවයේ යෙදී සිටියදී විශ්‍රාම යන්නට පෙර නිලධාරීන් මිය ගිය පසු අනාථ වන බිරින්දන්, දරුවන් වෙනුවෙන් තව දුරටත් සහන ලබා දෙන්නටයි මේ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. රජයේ සේවකයන්ට පමණක් නොවෙයි, විශ්‍රාමිකයන්ට සැලකීම අතිනුත් අපේ රටට තිබෙන්නේ ඉතාමත්ම හොඳ චිත්‍රයක්. අවංකව කිව්වොත් අපේ රටේ තමයි මේ තත්ත්වය තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා ඇති, ස්පාඤ්ඤයේ ආදී බොහෝ රටවල විශ්‍රාම වැටුප් ගෙවීම පවා නතර කර තිබෙන කාලයක් මේ කියලා. ඒ වාගේම රණ විරුවන්ට කළගුණ සැලකීමත් මෙයින් කෙරෙනවා. මිය ගිය රණ විරුවන්ගේ වැන්දඹු බිරින්දන්ටත්, දරුවන්ටත් විශේෂ වරප්‍රසාද හා ප්‍රතිලාභ රැසක් අයත් වනවා. ඒ ගැන සඳහන් කරන්නට කලින්, මීට ඉහතදී රජය යටතේ මිය ගිය රණ විරුවන්ගේ වැන්දඹුවන් වෙනුවෙන් ගත් වැදගත් මානුෂික තීන්දුවක් මතක් කරන්න මා කැමැතියි. පරණ -තිබුණු- නීතිය අනුව යුද්ධයෙන් රණ විරුවකු මිය ගියාට පසු ඔහුගේ වැන්දඹු බිරිඳට නැවත විවාහ වන්නට බැහැ. විවාහ වුණොත් විශ්‍රාම වැටුප් අහිමි වනවා. නමුත් අපේ ආණ්ඩුව ඒක සංශෝධනය කර දුන්නා. ස්වාමිපුරුෂයා මිය ගියත් නැවත වරක් විවාහ වුණත් විශ්‍රාම වැටුප අහිමි වන්නේ නැති විධියට සකස් කර දුන්නා. එය රජය ගත් ඉතාම වැදගත් තීන්දුවක්ය කියා මා හිතනවා. මොකද, අවුරුදු විස්සක්, විසිපහක්, තිහක්, තිස්පහක් පමණ වයස ඇති කාන්තාවන් විවාහ වෙලා සුමානයක් ඉඳලා පුරුෂයා යුද්ධයට යනවා. යුද්ධයට ගියාම ඔහු මිය යනවා. පුරුෂයා මිය ගියායින් පස්සේ ඒ බිරිඳට වෙනත් කෙනකු සමඟ විවාහ වන්නට බැහැ. විවාහ වුණොත් විශ්‍රාම වැටුප අහිමි වනවා. එම නිසා කවුරු කැමැති වුණත් විවාහ නොවී සිටීමේ ප්‍රවණතාවක් තිබුණා. දැන් ඒක වෙනස් කර දුන්නා. ඉතාමත්ම ස්තුතිවන්ත වන්නට ඕනෑ, ඒ කටයුත්ත කිරීම ගැන. ඒ අනුව දැන් ඒ මිය ගිය රණ විරුවන්ගේ බිරින්දන්ට කැමැති නම් නැවත විවාහ වන්නට පුළුවන්. තමන්ගේ විශ්‍රාම වැටුපත් දිගටම ලැබෙනවා. මේක හොඳ තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අලුත් සංශෝධනයෙන් ලැබෙන ප්‍රතිඵල මොනවා ද? ත්‍රස්තවාදය නිසා, ස්වාභාවික ආපදා නිසා රජයේ නිලධාරියෙක් විශ්‍රාම යන්නට පෙර මිය ගිය හොත් මෙතෙක් කල් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප ගෙවිවේ ඔහු මිය ගිය දිනට ලබමින් සිටි වැටුප පදනම් කර ගෙනයි. නමුත් දැන් එහෙම නොවෙයි. අවුරුදු පණස්පහක් දක්වා ජීවත්ව සිටියා නම් ඒ කාලය තුළ වාර්ෂිකව ලබන වැටුප් වර්ධකයද ඔහුට ලැබෙනවා. ගරු අමාත්‍යතුමනි, මේක ඔබතුමන්ලා කරන ලොකු පිංකමක් විධියටයි අප දකින්නේ. ඒ වාගේම මෙතෙක් කල් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවන ලද්දේ රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ යෙදී සිටියදී මිය ගිය අයට පමණයි. නමුත් දැන් එහෙම නොවෙයි. ස්ථිර සේවකයන්ට පමණක් නොවෙයි. අනියම් සහ තාවකාලික සේවකයන්ටත් මේක ලබා ගන්නට පුළුවන්. මෙතෙක් කල් අවුරුදු 21ට වැඩි පිරිමි ළමුන්ට වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම් ලැබුණේ නැහැ. ගැහැනු දරුවන්ට විතරයි ඒක ලැබුණේ. දැන් පිරිමි දරුවන්ටත් ඒක ලබා ගන්නට පුළුවන්. ඒක අප විශේෂයෙන් අගය කරන්නට ඕනෑ. ඒ ගැන ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වන්නට ඕනෑ. අවුරුදු 26 දක්වා රැකියා විරහිත අවිවාහක ගැහැනු දරුවන්ට පමණක් අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම් ලැබුණා. නමුත් මින් ඉදිරියට අවුරුදු 26 දක්වා රැකියා විරහිත පිරිමි දරුවන්වද විශ්‍රාම වැටුප් ලැබීම ලොකු කටයුත්තක් විධියටයි දකින්නේ. මේ සඳහා විශාල වියදමක් රජය දරනවා. වාර්ෂික වියදම් බලද්දී විශ්‍රාම වැටුප් සඳහා විශාල වියදමක්; බිලියන ගණනක් -මට හරියටම මතක නැහැ.- රජය දරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඉස්සෙල්ලා කිව්වා වාගේ ග්‍රීසිය, ස්පාඤ්ඤය ආදී යුරෝපීය රටවල්, ඒ ගොල්ලන්ගේ ආර්ථික අර්බුදයත් එක්ක දැන් විශ්‍රාම වැටුප් ගෙවීම නතර කර තිබෙනවා. අපේ ආර්ථිකය අර්බුදයට ලක් වී නැහැයි කියන එකට හොඳ හේතු සාධකයක් තමයි මෙහෙම තිබෙද්දීත් අප විශ්‍රාම වැටුප දෙන එක.

ඊ ළඟට ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් රකින්න අතිගරු ජනාධිපතිතුමා අවුරුදු හතළිහක් තිස්සේ දරන උත්සාහය වැදගත් බව මා කියන්නට කැමැතියි. එතුමා විරුද්ධ වුණේ ත්‍රස්තවාදයට මිස දෙමළ ජනතාවට නොවෙයි. ඒක අප පැහැදිලි කර ගන්නට ඕනෑ. අප මානුෂික මෙහෙයුමක් කළා. ද්‍රවිඩ ජනතාව අපේ සතුරෝ විධියට කල්පනා කළේ නැහැ. සෙබළුන් ද්‍රවිඩ අම්මලා

තාත්තාලා දැනින් ඔසවා ගෙන ආවා. ඒ අය නන්දිකඩාල් කළපුව දිගේ ඇවිත් අපට හාර වුණේ අප මානුෂික මෙහෙයුමක් කළ නිසයි. ඒක හොඳට මතක තබා ගන්න ඕනෑ. ඒ දවස්වල තිබුණ තත්ත්වය ගැන සමාලෝචනය කෙරුවොත්, මෙපමණ දෙයක් කළ රටකට බැන් කී මූන් වාගේ අය අද විරුද්ධ වෙලා කරන අපරාධය කුමක්ද කියන එක ගැන අපි කනගාටු වනවා. මම සිතන්නේ මුළු පාර්ලිමේන්තුවම එක හඬින් නැඟිටලා ඒකට විරෝධය පළ කරන්නට ඕනෑ. මෙවැනි ශුභසාධන කටයුතු කරමින් මේ රජය ගෙන යන වැඩ පිළිවෙළ අපි ප්‍රශංසාවට ලක් කරන්නට ඕනෑ. ඒ විතරක් නොවෙයි. මේ චෝදනා ඉදිරිපත් කරන්නේ ලංකාවේ ජනාධිපතිවරයාට මිස අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට නොවෙයි. අපි මානුෂීය මෙහෙයුමක් කළේ. ඒ සම්බන්ධයෙන් අද මේ ගෙන යන වැඩ පිළිවෙළ ගැන අපි මීට වඩා කටයුතු කරන්නට ඕනෑ.

ඊ ළඟට අපි බලමු ලංකාවේ වැන්දඹු ජනගහනය කොපමණද කියා. සංඛ්‍යා ලේඛන අනුව 2001 දී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයේම වැන්දඹු ජනගහනය 5,49,594ක් වුණා. එයින් 78,165ක්ම වැන්දඹු පුරුෂයන් වන අතර 4,71,429ක් කාන්තාවන් වුණා. ප්‍රතිශතයක් වශයෙන් ගත්තාම සියයට 14ක් සහ සියයට 86ක්. බලන්න. කාන්තාවන් තමයි වැඩියෙන්ම වැන්දඹු තත්ත්වයට පත් වී තිබෙන්නේ. මුළු ජනගහනයෙන් සියයට 59ක්ම වයස්ගත අයයි. ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අවුරුදු 60 ඉක්මවා ගිය අයයි. මේක තමයි මේ proportion එක. මේ විශ්‍රාම වැටුප්වලදී යන විධිය. කෙසේ නමුත් ජනගහනයේ වයස් කණ්ඩායම් දෙස බැලීමේදී පෙනී යන සුවිශේෂ තත්ත්වයක් තමයි අවුරුදු 25 සිට 40 දක්වා වයස් කණ්ඩායම්වල ස්ත්‍රී වැන්දඹු ප්‍රතිශතය වැඩි වී තිබීම. මෙම ප්‍රමාණය මුළු වැන්දඹුවන්ගෙන් සියයට 2.8ක් වන අතර, පිරිමින් සඳහා එය සියයට 0.4ක් වෙනවා.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා දත්ත අනුව ශ්‍රී ලංකාවේ වැන්දඹු ජනගහනය 2001 වර්ෂයේදී සියයට 3.2ක් වූ අතර, 2006/07 කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය අනුව 2006 දී එය සියයට 8ක් දක්වා වර්ධනයක් පෙන්නුම් කරනවා. මෙම සංඛ්‍යා දත්ත මගින් පෙන්නුම් කරන්නේ උතුරු ප්‍රදේශය සහ කිලිනොච්චි ප්‍රදේශය හැර අනෙක් ප්‍රදේශවල ජනගහන තත්ත්වයි. ශ්‍රී ලංකාවේ උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල වැන්දඹු ජනගහනය 40,000ක් පමණ වන බවට ගණන් බලා තිබෙනවා. මේ අතර බහුතරය නියෝජනය කරන්නේ වයස අවුරුදු 22-25 වයස් කාණ්ඩයේ කාන්තාවනුයි. මේක හොඳ ප්‍රවණතාවක් නොවෙයි. ඒ අය ගැන කරුණු සොයා බැලීමේදී මානසික, ආර්ථික අතින් පීඩාවට පත් වීම සහ නිශ්චිත ආදායම් මාර්ග නොමැති වීම වාගේම ලිංගික අවශ්‍යතාවන් පිළිබඳවත් ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඇත්ත තත්ත්වය ඒකයි. අවුරුදු 22-25යි නේ. ඒක සමාජයීය අවශ්‍යතාවක් කියලා විශ්ලේෂණයකදී ඔප්පු කර තිබෙනවා. අපේ රටේ සමාජය ශුද්ධ පවිත්‍ර කරනවා නම් ඒ පිළිබඳවත් අපට සිතන්නට වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රට ගැන කල්පනා කරද්දී මේ රටේ ප්‍රශ්න රාශියක් තිබෙද්දීත් අපි මේ කටයුත්ත කර ගෙන යන එක ගැන ලොකු ප්‍රශංසාවක් හිමි වන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂ කාලයේ මොනවා කිව්වත්, සටන් විරාම ගිවිසුම අත්සන් කළ වේලාවේ defensive-offensive කියන කථාන්දරය මුල් කර ගෙන සිදු වුණ අපරාධය සහ අවාසි සහගත තත්ත්වය අපි දැක්කා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අත්සන් කළ ගිවිසුමේ සංයුතිය බලද්දී offensive මෙහෙයුම් සහ ආරක්ෂක defensive මෙහෙයුම් යන ද්විධාකරණ පදනම් කොට ගත් ගිවිසුමේ (1) (iii) වගන්තිය යටතේ රජයේ හමුදාවන්ට එල්ටීටීඊ පැත්තට ප්‍රහාර එල්ල කරන්නට බැහැ. ඒක තහනම්. ඒක තහනම් කළා. එතකොට paramilitary groups. අපේ කරුණා මැතිතුමා ඒ කාලයේ ඒ කටයුතු කෙරුවා. ඒ අයව මර්දනය කිරීමත් රජයේ හමුදාවන්ට බාර දීලා තිබුණා. ඒ අය මර්දනය කරන්නත් රජයේ හමුදාව යන්න ඕනෑ. ගහද්දී නිකම් ඉන්න ඕනෑ. මොකුත් කරන්න බැහැ. එල්ටීටීඊ බලය සම්පූර්ණයෙන් ව්‍යාප්ත වන විධියට තමයි වැඩ කළේ. ඒකේ ප්‍රතිඵලය කුමක්ද? -[බාධා කිරීමක්]

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

At that time, His Excellency Mahinda Rajapaksa was the President of this country.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

No, not Pesident Rajapaksa. That was during President Premadasa's time. You know what happened at that time.ඒ කාලයේ වෙච්ච දේවල් දන්නවා නේ. අපේ පොලිස් නිලධාරින් 600ක් මැරුවේ. එක තැන 600ක් මරා දැමුවේ. පොඩි ගණනක් නොවෙයි නේ. "යටත් වෙන්නද" කියලා ඇහුවා. ඒකට මුකුත් කිව්වේ නැහැ. මොකද කරන්නේ කියලා අහපුවාම, "ඔහොම ඉන්න" කියලා කිව්වා. තුවක්කුව ඇල්ලුවා. 600ක් මරා දැමුවා. අදටත් වෙච්ච දෙයක් නැහැ. 600ක් එක දවසේ වැන්දඹුවන් බවට පත් වුණා. ඔන්න තත්ත්වය. ප්‍රේමදාස මහත්මයා ඒ කාලයේ ආයුධත් දුන්නා. ආයුධත් තොගයක් දුන්නා. ඒ නිසා ඒ ගැන තමුන්නාන්සේ කථා කරන්නට එපා.

ඊ ළඟට මා මේ කාරණය ගැනත් කියන්නට ඕනෑ. 2001 දෙසැම්බර් 20වැනි දින සිට ආරම්භ වූ සටන් විරාමයෙන් සහ 2002 පෙබරවාරි මස 22වැනි දා අත්සන් කළ සටන් විරාම ගිවිසුමෙන් පසුව මේ රට වෙනස් තත්ත්වයකට පත් වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි අද මෙච්චර ප්‍රමාණයක් වැන්දඹුවන්, ඒ වාගේම අනාථ වෙච්ච අය, අවතැන් වුණු අය සිටින්නේ. නමුත් අතිගරු ජනාධිපතිතුමා අද ඒ තත්ත්වය වෙනස් කර තිබෙනවා. කිලිනොච්චියේ කැබිනට් රැස්වීම පවත්වන්නට තරම් එඩිතර වෙලා තිබෙනවා. අද මුළු රටම සම්පූර්ණයෙන් ත්‍රස්තවාදයෙන් මුදා ගෙන තිබෙනවා. ඉතින් මීටත් වැඩියෙන් මොනවා කරන්නද? ඔය මිලිබෑන්ඩ්, බැන් කී මූන් ඊ ළඟට මොනවා කියන්නද? මුකුත් කියන්න දෙයක් නැහැ. අර බූවල්ලෙක් ඉන්නේ, "පෝල්" කියලා. පෝල්ට පෙන්වලා ඇහුවොත් පෝලුත් කියයි, ජනාධිපතිතුමා හරිද, බැන් කී මූන් හරිද කියලා. පෝල් කියන බූවල්ලාට ෆුට් බෝල් මැච් පිළිබඳව අනාවැකි කියන්නට පුළුවන් වාගේ මේකෙදිත් කවුද වැරදි, කවුද නිවැරදි කියලා අනිවාර්යෙන්ම කියයි කියන එකයි මගේ විශ්වාසය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශ්‍රාම වැටුප් සඳහා රුපියල් මිලියන 85,139ක් මේ රජය වියදම් කරනවා. දැන් මේක තවත් වැඩි කර තිබෙනවා. අපි තවත් බරක් දරනවා. ඉතින් ඒකෙන් අපි බලාපොරොත්තු වන්නේ කුමක්ද? සමාජ අසාධාරණත්වය කියන එක සංසිඳවන්නයි. මොකද සමාජ අසාධාරණත්වයක් සිදු වුණාම ඉවිඡා භංගත්වයට පත් වනවා. එතකොට මොනවා කෙරුවත් මේ රටේ සංවර්ධනයක් කරන්නට බැහැ. ඒ නිසා මිනිසුන්ගේ සිත් තුළට ඒ සැනසීම ලබා දිය යුතුයි. ඒ සැනසීම ලබා දෙන්නට අපේ රජය අද හොඳ පියවරක් අරගෙන තිබෙනවා. අද ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධන පනත් කෙටුම්පත් තුළින් ඒක ඉෂ්ට කර තිබෙන බවත් මා පැහැදිලිව කියන්නට ඕනෑ.

මේ විශ්‍රාම වැටුප් ලබා ගන්නා අය අතර, විශේෂයෙන්ම ඉස්සර තිබුණු තත්ත්වයයි, අද තිබෙන තත්ත්වයයි අතර වෙනස අපි පැහැදිලිවම දැක්කා. දැන් තිබෙන බලාපොරොත්තු සහ අනාගත

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

බලාපොරොත්තු කියන ඒවා කොතරම් දුරට මිනිසුන්ගේ සිත් තුළට කාවැදිලා තිබෙනවාද කියන එක අපට පෙනෙනවා. පෞද්ගලික අංශයටත් විශ්‍රාම වැටුප් ලබා දෙන්නට ඕනෑය කියලා මෙදා පාර අය වැයෙන් යෝජනාවක් ගෙනාවා. එතකොට අර සමාජ සමතුලිතභාවය ඇති වෙයි. පුළුවන් අය බදු ගෙවනවා. ඒ බදුවලින් අරගෙන මේ රටේ මුදල් පරිපාලනය තුළින් නැති බැරි අයට, අවතැන් වුණු අයට, ඒ වාගේම වැන්දඹුවන්ට, විශ්‍රාමිකයන්ට සහනයක් සලසන්නට රජය පොහොසත් වෙලා තිබෙනවා. ඇමෙරිකාවට මේක කරන්න බැරිව ගිහින් තිබෙනවා. ඇමෙරිකාව දැන් මොකක්ද කරන්න යන්නේ? විශ්‍රාම ගන්නා වයස් සීමාව වැඩි කරන්නට යනවා. එතකොට විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද කරන්නට ඒ අය දැන් කටයුතු කර ගෙන යනවා. ඉතින් අපේ රජයට මොන වෝදනාවක්වත් කරන්නට බැහැ. අද මේ රජය රටත් බේරා ගෙන තිබෙනවා; යුද්ධයත් ජයග්‍රහණය කර තිබෙනවා. රටත් සංවර්ධනය වනවා. මොනවා කිව්වත් රටේ වැඩ කටයුතුත් හොඳින් සිදු වනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් අතිගරු ජනාධිපතිතුමා අද එක්සත් ජාතික පක්ෂයත් එක්ක එකතු වෙලා අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්නට නවතම වැඩ පිළිවෙළක් ගෙන යන්නත් කටයුතු කරමින් සිටිනවා. විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අපි බොහොම ස්තුතිවන්ත වන්නට ඕනෑ, බොහොම සහයෝගයෙන් වැඩ කරලා මේ රටේ ජනතාව ජයග්‍රහණය කරවන්නට එකතු වන්නට එතුමා ගත් තීරණය ගැන. ඒ ගැන මා නම් අවංකව ප්‍රසාදය පළ කරනවා. මොකද, මේ නායකත්වය යටතේ වැඩ කර ගෙන යන්නට පුළුවන් බව පැහැදිලිව පෙනිලා තිබෙනවා. එදා ත්‍රස්තවාදීන් කියලා හංවඩු ගහලා පැත්තකට දමපු අයත් අද ප්‍රජාතන්ත්‍රවාදයට ඇවිල්ලා තිබෙනවා. ඒ අය ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටලා පමණක් නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය පිළිපදිමින් සංවර්ධන ක්‍රියාදාමයටත් අද සහයෝගය දක්වනවා. අපේ ගරු විනායගමූර්ති මුරලිදරන් නියෝජ්‍ය අමාත්‍යතුමාව උදාහරණයක් වශයෙන් දක්වන්නට පුළුවන්. එතුමාගේ ජීවිත කථාව මා බැලුවා. එතුමා ප්‍රභාකරන්ට විශාල මෙහෙවරක් ඉටු කළා. නමුත් එතුමා තේරුම් ගත්තා, ඔහු කරන්නේ බොරුවක් කියලා. එතුමා ඒකෙන් පිට පැන්නා. පිට පැනපු විගසම එතුමාව ඝාතනය කරන්නට විශාල වුවමනාවක් තිබුණා, එල්ටීටීඊ සංවිධානයට. ඒක පාක්ෂිකව තමන්ගේ පාලනය ගෙන යාමට විරුද්ධ වෙලා ඔහු ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට පිවිසුණාට පසුව ප්‍රභාකරන්ගේ පළමු අරමුණ වුණේ, පළමු ප්‍රයත්නය වුණේ ආණ්ඩුවට ගැහීම නොව කරුණා අම්මාන්ව විනාශ කිරීමයි. ඒ අරමුණ ඝාත්ඝාත් වුණේ නැහැ. අද ඉතාමත්ම හොඳ ක්‍රියා දාමයක් එතුමා මේ රට වෙනුවෙන් කරනවා. පක්ෂයෙත් නිලයක් අරගෙන අද මුළු ලෝකයටම ආදර්ශයක් වන විධියට සංවර්ධන ක්‍රියාදාමයේ යෙදෙනවා. නමුත් ඇයි විපක්ෂයට එහෙම කරන්න බැරි? විපක්ෂය ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරමින්, සංවර්ධනය ප්‍රතික්ෂේප කරමින්, රජය කඩා වට්ටන්න අභ්‍යන්තර කුමන්ත්‍රණ කරමින්, ජාත්‍යන්තර කුමන්ත්‍රණවලට සහයෝගය දෙමින් කටයුතු කරනවා.

විමල් වීරවංශ මැතිතුමාගේ ඒ වැඩ පිළිවෙළ මොනවා වුණත් අපි සියලු දෙනාම එකතු වෙලා ජනාධිපතිතුමාට කරන මේ කෙනෙහිලිකම්වලට විරුද්ධව නැඟී හිටලා අපට විරෝධය පළ කරන්න කාලය ඇවිත් තිබෙනවා. ඒකත් ප්‍රජාතන්ත්‍රවාදී විධියට විරෝධය පළ කිරීම තමයි වඩාත් වැදගත් වන්නේ කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම තවත් කාරණයක් මා කියන්න කැමැතියි. දැන් අපේ රජය ගැන ජාත්‍යන්තර ප්‍රජාව මොකක්ද කියන්නේ? අද බලන්න පැවැති සම්බාධක කොච්චර අයින් කර තිබෙනවාද කියලා. අර Lloyd'sවලින් දමා තිබුණු තහංචි -නැව්වලට අය කරපු ගාස්තුව- ඉවත් කරලා. සංචාරකයන්ට අවධානම් ප්‍රදේශයක් කියා පැත්තකට දමා තිබුණු මේ රටට දැන් දෙන recommendation එක බලන්න. "එන්න, භය වන්න එපා, ඕනෑම තැනක ආරක්ෂාව තිබෙනවා" කියා කරපු ප්‍රකාශය බලන්න. අපි දවසින් දවස, දවසින් දවස කොහේටද යන්නේ? දවසින් දවස ආරක්ෂාව පිළිබඳ ස්ථාවරය තහවුරු කරමින් තමයි සංවර්ධනය ගෙන යන්නේ. එම නිසා ඉදිරියේදී ඒ තුළින් අපිට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලැබෙයි කියා උපකල්පනය කරන්න පුළුවන්. හොඳම උදාහරණය සංචාරක ව්‍යාපාරය. අද හෝටලයක කාමරයක් ගන්න බැහැ. මේ week-end එකට ත්‍රිකුණාමලයේ කාමරයක් ගන්න විධියක් නැහැ. කාමර පිරිලා. කොළඹ කාමරයක් ගන්න විධියක් නැහැ. කාමර පිරිලා. ඇයි, ඒ? දැන් පුළුවන් තරම් සංචාරකයෝ එනවා. මාලදිවයින සංචාරක ව්‍යාපාරයෙන් විතරක් තමන්ගේ මූල්‍ය ශක්තිය ඇති කර ගත්තු රාජ්‍යයක්. ඒ තත්ත්වය දැන් ලංකාවට පැමිණ තිබෙනවා. එම නිසා කිසි භයක් වන්න ඕනෑ නැහැ. අපි කියන්නේ අපි ස්ථාවරයි. කොච්චර ස්ථාවර වුණත් දේශපාලන ස්ථාවරය රැක ගන්න නම් විපක්ෂයේ සහයෝගය ඕනෑ. ජාත්‍යන්තර කුමන්ත්‍රණවලදී සියලු දෙනාම එක පැත්තක ඉඳලා මේ රට බේරා ගැනීමට කටයුතු කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් මා අද ආයාචනයක් කරනවා. ජනාධිපතිතුමාට විරුද්ධව එදා බොරු ගිවිසුම් ගහලා නෝර්වේ රාජ්‍යයේ පහසුකම් සලසන්නා විධියට කටයුතු කරලා ගිවිසුම්වලින් වුණු හානිය හොඳටම පෙනෙනවා. සටන් විරාමයේදී මොන වාගේ ගිවිසුමක්ද ගැහුවේ? ඒක කාට ප්‍රයෝජනවත් විධියටද කෙරුවේ? අද ඒවා වෙනස් කර තිබෙනවා. එම නිසා අපි ඉල්ලා සිටිනවා, නැවත වරක් නොයෙකුත් ස්වරූපවලින් එන කුමන්ත්‍රණ පරාජය කරලා මේ රට බේරා ගැනීමට -අපේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ලා වාගේ පළපුරුදු නායකයෝ ඉන්නවා- අපේ ආණ්ඩු පක්ෂයේ අයට තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දීලා කටයුතු කරන්නය කියා ඉල්ලා සිටිමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.26]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(මාණ්පුමිකු එම්. ජෝසප් මයික්කල් පෙරේරා)
(The Hon. M. Joseph Michael Perera)

මූලාසනාරූඪ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ වැඩ බලන නායකතුමා කිව්වා වාගේ මේ පනත් කෙටුම්පත් දෙක පිළිබඳව අපේ කිසි විරුද්ධත්වයක් නැහැ. ඒවාට අපේ සම්පූර්ණ සහයෝගය ලැබෙනවා.

එතැනදී ප්‍රශ්න කිහිපයක් පැහැදිලි කර ගැනීම සඳහා ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එම පනත් කෙටුම්පතේ 2 වන වගන්තියේ මෙහෙම සඳහන් වනවා:

"...රාජ්‍ය සේවයට ඇතුළත් වූ සහ (1) වන උප වගන්තිය යටතේ විශ්‍රාම යාමකට හෝ ඉවත් කිරීමකට පෙරාතුව වසර දහයක සේවා කාලයක් සම්පූර්ණ කොට ඇති රජයේ නිලධරයකු ඉහත කී වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රතිලාභවලට සුදුසුකම් ලැබීමට සැලැස්වීම වන්නේ ය."

මෙතැනදී පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. එහෙම ඉවත් කරනවාය කියලා කියන්නේ රස්සාවෙන් අයින් කරනවාද? මේක නොපැහැදිලි තත්ත්වයක්, ගරු ඇමතිතුමනි. ඒක පොඩ්ඩක් අපට පැහැදිලි කරලා දුන්නොත් ඉතාමත්ම වටිනවා. මම ඊට වඩා ඒ ගැන කථා කරන්නේ නැහැ. මේ පනත් කෙටුම්පත ඉතාම උසස් තත්ත්වයේ තිබීම පිළිබඳව අපි ආඩම්බර වනවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(මාණ්පුමිකු ඵීලික්ස් පෙරේරා)
(The Hon. Felix Perera)
හොඳයි නේද?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි නේන්නම්. හොඳට හොඳයි කියන්න එපා යැ. හොඳට හොඳයි, හොඳට එක්කහු වෙනවා. වැරදි එකෙන් ඇත් වනවා. ඒක තමයි හැටි. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගෙන් අහන්න කෝ, අපි කොහොමද කියලා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මම දන්නවා,- [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපි Select Committee එකේ ඉන්දැද්දී එකඟ වන්න පුළුවන් ඒවා ඔක්කොටම එකඟ වුණා. ඩිව් ගුණසේකර ඇමතිතුමාගෙන් අහන්න.

ගරු ඩිව් ගුණසේකර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு டியூ குணசேகர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Rehabilitation and Prison Reforms)
ඔව්, ඔව්.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා, අපි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එකඟ වෙලා, තමුන්නාන්සේ Report එකත් ලෑස්ති කළා, recommendation එකට. අපි අත්සන් නොකරපු එක නේ වුණේ. කවුරුවත් අත්සන් කරලා නැහැ. නමුත් තමුන්නාන්සේගේ යුතුකම කළා, Seventeenth Amendment එකේ Report එක හැදුවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
බැන් කී මූන්ගේ Report එක - [බාධා කිරීම්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ ප්‍රශ්න අහන්න, මම උත්තර දෙන්නම්. ඒක සභාවෙන් එළියට ගිහින් කරමු. මේක පාර්ලිමේන්තුව නේ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
හා, හොඳයි, හොඳයි. [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම තමුන්නාන්සේ එක්ක කථා කළේ නැහැ නේ. බැන් කී මූන්ට ඔය දොර ඇරලා දුන්නේ කවුද? ඒක තේරුම් ගන්න. [බාධා කිරීමක්] ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, කරුණාකරලා එතුමාට කියන්න, - මගේ යාළුවා තමයි, මගේ නෑදෑයා තමයි - ශබ්ද නැතුව වාඩි වන්න කියලා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා මට වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පතේ දෙවන වගන්තියේ ඒ කාරණය පැහැදිලි කර දුන්නොත් වටිනවා. පනත් කෙටුම්පතේ අනෙක් කාරණා සියලු දේටම අපි එකඟයි. ඒක අත්‍යවශ්‍ය දෙයක්. හමුදාවේ නිලධාරීන් පිළිබඳව, රජයේ අනිකුත් සේවකයන් පිළිබඳව බොහොම පැහැදිලියි. හමුදාවේ නිලධාරීන් පිළිබඳව තිබෙන කොටසේ කිසිම ප්‍රශ්නයක් නැහැ, ඒවා පැහැදිලියි. අපිට ප්‍රශ්නය තිබෙන්නේ අනෙක් කොටස් ගැන. ඒක සාමාන්‍ය විශ්‍රාම වැටුප් පනත යටතේ තිබෙන්නේ. ඒකයි මම කිව්වේ, මේ පනත් කෙටුම්පතේ දෙවන වගන්තිය පොඩ්ඩක් පැහැදිලි කර දෙන්නය කියලා. ඒක අමාත්‍යතුමාගේ කථාවෙනුත් හරියාකාරව පැහැදිලි වුණේ නැහැ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
හොඳයි, මම පැහැදිලි කර දෙන්නම්.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම දැන් සම්පූර්ණයෙන් වෙනත් තැනකටයි යන්නේ. ඒ, ඇමතිතුමා මාර්ගයෙන් රජයට. කම්කරුවෝ ගැන කථා කරන තවත් ඇමතිවරු අපේ ඉන්නවා. අද මේ රටේ විශාල ධන සම්භාරයක් අයිති මේ රටේ වැඩ කරන ජනතාවටයි. මේක රහසක්ද? සේවක අර්ථසාධක අරමුදලේ රුපියල් බිලියන 700කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා- [බාධා කිරීමක්] නැහැ. සියලු දෙනාටමයි කිව්වේ. රුපියල් බිලියන 700කට වැඩි ප්‍රමාණයක මුදලක් සේවක අර්ථසාධක අරමුදලේ තිබෙනවා. සේවක භාරකාර අරමුදලේ තිබෙනවා, රුපියල් බිලියන 107කට වැඩි ප්‍රමාණයක මුදලක්. [බාධා කිරීමක්] රාජ්‍ය සේවයේ, අග්‍රහාර යටතේ ගත්ත මුදල් ප්‍රමාණය ගැන මම හරියට දන්නේ නැහැ.- මේ මුදල් සම්භාරය එක්කහු කරපුවාම මේ රටේ වැඩ කරන ජනතාවගේ, ඒ කියන්නේ සංවර්ධනයේ කොටස්කාරයන්ගේ මුදල්. දෙපැත්තේම. එකක් සේවයේ, අනෙක සංවර්ධනයේ. නමුත් අද ඒ අය නිහන්නන් බවට පත් වෙලා තිබෙනවා. මේක අවිවාදයෙන් පිළිගත යුතුයි. මම කියන්නම් එයින් කාරණා කිපයක්.

අද අපි සංසන්දනය කරලා බැලුවොත්, විශ්‍රාම වැටුපක් ලබන සමහර අය ඉන්නවා, රුපියල් 6,000යි, 7,000යි තවම විශ්‍රාම වැටුප ගන්නේ. ඒ හා සමාන වෘත්තියේ ගුරුවරු ඉන්නවා, අලුතින් විශ්‍රාම යන කොට රුපියල් 20,000ට ඉහළ විශ්‍රාම වැටුපක් ගන්න. මේ පරතරය අරන් බලන්න ජීවත් වන්න පුළුවන්ද කියලා. මේ විෂමතාව ඉවත් කරන්න ඕනෑ. මේක වැදගත්. අද රජයේ මුල් පත්වීම ලබන කොට වැටුප රුපියල් 11,000ක් විතර තිබෙනවා. සමහර දෙනෙකුට රුපියල් 20,000ක් ලැබෙන කොට සමහර අයට හම්බ වන්නේ රුපියල් 6,000යි. මේ පරතරය බලන්න. බරපතළ අසාධාරණයක්. මේකට තමුන්නාන්සේලා වහාම විසඳුමක් ගෙනෙන්න ඕනෑ. නැත්නම් මේ පනත් කෙටුම්පත් සියල්ලම හොඳයි, ඒ අයිතිවාසිකම් දෙන එක හොඳයි. අද විශ්‍රාමිකයන්ගේ මූලික අයිතිය ජීවත්වීමේ අයිතියයි. විශ්‍රාම ගිය හැම දෙනාම අද ජීවත් වන්න ඕනෑ; කෑම වේලක් ගන්න ඕනෑ; බෙහෙත් හේත් ගන්න ඕනෑ; දරුවන්ට සලකන්න ඕනෑ. මුනුබුරන්ට සලකන්න ඕනෑ. දැන් මේ අසහනයෙන් ඉන්න අයට අපි දෙන උත්තරය මොකක්ද? මේ වාගේම තමයි මම කිව්ව පෞද්ගලික අංශයේ සේවකයෝත්. මේ තත්ත්වයටමයි වැටෙන්නේ. අද රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුපක් යන්තම් හරි තිබෙනවා. පෞද්ගලික අංශයේ අයට තිබෙන්නේ අර්ථ සාධක අරමුදල විතරයි. ඒක ගත්තා; වියදම් කළා; ඉවර වුණා. මා රජයට යෝජනා කරන්නේ මේ රටේ පූර්ණ වෙනසක් ඇති කරන්න නම්, මේ රටේ සංවර්ධනයට හවුල් වන වැඩ කරන ජනතාව අපි ශක්තිමත් කළ

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

යුතු බවයි. කොහොමද අපි ඒ අය ශක්තිමත් කරන්නේ? මේ අයව ආයෝජනයට යොමු කරන පිළිවෙළක් අපි හදමු. මෙන්න එක්කාසු වන්න පුළුවන් තැන්. මොනවාද ආයෝජන? මේ පාර්ලිමේන්තුවේ කථාවල අනන්තවත් ඇති, රාජ්‍ය සේවකයන්ට ඉඩමක් ගන්න ගෙයක් හදන්න ණයක් දෙන්න කියලා. තමුන්නාන්සේලා පොරොන්දු වුණා සියයට හතේ පොලියට, හතරේ පොලියට දෙනවා කියලා. ඒ කාර්යය බැංකුවට පැවරුවා. නමුත් හම්බ වුණේ නැහැ. මා ඒකට දොස් කියන්නේ නැහැ. මම අහන්නේ මේකයි. වැඩ කරන ජනතාවගේ මේ සා විශාල මුදලක් තියෙද්දී ඇයි මේ අයට ගෙයක් හදා ගන්න මුදලක් දෙන්න බැරි? උක්සාහ කරලා බලන්න. අපි එකතු වෙලා කථා කරලා බලමු ඒක කරන්න. පුළුවන් වෙලාවක ගෙවන්න මේ අයට දීර්ඝ කාලීන ණයකට ලක්ෂ 10ක් දෙන්න. සමහර විට පොලියක් නැතිව දෙන්න පුළුවන්. නැත්නම් පොඩි පොලියක්, සේවා ගාස්තුවක් surcharge එකක් අය කරලා දෙන්න පුළුවන්. ඒක ඉල්ලන්නේ රජයෙන් නොවෙයි. ඒ ගොල්ලන්ට අයිති කොටසෙන් දෙන්න කියලායි ඉල්ලන්නේ. ඒවා ඒ ගොල්ලන්ගේ මුදල්. ඒ නිසා ඒ ගොල්ලන්ට අයිතියක් තිබෙනවා. සමස්තයක් හැටියට මේ ගැන රජයට හිතන්න පුළුවන් නම් අපි උදවු වෙන්නම්. අපි දන්නා පිළිවෙළට මේ පිළිබඳව අපේ අදහස් දෙන්නම්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් මම මේ කථා කරන්නේ රජයට. ඔබතුමාටම මේ කටයුතු භාර නැහැ. බිලියන දාහකට වඩා තිබෙන වැඩ කරන ජනතාවගේ සල්ලි තමයි රජය පාවිච්චි කරන්නේ. රජය පාවිච්චි කළ යුතුයි. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. සේවකයෙකුගේ හෘදය සැත්කමක් - heart surgery එකක් - කරන්න වුණොත් ජනාධිපති අරමුදලින් කීයද දෙන්නේ? එක්ලක්ෂ පණස්දාහයි. ඇයි අපි ජනාධිපති අරමුදලින් ඉල්ලන්නේ? අනෙක් සල්ලි ටික එකතු කරන්න කොහේටද යන්නේ? තමුන්නාන්සේලා ළඟට එනවා. අපි ළඟට එනවා. එහෙම නැත්නම් මේ රජයේ සේවකයා, පෞද්ගලික අංශයේ සේවකයා ලැයිස්තුවක් හදා ගෙන සල්ලි හොයා ගෙන යනවා. අද මේක සමාජයේ සිද්ධ වන, මේ සමාජයේ ඇති තත්ත්වයක්. ඇයි මේ ගොල්ලන්ගේ heart surgery එකේ සම්පූර්ණ වගකීම මේ Fund එකට භාර ගන්න බැරි? මොකක්ද ප්‍රශ්නය? සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, අග්‍රහාර කියන මේ ඔක්කොම එක්කහු කරලා ඇයි ඒ වගකීම භාර ගන්න බැරි? මේ සැත්කම කර ගන්න බැරිව අද රජයේ සේවකයෝ කී දෙනෙක් ඉස්පිරිතාලවල ඉන්නවාද?

මේ රට සංවර්ධනයේ කොටස්කාරයින්ට,- [බාධා කිරීමක්] කරුණාකර මා කථා කරන කොට බාධා කරන්න එපා. ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එතුමන්ලාට කථා වෙලාව දෙන්න. [බාධා කිරීම්] මෙහෙම බාධා කරන එක හරි නැහැ නේ. [බාධා කිරීමක්] කෙනෙක් කථා කරද්දී, යම් කිසි තර්කයක් ගොඩ නහා ගෙන එද්දී,- [බාධා කිරීමක්] මේ මගේ වෙලාව ගත වෙන්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කලින් பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please sit down.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) මේර්වින් සිල්වා)
(The Hon. (Dr.) Mervyn Silva)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කලින් பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(මාණ්පුමිකු එම්. ජෝසප් මයිකල් පෙරේරා)
(The Hon. M. Joseph Michael Perera)
මට ඉඩ දෙන්න බැහැ. [බාධා කිරීමක්] මොකක්ද මේ විහිළුව? [බාධා කිරීමක්] රජයට සහයෝගය දෙනවා කියලා මෙච්චර හොඳට සාකච්ඡාවක් කර ගෙන එද්දී මොකක්ද මේ විහිළුව? [බාධා කිරීමක්] තමුන්නාන්සේ කියන දෙය අහන්න මම සූදානම් නැහැ. මේ මගේ වෙලාව. මමයි කථා කරන්නේ. මට කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කලින් பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please sit down.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(මාණ්පුමිකු එම්. ජෝසප් මයිකල් පෙරේරා)
(The Hon. M. Joseph Michael Perera)
ගරු ඇමතිතුමනි, මේ සාකච්ඡාවට වැදගත් පිළිවෙළට මම ඉදිරිපත් කරන තර්ක මේ. මම හැම දාම කථා කරන එකක්. අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා දන්නවා. කොයි ඇමතිවරු හිටියත් හැම දාම මම කථා කරලා තිබෙනවා. අද මේක සමාජයේ ප්‍රශ්නයක් නොවෙයිද? නිවාස ණය ගන්න කියලා පළමුවන වතාවට සේවක අර්ථසාධක අරමුදල පනත වෙනස් කළේ මමයි. ඒ ගැන දන්නේ නැත්නම් දන්නා මිනිසුන්ගෙන් අහ ගන්න ඕනෑ බොරුවට කෑ ගහන්නේ නැතිව. [බාධා කිරීමක්] පළමු වැනි වතාවට අපි සේවක භාරකාර අරමුදලෙන් සැත්කම්වලට ආධාර දුන්නා. [බාධා කිරීමක්] සම්පූර්ණ මුදල නොවෙයි. කවුද ඒක කළේ? ඒ ගැන අපි කල්පනා කරන්න ඕනෑ. [බාධා කිරීමක්] දරුවන්ට පොත් ගන්න සල්ලි දුන්නා. කවුද ඒක කළේ? එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ. මමත් ඒකේ කොටස්කාරයෙක්. [බාධා කිරීමක්] මේ ගැන අපි කල්පනා කරන්න ඕනෑ. [බාධා කිරීමක්] මම කථා කරන කොට තවත් කථාවක් කරන්න යනවා නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද මේ විහිළුව? [බාධා කිරීමක්] මම බාධා කළ යුතු විධියට කථා කරන්න ගියේ නැහැ. [බාධා කිරීමක්]

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) මේර්වින් සිල්වා)
(The Hon. (Dr.) Mervyn Silva)
මේ බලන්න කෝ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කලින් பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න කෝ. [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(මාණ්පුමිකු එම්. ජෝසප් මයිකල් පෙරේරා)
(The Hon. M. Joseph Michael Perera)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, තමුන්නාන්සේට පුළුවන්ද තමුන්නාන්සේගේ පැත්තේ මිනිසුන්ව පාලනය කර ගන්න? මොකක්ද මේ විහිළුව? තමුන්නාන්සේට බැරි නම්,- [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනයට කියන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

නැහැ, නැහැ. තමුන්නාන්සේත් වග කිව යුත්තෙක් මෙතැන. තමුන්නාන්සේත් වග කිව යුත්තෙක්. මා සංවිධායක හැටියට හිටපු කාලයේ මගේ පැත්තේ කවුරු හරි ඔය වාගේ හැසිරුණා නම් මම ඒක නතර කරනවා. මම ඒක කරලා තිබෙනවා. මොකක්ද මේ විහිළුව? කරුණාකර මේ ක්‍රමය වෙනස් කරන්න. මේ වැදගත් පාර්ලිමේන්තුවේ අද තිබෙන මේ ක්‍රමය වෙනස් කරන්න. නැත්නම් අපට කථා කරන්න බැරි වනවා. අපට කථා කිරීමේ අයිතිය තිබෙනවා. අනෙක් අයට තිබෙනවා අසා ගෙන සිටීමේ අයිතිය. ඒ දෙකම තිබෙනවා. මෙහෙම නැඟිටලා කෑ ගහනවා නම් අපට අදහස් දක්වන්න හම්බ වන්නේ නැහැ. අපි කාටවත් බණින්නේ නැතිව, රජයට බණින්නේ නැතිව මේ තරම් හොඳට කථා කරනවා නම්, මේ රටේ ජනතාවගේ අයිතියක් පිළිබඳව කථා කරනවා නම් ඒක තමුන්නාන්සේලා පිළිගන්නා දෙයක් වෙන්න ඕනෑ. මම දන්නවා පිළිගන්නා බව. අපි එකට එක්කාසු වෙලා වැඩ කරමු.

අද තමුන්නාන්සේලා කියනවා අලුතෙන් විශ්වවිද්‍යාල විවෘත කරනවා කියලා. පෞද්ගලික විශ්වවිද්‍යාල. එහෙම විවෘත කරන කොට පිරිසක් එන්නේ සල්ලි දීලා ඉගෙන ගන්න. හොඳයි. මේ වැඩ පිළිවෙළ තමුන්නාන්සේලා අනුමත කරනවා නම් අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා, මේ රටට ගැළපෙනවාද කියා බලලා, අපේ විශ්වවිද්‍යාල නැති නොවන තත්ත්වයට මේ වැඩේ කරන්න පුළුවන් නම් අපි ඒ ගැන බලමු. පළමුවැනි පෞද්ගලික විශ්වවිද්‍යාලය -මෙඩිකල් කොලෙජ් එක- ඇති කළේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා. ඒකට ඔක්කෝම විරුද්ධ වුණා. අන්තිමේදී අපේම ආණ්ඩුවෙන් ඒක වැහුවා. වහලා ඒක රජයේ එකක් කළා. ඒ රාගම ඉස්පිරිතාලයේ තිබෙන තට්ටු ගොඩනැඟිල්ල සම්පූර්ණයෙන්ම හැදුවේ විදේශවලින් ආපු ළමයින්ගේ සල්ලිවලින්. අපේ ළමයින් ගියා. ඒ නිසා මම විරුද්ධ නැහැ, අපේ විශ්වවිද්‍යාල ආරක්ෂා වන පිළිවෙළට ඒ කටයුත්ත කරනවාට. නමුත් මා කියන්නේ ඒකේ ප්‍රතිශතයක් මේ රටේ වැඩ කරන ජනතාවගේ දරුවන්ට වෙන් කරලා අපේ මේ අරමුදලෙන් ගෙවලා උගන්වන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න කියලායි. හිහන්නන් විධියට නොවෙයි. මේවා ඒ මිනිසුන්ගේ සල්ලි. වැඩ කරන ජනතාවගේ සල්ලි. ඒ නිසා රජයේ සේවකයන්ගේ, පෞද්ගලික අංශයේ වැඩ කරන අයගේ දරුවන්ට ඒ විශ්වවිද්‍යාලයට යන්න ඉඩ සලසන්න.

අද තමුන්නාන්සේලාට බැලුවොත් පෙනේවි විදේශ විනිමය කොච්චර පිට රටට යනවාද කියලා. අධ්‍යාපනයට කී දෙනෙක් යනවාද රටින් පිට? රාජ්‍ය අංශයේ වැඩ කරන සේවකයෝ, පෞද්ගලික අංශයේ සේවකයෝ තමන්ගේ ගෙවල් උකසට තියලා දරුවන් පිට රට යවනවා. ඒ දරුවන් මෙහේට ආවාම අපි රස්සා දෙනවා වෛද්‍යවරු හැටියට. ඒක නේ කරන්නේ. එහෙම නම් මේ අලුතෙන් ඇති කරන විශ්වවිද්‍යාලයට ඒ සුදුසු දරුවන් යවන්න මේ මුදලින් වියදම් කරන්න අපට බැරිද? මේ ගැන කල්පනා කරලා බලන්න. සේවකයා විශ්‍රාම - pension - යන කොට නැත්නම් සේවයෙන් අයින් වෙලා යන කොට ගෙයක අයිතිකාරයකු හැටියටයි යන්නේ. අද ඒ ගේ හදන්න යන්නේ රුපියල් ලක්ෂ 10යි නම් විශ්‍රාම යන කොට ඒ ගෙයි වටිනාකම රුපියල් ලක්ෂ 50ට වැඩි වනවා. Pension යනකොට සේවක අර්ථසාධක අරමුදලේ හෝ සේවක භාරකාර අරමුදලේ හෝ මුදල් අර ගෙන කවදාවත් ගෙයක් ගන්න පුළුවන්ද? බැහැ. නමුත් අපි මේ මුදල ආයෝජනය කරන්න ඉඩ දුන්නොත් මේ ටික කරන්න පුළුවන්.

සිංගප්පූරුවේ වෘත්තීය සමිති නායකයෙක් හිටියා දේවන් නායර් කියලා. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, තමුන්නාන්සේ දන්නවා ඇති. එතුමා මොකක්ද කළේ? එතුමා සම්පූර්ණයෙන්ම ව්‍යාපාර ලෝකයට බැස්සා වෘත්තීය සමිති ව්‍යාපාරය සමඟ. විශාල ජයග්‍රහණයක් ඒ අය ලබා ගත්තා. ඒ අය සංවර්ධනයේ කොටස්කාරයන් වුණා. ඒ නිසා සංවර්ධනයේ කොටස්කාරයන් හැටියට මේ අයත් පත් කරන්න. මම කම්කරු අමාත්‍යාංශයේ හිටියා ඇමතිවරයා හැටියට. ඊට ඉස්සෙල්ලා මම හිටියේ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට. මම නියෝජ්‍ය ඇමතිවරයා හැටියට ඉන්න කොට මගේ ගරු අමාත්‍යතුමා හැටියට හිටියේ කැප්ටන් සී.පී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා. එතුමා මට භාර දීලා තිබුණා EPF එක; සේවක අර්ථසාධක අරමුදල කරන්න කියලා. මොකද, එතැන වැඩ ඔක්කෝම අක්‍රිය වෙලා තිබුණේ. මම භාර ගත්තා. මට ලිඛිතව ඒ කටයුත්ත භාර දීලා තිබුණා. දැන් මගෙන් ප්‍රශ්න අහන අයට ගිහිල්ලා සොයා බලන්න පුළුවන් ඒක ඇත්තද කියලා. මොකක්ද මම කළේ? රාජ්‍ය සේවකයෝ හිටියා ඒ ආයතනයේ. ඒ අය ගෙන්වලා මම ඒ අයට කිව්වේ මොකක්ද? සල්ලි එක්කාසු කරන්න බැරි ලොකු ප්‍රශ්නයක් තිබුණා. ඒ ලොකු ප්‍රශ්නයේදී මම ඒ අයට කිව්වේ මොකක්ද? OT දෙන්නේ නැහැ, incentives දෙන්නම් කිව්වා. OT දෙන කොට සමහර විට වැඩ නොකරන මිනිසුන්ටත් OT දෙන්න වෙනවා. මම කිව්වා, incentives දෙන්නම් කියලා. Files 25ක වැඩ කළ මනුෂ්‍යයා files 50ක වැඩ කරන්න පටන් ගත්තා. සමහර අය රුපියල් තිස්දාහ, රුපියල් හතළිස්දාහ හම්බ කළා. වැඩේ ඉවරයි. රජයට සල්ලි හම්බ වුණා. මම කියන්නේ කොටස්කරුවන් හැටියට ඔවුන්ට මේ සංවර්ධනයේ ලාභ ලබන්න ඉඩ දෙන්න කියායි. සේවයක් කරන මේ රාජ්‍ය සේවකයා ඉතා හොඳයි. හොඳ සේවකයෝ ඉන්නවා. අපි සියලු දෙනාම නරකයි කියන්නේ නැහැ. මේ රටට, මේ ජනතාවට ආදරයෙන් වැඩ කරන විශාල පිරිසක් ඉන්නවා. මේ විශාල පිරිසට අප කරන අගැයීම මොකක්ද? අවසානයේදී ඔවුන්ට ගෙයක් නැහැ. ගරු ඇමතිතුමනි, හොඳට වැඩ කළ, අවංකව වැඩ කළ ස්ථිර ලේකම්වරු සිටිය බව මම දන්නවා. ඒ අය විශ්‍රාම යන කොට ඒ අයට ඉන්න ගෙයක් නැහැ. මේකයි තත්ත්වය. විනිශ්චයකාරවරු ඉන්නවා. හරියට වැඩ කර විශ්‍රාම යන කොට ගෙයක් නැහැ. හරියට වැඩ නොකළොත් ගෙවල් තුන හතරක් තියේවි. මේක තමයි තත්ත්වය. එහෙම නම් පිරිසිදු සේවයක් කරන්නටත්, ඒ අයගේ කොටස ලබා දෙන්නටත් අපි කටයුතු කරනවා නම් තමුන්නාන්සේලා අලුත් යුගයකට මේ රට ගෙන යනවා.

දැන් අපි කථා කළේ රාජ්‍ය සේවය ගැන විතරයි. මම කථා කළේ මේ රටේ සංවර්ධනයට හවුල් වන පෞද්ගලික අංශයේ පිරිස ගැන විතරයි. තව පිරිසක් ඉන්නවා. එනම් රටේ සංවර්ධනයට අතිවිශාල දායකත්වයක් දරන කාන්තාවෝ. මේකත් වැදගත් දෙයක්. මේ දෙවන යෝජනාව. මේ රටේ සේවා අංශයේ, එනම් අධ්‍යාපනයේ, සෞඛ්‍ය අංශයේ සේවාවල යෙදී සිටින අයගෙන් බහුතරයක් කාන්තාවෝ. ආදරය තිබෙන අය; පාලනයක් කරන්න පුළුවන් අය. ඒ වාගේම චතු අංශය බලන්න. ඒ වාගේම විදේශ රැකියාවල නියුතු අය බලන්න. කවුද මේ රටට මුදල් ගෙනෙන්නේ? කවුද මේ රටට අතිවිශාල සේවයක් කරන්නේ? මේ අය මොකක්ද කර තිබෙන්නේ? අද ගෙදර ඉඳ ගෙන වැඩ කරන කාන්තාව කරන වැඩවල ප්‍රමාණය බැලුවොත්, පිට ගිහිල්ලා කළා නම් රුපියල් 30,000ක, 40,000ක පඩියක් ලබන වැඩ කොටසක්. උදේ නැඟිටලා දරුවන්ගේ වැඩ කරනවා; අපේ වැඩ කරනවා. කොච්චර වැඩ කරනවාද? කොච්චර ඉතුරු කරනවාද? මේ අයට කිසිම වග කීමක් මේ සමාජය දීලා නැහැ. ඒ අය housewivesලා හැටියට අපි කොන් කරලා ඉන්නවා.

සමෘද්ධිය ගැන කථා කරන විට තමුන්නාන්සේලා දන්නවා, සමෘද්ධියට එක් වන පිරිසෙන් බහුතරයක් කාන්තාවන් බව. මා තමුන්නාන්සේලාට අදහසක් දෙනවා. අපි එක්කාසු වෙලා කරන්න පුළුවන් ද කියා බලමු. රුපියල් 10,000ට අඩුවෙන් ආදායමක් තිබෙන මේ සෑම දරු පවුලකටම, රුපියල් 10,000න් එහාට මාස පතා ආදායම ගෙන යන්න යම් කිසි වැඩ පිළිවෙළක් -ස්වයං රැකියාවක් හෝ වෙන ණයක් හෝ- අපට දෙන්න පුළුවන්ද? මම ඔබතුමාට උදාහරණයක් කියන්නම්. මේවා හරිද, වැරදිද කියා තමුන්නාන්සේලා තර්ක කරන්න. දරුවන්ට පාසල් නිල ඇඳුම්

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

දෙනවා. ඒ ඇඳුම් දෙන තැන ඉඳලා අනවශ්‍ය වියදමක් යනවා. පගා ගහනවා කියා මම කියන්නේ නැහැ. ඒ වචනය මම පාවිච්චි කරන්නේ නැහැ. ඇඳුම් කපන තැන ඉඳලා, ඇඳුම් ප්‍රවාහනය කරන තැන ඉඳලා, ඇඳුම දරුවාට දෙන කොට රුපියල් 100 නම් තවත් 150ක් අනික් වැඩට වියදම් වෙනවා. මේක පාලනය කරන්න. මේක දැනුවත් කරන්න. ඇයි අපට බැරිද, අර අම්මාව නායකත්වයේ තියා ගෙන ඒ මුදල අම්මාට දෙන්න ක්‍රමවේදයක් හදන්න? ඒ අම්මා මේ වැඩ කොටස ඉතා හොඳට කරයි. අපි අවංකව කථා කරනවා නම් සමෘද්ධිය දෙන කොට කොයි ආණ්ඩුවෙන් දුන්නත් කොයි තරම් රස්තියාදුවක්ද? කොයි තරම් පාවිච්චි කිරීමක්ද? ඒ අය මේ රට වෙනුවෙන් වැඩ කරන ජනතාව. ඒ මුදල කෙළින්ම ඒ පවුලට ලැබෙන්න සලස්වන්න. එතකොට ඒක දෙ ගුණයක් වනවා. කාලය ඉතුරු වනවා. පෝලිම්වල සිටින එක නතර වනවා. මේ විධියට ගත්තොත් මේ රජය දෙන ආධාරවලින් විතරක් රුපියල් 5000ක් විතර ඒ පවුලට ඉතුරු වනවා.

අනික් පැත්තෙන් සෞඛ්‍යය ගැන බලන්න. ඒ සෞඛ්‍ය වැඩ පිළිවෙළ හරියට කර ගත්තොත් ඒ ඉතුරු වන මුදල් ප්‍රමාණය ඒ අම්මා ඉතුරු කරනවා. මේවා පිළිබඳව හොඳට සොයා බලා අධ්‍යයනය කර ඒ පවුලට බලය දෙන්න. ඒකට ජනතාව කැමැතියි. සහනාධාර දෙනවා නම් ඒ දෙන සහනාධාරය ඒ පවුලක මාසික ආදායම රුපියල් 10,000න් එහාට යන පිළිවෙළට ඒ පවුල නායකත්වය තියා ගෙන දෙන්න; භාර්යාව නායකත්වය තියා ගෙන දෙන්න. මේ පරිවර්තනය මේ රටේ විය යුතුයි.

අපි කථා කරනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන. අපි කථා කරනවා, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන. ඒ වාගේම අපි කථා කරනවා, මැතිවරණ ගැන. අපි යම් යම් එකඟතාවන්වලට ඇවිල්ලා තිබෙනවා. ඒක බොහොම හොඳයි. අපි කවුරුත් රැවටෙන්නේ නැතිව මේ රට වෙනුවෙන් කථා කරලා හොඳට වැඩ කටයුතු කරගෙන යනවා නම් හොඳයි. මේ වාගේ වැඩ පිළිවෙළවලුත් ඊට ඉස්සරහින් යන්න ඕනෑ. ඒ යන වැඩ පිළිවෙළට අප සියලු දෙනාගේම ශක්තිය, ධෛර්යය තිබෙනවා නම් හැම කෙනකුටම pension එකක් හම්බ වනවා කියලා මා හිතනවා. ඉන්න ගෙයක් හම්බ වනවා කියන්නේ ඒක pension එකේ කොටසක් නේ. දරුවනුත් ආදරයෙන් භාර ගනීවි. ඒ නිසා මා කියනවා, වැඩ කරන ජනතාවට ඉඩමක අයිතිය ලබා දෙන වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑය කියා. ඒ වාගේම තමුන්ගේ සෞඛ්‍යය පිළිබඳ ප්‍රශ්නයක් වුණත් -බරපතළ එකක් - ඒක ඔවුන්ට විඳ දරා ගන්න බැහැ. ඒ සඳහා මේ තිබෙන අතිවිශාල ධනස්කන්ධයෙන්, - ඒ ගොල්ලන්ගේ සල්ලිවලින්- දෙන්න තිබෙන ආධාරය දෙන්න. ඒකට කවුරුත් මොනවාවත් කියන්නේ නැහැ. අපි එකඟයි.

ඒ වාගේම ඒ දරුවන්ගේ අධ්‍යාපනයට මේ අරමුදලින් මුදල් දෙන්න. අද පිට රට යන දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය මුදල් මේ අරමුදලින් දෙන්න. එතකොට මේ අරමුදල නැති වෙන්නේ නැහැ. හොඳ ආයෝජනයක් වෙන්නේ. අධ්‍යාපනයට, universitiesවලට මේ රටේ ජනතාවගේ මුදල් කොච්චර වැය කරනවාද? මා මේ කියන්නේ ඒ සාමාජිකයින්ගේ මුදල් ටිකවත් ඒ ගොල්ලන්ට හරියට ආයෝජනය කරන්න දෙන්න කියලායි. ඒක අපි අරගෙන වෙන මාර්ගයකින් යවන්න එපා. ඒ ගොල්ලන්ට අයිති කොටස දෙන්න. මේ කොටස දුන්නොත් මේ රටේ විශාල දේශපාලන පරිවර්තනයක් වනවා. මේ රටේ විශාල ආර්ථික පරිවර්තනයක් වනවා. මේකට අපි ඔක්කෝටම අත් වැල් බැඳ ගන්නට පුළුවන්. මේකට දේශපාලන වශයෙන් කවුරුත් වෙනස් වන්නේ නැතිව එකතු වෙන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ඉන්න විවිධ දේශපාලන පක්ෂවල, කම්කරු ව්‍යාපාරවල යෙදිලා ඉන්න හැම දෙනාටම මේකට ඉදිරිපත් වෙන්න පුළුවන්. මා තමුන්නාන්සේලාට මතක් කරනවා, ඒකට තමුන්නාන්සේලා එක්ක සාකච්ඡා කරන්න එක්සත් ජාතික පක්ෂය ලෑස්තියි කියලා. මේ වෙනස අපි ගමට අරගෙන යන්න ඕනෑ. ගමේ දරු පවුලක කෙනකු හෝ අහිංසකයෙක් නැත්නම් හිහමන් ඉල්ලන කෙනෙක්, "සමෘද්ධිය පස්සේ යන කෙනෙක්" කියලා කොන් කරන්නේ නැතිව, බාල්දු කරන්නේ නැතිව ඔහුව නැත්නම් ඇයව ඒ සමෘද්ධිය තුළින්, ඇඳුම තුළින් දේශපාලන පෙළපාලියේ අරගෙන යන්නේ නැතිව ඔවුන්ට ආත්ම ගරුත්වයක් ඇතිව වැඩ කරන්න අපි ඉඩ දෙනවා ද, අන්න එතැනයි අපේ එක්සත්කම; අපේ එකමුතුකම. තමුන්නාන්සේලාත් හෘද සාක්ෂියට එකඟව රට හදන්න යනවා. ඒක හරි. අපිත් හෘද සාක්ෂියට එකඟව රට හදන්න යනවා. අපි ඔක්කෝටම එක්කහු වෙන්න තිබෙන තැන මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක ගැන අපි කථා කරන කොට අපිට ජාති භේදයක් නැහැ. අපිට සිංහල අය, ද්‍රවිඩ අය, මුස්ලිම් අය -මේ ඔක්කෝම- එකයි. අද මෙතුමා කිව්වා, යුද්ධය නිසා වැන්දඹුභාවයට පත් වුණු අය හතළිස්දහසක් විතර ඉන්නවා කියලා. මේ අයත් විශාල රාජකාරියක් කරන්න භාර ගන්න පුළුවන් අය. මේක අමතක කරන්න එපා.

ඒ වාගේම මේ මාතෘකාවෙන් පොඩ්ඩක් එහාට ගිහිල්ලා තමුන්නාන්සේලාට තවත් කාරණයක් පිළිබඳව මා මතක් කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් අලුතෙන් පදිංචි කිරීම් කරනවා. මේක ගැන අපට අලුත් විධියට හිතන්න බැරිද? අපි මේ ගැන අලුත් විධියට හිතලා බලමු. ඒ අය අර හිටපු තැනම පදිංචි කරනවා වෙනුවට ඒ ගොල්ලන්ගේ ඒ ගමේ තිබුණු ආගම, ජාතිය, කුලය ඔක්කෝම ආරක්ෂා වන පිළිවෙළට එක තැනකට ගෙනැල්ලා තට්ටු ගෙවල් ටිකක් හදලා - අපි හිතමු ගෙවල් 500ක් හැදුවා කියලා- ඉස්කෝල, ඉස්පිරිතාල එතැනට ගෙනැල්ලා, පහසුකම් ඔක්කෝම දීලා පදිංචි කළොත් වියදම කොච්චර අඩු වනවා ද? එවිට බස්වල යන්න ඕනෑ නැහැ. ඉස්පිරිතාල ගානේ යන්න ඕනෑ නැහැ. වුවමනා කරන්නේ ඒ ගෙදර ජීවත් වන මනුෂ්‍යයාට ඒකට වැය වුණ මුදල ගෙවන්න පුළුවන් තත්ත්වයට, යැපෙන්න පුළුවන් තත්ත්වයට ආදායමක් නිර්මාණය කරන එක විතරයි. එහෙනම් අලුත් රටක් බිහි වෙනවා. අලුත් සැලසුමක් ඇති වනවා. අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා මේ අවස්ථාවේ සභා ගර්භයේ ඉන්නවා. එතුමා එදා මේ සම්බන්ධයෙන් විශාල සේවයක් කරගෙන ගියා, UDA එක හරහා. අඩු පාඩුකම් එහෙමත් තිබෙනවා. අපි ඒවා ගැන කථා කරන්න යන්නේ නැහැ. දැන් එතුමා ඒ අදහස අත් හැරලා වෙන අදහසකට ගිහිල්ලා තිබෙනවා. නමුත් මේ රටේ සැලසුම් නැතිව සකස් කරපු ගම්මාන කොච්චර තිබෙනවා ද? නගර කොච්චර තිබෙනවාද? සැලසුමක් නැතිව ඉදි වන ගම්මාන තමයි තිබෙන්නේ. අද මොකක්ද කරන්නේ? අද ගිහිල්ලා ඒවායේ තිබෙන ඒවා ඔක්කෝම කඩලා අයින් කරනවා. මා කියන්නේ නැහැ ඒවා නරකයි කියලා. හරි නැත්නම් ඒ මිනිසුන්ව අයින් කරන්න ඕනෑ. නමුත් තව තැනක් දෙන්න ඕනෑ. ඒ අය අවුරුදු ගණනක් තිස්සේ pavement එකේ හරි කොහේ හරි හිටපු අය. ඒ අයව පාරට දමන්න බැහැ. නමුත් අපි පටන් ගන්නේ කොතැනින්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සැලසුමක් ඇති ගම්, නගර අලුතින් කිහිපයක්වත් අපට ඇති කරන්න පුළුවන්, ආදර්ශයක් හැටියට. මේකට හොඳම උදාහරණය තමයි දිවංගත ප්‍රේමදාස ජනාධිපතිතුමා -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, your time is over. Please wind up now.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Sir, how many minutes have I been allotted ?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have already taken five minutes more.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
No, I do not think so. I had 20 minutes. I should also get the 10 minutes saved from the Hon. Karu Jayasuriya's time.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, you had 20 minutes plus five minutes from his time. That is, 25 minutes.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Not five minutes. You have to add the 10 minutes from the Hon. Karu Jayasuriya's time. Please give me that time.

එහෙම නම් අලුත් රටක් ගොඩ නඟන්න යන මේ ගමනේදී අලුතින් හිතන්න. ආර්. ප්‍රේමදාස මැතිතුමා ගම් හැදුවා. ඒක අපි කවුරුත් දන්නවා. එතැන තිබුණා, පාර. එතැන තිබුණා, විදුලිය. දෙන්න පුළුවන් තැන්වලට වතුර දුන්නා. උපත් පාලනය පිළිබඳව එතුමා කියපු කථාවක් මට මතකයි. "මේ රටේ දුප්පත් අයට ස්ථිර ආදායමක් නැත්නම්, හොඳ ගෙයක් නැත්නම්, ඔහු ජීවත් වන්නේ පොල් අතු පැලේ නම්, හතර වටේටම පොල් අතු දිරලා, වහලත් දිරලා නම්, ඒ ගෙදර දරුවා අර වැලි පොළොවේ පය ගහගෙන අහස දිහා බැලුවේ ඒ දිරා ගිය පොල් අතු අතරින් නම්, එවැනි දරුවකු සඳහා කුඩා ගෙයක් දීලා, විදුලිය දීලා, සිමෙන්ති පොළොවක පය ගහන්න සලස්වා බලාපොරොත්තුවක් ඇති කළා නම් ඒ දරුවා එතැනින් නැඟිටිනවා. ඒ අම්මා, තාත්තා එදාට කල්පනා කරන්නේ තවත් දරුවෙක් හදන්න නොවෙයි; තවත් කාමරයක් හදන්නයි." එවැනි වැඩ පිළිවෙළවලින් සාර්ථක ප්‍රතිඵල මා අරගෙන තිබෙනවා. ජා ඇල මැතිවරණ කොට්ඨාසයේ ඒ විධියේ ගෙවල් තිබෙනවා. කුඩා ගෙයක් හැදුවා. කාමර දෙකක් හැදුවා. මේවා අපි ළඟ ඉඳ ගෙන කරපු දේවල්. අද අපට යන්න බැහැ. මොකද, ලොකුවට තාප්ප බැඳලා, මිනිස්සු වෙනස් වෙලා. එක පොල් ගහක්වත් නොතිබුණු තැන්වල අද පොල් ගස් තිබෙනවා. ඒවායේ පොල් කඩනවා. කරුණාකර අලුත් ගම්මාන, නගර සැලසුම් කිරීම පිළිබඳව වැඩ පිළිවෙළට යන්න. එතකොට මේ විශ්‍රාමිකයින්ට හොඳට ජීවත් වන්න පුළුවන් තත්ත්වයක් හදන්න පුළුවන්. මේක වැදගත්.

ඊ ළඟට ගරු ඇමතිතුමනි, මා නැවත වරක් තමුන්නාන්සේගේ අවධානයට යොමු කරනවා. අපේ කරු ජයසූරිය වැඩ බලන නායකතුමා කිව්වා වාගේ විශ්‍රාම යනවාය කියන්නේ සයිබීරියාවට යනවා වාගෙයි. අර යුනිෆෝම් එක ගළවපු කෙනා වාගෙයි නේ. නැහැ. ඔහු ඊට වඩා හොඳ තත්ත්වයට යන්න ඕනෑ. බෙහෙත් ටිකක් ගන්න බැහැ. මෙය විශ්‍රාම වැටුපට සම්බන්ධ කරන්න. අපේ පඩියෙන් යම් කිසි මුදලක් අඩු කරන්න. රජයත් ඒකට මුදලක් දෙන්න. ඒ වාගේම ඔහුට ඕනෑ කරන ඇඳුම් ටික නැහැ; බෙහෙත් ටික නැහැ. ඒ සමාජ තත්ත්වය ඔහුට නැහැ. විශ්‍රාම ගිය කෙනා අද ගෙදර අනාථ වුණු, අසරණ වුණු පුද්ගලයෙක් බවට පත් වෙලා ඉන්නවා. දැන් කල්පනා කරලා බලන්න. ඒ අයගෙන් ගත යුතු ප්‍රයෝජනය ගන්න. මේ ගන්න රුපියල් හයදාහ, හත්දාහ සමහර විට අර මා කිව්වා වාගේ බෙහෙත්වලටවත් මදියි. ඔහු කරපු සේවයට ප්‍රතිලාභය මොකක්ද? ඒ මුදල බෙහෙත්වලටවත් මදියි. බෙහෙත් ඊට වඩා ගණන් ගිහින්. පෙන්ෂන් එක ගණන් ගිහිල්ලා නැහැ. පෙන්ෂන් එකේ වටිනාකම අඩු වෙලා. ගරු ඇමතිතුමනි, මේ ක්‍රමවේදය තමුන්නාන්සේ රජයටත් කියලා විශේෂයෙන්ම රාජ්‍ය සේවකයා -හැම දාම තමුන්නන්සේලාට වැඩිපුර ඡන්දය දෙන කොටසක් රාජ්‍ය සේවකයා- පිළිබඳව හිතලා අලුත් විධියකට වැඩ පිළිවෙළක් හදන්න. විශ්‍රාම යන කොට ඒ විශ්‍රාම යන අයට හොඳ ගෙයක ඉන්න, විශ්‍රාම ගියාට පස්සේ බෙහෙත් ටිකක් ගන්න පුළුවන් විධියට පරිවර්තනය කරන්න. මේ එකකටවත් තමුන්නාන්සේලාගෙන් සල්ලි අවශ්‍ය වන්නේ නැහැ. ඔවුන්ගේම සල්ලි -මේ විශ්‍රාම අරමුදල- පාවිච්චි කරලා මේ කටයුත්ත කරන්න පුළුවන් කියලා මා යෝජනා කරනවා.

විශේෂයෙන්ම අපේ හමුදාවල සේවයේ නියුතුව සිට මේ රට වෙනුවෙන් දිවි පිදූ ඒ රණ විරුවන්ගේ භාර්යාවන්ට, ස්වාමිපුරුෂයන්ට, දරුවන්ට ලොකු සහනයක් ගෙන දෙන මේ වැඩ පිළිවෙළ මේකේම කොටසක් හැටියට ගෙන ඒම පිළිබඳව මගේත්, එක්සත් ජාතික පක්ෂයේත් විශේෂ ස්තුතිය තමුන්නාන්සේට පුද කරමින්, මේ පනත් කෙටුම්පත් දෙකටම අපේ සම්පූර්ණ සහයෝගය දෙනවාය කියා ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දිව්‍ය ලෝකයෙන් ලියුමක් ඇවිත් තිබෙනවා. විපක්ෂ නායකතුමා ගිය අවුරුද්දේ- [බාධා කිරීමක්] මිය ගිය කෙනකුට මේ අවුරුද්දේ හතරවන මාසයේ 30වන දා ලයනල් සරත් කියන අපේ ආදරණීය- [බාධා කිරීමක්] එහි මෙසේ සඳහන් වනවා. "අද දිනට යෙදී ඇති ඔබගේ උපන් දිනය -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Mervyn Silva, please sit down. කරුණාකරලා වාඩි වන්න. [බාධා කිරීම] The next speaker is the Hon. (Mrs.) Sriyani Wijewickrama. - [*Interruption.*] නියෝජ්‍ය ඇමතිතුමා, කරුණාකර වාඩි වන්න.

ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
එක්සත් ජාතික පක්ෂය වැඩ කරන්නේ මේ ආකාරයට නම්- [බාධා කිරීමක්]

[අ. භා. 3.57]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමිය කථා කරන්න.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාමත් වැදගත් පනත්

[ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය]

කෙටුම්පත් දෙකක් වන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පතත්, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පතත් සම්බන්ධයෙන් මෙම විවාදයේදී මට කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වනවා. ඇත්තටම කාන්තාවක විධියට මා මේ පනත් කෙටුම්පත් දෙකේ විශේෂත්වයක් දකිනවා. එනම් වැඩි වශයෙන්ම මේ පනත් කෙටුම්පත් දෙකෙන් රැකවරණය හා ආරක්ෂාව ලැබෙන්නේ කාන්තාවන්ට වීමයි. වැන්දඹු ජනගහනය ගැන කථා කරද්දී ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 2001 වර්ෂයේ සිදු කරන ලද සංගණනයේ තොරතුරුවලට අනුව අද ශ්‍රී ලංකාවේ වැන්දඹුවන් 5,49,594ක් සිටිනවා. ඒ තොරතුරුවලට අනුව වැන්දඹු පිරිමින් 78,165ක ප්‍රමාණයකුත්, වැන්දඹු කාන්තාවන් 4,71,429ක ප්‍රමාණයකුත් සිටිනවා. අවුරුදු 60 ඉක්මවන වැඩි වයස් කාණ්ඩයේ සිටින වැන්දඹුවන් සංඛ්‍යාවෙන් වැඩි පිරිසක් කාන්තාවන් වනවා. නැහෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරියක විධියට මා කියන්න ඕනෑ උතුරු හා නැහෙනහිර යුද්ධය නිසා කාන්තාවන් 40,000කට වැඩි සංඛ්‍යාවක් වැන්දඹුවන් බවට පත් වෙලා තිබෙනවාය කියලා. ඒ නිසා මා විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත් දෙක ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා ඇතුළු අපේ රජයට ස්තුතිවන්ත වනවා.

විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කථා කරද්දී විශාල ප්‍රශ්න රාශියක් -සමාජයීය ප්‍රශ්න රාශියක්- විසඳා ගන්න මේ පනත් දෙක උපකාරී වනවාය කියන කාරණය මා මේ ගරු සභාවට විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, මාසයක්වත් නැහැ, ප්‍රායෝගිකව මුහුණු දුන්න සිද්ධියක් ගැන මා කියන්නම්. අම්පාර දිස්ත්‍රික්කයේ එක කාන්තාවක් මට හමු වුණා. ඇගේ ස්වාමිපුරුෂයා යුද්ධයේදී මිය ගිහිල්ලා. විශ්‍රාම වැටුප අහිමි වන නිසා ඇය විවාහ නොවී වෙනත් පුද්ගලයකු සමඟ -වෙනත් පුරුෂයකු සමඟ- ජීවත් වුණා. ඒ කාන්තාවට දරුවකු ඉපදුණා. ඒ දරුවාගේ උප්පැන්නයට නම දෙන කොට අර මිය ගිය ස්වාමි පුරුෂයාගේ නමින් උප්පැන්නයට නම දීලා තිබෙනවා. මොකද, නැත්නම් ඒ දරුවා අවිවාහජ දරුවකු වන නිසා. මාසයක්වත් නැහැ මේ සිද්ධිය සිදු වෙලා. ඒ කාන්තාවගේ වැඩි මහල් දරුවන් දෙදෙනාගෙන් පළමුවැනි දරුවා නාවික හමුදාවට යන්න පොලිස් වාර්තාව ගැනීමේදී ඒ අම්මාට උපන් අවිවාහජ දරුවා නිසා වැඩි මහල් දරුවාට ප්‍රශ්නයක් ඇති වුණා. මේ නිසා මේ පනත් කෙටුම්පත සම්මත වීමෙන් පසු මම විශ්වාස කරනවා අපේ රටේ කාන්තාවන් විශාල ප්‍රමාණයකට, පුරුෂයන් ප්‍රමාණයකට සහනයක් සැලසේවිය කියලා. මොකද, වැන්දඹුවන් වන සියලු දෙනාම විශ්‍රාම වැටුප ආරක්ෂා කර ගන්න විවාහ නොවී පවුල් ජීවිත ගත කරන අවස්ථාවන් සමාජයේ විශාල වශයෙන් තිබෙනවා. ඒ නිසා විශාල සමාජයීය ගැටලුවකට මේ පනත් කෙටුම්පත් දෙක තුළින් විසඳුමක්, සාධාරණත්වයක් ඉටු කෙරෙන බව විශේෂයෙන්ම සඳහන් කරමින් මා මේ පනත් කෙටුම්පත් දෙක අගය කරන්න කැමැතියි.

ඒ වාගේම විශේෂයෙන්ම අපි මෙයින් බලාපාරොත්තු වන්නේ කාන්තාවන්ට වැඩි පිළිසරණක් සැලසීම නිසා මම කාන්තාව ගැන කථා කරන්න කැමැතියි. විශ්‍රාම වැටුප අහිමි වන නිසා පසු ගිය කාල සීමාව තුළ ත්‍රිවිධ හමුදාවල -දැන් මේ පනත් කෙටුම්පත මඟින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කළ අයටත් විශ්‍රාම වැටුප් දෙන්න කටයුතු කර ගෙන යනවා- සේවය කර මිය ගිය අයගේ භාර්යාවන් නැවත විවාහ ජීවිතයට ඇතුළත් නොවී සිටින අවස්ථා තිබුණා. අද මේ පනත් කෙටුම්පතින් පසුව ඒ අයට නීත්‍යානුකූල විවාහයක් කර ගෙන ජීවත් වන්නට හැකියාවක් ලැබෙන බව විශේෂයෙන් කියන්න ඕනෑ. ඒ වාගේම මම දකිනවා ස්වාමිපුරුෂයාගේ විශ්‍රාම වැටුපත් එක්ක විවාහ වන්නට ලැබීම තුළින් පෙර නීතිය යටතේ විවාහ වුණාට වඩා වටිනාකමකින් යුතුව විවාහයට එළඹෙන්නට ඒ කාන්තාවන්ට අවස්ථාවක් ලැබෙන බව. මොකද, හැම දෙයක්ම ආර්ථිකය මත පදනම් වන මේ ලෝකයේ ඒ තත්ත්වයන්ට, ඒ යථාර්ථයන්ට ඒ කාන්තාවන්ට මුහුණ දෙන්නට සිදු වන නිසා මේ පනත් කෙටුම්පත් තුළින් අපේ රටේ සිටින සියලුම වැන්දඹුවන්ට -ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශ්වයටම- විශාල රැකවරණයක් සැලසෙන බව විශේෂයෙන්ම අවධාරණය කරන්න කැමැතියි.

ඒ වාගේම මෙයින් අපට ලැබෙන ප්‍රතිලාභ ගැන මේ ගරු සභාව තුළ කථා කළා. ඒ නිසා මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. නමුත් අද මේ පනත් කෙටුම්පත් සම්මත වුණාට පස්සේ මේ රැක දෙන අයිතිවාසිකම් මඟින් අපේ රට ආසියාවේ ආශ්චර්ය කරන්න අතිගරු ජනාධිපතිතුමා යන ගමනට විශාල රුකුලක් ලැබෙනවාය කියන කාරණයත් මම විශේෂයෙන්ම කියන්න ඕනෑ.

අපේ රටේ සමාන ස්ථරවල විශ්‍රාමිකයන් විවිධ වැටුප් තලවල ඉන්න බව අපි දන්නවා. අපේ රටේ housewife කෙනකුගේ නිශ්චිත ආදායම ගණනය කරන්නේ නැහැ වාගේම අපේ රටට, අපේ රටේ සංවර්ධනයට විශ්‍රාමිකයන් දෙන දායකත්වය නිශ්චිතවම ගණනය කරන්නේ නැහැ. ඒ නිසා මේ විශ්‍රාම වැටුපත් සමානයින් අතර විවිධ මට්ටම්වල තියන්නේ නැතිව සමාන මට්ටමකට ගේනවා නම් ඒක සුදුසුයි. ඒ වාගේම වැන්දඹු කාන්තාවන් ගැන කථා කරද්දී, විවිධාකාරයෙන් මේ විශ්‍රාම වැටුප ලබන තරුණ කාන්තාවන් ඉන්නවා. නමුත් සමාජයීය වශයෙන් එක එක ආකාරයට මේ විශ්‍රාම වැටුපෙන් ප්‍රයෝජන ගන්නවා. මෙම විශ්‍රාම වැටුප නිසා පුරුෂයන් විසින් නොයෙකුත් විධියට අයථා කටයුතුවලට නම්මා ගත් කාන්තාවන්, ඒ වාගේම නැමෙන්නට සිදු වුණු කාන්තාවන් ඉන්නවා. මේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා කර දුන්නා වාගේම මෙන්න මේ සම්බන්ධයෙනුත් මේ අය දැනුවත් කිරීම අපේ රජයේ වග කීමක් වන්න ඕනෑ. මොකද, අපේ රටේ යුද්ධයක් හමාර කළා. ඒ යුද්ධයට පුරුෂ පාර්ශ්වය විශාල වශයෙන් සම්බන්ධ වෙලා මිය ගියා. 2010 අවුරුද්ද වන විට කාන්තාවන් විශාල ප්‍රමාණයක් වැන්දඹුවන් වෙලා සිටිනවා. ඒ නිසා මේ කාන්තාවන් ආරක්ෂා කර ගන්න, ඒ අයට යහපත සලසන්න අපේ රජයෙන් වැඩ පිළිවෙළක් සකස් වන්න ඕනෑ.

ඒ වාගේම විශ්‍රාමිකයා මිය යාමෙන් පසුව, විශ්‍රාමිකයාගේ කලත්‍රයාද මිය ගියායින් පසුව අවිවාහක දියණියන්ට වයස් සීමාව නොතකා අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීම, එසේම අවිවාහක පිරිමි දරුවා රැකියාවක් කරන්න බැරිව නොහැකියාවකින් පසු වනවා නම්, ආබාධිත වී සිටිනවා නම් ඒ අයටත් විශ්‍රාම වැටුප ලබා දීම සුදුසුයි කියන කාරණයත් මා යෝජනා කරනවා.

ඒ වාගේම රජයට අයත් නීත්‍යානුකූලව වහපු ආයතන ගැන අද මේ ගරු සභාවේ කථා කළා. ඒ අනුව විශ්‍රාම වැටුප් ලබන සේවකයෝ ඉන්නවා. තරුණ අය ඉන්නවා. ඒ වාගේ අයටත් විශේෂයෙන්ම මේ රැකවරණ අවස්ථා සැලසිය යුතුයි. ඒ අනුව යම් රජයේ නිලධාරියෙක් හෝ නිලධාරිනියක් විශ්‍රාම ගත් පසු කලත්‍රයාගේ මරණින් අනතුරුව වෙනත් විවාහයක් කර ගතහොත් දැනට ක්‍රියාත්මක වන පනත අනුව වැන්දඹුවන්ට මේ දීමනාව අයිති වන්නේ නැහැ. විශ්‍රාමිකයා විසින් වැන්දඹු අනත්දරු අරමුදලේ දායකත්වය ලබා ගෙන දායක මුදල් ගෙවා ඇති එවැනි අවස්ථාවක විවාහයට පත් වූ නව අයටත් මේ අදාළ විශ්‍රාමික වැටුප ලබා දෙන්න කටයුතු කරන එක සුදුසුයි කියන යෝජනාවත් මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරමින් මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ. භා. 4.08]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Hon. Deputy Chairman of Committees, I am glad to speak today on the Widows' and Orphans' Pension Fund (Amendment) Bill and the Widowers' and Orphans' Pension (Amendment) Bill. I am grateful to the Hon. Minister of Public Administration and Home Affairs for giving us the opportunity to discuss the Bill extensively at the Consultative Committee, where we raised many issues. The Hon. Minister, the Hon. Deputy Minister and the officials were good enough to explain to us the motive and how this Bill would affect the Public servants concerned. Further, the former Minister of Public Administration and Home Affairs, the Hon. Karu Jayasuriya has expressed his fullest support and appreciation to place this Bill before the House today. This Bill has been designed to eradicate certain anomalies that existed in the pension laws which affected those widows and widowers who lost their spouses during the war. We welcome this and we appreciate the action taken by the Hon. Minister.

Sir, there is one issue which I would like to raise here. This is regarding the widows who were punished when they remarry. You have eradicated that issue here by granting them half the pension. So, when you grant them half the pension when they get married, if they have children, I suggest that the balance half of the pension be given to the children of the first marriage so that there will be harmony in the family. If a woman with children marries a new person, then there could be differences that occur due to the maltreatment of the children of the first marriage. If the children of the first marriage have their own sustenance, that would help to build family harmony. So, if half of that money could be paid -

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

The balance half of the pension would be given for the children of the first marriage.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Thank you, Sir. That is very good.

Talking further on this issue, the pension is a social security arrangement available to the Public servant. As a social security, an employee in a private organization has provisions of EPF and ETF for his sustenance after retirement. Sir, it is seen mostly in the Plantation Sector where when a person retires, he draws his EPF or ETF and spends it for his own children on their marriages, on other requirements such as finding an employment or to pay for something. So, once that money has been spent they are left without any means of sustenance and they become destitute. Therefore, Sir, this Government should look into the possibilities of holding a part of the EPF in a fund so that the private sector employees are able to draw a pension, after their retirement. So, this is a necessary social security measure that I would suggest for your consideration. Recently, the interest rates on deposits at banks have been reduced and many of those who are depositing their savings which they receive through their Provident Fund or Trust Fund contributions are finding it difficult to survive because interest rates have been almost halved. The finance companies and financial institutions like Golden Key Company were able to survive because they paid high interest rates. People deposited money with them for high interest rates and now, they have lost all their money.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

People went for the higher interest rates.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Yes, Sir. Because of the lack of income for them to live from the savings, they went to places where they were paid higher interest rates and finally they have lost everything. So, if they have a scheme where the Government can use the EPF - it may be on an optional basis, the option of the employee - if they can hold it and if a pension can be paid, it would be a very positive thing for those retired persons.

I also wish to take this opportunity today, to table* in this House the "Proposals made by the All Party Representative Committee to form the basis of a New Constitution".

Maybe, you would consider this as not so relevant to this issue. But, today, you are trying to correct a situation that has been caused by the war where many have been rendered widows. Similarly, there is another fallout of the war. The war has ended, but there has been no political solution to the issues that created the war.

So, because of that, His Excellency the President on 11th of July, 2006 appointed the All Party Conference and decided to appoint a Committee of Representatives of the Parties at the All Party Conference and this was called the All Party Representative Committee. His Excellency the President mandated this Committee to formulate a draft proposal for constitutional reform. The President mandated the APRC to evolve a home-grown new Constitution which will provide a comprehensive approach to the resolution of the national question. Sir,

---

මූලාසනයේ අණ පරිදි ලියවිල්ල සභාගත නොකරන ලදී.
** அக்கிராசனக் கட்டளைப்படி ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
**Document not tabled on the order of the Chair.*

the national question has still not been resolved. The initial Members of this Committee are listed in this Report, which I wish to table in this House for inclusion in Hansard.

The All Party Representative Committee in its first meeting unanimously selected the Hon. Prof. Tissa Vitarana as its Chairman. We are grateful and we appreciate the great service done by the Chairman who was able to bring a consensus among the 14 Parties who participated in the All Party Representative Committee. It is his ability, his persuasiveness and his good leadership that evolved into a consensus of the All Party Representative Committee. Since July 2006, the All Party Representative Committee met almost every week, deliberating more than three to four hours each time. A panel of experts were also constituted - [*Interruption.*]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
There is a point of Order being raised.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. [*Interruption.*] He is a very good Friend of mine. Do not worry about those things. We will settle it among ourselves. Sir, my question is, has the Hon. Member got the authority of the Chairman? This has been appointed, as you say, by the President and also there was a Chairman - the Hon. Prof. Tissa Vitarana was the Chairman of the Committee. What is the - [*Interruption.*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Alhaj Azwer, that is not a point of Order. Please sit down.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
No, Sir. I ask - [*Interruption.*]

ගරු මන්ත්‍රීවරයෙක්
மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
You go ahead.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
A panel of experts, Sir, were also constituted by His Excellency the President to facilitate the APRC process. This panel of experts, after deliberating among themselves, produced two reports which were made available to the APRC in December 2006. - [*Interruption.*]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena- Minister of Water Supply and Drainage and Chief Government Whip)
Sir, I rise to a point of Order. As pointed out by Hon. Azwer, is the Member trying to place before this House a document purported to be the final document of the APRC?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
I do not say that it is purported to be the final document, Sir, because -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Is it signed by all the representatives?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Is it not a document of the APRC -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
No, I am simply asking the question whether -

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
It is not signed by all the Members of the APRC.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You cannot just bring a document and say, "this document is a document of all the parties attending", if they have not signed it. - [*Interruption.*] It is not a document, if so.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
It is not. I do not say it is.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Then, the Hon. Member, what are you trying to read? If the APRC has no final document so far signed by the

representatives, what are you trying to read? I do not think that this can be allowed if it is so.- [*Interruption.*] What are you trying to read? You just now mentioned about a document of the APRC, which was attended by so many political parties - [*Interruption.*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. R. Yogarajan, do you take responsibility for that document?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Yes, I take full responsibility. - *[Interruption.]* This is a signed document I am placing before the House. Sir, this draft contain 21 chapters. - *[Interruption.]*

Based on these two reports the Chairman of the APRC - *[Interruption.]* presented a draft containing the main features to form the basis of a new Constitution. This draft contained 21 chapters of various aspects of a new Constitution and since August 2007, for almost two years, the APRC discussed each of the chapters separately seeking inputs from political parties through their representatives at the APRC.- *[Interruption.]*

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
He cannot be allowed to read this document. - *[Interruption.]*

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
These discussions finally came to a conclusion in June 2009 after completing 128 meetings. - *[Interruption.]* by which time, the Committee reached consensus in respect of almost all the chapters and it was agreed based on this consensus - *[Interruption.]*

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Dinesh Gunawardena, please -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You cannot read like that. How can you read a document which the members have not signed? [*Interruption.*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please raise your point of Order.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
How can you read a document that the members have not signed? [*Interruption.*]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
If the Chairman is not objecting, why are you objecting? [*Interruption.*]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You can ask the Chairman if you want. [*Interruption.*]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Besides that, a point of Order has now been raised and he cannot read it. You have to give a ruling on that.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You must give a ruling, Sir.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
It cannot be read until you give an Order. Sir, you will have to give an Order. [*Interruption.*]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Sir, I am not reading from the APRC Report.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
You cannot read it now.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
I am reading from a document - [*Interruption.*] I have a right to speak in this House.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Yogarajan, what is your authority for that?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
I have signed the document.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Is it only you or -

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
I take full responsibility for it.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
He has signed the document. So what more authority do you need?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
It is my document that I am placing before this House. It is a document of -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
It does not become the document of the APRC.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
It is up to the public to decide whether it is authentic or not.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You cannot read a document on behalf of the CWC. You are no more a Member of the CWC.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Yes, I am not a Member of the CWC now.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
It was the CWC that you represented. Do not try to smuggle documents into this House.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
I will read from that document. "Though it was reported in the media ...."

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Yogarajan, have you signed it on behalf of the CWC or otherwise?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, he is trying to smuggle a document into this House.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
"Though it was reported in the Media a final report was submitted to the President by the Chairman, we found there had not been a release of this final report either to the members of the APRC, main opposition political party, the United National Party or the Tamil National Alliance or to the public."

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේකට ඉඩ දෙන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ලියවිල්ල හොරෙන් ඇතුළත් කරන්න හදනවා. එහෙම කරන්නේ කොහොමද? ලියවිල්ලක් නම් ඒක අත්සන් කරපු එකක් වෙන්න ඕනෑ. හොරෙන් ඇතුළු කරන්න දෙන්න බැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I will not allow that document to be tabled or to be included in Hansard.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
"It is in these circumstances, we R. Yogarajan (presently a Member of Parliament representing United National Party) who represented the Ceylon Workers' Congress at the APRC till its conclusion and M. Nizam Kariapper who represented the Sri Lanka Muslim Congress in the APRC decided to compile the final report based on the final draft discussion papers on each subject presented by the Chairman and amendments made by the APRC at the final APRC meetings with theh elp of the proceedings that were made available. The final report is attached in Annexure 2. We are confident that this final report comiled by us reflects correctly the decisions taken by the APRC..."

ගරු මුතු සිවලිංගම් මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு முத்து சிவலிங்கம் - பொருளாதார அபிவிருத்தி பிரதி அமைசர்)
(The Hon. Muthu Sivalingam - Deputy Minister of Economic Development)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised.

ගරු මුතු සිවලිංගම් මහතා
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

Sir, he has no right to submit a document on behalf of the Ceylon Workers' Congress. He is not a Member of the CWC now. He was a member long ago, not now. - [*Interruption.*] No, you cannot do that. You are not permitted by the CWC to do so. Sir, he is not a member of the CWC. So he has no right to do so. - [*Interruption.*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Minister is on a point of Order.

ගරු මුතු සිවලිංගම් මහතා
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

Sir, Hon. Yogarajan is not a member of the CWC now. He cannot submit a document here on behalf of the CWC. He was appointed as the CWC representative at that time to watch the interests of the CWC and report to the party. He has never done it. Now, he comes before Parliament and submits a document on behalf of the CWC. He has no business with the CWC. He has no right to do so. So, my point of Order is, since he is not a member of the CWC, he cannot submit a report here on behalf of the CWC.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, you have to expunge the whole thing.

ගරු මුතු සිවලිංගම් මහතා
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

If it is on behalf of the CWC, you have to expunge the entire thing.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

If that document or his speech contains anything against the Standing Orders, those will be expunged.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

That is fine.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

"We are confident that this final report compiled by us reflects correctly the decisions taken by the APRC and should be in conformity with the final report submitted by Prof. Tissa Vitarana Chairman of the APRC."

Sir, I wish to place this document before this House and request that this be included in Hansard.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Yogarajan, why do you not speak on the subject? This is out of subject.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Okay. I will come back to the subject.

Hon. Deputy Chairman of Committees, I certify that this document I am placing is a proper reflection of the discussions and the consensus reached at the APRC.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Mr. Yogarajan, what is the relevancy of this document to the subject matter?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

I will explain.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, your time is over.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Please give me a minute. I will explain. Sir, I started by telling you the connection between my speech and this document.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Yogarajan, please wind up. Your time is over.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Sir, as a fallout of the war, there were widows and widowers and there is a need to address the aspirations of the Tamil people of the North and the East. That is why I place this Report before the House. I request that this be included in Hansard and also -

ගරු සජීන් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

No, no, it cannot be done.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I cannot do that, I am sorry.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

I want to tell you Sir, that this Government is scared to release this Report. Why is the Government scared to release this Report? The President has said that they will base it to formulate a new Constitution for this country. He has said that and we have done it. So, why are they scared about it now? Do they think that by ending the war, they have solved the problem?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Thank you very much. The next speaker is the Hon. Alhaj A.H.M. Azwer. You also have to speak to the subject.

[අ. භා. 4.26]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

I am very sorry - [*Interruption.*] Sit down, Hon. Yogarajan, sit down. You have a self-respect. Do not sell it to the UNP.

Sir, today, I am very sorry to see a good Friend of mine being shamelessly made a scapegoat by the United National Party. The jubilation expressed by the Hon. John Amaratunga and the Hon. Gamini Jayawickrama Perera proved it very well to the House. Sir, Erskine May, who is the authority on "Parliamentary Practice", is very clear on this matter.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. R. Yogarajan is on a point of Order. Yes, what is your point of Order, Hon. Yogarajan?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

The Hon. Member is casting aspersions on my conduct. I request him to withdraw that. I cannot be bought by anybody. They tried to buy me for Rs. 50 million. I did not sell myself; I refused to be sold.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Here, he is going from "May" to hay-haywire. This is what is happening. I am very much ashamed of you. You should not have done that.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Azwer, please make your speech to the subject. Do not go beyond that.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I am speaking now. I am on my feet. I have to respond to what he said. Sir, in a Parliamentary democracy - Erskine May is very clear on that - a Committee can be set up, it can be a Select Committee or it can be a Commission. As the Hon. Yogarajan said, this Committee was appointed by His Excellency the President and he has appointed Minister, Hon. (Prof.) Tissa Vitarana as the Chairman of that Committee. So, I am asking, what is the propriety in your coming here and presenting this document? The others are making you a scapegoat. බළලුන් ලවා කොස් ඇට බා ගන්නයි හැදුවේ තමුන්නාන්සේට කියලා. අනේ, ඒකට ඉඩ දෙන්න එපා. තමුන්නාන්සේගේ community එකේ ගෞරවය රැක ගන්න. Sir, in keeping with the Parliamentary procedures and in keeping with the opinion of Erskine May, the greatest authority on "Parliamentary Practice", I would request you that whatever the Hon. Member said on this matter be completely expunged from Hansard.

Now, Sir, coming on to the Widows' and Orphans' Pension Fund (Amendment) Bill- [*Interruption.*] You have no right. Sit down. Hon. John Amaratunga, do not give him anymore dead ropes. දිරව්ව ලණු දෙන්න එපා. වැන්දඹුවන් සහ අනත්දරුවන් - Widows and Orphans - පිළිබඳව අපි කථා කරන්නේ. කථා කරන්න ඉඩ දෙන්න. ඔය ගොල්ලෝ වැන්දඹුවන්ටත් අපරාධ කරනවා. ඒකත් කරලා තිබෙන්නේ. ජෝශප් මයිකල් පෙරේරා මහත්තයා කථා කරන කොට කිව්වා, ප්‍රේමදාස මහත්මයා ගැන. අයියෝ! හරියට - අර මොකක්ද - එළුවා තෙමෙනවා කියලා හිවලා ඇඬුවා කියන එක - [බාධා කිරීම්] එළුවාගේ මොනවාද කියන එක තමුන්නාන්සේලා දන්නවා. ඒක වැටෙනකම් තමයි තමුන්නාන්සේලා බලා ගෙන ඉන්නේ. මේ ජන්මයේදී ඒක හරි යන්නේ නැහැ. වැටෙන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

වැටෙන්න වාගේ තිබෙනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

එහෙමයි ඒ ගොල්ලෝ හිතන්නේ. කවදාකවත් වැටෙන්නේ නැහැ. දැන් ගරු ජෝශප් මයිකල් පෙරේරා මහත්තයා කිව්වා, ප්‍රේමදාස මහත්තයා ගැන. [බාධා කිරීම්] හරිම අනුකම්පාවක් කරනවා. It is the like the story the wolf where is crying saying that the sheep is getting wet.

The Hon. Ranil Wickremasinghe, the present Leader of the Opposition, when he was the Prime Minister - we

know how much he disregarded President Ranasinghe Premadasa at that time. Sir, I have a story which should be told to the country. There was the "Premadasa Foundation" established by the Hon. B. Sirisena Cooray. It was in Hulftsdorp - President Premadasa's worthy son, the Hon. Sajith Premadasa is before me - and there was a press belonging to the United National Party, the Chairman of which was Mr. Razik Zarook, who was the then Chairman of the CWE. The Hon. Ranil Wickremasinghe told him to remove that board. Mr. Razik Zarook refused it flatly. He said, "I will never remove that". That is the amount of respect and regard Mr. Wickremasinghe had shown the late Premadasa Now what is happening? What has happened in May he forgets in June. Now, Sir, my good Friend, the Hon. (Dr.) Mervyn Silva tried to say this because this should be said in this House. There was a very famous journalist called Lionel Sarath Edirisinghe. He died on 16.08.2009 and the Hon. Ranil Wickremasinghe, worthy of his name, sent a සුබ පැතුම on 30.04.2010 on his birthday saying, "ඔබ දිවි මහ පැතුම ඉටු වේවා!" නැසී ගිය මනුෂ්‍යයාට මොන තරම් අගෞරවයක් ද? මෙන්න මෙහෙම තමයි. මොළේ කුලප්පු වෙලා, විකල් වෙලා තමයි මේ වැඩ කරන්නේ කියන එක මම තමුන්නාන්සේලාට කියනවා. දැන් අපි widows and orphans පිළිබඳව දෙමළෙනුත් පොඩ්ඩක් කියන්නට ඕනෑ. කවුරුවත් කිව්වේ නැහැ. මේකේ තිබෙනවා - **விதுரர்கள், அநாதைகள்** ஓய்வூதியம் (திருத்தம்) மற்றும் விதவைகள், அநாதைகள் ஒய்வூதிய நிதியம் (திருத்தம்) ஆகிய சட்டமூலங்கள் பற்றி தமிழிலும் சொல்லத்தான் வேண்டும். விதுரர்கள் - தாரமிழந்த ஆண்கள். ஆகவே, அவர்களுக்கும் இந்த ஓய்வூதியப் பலாபலன்கள் கிடைக்க வேண்டும் என்பதற்காக கௌரவ அமைச்சர் டபிள்யு.டி.ஜே. செனெவிரத்ன அவர்கள் இதனைப் பாராளுமன்றத்திலே முன்மொழிந்திருக்கின்றார். அதனையிட்டு அவருக்கு நாங்கள் எங்களுடைய பாராட்டைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றோம். Sir, His Excellency Mahinda Rajapaksa said: "This Government is a caring and sharing Government" අද බලන්න, රටේ හැම තැනම ගිහිල්ලා මොකක් ද කිව්වේ? කියපු කෙනා දැන් මෙතැන නැහැ. මොකක්ද කිව්වේ? අලි මංකඩ කියලා පාමංකඩ ගියාලු. මොන තරම් අගෞරවයක් ද ඒ රණ විරුවන්ට කළේ. මේ සම්මතේට කවුරුවත් එහෙම අපහාස කළේ නැහැ රණ විරුවන්ට. විකුම් ගුණසේකර වැනි ආඛ්‍යාත අයව අපි පළාත් සභා මන්ත්‍රී කරලා ගෞරව කරලා තිබෙනවා. අනෙක් එක මොකක් ද? කිළිනොච්චි කියලා මැදවච්චි ගියාලු. අනේ, මගේ අම්මේ! අපේ හාමුදුරුවනේ! මේ රට බේරා ගැනීම සඳහා දිවි පුදා සටන් කළ රණ විරුවන්ට අගෞරව කළ කෙනා තමයි අද මේ එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට කෙළ හළන්නේ. මෙවන් මිනිස්සුත් සමඟ සමාජයක් හදන්න පුළුවන් ද? රටක් හදන්න පුළුවන්ද? ඒක නිසා අපි කියනවා, අපේ ජනාධිපතිතුමා, ගෝඨාභය රාජපක්ෂ රාජ්‍ය ආරක්ෂක ලේකම්තුමා, ඒ වාගේම බැසිල් රාජපක්ෂ ඇමතිතුමා, "තාරුණ්‍යයට හෙටක්" ගෙන එන අපේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා -නාමල් මල් රටේ හැම තැනම පිපිලා- රට වටේ ගොස් අද මේ අය ජනතාවට කොයි තරම් උදවු උපකාර කරනවා ද? අසරණයන්ට සරණ වෙනවා නේද? ඒකට මේ අය විරුද්ධයි. මේ ගොල්ලන්ට ඕනෑ "බැන් - චූන් - කීන් - මූන්" මෙහේට එන්න. ඒකට ඉඩ දෙන්නේ නැහැ. අපේ ආත්ම ගරුත්වය, මනුෂ්‍යයෙකුට තිබෙන ආත්ම ගරුත්වය, රටක තිබෙන ආත්ම ගරුත්වය සදාකාලිකවම අපට ආරක්ෂා කරලා දුන්නේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමායි කියන එක මම මෙම උත්තරීතර සභාවේ හඬ නහා කියනවා.

ඔම්බුඩ්ස්මන් ගැනත් වචනයක් කියන්නට ඕනෑ. ඔම්බුඩ්ස්මන් පිළිබඳවත් අද කථා කරනවා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. එයා පොන්නම්බලම්ගේ 'வாரிசு' -ගෝලයා- එයා මොකවත් කියන්නේ නැහැ අපට. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔම්බුඩ්ස්මන් පිළිබඳවත් කියන්නට ඕනෑ.

This was established on 20th January, 1971 by the then regime in Sweden. There was no Ombudsman in the world prior to the system that was introduced by Sweden. It was done to ensure that the higher standard would be obtained in the administration of the country in which they live. That is the reason, because administratively, you come into a lot of problems; obstacles. People who work in a Pradeshiya Sabha or a Government office in remote areas in the country have to come to Colombo. They have to spend a lot of money for cases in courts.

How did it happen in Sweden? It happened due to the serious limitations in that country. Sir, according to the traditions and democracy they followed, Ministers had serious limitations in their country. Administratively, they were not able to do anything. Ministers were not responsible to Parliament in a country like Sweden. At that time, Sir, when we were having free democracy, they did not have the powers even to administer. Ministers were not responsible to Parliament and the administration was not responsible to a Minister.

Not allowing administration to go haywire, like what the Hon. R. Yogarajan tried to do today, this system was introduced. Until then, this system or experience, of a tradition was not known to other countries.

Modern governments recognized this system, Sir. Denmark and Norway followed Sweden and subsequently it was introduced in New Zealand, United Kingdom and Australia. We sought to do the same thing in Sri Lanka in 1971. At that time Sir, it was a well-thought out system. They deliberated upon it, the judges, the intelligentsia; the political leaders of this country. A working paper was prepared by the Sri Lanka Law Commission.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Alhaj A.H.M. Azwer, please wind up.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Article 156 of the Constitution imposed on Parliament, an obligation to enact a law for the creation of this office of the Parliamentary Commissioner for Administration called Ombudsman. Article 156 of the Constitution spelt it out in that form, Sir. Then, Sir, the petitions sent to Ombudsman - this must be clear.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Alhaj A.H.M. Azwer, please wind up. Your time is over.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, please, give me two more minutes. The Ombudsman's Report is sent to the Committee on Public Petitions. Now, the public can even directly send the petitions to the Ombudsman. The first Ombudsman of this country was one of our distinguished Secretaries-General of Parliament, the first Secretary-General, Mr. S.S. Wijesinha. Sir, he had been the Ombudsman from 1981 to 1991. The person who holds the office of the Ombudsman at present is Mr. L.A. Tissa Ekanayake. When I consulted him, he said that there were about 700 petitions. What is causing concern among the Government servants who seek redress, is the delay. He also said that for the three weeks he worked there, he could dispose seven to eight petitions a day. Sir, the office of the Ombudsman is an essential ingredient and part of the Constitution of Sri Lanka. I would commend the salary increase to the Ombudsman and also wish to mention how the other countries like the UK do it. In India, I saw for myself as to how they do it.

විතවෛක්කු මනුමණම් සෙය්තිට වේණ්ටුම් එන නපිකළ් නායකම් (ස්ල්) අවර්කළ් සොන්නාර්කළ්. අන්ත වකෙයිල් විතවෛකළින් නලන්කළෛක් කවනික්කින්ර ඔර් අරසාඞ්කම්තාන් මහින්ත රාජපක්ෂ අවර්කළුටෙය අරසාඞ්කම්. නපිකළ් නායකම් (ස්ල්) අවර්කළුටෙය පෝතනෛප්පටි අවර්කළ් අතනෛ ඉඞ්කේ සෙය්කින්රාර්කළ්. පෞත්ත තර්මත්තින්පටි සෙය්කින්රාර්කළ්; ඉන්තු තර්මඞ්කළින්පටි සෙය්කින්රාර්කළ් එන්රුම් සොල්ලලාම්. නාඞ්කළ් අතනෛ වරවේර්ක වේණ්ටුම්. එනවේ, වළි තවරියවර්කළ් ඉතර්කු ඌරු විළෛවික්කාමල්, අවර්කළ් ඉන්ත අරසාඞ්කත්තුක්කුම් අමෛච්චර් ටපිළ්යු.ටි.ජේ. සෙනෙවිරත්න අවර්කළුක්කුම් මානසීකමාක, වාය්තිරන්තු නන්රික්කටන් සෙලුත්තුවතර්කු කටමෛප්පට්ටිරුක්කින්රාර්කළ් එන්රු කූරි, විටෛපෙරුකින්රේන්. නන්රි!

[අ. භා. 4.40]

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ ඒ සම්බන්ධයෙන් මටත් වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පිළිබඳව සුබ පැතීම තමයි අපට කරන්නට තිබෙන්නේ. රාජ්‍ය සේවකයන්ට සුබ පතන්නයි අපට තිබෙන්නේ. මහින්ද චින්තන යටතේ ගෙනා මේ මා හැඟි සංශෝධන පනත් කෙටුම්පත් දෙක පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, මේ ගෞරවණීය සභාවට මෙය ගෙනා ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාටත් සුබ පැතීම තමයි අපි විශේෂයෙන් කරන්නේ. අපේ ඉතිහාසයේ මේ වාගේ විශේෂ සේවාවක් වන විශ්‍රාම වැටුප් තත්ත්වයක් තිබුණේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේට මතක ඇති, විශ්‍රාම වැටුප පවා අහිමි කරන්නට ගිය කාලයක් මේ රට තුළ තිබුණා. ඒ වාගේම සෞඛ්‍ය කම්කරු තනතුරක්වත් ලබා දෙන්නට බැරිව ඒවාට වක්‍රලේඛන ගහලා අයින් කරපු කාලයක් තිබුණා. විශ්‍රාමිකයන්ට කණ කොකා හඬන යුගයක් තමයි ඒ කාලයේ තිබුණේ. ඒක නියම භාෂාවෙන්ම කියනවා නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය සේවය බල්ලාට යවන්න ගිය කාලයක් මේ රට තුළ තිබුණාය කියන එකයි. එය මතක් කර ගත්තොත් හොඳයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම සංශෝධන පනත් කෙටුම්පත් දෙක පිළිබඳව ආණ්ඩු පක්ෂය දරන ස්ථාවරය මා කියන්නම්. පක්ෂ විපක්ෂ සියලුම දෙනා අගය කරන සංශෝධන පනත් කෙටුම්පත් දෙකක් හැටියට අපි මේවා දකිනවා. රාජ්‍ය සේවයට ඉතාමත් හොඳ යුගයක් උදා වුණ සංශෝධන පනත් කෙටුම්පත් හැටියටයි මා මේවා දකින්නේ. ඒ වාගේම මේක මිය යන විශ්‍රාමිකයන්ටත් ගෞරවයක්. බලන්න, අපි රැකියාවක් කරන්න හොයන කොට අපේ දෙමව්පියන්, අපේ නෑදෑයන් කියන්නේ "අතුගාන්න හරි ආණ්ඩුවේ රස්සාවක් අරන් දෙන්න" කියලායි. ඇයි ඒ? ඒකේ මූලික පරමාර්ථය වන්නේ විශ්‍රාම වැටුපයි. ජීවිතයේ තමන්ගේ හොඳම කාලයේදී, තමන්ගේ හොඳම ශක්තිය තිබෙන යුගයේදී රාජ්‍ය සේවයට ඇප කැප වෙලා, අවසාන කාලයේ තමන්ට විශ්‍රාම වැටුප අරගෙන සැඳෑ සුවයෙන් ජීවත් වන්න පුළුවන් තත්ත්වයක් තමයි මේ විශ්‍රාම වැටුපෙන් බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙයින් සිද්ධ වන සමාජ සුබසාධනයයි ඉතාමත් වැදගත් වන්නේ. මෙම විශ්‍රාම වැටුප් සංශෝධනයෙන් රාජ්‍ය සේවකයන්ට ලැබෙන සුබසාධනය ඉතාමත් වැදගත්. තමන්ගේ කලත්‍රයාට, ඒ වාගේම අනත්දරුවන්ට ලැබෙන විශේෂ වරප්‍රසාදය තමයි අපි මේකේ අගය කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනියම් සේවකයන්ට පවා විශ්‍රාම වැටුපක් ලබන්න හිමිකම ලබා දෙන මෙම සංශෝධන පනත් කෙටුම්පත් අද කාගේත් ගෞරවයට පත් වෙච්ච පනත් කෙටුම්පත් හැටියට අපි දකිනවා.

අපි මේ අවස්ථාවේ අමතක කරන්න හොඳ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුළු රටම එක් සේසත් වෙලා තිබෙන කාලයක ගොවියන්ට විශ්‍රාම වැටුපක්, කම්කරුවන්ට විශ්‍රාම වැටුපක්, කලාකරුවන්ට විශ්‍රාම වැටුපක් -මේ හැම කෙනකුටම විශ්‍රාම වැටුපක් ලබා දෙන්න- මහින්ද චින්තනය යටතේ අද වැඩ කටයුතු කරගෙන යන බව. එහෙම යුගයක තමයි මෙවැනි සංශෝධන පනත් කෙටුම්පත් අද ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සංශෝධන පනත් කෙටුම්පත් දිහා බලද්දි අපිට පැහැදිලිව පෙනෙන්නේ වෙන මොකක්වත් නොවෙයි, මෙහි මානුෂීය පැත්තයි. මානුෂීය පැත්තට නැඹුරු වෙච්ච මෙවැනි සංශෝධන පනත් කෙටුම්පත් අපි අගය කිරීම ඉතාමත් වැදගත් කියන එක මේ අවස්ථාවේ මම තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම අද සමාජයේ තිබෙන ප්‍රශ්න දිහා බලමු. විශ්‍රාම වැටුප පිළිබඳ උද්ගත වෙලා තිබෙන ප්‍රශ්නයි අද අපිට ඉතාමත් වැදගත් වන්නේ. ඒ සියලුම ප්‍රශ්නවලට මේ සංශෝධන පනත් කෙටුම්පත්වලින් අද පිළිතුරු ලැබිලා තිබෙනවා.

මම එක සිද්ධියක් කියන්නම්. එකක් නොවෙයි, දැන් දෙකක් තුනක් තිබෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ ප්‍රදේශයක හමුදාවට ගිය තරුණයෙක් විවාහ වුණා. විවාහ වුණාට තමන්ගේ විවාහක භාර්යාව ගෙදරට කැන්දා ගෙන ආවේ නැහැ. නීත්‍යානුකූලව විවාහ වුණත් චාරිත්‍රානුකූලව ගෙදරට කැන්දා ගෙන ආවේ නැහැ. ඒ අතරතුර හමුදාවේ සිටියදී ඔහු වෙඩි පහරකින් මිය ගියා. අද ඔහුගේ විශ්‍රාම වැටුප ලබන්නේ නීත්‍යානුකූලව විවාහ වුණත් චාරිත්‍රානුකූලව කැන්දා ගෙන ආවේවත් නැති අර බිරිඳයි. අද එතුමිය තමයි අර හමුදා සෙබළාගේ විශ්‍රාම වැටුප බුක්ති විඳින්නේ. හදලා වඩලා, උස් මහත් කරලා, උගන්වලා තමන්ගේ දරුවා රාජ්‍ය සේවයට, -හමුදා සේවයට- රට, ජාතිය වෙනුවෙන් කැප කරපු දෙමව්පියන්ට අද මොකුත් ලැබෙන ක්‍රමයක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කරන මේ සංශෝධන මඟින් එවැනි දෙමව්පියන්ට පවා යම් කිසි සෙතක් සැලසීම පිළිබඳව අපි විශේෂයෙන්ම සන්තෝෂ වන්න ඕනෑ. ඒකයි මම කිව්වේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක

මානුෂීය පැත්ත බලා හදපු විශ්‍රාම වැටුප් සංශෝධන පනතක්ය කියා. ඒක නිසා අපි විශේෂයෙන්ම මේක අගය කරනවා. ඒ වාගේම මම හිතන්නේ මිලියන 12ක් පමණ වන මේ රටේ රාජ්‍ය සේවකයන්ට අද මේක හොඳ ප්‍රවෘත්තියක් වේවි කියලායි. අද කවුරුත් සතුටු වේවි. විශ්‍රාම වැටුපක් ලබනවාය කියන එක ඒ මුළු පවුලටම ලොකු සෙතක්. ඒක තමයි පවුලට තිබෙන ශක්තිය. ඒක තමයි පවුලට තිබෙන පදනම. එවැනි දෙයක් ලබන කොට අද ලොකු ශක්තියක් ඒ දරු පවුලට ලැබෙනවා. ඒ නිසා මේ සංශෝධන පනත් කෙටුම්පත අපි ඉතාම අගය කරනවා විතරක් නොවෙයි, අපි මේකට සුබ පතනවා. ඒකයි මම මුලින්ම පටන් ගත්තේ අපි මේකට සුබ පතන්න අවශ්‍යයි කියලා. අද මේ පනත් කෙටුම්පත් පක්ෂ විපක්ෂ සියලු දෙනාගේම ප්‍රසාදයට ලක් වෙලා තිබෙනවා. මෙවැනි පනතකින් අපේ රාජ්‍ය සේවකයන්ට සැලසෙන සෙත පිළිබඳව අපි හදවතින්ම සතුටු වනවා. අපි සුබ පතනවා, රාජ්‍ය සේවකයන්ට. මේකේ තිබෙන මානුෂීය පැත්ත මොකක්ද? රජයේ සේවකයෙක් යම් කිසි අවස්ථාවක ඔහුගේ වැරදි ක්‍රියාවක් නිසා සේවයෙන් ඉවත් කළොත් එසේ ඉවත් කළායින් පසුව ඇත්ත වශයෙන්ම එහෙම ඉවත් කරපු කෙනකුට මීට ඉස්සර විශ්‍රාම වැටුපක් ලැබුණේ නැහැ. නමුත් මේ මානුෂීය පැත්තේ වටිනාකම කොච්චරද කියා බලන්න. ඒ පුද්ගලයා කරපු වරදට පවුල පළි නැහැ කියන පදනම මත අර වැන්දඹුවට සහ දරුවන්ට සෙතක් සැලසෙන විධියේ සංශෝධනයක් අද මේකෙන් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම තරුණ වියේ ජීවත් වන වැන්දඹුවන්ට සිදු වෙලා තිබුණු අසාධාරණය ගැන බලන කොට එතුමියට නැවත කවදාවත් විවාහ ජීවිතයක් ගත කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. මෙහිදී කොච්චර දුරට එතුමියගේ මානුෂීය පැත්ත ගැන බලා, ඒ මානුෂීය පැත්තට කොච්චර දුරට ගරු කරලා ඒ පනත සංශෝධනය කර තිබෙනවාද කියන එකයි වැදගත් වන්නේ. විපක්ෂයට අද මේ පිළිබඳව විරුද්ධ වන්න, කතා කරන්න බැරි වෙලා තිබෙන්නේ මෙහි තිබෙන මානුෂීය තත්ත්වය නිසාය කියන එකයි මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක මේ යුගයේදී ගෙනාපු ඉතාම වැදගත් සංශෝධන පනත් කෙටුම්පතක්. මේක රාජ්‍ය සේවකයන්ට කරන උපහාරයක් වාගේම ගෞරවයක්. ඒ වාගේම මැරෙන්න යන විශ්‍රාමිකයකුට හරි සැනසීමෙන් මැරෙන්න පුළුවන්. තමන්ගේ දරු පවුල දිහා බලා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යන කෙනෙක් සැනසීමෙන් මිය යනවා, "අනේ මගේ දරුවන්ට, මගේ කලත්‍රයාට යම් කිසි සහනයක් සැලසෙනවා"ය කියන අදහස නිසා. ඒකයි අපි ඇති කරන්න ඕනෑ. මුළු සේවා කාලයම, තරුණ කාලයේ ඉඳලාම තමන්ගේ ජවය, ශක්තිය, ඥානය, කුසලතාවන් යන සියලු දේ රාජ්‍ය සේවය වෙනුවෙන් කැප කරලා මේ රටටත්, අනාගත දරු පරම්පරාවටත් වැඩ කරන රාජ්‍ය සේවකයන්ට කරන උපහාරයක් ලෙස අප සලකනවා, මේ සංශෝධනය. ඒ නිසා මම ඒ සියලු දෙනාටම සුබ පතනවා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න මහින්ද චින්තනය තුළින් ගෙනා සංකල්පය, ඒ වාගේම අපේ අමාත්‍යතුමාගේ දක්ෂතාවක් මත ඉතාමත් දක්ෂ විධියට ඉදිරිපත් කළ මේ සංශෝධනය පිළිබඳව එතුමාට සුබ පතමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් සුබ පතමින් මා නවතිනවා. ස්තුතියි.

[අ. භා. 4.50]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින සාකච්ඡා කරන්නට තිබෙන කාරණා තුන අතුරින් අඩුවෙන්ම කථා වුණු නමුත් පළමුවැනි, දෙවැනි කාරණා වාගේම වැදගත්කමක් තිබෙන යෝජනාවක් තමයි පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ වැටුප් වැඩි කිරීම. හැබැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156වන ව්‍යවස්ථාවෙන් මේ ධුරය ඇති කරලා රාජ්‍ය අංශයේ සංස්ථාවන්, ඒ වාගේම පළාත් පාලන ආයතනවලින් රටේ ජනතාවට සිද්ධ වන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ වෙනත් අසාධාරණකම් පිළිබඳ පරීක්ෂණ පවත්වලා නිර්දේශ කරන්න බලය තිබෙන අධිකරණමය නොවන ව්‍යුහයක් රටට තියෙන්න ඕනෑ කියන ශ්‍රේෂ්ඨ පරමාර්ථයෙන් තමයි මේ ඔම්බුඩ්ස්මන් ධුරය පිහිටු වූයේ. අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමා කිව්වා, මේ ඔම්බුඩ්ස්මන් ධුරය ස්වීඩනයෙන් ලෝකයට හඳුන්වා දුන්නාය කියලා. ඒක ඇත්ත. ඔම්බුඩ්ස්මන් නාමය හඳුන්වලා දුන්නේ ස්වීඩනයෙන් තමයි.

නමුත් ලංකාවේ සිංහල රජ කාලයේ "දුග්ගන්නා රාල" කියන අර්ථය ඇතුව මිනිසුන්ගේ දුක් අසන, රජයේ නිලධාරීන්ගෙන් සමාජයට සිදු වන අයුතු අසාධාරණකම්වලට සවන් දෙන නිලධාරියෙක් හිටියා. මොකද, මූලික අයිතිවාසිකමක් කඩ වුණාම, අසාධාරණයක් සිදු වුණාම රටේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා සහන ලබා ගන්න දුප්පත් මිනිසුන්ට බැරුවා වාගේම ඒ සඳහා අධික කාලයක් ගත වනවා. ඔවුන්ට ඒ කටයුතු සඳහා කොළඹට එන්න වනවා. හැබැයි ඔම්බුඩ්ස්මන් ධුරය පසු ගිය කාලයේ ක්‍රියාත්මක වුණු ආකාරය ගැන කල්පනා කළාම ඔම්බුඩ්ස්මන් ධුරය ඇති කිරීමෙන් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපේක්ෂා කරපු ඒ පරමාර්ථය ඉෂ්ට වෙලා තිබෙනවාද කියන කාරණය ගැන බලවත් සැකයක් ඇති වනවා. ඔම්බුඩ්ස්මන් ධුරයට අලුතෙන්ම පත් වුණු තිස්ස ඒකනායක මැතිතුමාට අපේ සුබ පැතුම් පිරිනමන්න අවශ්‍යයි. එතුමා තමයි මේ රටේ ඔම්බුඩ්ස්මන් ධුරයට පත් වන්න සුදුසුම පුද්ගලයන්ගෙන් කෙනෙක්. මොකද, හේතුව? රාජ්‍ය තන්ත්‍රය තුළ සිදු වන අසාධාරණවලින් පීඩාවට පත් වෙලා සාධාරණ විනය පරීක්ෂණයකටවත් මුහුණ දෙන්නේ නැතිව රැකියාවෙන් ඉවත් වීම සඳහා බල කරනු ලැබීමට ලක් වුණු පුද්ගලයෙක් තමයි, වර්තමාන ඔම්බුඩ්ස්මන්තුමා. එවැනි අසාධාරණයට ලක් වුණු පුද්ගලයෙකු හැටියට, හිටපු විනිශ්චයකාරවරයෙකු හැටියට එතුමා දන්නවා, මේ රටේ මිනිසුන්ට අධිකරණමය නොවන සහනයන් ලබා ගැනීමට තිබෙන අවකාශය පිළිබඳව. එම අවකාශය තියෙන්න ඕනෑ වාගේම ඉක්මනින් කෙරෙන්නත් ඕනෑ. හැබැයි අද ඔම්බුඩ්ස්මන් ධුරය කියලා කියන්නේ මේ රටේ මිනිසුන්ට බොහොම දුරස්ථ දෙයක්. කෙනකුගේ දුක්ගැනවිල්ලක් පිළිබඳව ඔම්බුඩ්ස්මන්වරයාට පැමිණිලි කළොත් ඒකේ ප්‍රතිඵලයක් ලබා ගන්න වසර ගණනාවක් බලා ගෙන ඉන්න වනවා. ඒ වාගේම ඔම්බුඩ්ස්මන්වරයාගේ නිර්දේශ රාජ්‍ය තන්ත්‍රය විසින් නොසලකා හරින තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම සමාජය තුළ ඔම්බුඩ්ස්මන්වරයාගේ වගකීම් කුමක්ද කියන කාරණය ගැන නිවැරදි අවබෝධයක් නැහැ; දැනුමක් නැහැ; විශ්වාසයක් නැහැ. විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, ඔම්බුඩ්ස්මන්වරයාගේ වැටුප් වැඩි කිරීම වාගේම එම ධුරයේ ඵලදායීතාව පිළිබඳ විශේෂ පරීක්ෂණයක් කරලා ඵලදායීතාව වැඩිදියුණු කරන්න අවශ්‍ය කරන පහසුකමුත් ඔම්බුඩ්ස්මන්වරයාට සපයන්න අවශ්‍යයි කියලා. ඒ නිසා මේ වැටුප් වැඩි කිරීමේ යෝජනාව අගය කරන අතරම ඔම්බුඩ්ස්මන් ධුරයේ රාජකාරී කාර්යක්ෂමව, ඉක්මනින් සිදු කර ගන්න, මාසයක් දෙකක් ඇතුළත ඔම්බුඩ්ස්මන්වරයා වෙත යවන ආරාවුලක් විසඳා ගන්න පුළුවන් විධියේ යන්ත්‍රණයක් සකස් කිරීමේ වග කීමක් රජයට තිබෙනවා. විපක්ෂය හැටියට අපි එවැනි කාරණයකදී සහාය දෙන්න කැමැතියි.

ඒ වාගේම තව එක දෙයක් කියන්නට ඕනෑ, මේ රටේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිළිබඳව කටයුතු කරන රාජ්‍ය ව්‍යුහයන් තුනයි තිබෙන්නේ. ඒ ශ්‍රේෂ්ඨාධිකරණය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ ඔම්බුඩ්ස්මන් ධුරයයි.

මම කලින් කිව්වා වාගේ ඔම්බුඩ්ස්මන් ධුරය ඵලදායීතාව අඩු, දැනුවත්කමින් අඩු ස්ථානයක් වෙද්දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අද වන කොට අකර්මණ්‍ය වෙලා තිබෙනවා; දේශපාලන බලපෑම්වලට යටත් වෙලා තිබෙනවා. ඒ වාගේම

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ගණන් නොගන්නා තත්ත්වයට මේ රටේ රාජ්‍ය තන්ත්‍රය පත් වෙලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ, මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් පිළිබඳව සහන ලබා ගන්න පුළුවන්කම තිබෙන්නේ සීමිත පිරිසකට පමණයි; සීමිත අවස්ථාවල පමණයි. ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුත් ක්‍රියාත්මක නොකරන තරමට අද මේ රටේ රාජ්‍ය ආයතන පත් වෙලා තිබෙනවාය කියන කාරණය පසු ගිය දවස්වල අපට වාර්තා වුණා. ඒ නිසා පොදුවේ, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වැළැක්වීම සහ ඒවායින් පීඩාවට ලක් වුණු පුද්ගලයන්ට ඉක්මනින් සහන දීම සඳහා අධිකරණමය නොවන ආයතන පිහිටු වන්න ඕනෑ කියන කාරණයත් ඒ අධිකරණමය නොවන ව්‍යුහයන් ශක්තිමත් කරන්න ඕනෑ කියන කාරණයත් මම කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කොටුම්පතත්, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පතත් ඉතාම වැදගත්. ඒ ගැන අපේ ස්තුතිය පිරිනමන්න ඕනෑ. ඒ වාගේම මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීවරු සමාජය තුළ විවිධාකාර, විශේෂ අත් දැකීම් තිබෙන අය; සමාජයට සමීප අය. බොහෝ දෙනෙක් මේ සංශෝධන පනත් කෙටුම්පත් දෙකෙන් ලැබෙන සහනයන් මොනවාද කියන කාරණය ගැන විවිධ උදාහරණ ගෙන හැර දක්වමින් කරුණු පැහැදිලි කළා. මේ විධියට සමාජයේ තිබෙන ප්‍රශ්න ගැන සංවේදී වුණා වාගේම සමාජයේ තිබෙන අනෙකුත් ප්‍රශ්න ගැනත් මේ සංවේදීතාව මේ පමණටම දක්වන්න පුළුවන් නම් අපේ මේ ගෞරවණීය සභාවේ වගකීම අපි ඉෂ්ට කළා වනවා. ඒ නිසා ඉතාම වැදගත් වූ මේ සංශෝධන පනත් කෙටුම්පත් ගෙන ඒම පිළිබඳව රජයටත්, අපේ ගරු අමාත්‍යතුමාටත් විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා. ඒ වාගේම මෙවැනි කාරණාවලදී අවශ්‍ය සහයෝගය අනාගතයේදීත් ලබා දෙන්න අපි සූදානම් කියන කාරණය මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම සංශෝධන පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡාව අතරතුර, මේ සාකච්ඡාවේදී මතු වීමට අපේක්ෂා නොකරපු සමහර අරුම පුදුම විවේචනත් අහන්න ලැබුණා. ඒ එක කාරණයක් තමයි මෙන්න මෙය. ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා සඳහන් කළා, "වැන්දඹුවන් වැඩි වුණේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මූලිකත්වයෙන් අර ගෙන ආපු සටන් විරාම ගිවිසුම යටතේ" කියලා. මේ රටට සාමය උදා කර ගන්න මේ රටේ සෑම පාලකයකුටම අවශ්‍යතාව තිබුණා. ඒ අවශ්‍යතාව ගැන කල්පනා කරලා ඒ සාමය ලබා ගැනීම වෙනුවෙන් විවිධ ක්‍රියා මාර්ග, උපක්‍රමවලට ඒ පාලකයන් ගියා. ඒවායේ සාර්ථක අසාර්ථකභාවය පිළිබඳව අපට අවබෝධයක් තිබෙනවා. ඒ වාගේම එකම අරමුණකට වුණත් යන්න මාර්ග කිහිපයක් තිබෙනවා. වර්තමාන ආණ්ඩුව යුද්ධය ජයග්‍රහණයක් ලැබීම ගැන අප සතුටු වන අතරම, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මූලිකත්වයෙන් අර ගෙන ආපු සටන් විරාම ගිවිසුම නිසා මේ රටේ වැන්දඹුවන් වැඩි වුණාය කියන කාරණය නම් හරිම හාස්‍යජනකයි. මට තේරෙන්නේ නැහැ, එය මොන අර්ථයෙන්, කොහොම කියනවාද කියලා. ඒ පිළිබඳව තිබෙන විශ්ලේෂණය මොකක්ද, සංඛ්‍යා ලේඛන මොනවාද කියන කාරණය ගැන මට ප්‍රශ්න කරන්න වනවා.

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න කැමැතියි, විශ්‍රාම යෑමේ වයස පිළිබඳව අදහසක් පළ වුණාය කියා. ඇමෙරිකා එක්සත් ජනපදයේ විශ්‍රාම යෑමේ වයස ඉහළ නංවලා තිබෙන්නේ ඇමෙරිකානු ආණ්ඩුවට විශ්‍රාම වැටුප් දෙන්න බැරි නිසා කියලා මතයක් පළ වුණා. ඒක සත්‍යයක් නොවෙයි. ඇමෙරිකාවේ විතරක් නොවෙයි ප්‍රංශයේත් පසු ගිය මාසයේදී විශ්‍රාම යෑමේ වයස් සීමාව ඉහළ නැංවුවා. ඒක සිද්ධ වෙලා තිබෙන්නේ, අද ලෝකයේ මනුෂ්‍යයන්ගේ ජීවන තත්ත්වය ඉහළ ගිහිල්ලා, ඔවුන්ගේ හැකියාවන් දියුණු වෙලා, රැකියාවන් කිරීමේ වුවමනාව සහ එයින් රටකට ලබා ගත හැකි දායකත්වය පිළිබඳ තිබෙන හැඟීම ගැන අලුත් අදහස් ඇති වෙලා නිසායි. අද ලෝකය, යම් පුද්ගලයකුට සේවය කිරීමට හැකියාව, වුවමනාව හා නිරෝගිකම තිබෙනවා නම් වැඩි වයසක් දක්වා රාජ්‍ය සේවය තුළ සිටින්නට, වැඩ කරන්නට අවස්ථාව ලබා දෙනවා. අද ලෝකයේ තිබෙන ප්‍රවණතාව ඒකයි. දැන් මෙතැනදී අදහසක් ප්‍රකාශ වුණා, රජයේ නිලධාරියෙක් යම් ධුරයක් දරලා -විශේෂයෙන්ම ඉහළ ධුරයන් දරන ලද නිලධාරින්- විශ්‍රාම ගත්තාට පස්සේ තමන්ගේ තනතුර, තමන්ගේ බලය නැති වීමෙන් සමාජය තුළ අසරණභාවයක් ඇති වනවා කියලා. ඇත්ත. අවුරුදු 55ක් වන කොට බොහෝ දෙනකුට ඉතාම නිරෝගිව තමන්ගේ රැකියාව කර ගෙන යෑමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම අවුරුදු 55ක් වන කොට ලබා ගත් ජීවිත අත්දැකීම්, අධ්‍යාපනය සහ සමාජ අත් දැකීම් හරහා වඩාත් පරිණත වෙලා සමාජයට වැඩ කරන්න ඉහළ හැකියාවක් තිබෙනවා. ඒ නිසා අවුරුදු 55දී කැමැති කෙනකුට විශ්‍රාම යන්න පුළුවන්. නමුත් වැඩ කරන්න කැමැති අයට ඊට වඩා වැඩි කාලයක්, -එකිනෙකා පිටුපස ගිහිල්ලා, කොන්ත්‍රාත් පදනම මත හෝ සේවා දීර්ඝ කර ගැනීම වෙනුවෙන් යටහත් පහත් වෙලා වැඩ කරලා නොවෙයි.- අයිතිවාසිකමක් විධියට උපරිම කාලයක් රාජ්‍ය සේවය තුළ රැකියාව කරන්න අවශ්‍යතාව හා දක්ෂකම තිබෙන නිලධාරින්ට හැකියාව දෙන පරිදි විශ්‍රාම යෑමේ වයස් සීමාවන් පිළිබඳ ප්‍රතිපත්තිය නැවත සලකා බලන්න ඕනෑ කියන කාරණය මම කියන්න කැමැතියි.

අද ලෝකයේ තිබෙන ප්‍රවණතාව විශ්‍රාම යාමේ වයස අඩු කිරීම නොවෙයි. විශ්‍රාම වැටුප් ගෙවන්න පුළුවන් රටවලුත්, ලෝකයේ ආර්ථික වශයෙන් ශක්තිමත්ම රටවල්වලත් අද කල්පනා කරන්නේ හැකි තාක් දුරට මිනිසුන්ගේ සේවය -ඒ පුරවැසියන්ගේ සේවය- රටට ලබා ගැනීමටයි. මේ වටිනා පනත් කෙටුම්පත් දෙක නිසා සමාජය තුළ ඇති වන්න පුළුවන් වෙනස්කම් ගැනත් විශේෂ අවධානයක් යොමු වුණා. ඒක සත්‍යයක්. මොකද, විශ්‍රාම වැටුප් අහිමි වීමේ අනතුර නිසා, ඒ විශ්‍රාම වැටුප් ආරක්ෂා කර ගැනීමේ අරමුණ නිසා නීත්‍යානුකූල විවාහ බන්ධනයන්ට ඇතුළු නොවන අවස්ථා තිබෙනවා. එවැනි තත්ත්වයන් යටතේ අපට අධිකරණයන් තුළ අපේ වෘත්තීය කටයුතු කර ගෙන යන්න ලැබිලා තිබෙනවා. එහෙම නීත්‍යානුකූල විවාහ බන්ධනයන්ට ඇතුළු නොවන අවස්ථාවලදී ඒ උපදින දරුවන්ගේ අයිතිවාසිකම් පැත්තෙන්ද, ඒ වාගේම යම් වෙලාවක ඒ දරුවා අත් හැර දමනු ලැබුවහොත්, ඒ දරුවාගේ පීතෘත්වය පිළිබඳ ප්‍රශ්නයද එක පැත්තකින් ඉතාම වැදගත් කරුණක් වශයෙන් මතු වනවා. මේ සංශෝධනත් එක්ක දැන් ඒ ප්‍රශ්න යම් තාක් දුරකට අවම වනවා කියන කාරණය කියන්න පුළුවන්. එය එක් අතකින් නඩත්තු පිළිබඳ ප්‍රශ්නවලදීත්, අනෙක් අතට පවුල් ඒකකයේ යහ පැවැත්ම පිළිබඳව සලකා බලන කොටත් යහපත් කාරණයක්ය කියා මා කල්පනා කරනවා.

ඒ විතරක් නොවෙයි. මේ මාතෘ භූමිය වෙනුවෙන් යුද්ධයේදී ජීවිතය පූජා කරලා ඒ ශ්‍රේෂ්ඨතම පරිත්‍යාගය කරපු රණ විරුවන් ගැනත් මේ සභාවේදී විශේෂයෙන් කථා වුණා. ඒක මා අගය කරනවා; එකඟ වනවා. හැබැයි හමුදාවේ, පොලීසියේ පමණක් නොවෙයි, අන් සෑම ක්ෂේත්‍රයකම රාජ්‍ය සේවය තුළ සිටින නිලධාරින් ඉතාමත්ම දුක් ගැහැට්වලට ලක් වන, අවම පහසුකම් යටතේ ජීවත් වන අයයි. මගේ මව සහ පියාත් රජයේ සේවකයෝ. රජයේ සේවය තුළ ලැබෙන ඒ අවම පහසුකම් සහ අවම වැටුප් නිසා ඔවුන්ගේ ජීවිත ගෙන යන්නට, අපට උසස් අධ්‍යාපනය ලබා දෙන්නට කොපමණ අසීරුතාවක් ඔවුන්ට ඇති වුණාද කියලා මට

මතකයි. ඒ වාගේම මට මතකයි, අපි උසස් අධ්‍යාපනය ලබන කොට ඔවුන් විශ්‍රාම ගිය බව. විශ්‍රාම ගියාට පසුව ලැබෙන අවම විශ්‍රාම වැටුපත් එක්ක තමන්ගේ දරුවන්ට උසස් අධ්‍යාපනය ලබා දෙන්න ඒ කරන සටන ඉතාම අසීරුයි. ඒ නිසා මා යෝජනා කරන්න කැමැතියි, මේ පනත් කෙටුම්පත් තුළින් ගෙනැල්ලා තිබෙන ඒ ශ්‍රේෂ්ඨ පරමාර්ථය, අරමුණු, ඒ වාගේම මේ රටේ රජයේ සේවකයන්ගේ සියයට අසූපහක තත්ත්වයේ අද තිබෙන විශ්‍රාම වැටුප් ප්‍රමාණය, සියයට සියයක් දක්වා අර ගෙන ගිහිල්ලා දුන්නත් ඒක පවක් නැහැ, වරදක් නැහැ, අඩු පාඩුවක් නැහැ කියලා. මොකද රජයේ සේවකයා මේ රටට සේවය කරන්නේ ඒ තරමට සාපේක්ෂ අඩු වැටුපකට හා දීර්ඝ කාලයක සිට අඩු පහසුකම් යටතේයි. ඒ නිසා රජයේ සේවකයාගේ සේවය අගය කරන්න විශ්‍රාම වැටුප් දෙන ප්‍රමාණය සියයට අසූපහේ මට්ටම නොවෙයි ඊටත් එහාට ගිහිල්ලා ඒ ලබපු අවසාන මූලික වැටුපම විශ්‍රාම වැටුප වශයෙන් ලබා දෙන්න පුළුවන් නම් ඒ තරමට හොඳයි කියන කාරණයත් මා යෝජනා කරන්න කැමැතියි.

ජනගහනය වැඩිහිටි වීම ගැනත් මා විශේෂයෙන් සඳහන් කරන්නට කැමැතියි. අද මේ රටේ සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු වෙලා තිබෙනවා; වැඩිදියුණු වෙමින් තිබෙනවා. ඒ වාගේම අද වැඩිමහල් පරම්පරාව වැඩි කලක් ජීවත් වීමේ ප්‍රවණතාවක් තිබෙනවා. ඒ නිසා මේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය වාගේම වැඩිහිටි ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු වන්නට ඕනෑ. රජයේ රැකියාවක් කරපු කෙනෙකුට දැන් මොන යම් හෝ තරමක විශ්‍රාම වැටුපක් ලැබෙනවා. පෞද්ගලික අංශයේ රැකියාවක් කරලා විශ්‍රාම ගිය තැනැත්තන්ටත්, ඒ වාගේම ස්වයං රැකියා කරමින් සිට තමන්ගේ වෘත්තීය කටයුතු තව දුරටත් කර ගෙන යන්නට බැරි අයටත් විශේෂ අවධානයක් යොමු කරලා සමාජය තුළ කෙළින් ඉන්න, ඒ වාගේම අසීරු කාලයේ ජීවත් වන්න ඔවුන්ට ඒ අවස්ථාව අපි සලසන්නට ඕනෑ. ඒ වාගේම වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ වැඩිහිටියන්ගේ ඉල්ලීම් පිළිබඳ මණ්ඩලයක් පත් කරලා තිබෙනවා, ඔවුන්ට තමන්ගේ දරුවන්ගෙන් නඩත්තු ලබා ගැනීම සඳහා. ඒ ගැනත් විශේෂයෙන් කියන්නට ඕනෑ. හැබැයි අවුරුදු 60ට වැඩි අය තමයි "වැඩිහිටියා" කියන කොටසට වැටෙන්නේ. මේ පනතින් ආවරණය වන මේ වැඩිහිටියන්ගේ ඉල්ලීම් පිළිබඳ මණ්ඩලය ප්‍රයෝජනවත් වන විධියට ක්‍රියාත්මක වන්නේ නැහැ. වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් සම්බන්ධව සමාජය තුළ තිබෙන දැනුවත්කම් බොහොම අඩුයි. අඩු ගණනේ මේ වැඩිහිටියන්ගේ ඉල්ලීම් පිළිබඳ මණ්ඩල මේ රටේ සෑම දිස්ත්‍රික්කයකටම එක බැගින් හෝ පත් කරන්නට ඕනෑ. ඒ මණ්ඩලයට ලැබෙන ඉල්ලීම් ඉක්මනින්, ඵලදායී ලෙස ක්‍රියාත්මක කරලා එම ආයතනය දෙන ඵලදායීතාව අපට සමාජයට පෙන්වන්න පුළුවන් නම් වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් පිළිබඳව සමාජයට මීට වඩා ශක්තියක්, දැනුමක් ලැබෙනවා.

ඒ නිසා මේ විශ්‍රාම වැටුප් පිළිබඳ කාරණය අගය කරන ගමන්ම, විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන, ඒ වාගේම තමන්ගේ පැවැත්ම පිළිබඳ නිශ්චිත ආදායමක් නොලබන, තමන්ගේ දරුවන්ගෙන් භවිහරණක් නොලැබෙන වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් පිළිබඳවත් අපේ අවධානය යොමු වන්නට ඕනෑ. වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා හෝ යම් පිළිවෙළකට යා යුතුයි කියන කාරණය මා විශේෂයෙන් කියන්නට කැමැතියි. ඒ නිසා මේ ගෞරවනීය සභාවේ දිගින් දිගට කියපු කාරණා නැවත කියලා කාලය ගත කරන්න මම අපේක්ෂා කරන්නේ නැහැ. ඉතා වැදගත් කාරණයක් පිළිබඳව මේ දක්වපු උනන්දුව ගැන විශේෂ ස්තුතිය ප්‍රකාශ කරන්න මා කැමැතියි. ඒ වාගේම මේ ගෞරවනීය සභාවේ මෙවැනි වැදගත් කාරණාවලදී ඒ සඳහා අපේ සහාය ලැබෙනවාය කියන කාරණයත් ප්‍රකාශ කරමින් මා නතර වනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.07]

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

(மாண்புமிகு வைத்திய கலாநிதி (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)

(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී ඒ පිළිබඳව අදහස් දැක් වීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මා සන්තෝෂ වනවා. විශේෂයෙන්ම මේ රටේ තිබුණු යුද්ධය නිසා වැන්දඹු තත්ත්වයට පත් වුණු මටත්, මා වාගේ අසරණ වෙලා ඉන්න කාන්තාවන්ටත් මේ සංශෝධනය මහත් පිටිවහලක් වනවාය කියන කාරණයත් මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම ඒ ගැන මා ස්තුතිවන්ත වනවා. මේ සංශෝධනය ඉදිරිපත් කරලා, මේ රටේ ඉන්න ඒ අහිංසක, අසරණ වැන්දඹු කාන්තාවන්ට සහ අනත්දරුවන්ට විශාල ආර්ථික ශක්තියක් ලබා දීමට, ඒ වාගේම ඔවුන්ට අලුත් ජීවිතයක් ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව විශේෂයෙන්ම ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමාට මාගේ ස්තුතිය පුද කරන්නට ඕනෑ. මහින්ද චින්තන ඉදිරි දැක්මේ විශේෂයෙන්ම රාජ්‍ය සේවය ශක්තිමත් කිරීමේ එක් පියවරක් හැටියටත් මා මෙය දකිනවා.

2001 වසර වන විට මේ රටේ ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශ්වයේම වැන්දඹු ජනගහනය ලක්ෂ 6කට ආසන්න සංඛ්‍යාවක් ඉඳලා තිබෙනවා. එයිනුත් වැඩි ප්‍රතිශතයක් -සියයට 86ක්- ඉඳලා තිබෙන්නේ කාන්තාවෝයි. ඒකටත් හේතුවක් තිබෙනවා. පුරුෂයෝ සියයට 14ක් ඉන්න කොට කාන්තාවෝ සියයට 86ක් වශයෙන් වාර්තා වෙලා තිබෙනවා. මෙයිනුත් සියයට 59ක් අවුරුදු 60ට වැඩි වයස්ගත කාණ්ඩය. ඒකටත් හේතුවක් තිබෙනවා. කාන්තාවෝ තමයි වැඩි පුරම වැන්දඹු තත්ත්වයට පත් වන්නේ. විශේෂයෙන්ම ජීවත් වීමේ ආයු කාලය කාන්තාවන්ට වැඩි නිසා. අපි දැක්කා, අතීතයේදීත් විශාල වශයෙන් වැන්දඹු කාන්තාවෝ මේ රටේ සිටියා. නමුත් පසු ගිය වසර කිහිපය තුළ මීට වඩා අඩු වයස් කාණ්ඩවල අය -විශේෂයෙන්ම අවුරුදු 25 සිට 40 දක්වා වයස් කාණ්ඩවල අය- වැන්දඹු තත්ත්වයට පත් වුණු ජනතාව අතර සිටියා. එයිනුත් සියයට 3ක් පමණ ඉන්නේ කාන්තාවෝයි. 2001 සමස්ත ජනගහනයෙන් සියයට 3.2ක් වුණු වැන්දඹු ජනගහනය 2006 වන විට සියයට 8 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ උතුරු-නැඟෙනහිරට අමතරව. ඒ දෙකම එකතු කළාම මා හිතන්නේ මීට වඩා වැඩි ප්‍රතිශතයක් අද වැන්දඹු තත්ත්වයට පත් වෙලා ඉන්නවා. විශේෂයෙන්ම මේ රටේ තිබුණු ජනවාර්ගික යුද්ධය නිසා උතුරු-නැඟෙනහිර ඇතුළත්ව සමස්ත ලංකාවේම වැන්දඹු සංඛ්‍යාව ඉතාමත්ම ශීඝ්‍ර ලෙස ඉහළට ගියා. උතුරු-නැඟෙනහිර විතරක් නොවෙයි. මේ යුද්ධය නිසා දකුණේ ප්‍රදේශවලත් විශාල වශයෙන් අද වැන්දඹු කාන්තාවෝ වාගේම පුරුෂයෝ දකින්නට ලැබෙනවා. ඒ වාගේම ස්වාභාවික ව්‍යසන නිසාත් වැන්දඹු වෙනවා. 2004 වර්ෂයේ සුනාමිය ආපු නිසා විශාල සංඛ්‍යාවක් මිය ගියා; දරුවෝ, කාන්තාවෝ, පුරුෂයෝ මිය ගියා. ඊට අමතරව නාය යෑම්, ගංවතුර ගැලීම් වාගේ ස්වාභාවික ව්‍යසන පැමිණි අවස්ථාවලදීත් විශාල ප්‍රමාණයක් වැන්දඹු තත්ත්වයට පත් වුණා. ඒ නිසා පවුල් සංස්ථා විනාශ වෙලා ගියා. එතැනදීත් විශේෂයෙන්ම මව සහ දරුවා තමයි මේ තත්ත්වය නිසා දුක් වින්දේ.

අපි දකිනවා, විශේෂයෙන්ම වැන්දඹු කාන්තාවක් වුණාම ගැටලු රාශියකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන බව. විශේෂයෙන්ම ආර්ථික ගැටලුවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ජීවත් වෙන්න මුදල් නොමැතිකම නිසා ඒ පවුල ගෙන යාමේදී ආර්ථික ගැටලු මතු වෙනවා. ඒ වාගේම සමාජයීය ගැටලුවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. විශේෂයෙන්ම තරුණ කාන්තාවක් වුණාම සමාජය නිසාත් ඔවුන්ට නොයෙකුත් කරදරවලට මුහුණ

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

දෙන්නට සිද්ධ වෙනවා. ඒ අතරට ආර්ථික ශක්තිය නැති වුණොත් ඔවුන් තවත් අසරණ වෙනවා. ඒ නිසා මේ සංශෝධනය ඉතාමත් වැදගත්. ඒ වාගේම කාලීන අවශ්‍යතාවක්. මොකද, මේ රටේ පැවැති යුද්ධය නිසා වැන්දඹුභාවයට පත් වුණු අහිංසක, අසරණ කාන්තාවෝ ඉන්නවා. අවුරුදු 55 දක්වා සියලුම වැටුප් වර්ධක සහිතව ලැබුණු වැටුපෙන් තමයි ඒ විශ්‍රාම වැටුප ගණනය කිරීම සිද්ධ වන්නේ. ඒ නිසා මෙය ඉතාමත්ම හොඳ සංශෝධනයක් හැටියට අපි දකිනවා. ඒ වාගේම මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ තරුණ වියේ පසු වන කාන්තාවන්ට ලොකු සමාජමය ගැටලුවකට මුහුණ දෙන්න සිදු වී තිබෙන බව. විශේෂයෙන්ම යුද්ධය නිසා වැන්දඹුභාවයට පත් වුණ තරුණ කාන්තාවෝ විශාල පිරිසක් ඉන්නවා. ඔවුන්ට නැවත විවාහ වීමේ ගැටලු තිබෙනවා. විවාහ වුණොත් තමන්ට තිබෙන ඒ ආර්ථික ශක්තිය නැති වෙයි කියන ගැටලුව ඔවුන්ට තිබුණා. ඒ නිසා අනෙක් කාන්තාවන්ට වාගේ නැවත විවාහ දිවියට ඇතුළත් වීමේ අයිතිය නැති වෙලා තිබුණා. එවැනි අවස්ථාවක මේ වාගේ සංශෝධනයක් ඉදිරිපත් කරලා ඔවුන්ට නැවත විවාහ වීමේ අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ ගැන රජයටත්, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, මේ විෂය භාර අමාත්‍යවරයාටත් මේ අවස්ථාවේදී අප ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම ගැහැනු පිරිමි, විවාහක අවිවාහක තත්ත්වය නොසලකා අවුරුදු 26 දක්වා රැකියාවක් නොකරන දරුවන්ටත් විශ්‍රාම වැටුප ලබා ගැනීමේ අවකාශ පෑදී තිබෙනවා. නමුත් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ, මේ විශ්‍රාම වැටුප ගන්න ගියාම කාන්තාවන්ට බොහෝ අසීරුතාවලට මුහුණ පාන්නට සිදු වන බව. මේ රාජ්‍ය තන්ත්‍රයේ සමහර නිලධාරීන්ට කියලා ක්ෂණිකව ඒ වැඩ ටික ක්‍රියාත්මක කර ගැනීමේදී ගැටලු මතු වනවා. ඒ නිසා මේ කාන්තාවන් වෙනුනේ මම ඉතාම කාරුණිකව ඉල්ලා සිටින්නේ, විශ්‍රාම වැටුප ලබා ගන්න ගියාම ඒක ප්‍රමාදයකින් තොරව, ක්ෂණිකව ලබා ගැනීමට අවශ්‍ය කරන සහයෝගය ලබා දෙන්න කියලායි. මේ කටයුතු සඳහා යන්නේ වැන්දඹු කාන්තාවන්. ස්වාමිපුරුෂයා නැති වෙලා, මානසික කම්පනයට ලක් වෙලා, ආර්ථික ගැටලුවලට ලක් වෙච්ච කාන්තාවක් විශ්‍රාම වැටුප හදා ගන්න ගියාම විශාල කාලයක් ගත වනවා නම් මම හිතන විධියට ඒක කාන්තාවට කරන අසාධාරණයක්; ඒ දරුවන්ට කරන අසාධාරණයක්. නවීන තාක්ෂණයත් එක්ක ගනුදෙනු කරන යුගයක ඒ ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කිරීම පිළිබඳ අවධානය යොමු වනවා නම් ඉතාම වැදගත් කියලා මම හිතනවා. මම මේ සංශෝධන ගැන දිගින් දිගටම කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

අපේ තවත් කාන්තාවන් කොටසක් සිටිනවා. විශේෂයෙන්ම වතු ආශ්‍රිත රැකියාවල නියැලෙන කාන්තාවන්ටත් මේ හා සමාන අයිතිවාසිකම් ලබා දෙනවා නම් වඩාත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. වතු ආශ්‍රිත රැකියාවන් කරන කාන්තාවන් මේ රට වෙනුවෙන්, රටේ ආර්ථිකය වෙනුවෙන් ලොකු දායකත්වයක් ලබා දෙන පිරිසක්. මේ කාන්තාවන්ටත් රජයේ රැකියා කරන කාන්තාවට තිබෙන වරප්‍රසාද ලබා දෙනවා නම් හොඳයි. ඒ අයත් අපේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන කොටසක්.

ඒ වාගේම අද සමාජයේ ඉන්නවා ආබාධිත පුද්ගලයෝ. විවිධ ආබාධවලට ලක් වෙච්ච පුද්ගලයෝ ඉන්නවා. මේ ආබාධිත පුද්ගලයන් වෙනුවෙනුත් අපි යම් කිසි ක්‍රම වේදයක් හදුන්වා දෙන්න ඕනෑ. රජයේ රැකියා ලබා දීමේදී ඔවුන්ටත් යම් කිසි ප්‍රතිශතයක් ලබා දීමට කටයුතු කරන්න ඕනෑ කියා මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

ඒ වාගේම අද අපට විශාල වශයෙන් විදේශ විනිමය උපයා දෙන විදේශ රැකියා කරන කාන්තාවන් ඉන්නවා. මේ කාන්තාව අපට විදේශ විනිමය අර ගෙන ආවාට, අපි දැකලා තිබෙන අන්දමට මොවුන්ගේ පවුල් සංස්ථාව බොහෝ විට අසාර්ථකයි. හොඳ සාර්ථක ජීවිත ගත කරන පවුල්වල කාන්තාවන් පවා විදේශ රැකියාවලට ගිහින් හම්බ කර ගෙන ආවාම විශාල වශයෙන් සමාජ ප්‍රශ්නවලට ගොදුරු වෙලා තිබෙනවා. ඒ කාන්තාවන් වෙනුවෙනුත් යම් කිසි විශ්‍රාම ක්‍රමයක් හඳුන්වා දෙන එක සුදුසුයි කියා මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම විශාල වශයෙන් අපට විදේශ විනිමය හොයලා දෙන, ආර්ථික සංවර්ධනයට දායක වන ඇහලුම් ක්ෂේත්‍රයේ සිටින කාන්තාවන්ගේ සුරක්ෂිතභාවය ගැනත් අපි කටයුතු කරන්න ඕනෑ කියලා මතක් කරනවා.

යුද්ධය සහ ස්වාභාවික විපත් නිසා වැන්දඹුභාවයට පත් වෙච්ච කාන්තාවන්ට අත් වන ප්‍රතිලාභ පිළිබඳව මා කිව්වා. නමුත් රාජ්‍ය සේවයේ නොයෙදුණු, යුද්ධය නිසා වැන්දඹුභාවයට පත් වෙච්ච කාන්තාවන් ඉන්නවා. මේ රටේ තිබිච්ච ත්‍රස්තවාදය නිසා බස් එකේ කෝච්චියේ යන විට සිදු වූ විපත්වලින් තම ස්වාමිපුරුෂයා අහිමි වීම නිසා ආර්ථික වශයෙන් ඉතාම දුක්ඛිත තත්ත්වයට පත් වෙච්ච කාන්තාවන්, දරුවන් ඉන්නවා. අපි මේ කාන්තාවෝත් රැක බලා ගන්න ඕනෑ කියලා මේ අවස්ථාවේදී යෝජනා කරනවා. එහෙම නැති වුණොත් ඉදිරියේදී අපට ලොකු සමාජමය ප්‍රශ්නයක් ඇති වනවා. විශේෂයෙන් ඒ දරුවෝ ගැන සොයා බලන්නට ඕනෑ. මේ දරුවන්ව පාසල් යවන්න කටයුතු කරන්න ඕනෑ. අපි දකිනවා, අද අසරණ වෙච්ච වැන්දඹු කාන්තාවන් ඉන්න පවුල්වල දරුවෝ පාසල් ජීවිතය ඉක්මනට අත හරින බව. පාසල් ජීවිතය ඉක්මනට අත හැරලා පවුලට යම් කිසි ආර්ථික ශක්තියක් ලබා දීම උදෙසා ඉතාමත් අඩු පඩියකට කම්කරු රක්ෂාවල නියැලෙනවා. සමහර විට වැරදි ක්‍රියා කිරීමට පෙලඹෙනවා. ඒ නිසා ඒ කාන්තාවන් වෙනුවෙනුත් යම් කිසි වැඩ පිළිවෙළක් අනිවාර්යයෙන්ම හඳුන්වා දෙන්න ඕනෑ කියන එක මේ අවස්ථාවේදී මතක් කරනවා. විශේෂයෙන් ඔවුන්ගේ මානසික තත්ත්වය දියුණු කරන්න, මානසික තත්ත්වය ශක්තිමත් කරන්න අපි යම් කිසි වැඩ පිළිවෙළක් හඳුන්වා දෙනවා නම් වඩාත් සුදුසුයි කියලා මේ අවස්ථාවේදී මතක් කරනවා.

මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළින් ඒ වාගේම මේ සංශෝධන පනත් කෙටුම්පත් මඟින් අද රාජ්‍ය සේවයට ලොකු ශක්තියක්, වටිනාකමක්, ලබා දීලා තිබීම පිළිබඳව අපි සන්තෝෂ වනවා. මොකද, 2003 වසරේ දී එක්සත් ජාතික පක්ෂ රජය පැවැති කාලයේ විශ්‍රාම වැටුප කප්පාදු කිරීමට පවා පියවර ගත් ආකාරය අපි දැක්කා. ඒ වාගේම අග්‍රහාර රක්ෂණ ක්‍රමය රාජ්‍ය තන්ත්‍රයෙන් ඉවත් කරන්නට කටයුතු කරපු අවධියක් තිබුණා. අද ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධන පනත් කෙටුම්පත් තුළින් රාජ්‍ය සේවය නැවත ගෞරවයට පාත්‍ර කිරීමට කටයුතු කරලා තිබෙන බව මතක් කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Sajith Premadasa. Before he starts, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair and THE HON. ALHAJ A.H.M AZWER took the Chair.

[අ. භා. 5.19]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ දී මටත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබීම ගැන සන්තෝෂ වනවා.

ගරු අමාත්‍යතුමාටත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, එම නිලධාරී මණ්ඩලයටත් විරුද්ධ පක්ෂයේත්, මගේත් ප්‍රසාදය පළ කර සිටිනවා, මේ ක්ෂේත්‍රය තුළ තිබෙන අඩු පාඩුකම් ගණනාවක් සඳහා හොඳ ධනාත්මක විසඳුම් රැසක් ලබා දෙන්නට අද ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනත් කෙටුම්පත් හරහා කටයුතු කර තිබීම ගැන. මෙය අපේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවට ඉමහත් සහනයක් ලබා දෙන අවස්ථාවක් කියලා මා හිතනවා. දේශපාලනික වශයෙනුත් ඉතාම වැදගත් වන, රටට යහපත්, රටේ ජීවත් වන ජනතාවට යහපත් කරුණු කාරණා පිළිබඳ තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමේදී දේශපාලන පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව ධනාත්මක ලෙස එකතු විය හැකි අවස්ථාවක් අද උදාවීම ගැන මා බොහෝ ලෙස සන්තෝෂ වනවා.

එසේම මේ මාතෘකාවට ප්‍රවේශ වන අතරතුර ඉන් මඳක් ඔබ්බට ගිහිල්ලා, මේ රටේ දශක තුනක් මුළුල්ලේ ක්‍රියාත්මක වුණු යුද්මය ක්‍රියා දාමය නිසා අවතැන් වුණු, ඒ වාගේම විපතට පත් වුණු ඒ වැන්දඹු කාන්තාවන්ට අද අත් වෙලා තිබෙන ඉරණම පිළිබඳව යම් කිසි විග්‍රහයක් කරන්නටත් මා බලාපොරොත්තු වනවා. ඒ වාගේම විශේෂයෙන්ම මේ ගරු සභාවේ වග කිව යුතු මැති ඇමතිතුමන්ලාගේත් අවධානය මේ ප්‍රශ්නය කෙරෙහි යොමු කරලා, මේ මහා ව්‍යසනයට පත් වුණු ඒ වැන්දඹු කාන්තාව සුරක්ෂිත කරන්නට, ආරක්ෂා කරන්නට පාලන ක්ෂේත්‍රය තුළින් ලබා දිය යුතු ඒ නිශ්චිත රැකවරණය ලබා දෙන්නට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. එතුමන්ලා එසේ කටයුතු කරයි කියලා මා අපේක්ෂා කරනවා.

මේ යුද්මය ජයග්‍රහණය ලබා ගන්නට අපේ රටේ ත්‍රිවිධ හමුදාව ඇතුළු ආරක්ෂක ක්ෂේත්‍රය සුවිශාල පරිත්‍යාගයන් රැසක් සිදු කළා. ඒ නිසාම වැන්දඹුභාවයට පත් වුණු දසදහස් ගණන් කාන්තාවන් අද ජන සමාජයේ තමන්ගේ දු දරුවනුත් සමඟ බොහොම අභිංසක අසරණ ජීවිතයක් ගත කරනවා. මේ යුද්මය ක්‍රියාදාමය හරහා සිවිල් සමාජය තුළත් මහා විශාල හානි රැසක්, ජීවිත හානි රැසක් සිදු වෙලා තිබෙනවා. එයිනුත් අභිංසකභාවයට, අසරණභාවයට පත් වුණු වැන්දඹු කාන්තාවන් දහස් ගණනින්, දස දහස් ගණනින් ජීවත් වනවා. ඉතින් මේ අවස්ථාවේදී මා මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්නට කැමැතියි, මේ වැන්දඹු කාන්තාවන්ගේත්, ඒ වැන්දඹු කාන්තාව මූලික වුණු පවුල් ඒකකයේත් සුරක්ෂිතභාවය, ආරක්ෂිතභාවය සහ ශක්තිය තහවුරු කිරීම පිළිබඳව. ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙළක් වර්තමාන පාලනය හරහා ක්‍රියාත්මක වනවාද, නැද්ද කියන එක පිළිබඳවත් අප මේ අවස්ථාවේ ප්‍රශ්න කරන්නට ඕනෑ. විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර බල ප්‍රදේශවල නැඟෙනහිර කොට්ඨාසය ගත්තොත්, පවතින සංඛ්‍යා ලේඛනවලට අනුකූලව 40,000කට වැඩි ප්‍රමාණයක් වැන්දඹු කාන්තාවන් ජීවත් වනවායි කියලා ඒ ආරංචි, තොරතුරු අපට ලැබිලා තිබෙනවා. ඒ වාගේම උතුරු පළාතෙත් ඒ හා සමාන ප්‍රමාණයක් -තවත් 40,000ක්-, යාපනයේ දිස්ත්‍රික්කය පමණක් ගත්තොත් 25,000ක් පමණද වැන්දඹු ගෘහ මූලික පවුල් ඒකක තිබෙනවායි කියලා ඒ තොරතුරු අපට ලැබිලා තිබෙනවා.

ඇත්ත වශයෙන්ම විධිමත් තොරතුරු ලබා ගැනීමක් අද සිදු වෙලා නැහැ. පළමුවෙන්ම කරන්න ඕනෑ මේ ප්‍රදේශවල පැහැදිලි සංගණනයක් ක්‍රියාත්මක කරලා නියමිත දත්තයන්, පැහැදිලි, පිරිසිදු තොරතුරු ලබා ගන්නට මේ වර්තමාන ආණ්ඩුව කටයුතු කිරීමයි. ඒ වාගේම වර්තමාන ආණ්ඩුවේ ප්‍රධානත්වයෙන් මේ වැන්දඹු කාන්තාව කේන්ද්‍ර කර ගත් ශක්තිමත් සමාජ සුබසාධන, සමාජ ආරක්ෂණ වැඩසටහනක් දියත් වන්නට ඕනෑ. අද විවිධ රාජ්‍ය නොවන සංවිධාන, විවිධ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන මේ වැන්දඹු කාන්තාව මුල් කර ගත් ඒ ගෘහ මූලික පවුල් ඒකක සවිමත් කරන්නට, ශක්තිමත් කරන්නට, ඒ අයගේ ජන ජීවිතයට පුනර්ජීවයක් ලබා දෙන්නට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. නමුත් මේ වගකීම රාජ්‍ය නොවන සංවිධානවලට, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට අයිති කාර්ය භාරයක් නොවෙයි. ඒ අය කරන්නා වූ ඒ ධනාත්මක සේවය ඇත්ත වශයෙන්ම අපි අගය කරන්නට ඕනෑ. ඒ අය කරන්නා වූ ඒ ප්‍රගතිශීලි වැඩසටහන් අපි ප්‍රශංසාවට ලක් කරන්නට ඕනෑ. නමුත් රටේ වර්තමාන ආණ්ඩුවේ, වර්තමාන පාලකයන්ගේ වග කීමක් තිබෙනවා, පැහැදිලි ශක්තිමත් සැලැස්මක් ඔස්සේ මේ වැන්දඹු කාන්තාව කේන්ද්‍ර කර ගත් ඒ ගෘහ මූලික පවුල් ඒකකයට ලබා දිය යුතු ආර්ථික ශක්තිය, ලබා දිය යුතු රාජ්‍ය අනුග්‍රහය, ලබා දිය යුතු රාජ්‍ය මැදිහත්වීම නිවැරදිව නිරතුරුවම ලබා දෙන්නට කටයුතු කරන්නට. එයයි මගේ අදහස.

ඒ වාගේම, යම් කිසි මානසික පුනරුත්ථාපන උපදේශන වැඩසටහනක් දියත් කරලා ඒ වැන්දඹු කාන්තාව කේන්ද්‍ර කර ගත් ඒ ගෘහ මූලික පවුල් ඒකකයේ විශේෂයෙන්ම ඒ දු දරුවන්ගේත්, ඒ මවගේත් මානසික තත්ත්වය ධනාත්මක පැත්තට අපි ගෙනෙන්නට ඕනෑ. අපි හැමෝම දන්නවා, මේ මහා ව්‍යසනයන් තුළින් මේ වැන්දඹු කාන්තාව මුල් වෙච්ච ගෘහ මූලික පවුල් ඒකකය මුළුමහත් ජන සමාජයේ කොන් කිරීම්වලට ලක් වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම ඒ පවුල් ඒකකයේ තිරසාර ආදායම් මාර්ග ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්නට රාජ්‍ය මැදිහත්වීම අද අත්‍යවශ්‍ය කාරණාවක් බවට පත් වෙලා තිබෙනවා.

අද රාජ්‍ය මැදිහත්වීම ගැන කථා කරන කොට විවිධ අමාත්‍යාංශ හරහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වන බව පෙනෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හරහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක වනවා. ඒ වාගේම ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හරහා වැඩසටහන් ක්‍රියාත්මක වනවා. ඒ වාගේම සමාජ සේවා අමාත්‍යාංශය හරහා තවත් වැඩසටහන් ක්‍රියාත්මක වනවා. නමුත් මේ වැඩසටහන් සියල්ලක්ම පැහැදිලි ඉලක්ක කරා යන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහනක් හැටියට ක්‍රියාත්මක කරන්නට අපි හැමෝම අපගේ අවධානය යොමු කරන්නට ඕනෑ. මේ වැන්දඹු කාන්තාවන්ගේ ප්‍රශ්න පිළිබඳව වෙනමම ජනාධිපති කාර්ය සාධක බල කායක් පිහිටුවලා ඒ ජනාධිපති කාර්ය සාධක බල කාය හරහා කෙටි කාලීනව, මධ්‍ය කාලීනව, ඒ වාගේ දීර්ඝ කාලීනව පැහැදිලි, පිරිසිදු විසඳුම් මාලාවක් මේ වැන්දඹු කාන්තාව කේන්ද්‍ර කර ගත් ගෘහ මූලික පවුල් ඒකක සවිමත් කරන්නට, ශක්තිමත් කරන්නට, සවිබල ගන්වන්නට, ඒ වාගේම ඒ අයගේ ආර්ථික රටාවට නව පුනර්ජීවයක් උදා කරන්නට කටයුතු කරන්න කියන යෝජනාව මම මේ අවස්ථාවේදී කරනවා. විශේෂයෙන්ම ඒ උතුරු නැඟෙනහිර බල ප්‍රදේශ කේන්ද්‍ර කර ගත් දසදහස් ගණන් වැන්දඹු කාන්තාවන්ගේ ජන ජීවිතය ශක්තිමත් කරන්නට ඒ කාන්තාව කේන්ද්‍ර කර ගත්ත ඒ ගෘහ මූලික පවුල් ඒකකවල සුබසාධන

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පක්ෂ විපක්ෂ අප සියලු දෙනාම ලබා දෙන්න පුළුවන් ඉහළම සහයෝගය, ඉහළම ශක්තිය ලබා දෙනවා කියන එකත් ප්‍රකාශ කරනවා.

මාතෘකාවෙන් පිට පැන වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැනත් මා සන්තෝෂ වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැවත වරක් මා මේ කාරණය කියන්නට ඕනෑ. වර්තමාන අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා ප්‍රමුඛ ඒ නිලධාරි මණ්ඩලය අද බොහොම ධනාත්මක පනත් කෙටුම්පත් දෙකක් ඉදිරිපත් කර විශේෂයෙන් රටේ ජනතාවගේ සුබසිද්ධිය උදෙසා මෙවැනි ධනාත්මක වැඩ පිළිවෙළක් දියත් කිරීම ගැන මගේ ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමා. දැන් ගරු ජයරත්න හේරත් නියෝජ්‍ය අමාත්‍යතුමා - නැහැ.

ගරු ඩිලාන් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා.

[අ. භා. 5.28]

ගරු ඩිලාන් පෙරේරා මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dilan Perera - Deputy Minister of Public Administration and Home Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත්වල අන්තර්ගතය පිළිබඳව ගරු ඇමතිතුමා අද උදේ වරුවේ ඉතාම හොඳින් විස්තර කළා. ඉන් පසුව ඒ අන්තර්ගතය පිළිබඳව හා එයින් සිදු වන සේවය හා ජනතාවට අත් වෙලා තිබෙන වාසිය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ වෙන දාට අපට දක්නට නොලැබෙන්නා වූ එකඟත්වයකුත් අද තිබුණා. මුළු විවාදය තුළම බොහොම සුසංයෝගයෙන් යුතුව එම විවාදයේ කටයුතු සිදු වුණාය කියන එක පිළිගන්නට ඕනෑ.

එක්සත් ජාතික පක්ෂයත්, ටීඑන්ඒ පක්ෂයත් යන පක්ෂ දෙකේම මන්ත්‍රීවරු හැටියට පෞද්ගලිකවත්, පක්ෂ හැටියටත් මේ පිළිබඳව තමන්ගේ මතය ප්‍රකාශ කළා. අප මෑතකදී දැක තිබෙන පුරවැසි පෙරමුණේ නායක ගරු ශ්‍රී රංග මැතිතුමා නම් කථා කරනවා අද අප ඇහුවේ නැහැ. එහෙත් එතුමා නිශ්ශබ්දව සිනා සෙමින් සිටින නිසා අපට විශ්වාසයි, - [බාධා කිරීමක්] එතුමා ඊළඟට කථා කරනවාලු - මේ සඳහා එතුමාගේ පක්ෂයේ සහයෝගයත් ලබා දෙන බවට. හැබැයි ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු ඒ කණ්ඩායම නම් උදේ වරුවේ සිට මේ විවාදයට සම්බන්ධ වුණේත් නැහැ; මේ පනත් කෙටුම්පත් ගැන කරුණු කිව්වේත් නැහැ. සුසංයෝගයෙන් වැඩ කිරීමේ දේශපාලනයට ඇති අකැමැත්ත නිසා ඒ අය එහෙම කළා දෝ කියන ප්‍රශ්නය මට පැන නඟිනවා.

කෙසේ වෙතත්, අද මේ ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් දෙස බැලුවාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිව පෙනෙන්නේ ශ්‍රී ලංකාවේ වර්තමාන රජය මේ රටේ සුබසාධනය ලබා දිය යුතු, ආරක්ෂාව ලබා දිය යුතු, රජයේ රැකවරණය ලබා දිය යුතු අංශ කෙරෙහි දක්වන රජයේ ප්‍රතිපත්තියයි. මේ පනත් කෙටුම්පත් දෙස බැලුවාම අපට පෙනෙනවා, විශේෂයෙන් මේ රටේ ආරක්ෂාව, රැකවරණය වඩා වැඩියෙන් ලැබිය යුතු කොටස් කෙරෙහි ඒ ආරක්ෂාව, රැකවරණය ලබා දෙන්න රජය මේ හරහා මැදිහත් වෙලා තිබෙනවාය කියන එක. කාන්තාවන් දරුවන් විතරක් නොවෙයි, රාජ්‍ය අංශයේ තාවකාලිකව වැඩ කළ, අනියම් ආකාරයෙන් වැඩ කළ කොටස් බොහොම අනාරක්ෂිතව රාජ්‍ය රැකවරණය පිළිබඳ ප්‍රශ්න තියා ගෙන, විශ්‍රාම වැටුපේ ප්‍රශ්න තියා ගෙන, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රශ්න තියා ගෙන තමයි තමන්ගේ එදිනෙදා කටයුතු කළේ. ඒ නිසා මහින්ද චින්තන වැඩ පිළිවෙළ අනුව, ඒ සියලු කොටස් කෙරෙහි ප්‍රතිපත්තියක් හැටියට අපේ රජය දක්වන්නා වූ රැකවරණය සුබසාධනවාදී ප්‍රතිපත්තිය ඵලෙසම ක්‍රියාත්මක කරන වගයි මේ පනත් කෙටුම්පත් හරහා පෙන්වා දුන්නේ.

ඒ නිසා මේ පනත් කෙටුම්පත් පිළිබඳව සාකච්ඡා කිරීමේදී එක්සත් ජාතික පක්ෂයේ වැඩ බලන නායකතුමාගෙන්- ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමාගෙන්- පටන් ගත්තාම විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන් දුන් අදහස් අප ඉතා අගය කොට සලකනවා.

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මූලාරම්භයේ කථාව කරලා කිව්වා, එතුමා කථාවෙන් ටිකක් පිට පනිනවා වාගේ කියලා. නමුත් එතුමාගේ කථාවෙන් පිට පැනීමක් මා දැක්කේ නැහැ. මූල්‍ය වශයෙන් වැන්දඹුවන් සහ අනත්දරුවන් පිළිබඳව රජය මේ පනත් කෙටුම්පත් හරහා දෙන්නා වූ වැඩ පිළිවෙළ ගැන ප්‍රසාදය පළ කරමින් එතුමා තවත් පියවරක් ඉදිරියට තබා කිව්වේ, මේ රටේ උතුරු නැඟෙනහිර සහ දකුණු පළාත්වල වැන්දඹු මූලික පවුල්වලට මූල්‍ය වශයෙන් දෙන්නා වූ රැකවරණයට අමතරව ඒ ගොල්ලන් අද ගත කරන්නා වූ ජීවිතය තුළ ඒ ගොල්ලන්ට දෙන්නට පුළුවන් අනෙකුත් ශක්තීන් ලබා දෙන්නට අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් ගොනු කරන්නය කියන කාරණයයි. ඒ නිසා මා හිතන්නේ නැහැ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඔබතුමා මාතෘකාවෙන් පිට පැන්නාය කියලා. ඔබතුමාගේ කථාවෙන් සිදු වුණේ මාතෘකාව සම්බන්ධයෙන් තවත් පියවරක් ඉදිරියට තැබීමක්ය කියලායි මම හිතන්නේ. මොකද, කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හෝ අද අප පිළිගන්න ඕනෑ කාරණයක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වැන්දඹුවන් මූලික කර ගත්තු පවුල් අද මේ රටේ උපසංස්කෘතික කුලකයක්; they are a sub-culture in our society. ඒ නිසා ඒ උපසංස්කෘතික කුලකය පිළිබඳව මේ රටේ, විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ ඉන්න අපේ වැඩි අවධානයක් යොමු වන්න ඕනෑ කාලය ඇවිල්ලා තිබෙනවා. රජයේ රැකවරණය මූල්‍යමය වශයෙන් අහිමි වන්න තිබුණු ඒ වැන්දඹුවන් සහ අනත්දරුවන්ට ඒ රැකවරණය ලබා දීම සඳහා රජය පනත් කෙටුම්පත් ඉදිරිපත් කරමින් මේ වාගේ ප්‍රගතිශීලි පියවර ගන්නා වෙලාව තමයි ඔවුන් කෙරේ වැඩි අවධානය යොමු කරවීමේ විධික්‍රමය පිළිබඳව පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව වඩා වැඩියෙන්, වඩා හොඳින් සාකච්ඡා කරන්න අපට තිබෙන හොඳම අවස්ථාව කියා මම හිතනවා.

අද ආණ්ඩුව හැටියට විශේෂයෙන්ම මේ රට වෙනුවෙන් ධනාත්මක දේවල් ඉදිරිපත් කරන කොට "මේක ඉදිරිපත් කරන්නේ ආණ්ඩුව, ඒ නිසා විරුද්ධ පක්ෂයේ අපි හැම දාම විරුද්ධ වන්න ඕනෑ" කියන ප්‍රතිපත්තිය පැත්තකට දමලා "ආණ්ඩුව ඉදිරිපත් කරන්නේ ධනාත්මක දෙයක් නම් ඒකට විරුද්ධ පක්ෂයේ අපිත් සහයෝගය දෙන්නට ඕනෑ" කියන ප්‍රතිපත්තියට අද විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් එකඟ වීම සම්බන්ධයෙන් අපි ඉතාම සතුටු වනවා. මේ වාගේ ධනාත්මක අණපනත්වලට විරුද්ධ පක්ෂය අද දක්වපු සහයෝගයම මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සම්බන්ධයෙනුත් ඉතා ධනාත්මකව හිතලා ලබා දේවිය කියා මම කල්පනා කරනවා. "ඔව්, ධනාත්මක දේවලට අප සහයෝගය දෙනවා" කියලා මේ පනත් කෙටුම්පත් දෙස බලපු විධියටම අතිගරු ජනාධිපතිතුමා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වූ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඇතුළු එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ

විපක්ෂ නායකතුමාගේ කණ්ඩායමත් එකතු වෙලා කර ගෙන යන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සම්බන්ධ සාකච්ඡා දිහාත් බලලා, ඊට අවශ්‍ය කරන සහයෝගය පටු පක්ෂ සහ පටු පෞද්ගලික දේශපාලන න්‍යාය පත්‍රයන් පැත්තකට දමලා ලබා දේවිය කියලා මම විශ්වාස කරනවා. ඒක තමයි අද මේ රටේ විය යුතු ප්‍රධානතම කාර්ය භාරය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ පනත් කෙටුම්පත් පිළිබඳ විවාදය අවස්ථාවේදී විශේෂයෙන්ම ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පතට ඇතුළත් විය යුතු සංශෝධනයක් පිළිබඳව අපට කරුණු දැක්වුවා. ඒ අර තුන් වැනි වගන්තියේ දෙවන ඡේදයේ පළමුවන උපවගන්තිය යටතේ තිබෙන විශ්‍රාම යාමකට හෝ ඉවත් කිරීමකට කියන කාරණයට අමතරව "හැර යෑමක්" කියන වචන ඇතුළත් කරන්න කියන කාරණයයි. අප ප්‍රතිපත්තියක් හැටියට ඒ සංශෝධනය පිළිගන්න සූදානම්. අද ඒ සංශෝධනය ඇතුළත් කිරීමට ක්‍රමවේදයක් නැති වුණත් අපි එතුමාට කියන්න කැමැතියි ඒ වචනය ඇතුළත් කිරීම අපි පිළිගන්නවා කියලා. මේ සංශෝධනයට ඇතුළත් කළ යුතු සංශෝධනයක් හැටියට අප ඒ සංශෝධනය භාර ගන්න සූදානම් කියන එක මේ වෙලාවේදී අප එතුමාට කියන්න කැමැතියි. සිංහල භාෂාවෙන් එය "හැර යෑමක්" වන කොට එහි ඉංග්‍රීසි යෙදුම වන්නේ "retirement or leaving or removal" කියන එකයි. ඒ ආකාරයට සංශෝධනය වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ගොවියා, කම්කරුවා, රාජ්‍ය සේවකයා ආරක්ෂා කරනවා වාගේම වැන්දඹුවන් විශාල පිරිසක් මේ රටේ ඇති වෙමින් යන තත්ත්වය තුළ "මහින්ද චින්තන"ති ඇති පරිදිම ඒ වැන්දඹුවන් මූලික වූ පවුල් සංස්ථාව ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළට අදාළ වැඩ කටයුතුත් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ විශේෂයෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේත් අනගි සහයෝගයක් අර ගෙන කරන්න ලැබීම පිළිබඳව අපි සතුටු වනවා.

ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමාත් ඉතාම හොඳ අදහස් කීපයක්ම යොමු කළා. එතුමා කියන්න යෙදුණා අද වෙනත් රටවල විශ්‍රාම ගන්නා අයගේ වයස් සීමාව වැඩි කරනවාය, ඒක හොඳ කාරණයක්ය කියලා. මම පෞද්ගලිකවම විශ්වාස කරනවා අපේ රටෙත් විශ්‍රාම ගන්නා වූ වයස් සීමාව වැඩි කළාට කමක් නැහැ කියලා. ඒක මගේ පෞද්ගලික මතයක්. මම විශ්වාස කරනවා, අපේ රටෙත් විශ්‍රාම ගන්නා වූ අයගේ වයස් සීමාව වැඩි විය යුතුය කියලා. මොකක්ද හේතුව? දැන් ඉස්සර වාගේ නොවෙයි, අද තිබෙන්නා වූ ජීවන තත්ත්වය අනුව, විෂයානුබද්ධව සේවය කරන්නා වූ තත්ත්වයන් අනුව ඒක විය යුතුය කියලා මා හිතනවා. අද විශ්‍රාම යන අපේ බොහෝ විශ්‍රාමිකයන්ට අඩු වයස් සීමාවෙන් විශ්‍රාම යන්න සිදු වෙලා දෝ කියා මට හැඟෙනවා. ඒ නිසා ඒ අයගේ විශ්‍රාම වයස් සීමාව වැඩි කළාට කමක් නැහැ. අපි දන්නවා අධිකරණ ක්ෂේත්‍රයේ එහෙම සාමාන්‍යයෙන් රජයේ සේවකයන්ට නැති විශ්‍රාම වයස් සීමාවන් යොදවලා තිබෙන බව. ඒ දිහා බැලුවාම අපට පෙනෙනවා, ඒ විශ්‍රාම යන වයස් සීමාවේ වැඩ කරන විනිශ්චයකාරවරුන්ගෙන් බහුතරයක් උදවිය ඉතාම හොඳ සිහිබුද්ධියෙන් හොඳාකාරව මේ කාරණා කටයුතු කරන බව. ඒ නිසා ඒ හැකියාවම අපේ රාජ්‍ය සේවයේ සිටින බොහෝ රාජ්‍ය සේවකයන්ටත් තිබෙනවා කියා මා කල්පනා කරනවා. ඒ නිසා අජිත් පෙරේරා මන්ත්‍රීතුමා කිව්ව විධියට මමත් විශ්වාස කරනවා, අපේ රාජ්‍ය සේවයේ විශ්‍රාම යන වයස දැන් තිබෙන වයසට වඩා වැඩි කළාට ඒක අපේ රටට ප්‍රශ්නයක් වන්නේ නැහැ කියා. අද බොහොම සුසංයෝගයෙන්, බොහොම එකමුතුවෙන් මේ හොඳ අණපනත් කථා කළා වාගේ ඒ පිළිබඳව රජයත්, විපක්ෂයත් එකඟ වනවා නම් අපට අනාගතයේදී කථා කර තීන්දුවක් ගන්න පුළුවන්. ඒකයි විය යුත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනික් කාරණය මෙයයි. අද මේ ප්‍රශ්නය දෙස අපි බලන විට අද වැන්දඹුවන් සහ අනත්දරුවන් පිළිබඳව රජයට පුළුවන් මට්ටමින් අවශ්‍ය විධියට ඒ අයගේ මූල්‍ය රැකවරණය ලබා දෙන්න, ඒ අයට වැඩි මූල්‍ය ශක්තියක් ලබා දෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ගොනු වුණා වාගේම අද වැන්දඹුවන් මූලික කර ගත් උපසංස්කෘතියක් අපේ රටේ ගොඩ නැඟී තිබෙනවා කියන කාරණය අපි පිළිගෙන ඒ අයත් අපේ සමාජයේ අනික් අය වාගේම සමානව අයිතිවාසිකම් ලබා ගන්නා වූ කොටසක් කියන කාරණය අපි පිළිගන්නට වනවා. එහෙම නැතිව ඒ වැන්දඹුවක්, ඒ දරුවන් අනත් දරුවන් කියා හිතන්න හොඳ නැහැ. අපි ඒ අය හඳුන්වන්නෙත් ඒ විධියට. අනත්දරුවන් කියන අය අනාථ දරුවන් හැටියට තල්ලු කර දමන්න හොඳ නැහැ. සමහර වෙලාවට ඒ අයගේ ස්වාමිපුරුෂයනුත්, මේ රටේ අපටත් වඩා වැඩි සේවයක් කළ අය. අප සේවය කරන්නේ ජීවත් වෙමින්; මහන්සි වෙමින්. ඒ අයගෙන් සමහර උදවිය ජීවිතය නැති කර ගෙන තිබෙන්නේ මේ රටේ රාජකාරියක් කරන්න ගිහින්. ඒ නිසා ඒ අයට අපටත් වඩා ප්‍රමුඛස්ථානයක් මේ සමාජයේ හිමි විය යුතුව පවතිනවා. අද සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය කථා කරන විට මම දැක්කේ සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය පිටුපස ඉඳ ගෙන කථා කරනවා. හැබැයි මම ඉස්සරහින් දැක්කේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා කථා කරනවා. ඒ නිසා අද ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා නැති අඩුව සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය මේ විවාදය හරහා නිවැරදිව සැපිරුවාය කියා මම කල්පනා කරනවා, මේ විවාදයට එකතු කළ කාරණා දිහා බැලුවාම. විරුද්ධ පක්ෂය පැත්තෙන් හිටපු ගරු මහේස්වරන් මන්ත්‍රීතුමා ගත්තොත් ඒ කාරණයත් එහෙමමයි. ඒ නිසා අද මේ සභාව තුළත් අපට පෙනෙනවා, වැන්දඹුව මූලික කර ගත් පවුල්වල උදවිය මේ සභාව තුළට ඇවිල්ලා තමාගේ ස්වාමිපුරුෂයා අරගෙන ගිය අරගලය, අරගෙන ගිය වැඩ පිළිවෙළ කරන්නට උත්සාහ කරන බව. අපේ සුමේධා ජයසේන මැතිතුමිය ගත්තත් එහෙමයි. එතුමියගේ ස්වාමිපුරුෂයා දේශපාලනයට ආවා. එතුමාගෙන් පස්සේ මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් එතුමිය ඉස්සරහට ඇවිල්ලා නායකත්වය දීලා කාලයක් තිස්සේ කටයුතු කරන කාන්තාවක්. පාට කණ්ණාඩි ගලවා අද උදේ වරුවේ ඉඳලා මේ අගනා කියන අණපනත් දිහා බැලූ විධියටම ඉදිරියේදීත් ඒ සුසංයෝගය, ඒ සහයෝගය තියා ගත්තොත් පාර්ලිමේන්තුව හරහා ජනතාව බලාපොරොත්තු වන්නාවූ, ජනතාව අපෙන් බලාපොරොත්තු වන වැඩ කොටස් අපට කරන්නට හැකියාව ලැබෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එනිසා මේ අණපනත්වල තිබෙන්නා වූ අන්තර්ගතය පිළිබඳව මම පුනපුනා විස්තර කරන්න, විග්‍රහ කරන්න යන්නේ නැහැ. මොකද, හේතුව ඒ විස්තර කිරීම් නිවැරදිව පිළිගෙන සභාව තුළ විතරක් නොවෙයි, උපදේශක කාරක සභාව තුළ වුණත් TNA සංවිධානයේ විනායගමූර්ති පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා අදහස් රාශියක් ඉදිරිපත් කරන්නට යෙදුණු බව මම දැක්කා. ඒ නිසා මේ අණපනත් පිළිබඳව උපදේශක කාරක සභා මට්ටම් තුළත් ඉතා හොඳින් සාකච්ඡාවට භාජනය කර ඒ සාකච්ඡාවට භාජනය කළ කරුණු ගැන තවත් සවිස්තරාත්මකව ඉතාම ගුණාත්මකව, ඉතාම ධනාත්මකව බලා අපි කටයුතු කරන්න ඕනෑ. මේක ගෙනෙන්නේ ආණ්ඩුවෙන්, ඒ නිසා මේකෙන් ආණ්ඩුවට වැඩි වාසියක් වෙයි, ආණ්ඩුවට දේශපාලන වාසියක් වෙයි කියන විධියට ඒ හැම දෙයක් දිහාම බලන්නේ නැතිව, "ඔව්, මේක විය යුතු වැඩක්, වාසි යන්නේ ජනතාවට. මේ රටේ වැන්දඹුවන්, අනත්දරුවන්, රාජ්‍ය සේවකයන් විශාල ප්‍රමාණයක් මේකෙන් වාසි ලබනවා. ඒ නිසා ඒක යන්නේ අපේ ජනතාවට. ඒ අයගේ ඡන්දය කාට දුන්නාද කියන ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ, මේක අපේ ජනතාවටයි, අපි නියෝජනය කරන ජනතාවයි මේකෙන් වාසි ගන්නේ" කියන කාරණය පෙරදැරි කර ගෙන අද උදය වරුවේ ඉඳලා මේ සාකච්ඡාවට, විවාදයට සහභාගි වුණු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මේ වෙලාවේ ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මගේ ස්තුතිය ප්‍රණාමය පුද කරන්න කැමතියි. ඒ එක්කම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, ඒ වාගේම

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

විශේෂයෙන්ම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂතුමා ඇතුළු ඒ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය මේ සඳහා විශාල වෙහෙසක් ගත්තා. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරිනුත් විශාල මහන්සියක් ගත්තා. ඒ පිළිබඳවත් මගේ ස්තුතිය පුද කරනවා. අද මේ පාර්ලිමේන්තුව තුළ ඉතා වැදගත් අණපනතක් සම්බන්ධයෙන් නිවැරදිව ගැඹුරින් සාකච්ඡා කර ඒ සාකච්ඡාව අවසානයේ මේ රටට අවශ්‍යම කරන අණපනත් සාර්ථකව සම්මත කර ගන්නට විරුද්ධ පක්ෂයත්, ආණ්ඩු පක්ෂයත් දැන් සහයෝගය පිළිබඳව ස්තුතිය පළ කරමින්, මේ ආදර්ශයම ඉදිරියේදීත් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව නිවැරදි දේ සඳහා ලබා දෙන්නය කියන ඉල්ලීම විපක්ෂයෙන් කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 5.43]

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(මාණ්පුමිකු එச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

තුන් වැනි කාරණය හැටියට මම දකින්නේ මේකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන ජනතාවට විශාල කලකිරීමක් ඇති වෙලා තිබෙනවා. "අපේ ඡන්දය මං කොල්ල කනවා නම්, ඡන්ද ගණන් කිරීමේදී මං කොල්ලකෑම් එනවා නම්, කම්පියුටර් ජිල්මාට් ඇති වනවා නම් ඇයි අපි ඡන්දය දාන්න යන්නේ" කියලා අද ඡන්ද දායකයෝ අතර මන්දෝත්සාහී ගතියක් තිබෙනවා; ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව විශ්වාසය නැති වෙලා තිබෙනවා. අන්න ඒ නිසයි, එක්සත් ජාතික පක්ෂය හැටියට අපි ස්වාධීන මැතිවරණ කොමිසම, ස්වාධීන පොලිස් කොමිසම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම ස්ථාපිත විය යුතුයි කියා පුනපුනා කියන්නේ. ඒ, දේශපාලන වාසි ලබා ගන්න නොවෙයි. අද බලන්න. අපි එක මැතිවරණයෙන් මැතිවරණයට ගත්තොත් ඡන්දය දැමීමට යන සංඛ්‍යාවේ ප්‍රතිශතයේ බරපතළ අඩු වීමක් දකින්නට තිබෙනවා. ඒ නිසා සමහර වේලාවට ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගන්න අනාගතයේදී අර ඕස්ට්‍රේලියාවේ වාගේ ඡන්දය දැමීම සෑම පුරවැසියෙකුටම අනිවාර්ය කරන්න පුළුවන් තත්ත්වයකට ගෙනෙන්න අපට සිදු වෙයි. එසේ නැතිනම් මේ ප්‍රජාතන්ත්‍රවාදී ඉතාම සුළු කොටසකින් රටේ පාලක පක්ෂයක් පත් වනවා. මෙය ප්‍රජාතන්ත්‍රවාදී මූල ධර්මයට විරුද්ධයි කියන එක මම පැහැදිලිව කියන්නට ඕනෑ. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව අද අපේ රටේ ජනතාවගේ විශාල කලකිරීමක්, මන්දෝත්සාහයක් තිබෙනවා. එයට හේතුව වශයෙන් ජනතාව කල්පනා කරනවා, "අපි ඡන්දය දාලා වැඩක් නැහැ. අපේ ඡන්දය හොරා කනවා. අපේ ඡන්දය ගසා කනවා. කම්පියුටර් ජිල්මාට් තියෙනවා" කියලා. මේ නිසා පාර්ලිමේන්තුවේ ඒ ආණ්ඩු පක්ෂය පැත්තේ හිටියත්, මේ විපක්ෂයපැත්තේ හිටියත් අපට ලොකු වග කීමක් තිබෙනවා, ජනතා නියෝජිතයන් හැටියට ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී උරුමය ආරක්ෂා කර දෙන්න; ඡන්ද අයිතිය ආරක්ෂා කර දෙන්න; අපක්ෂපාතීව, ජාති, ආගම්, කුලමල, දේශපාලන භේදයෙන් තොරව ඒ මැතිවරණ ක්‍රමය හැකිතාක් දුරට ස්වාධීන, අපක්ෂපාතී, සාධාරණ මැතිවරණයක් බවට පත් කරන්නට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා මූලික වන්නේ ස්වාධීන මැතිවරණ කොමිසමක් ඇති කිරීම කියා මම නැවතත් කියනවා. විශේෂයෙන්ම ඔබතුමා මුස්ලිම් ජාතිකයෙකු හැටියට, මුස්ලිම් නායකයෙකු හැටියට මේ රටේ සුළු ජාතීන් කියලා අපි කථා කරන්නේ නැහැ. ජනාධිපතිතුමා කියනවා සුළු ජාතීන්, මහා ජාතීන් වශයෙන් දෙ ගොල්ලක් නැහැ කියලා. එහෙම නම් ශ්‍රී ලාංකිකයන්ට, විශේෂයෙන්ම උතුරු නැහෙනහිර ප්‍රදේශවල ජීවත් වන අපේ රටේම පුරවැසියන්ට ඒ ඡන්ද අයිතිය ලබා දීමට -සමහර වෙලාවට පසු ගිය අවුරුදු 30 ඇතුළත ඒ අයට ඡන්ද අයිතිය ලැබුණේ නැහැ, හරිහමන් විධියට ඡන්ද අයිතිය ලැබුණේ නැහැ- කටයුතු කරන්නට ඕනෑ. ඒ වාගේම බයක් සැකක් නැතිව මැතිවරණයක දී තමන්ගේ ඡන්දය පාවිච්චි කිරීමේ නිදහස අපේ ඡන්ද දායකයන්ට ස්ථාපිත කරලා දෙන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි ස්වාධීන පොලිස් කොමිසමක් අවශ්‍ය වන්නේ. එසේ නැත්නම්, මැර දේශපාලනය, හිතුවක්කාර දේශපාලනය, ගණන්කාර දේශපාලනය නිසා "ඡන්දය දාන්න එපා, මෙහාට දීපල්ලා උඹලාගේ identity cards ටික" කියලා කිව්ව කාලයක් තිබුණා අපි දැක්කා. කන්ද උඩ රට, විශේෂයෙන්ම දුවිඩ ජනතාව වාසය කරන ප්‍රදේශවල ඒ ජාතික හැඳුනුම් පත පවා උදුරා ගන්න සමහර මැර දේශපාලනඥයෝ -මම කියන්නේ නැහැ ඔක්කෝම කියලා- උත්සාහ කළ අවස්ථාවන් වාර්තා වෙලා තිබෙනවා. එහෙම නම් මේ රටේ ජනතාවට බියක් සැකක් නැතිව තමන්ගේ ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය ස්ථාපිත කිරීමේ වග කීමත් මේ පාර්ලිමේන්තුවේ එහා පැත්තේත්, මෙහා පැත්තේත් සිටින අපි දෙගොල්ලන්ටම පැවරිලා තිබෙනවා. රවී කරුණානායක මන්ත්‍රීතුමා ජනතා නියෝජිතයෙකු හැටියට මීට ප්‍රථමවත් තමන්ගේ ධනය වියදම් කරලා ප්‍රසිද්ධ දැන්වීම් දාලා ඡන්ද හිමි නාම ලේඛනයේ ඡන්දය ලියාපදිංචි කර ගන්නට අපේ ඡන්ද දායකයෝ උනන්දු කරවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ ගැන මම ඉතාමත් සතුටු වෙනවා, ඒ වාගේම ස්තුතිවන්ත වෙනවා. ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරු රවී කරුණානායක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඉතාමත් කාලෝචිත, ජාතිකමය වශයෙන් ඉතාමත්ම වැදගත් -අපි ජාතික සමගිය ගැන කථා කරනවා; ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. - මේ යෝජනාව ඉතාම සතුටින් ස්ථිර කරන ගමන් මම මතු කළ ප්‍රශ්න පිළිබඳව, ඒ කරුණු පිළිබඳව රජය පැත්තෙන් විශේෂ අවධානයක් යොමු වේවිය කියා විශ්වාස කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கொழும்பு, கம்பஹா ஆகிய மாவட்டங்களின் வாக்காளர் பதிவு நடைமுறைகள் பற்றி பாராளுமன்ற உறுப்பினர்களான கௌரவ ரவி கருணாநாயக்க அவர்களும் கௌரவ ஜயலத் ஜயவர்தன அவர்களும் விலாவாரியாக விளக்கினார்கள். நுவரெலியா மாவட்டத்தில் கடந்த ஜனாதிபதி தேர்தலில் வாக்களிக்கச்

සන්දර්ප්පම් කිටෙක්ක පලරුක්කුප් පොතුත් තේර්තලින්පෝතු සන්දර්ප්පම් කිටෙක්කවිල්ලෙ. ආනාල්, අංකිරුක්කින්ර කිරාම සේවකර්කළ් මර්රුම් Divisional Secretary කාරියාලයත්තිල් ඉරුක්කින්රවර්කළ් කූරුකින්ර කරුත්තු, අන්තන්ත ආණ්ටුක්කුරිය වාක්කාළර් ඉටාප්පින්පටි අවර්කළුක්කු වාක්කළික්කච් සන්දර්ප්පම් වළංකප්පට්ටතු එන්පතාකුම්. උණ්ම෈යිල් වාක්කුරිමෙ එන්පතු ඔරු මනිතනින් අටිප්පටෙ උරිම෈යාකුම්. ආනාල්, ඇන්ත අටිප්පටෙ උරිම෈ මීරප්පටුකින්රතු. ඉන්රු නාංකළ් මනිත උරිම෈කළ් පර්රි පේසුකින්රෝම්. All fundamental rights are human rights, but all human rights are not fundamental rights. අප්පටි ඉරුක්කින්රපොළුතු fundamental rights ආක ඉරුක්කින්ර ඇන්ත වාක්කුරිම෈යෙ නාංකළ් නිච්සයමාක එමතු මක්කළුක්කු වළංක වේණ්ටුම්; යාරුක්කු වාක්කළිප්පතු එන්පතෙ අවර්කළ් තීර්මානිප්පාර්කළ්.

ආනාල්, ඉන්රු වාක්කාළර් පට්ටියලෙප් පතිවතිල්කූට තාමතම්! ඉන්රු නාංකළ් computer යුකම් එන්කින්රෝම්; Royal College පල computer award කළෙප් පෙර්රුක්කොණ්ටිරුක්කින්රතු. අතේපෝල මොරට්ටුවෙ පල්කලෙක්කළකමුම් පෙර්රු වරුකින්රතු. ආනාල්, වාක්කාළර් පට්ටියලෙප් පතිවතිලේ ඉන්රුම් පල කුළරුපටිකළ් ඉටම්පෙරුකින්රන. අවෙ උරියමුරෙයිල් පතිවු සෙය්යප්පටුවතිල්ලෙ. නුවරෙලියා මාවට්ටත්තිල් කටන්ත ජනාතිපති තේර්තලිල් අළික්කප්පට්ට වාක්කුකළිලුම් පාර්ක්ක පොතුත් තේර්තලිල් වාක්කුකළ් කුරෛන්තිරුක්කින්රන. පලරුක්කු වාක්කාළර් අට්ටෙ කිටෙක්කවිල්ලෙ. උණ්ම෈යිල් ඉන්ත නිලෙමෙයිල් මාර්රම් ඒර්පට වේණ්ටුම්. නාංකළ් සෙල්කින්ර ඉටමෙල්ලාම් අංකුළ්ළ මක්කළ් "එංකළුක්කු ඉන්තමුරෙ තේර්තලුක්කාන වාක්කාළර් අට්ටෙ කිටෙක්කවිල්ලෙ" එන්රු කූරුකින්රාර්කළ්. ඔව්වොරු වරුටමුම් ඉන විකිතාචාරම් අතිකරික්කින්රපෝතු අතන් අටිප්පටෙයිලේ වාක්කළිප්පු වීතමුම් අතිකරික්ක වේණ්ටුම්. ආනාල්, චිල ඉටංකළිල් අප්පටි අතිකරිප්පතිල්ලෙ. කිරාමචේවකර් මට්ටත්තිල් ඉන්තප් පිෙ ඒර්පටුකින්රතා අල්ලතු Divisional Secretary මට්ටත්තිල් ඉන්තප් පිෙ ඒර්පටුකින්රතා එන්පතෙ අරසු නිච්සයමාකත් තේටිප් පාර්ක්ක වේණ්ටුම්. වාක්කුරිමෙ එන්පතු පොතුවාන විටයමාකුම්. චම්පන්තප්පට්ටවර්කළ් එන්තක් කට්චික්කු වාක්කුප් පෝටුකින්රාර්කළ් එන්පතු වේරු විටයම්. ආනාල්, අවර්කළින් අටිප්පටෙ උරිම෈යාන වාක්කළික්කුම් උරිමෙ නිච්සයමාක වළංකප්පට්ට වේණ්ටුම්. අතනූටාකත්තාන් අවර්කළ් තංකළුටෙය පිරතිනිතිකළෙ උරියමුරෙයිල් තෙරිවු සෙය්ය මුටියුම්. ඉන්ත නාට්ටෙ වළිනටත්තුකින්ර පාරාළුමන්රමාක ඉරුන්තාලුම් චරි, පිරතේච චපෛකළාක ඉරුන්තාලුම් චරි, මාකාණ චපෛකළාක ඉරුන්තාලුම් චරි, ඉවෙ අනෛත්තිනුම් නිරුවාකත්තෙ මක්කළ් තීර්මානික්ක වේණ්ටුමාක ඉරුන්තාල් අවර්කළුක්කුරිය වාක්කුරිමෙ වළංකප්පට වේණ්ටුම්. අව්වාරින්රි, "එමතු නාට්ටිල් චනනායකම් නිලව වේණ්ටුම්, good governance ඒර්පට වේණ්ටුම්" එන්පතෙල්ලාම් ෂන්චාට් ඉල් පතියප්පට්ට වෙරුම් පේච්චුක්කළාකවේ ඉරුක්කුම්. එනවේ, ඔරු මනිතනින් අටිප්පටෙ උරිමෙකළිල් ඔන්රාක ඉරුක්කින්ර ඉතනෙ නාංකළ් නිච්සයමාකච් චෙයර්පටුත්ත වේණ්ටුම්. අතනූටාකත්තාන් මක්කළ් තංකළතු පිරතිනිකළෛත් තෙරිවුචෙය්ය මුටියුම්; නල්ලවර්කළ් පාරාළුමන්රත්තුත් තෙරිවාකි වර මුටියුම්. ඉන්තච් චපෛයිලේ පීට්ටර් කෙනමන්, කොල්වින් ආර්. ටි චිල්වා, ජී.ජී. පොන්නම්පලම්, චෙල්වනායකම් පෝන්ර පල පටිත්ත තලෛමෙකළ් නිරෛන්තිරුන්ත කාලකට්టම් මාරි, ඉන්රු ඉන්තප් පාරාළුමන්රත්තුක්කු යාරුම් චෙල්ලලාම් එන්කින්ර ඔරු නිලෙමෙ ඒර්පට්ටිරුක්කින්රතු. උණ්ම෈යිල් උරියමුරෙයිල් වාක්කාළර් පට්ටියල් පතියප්පට්ටු, වාක්කුරිමෙ අළික්කප්පටුකින්රපෝතුතාන් අන්ත මක්කළ් තුරුප්පුච්චීට්ටාන අන්ත වාක්කුච්චීට්ටිනූටාකත් තංකළතු තලෛවර්කළෛත් තීර්මානිප්පාර්කළ්.

නුවරෙලියා මාවට්ට වාක්කළිප්පිල් පාරිය වීළ්ච්චි කාණප්පටුකින්රතු. අවර්කළ් වාක්කළිප්පු නිලෙයංකළුක්කුච් චෙල්කින්රපොළුතු "ඉන්ත මුරෙ උංකළ් පෙයර් වාක්කාළර් පට්ටියලිල් ඉල්ලෙ" එන්රු චර්වචාතාරණමාකක් කූරිවිටුකින්රාර්කළ්. අප්පටි ඉරුක්කින්රපොළුතු අන්ත මක්කළ් එප්පටි තමක්කුරිය තලෛවර්කළෛත් තෙරිවු චෙය්ය මුටියුම්? යාළ්ප්පාණත්තිලිරුන්තු පේචිය වයෝතිපර් ඔරුවර් එන්නිටම් කූරිනාර්, "එනතු තන්තෛයින් පෙයර්කූට එංකළ් ඉටත්තිලේ පතිවු චෙය්යප්පට්ටිරුක්කින්රතු" එන්රු. ඉවරුක්කේ වයතු 70-80 ඉරුක්කුමෙන්රාල් ඉවරතු තන්තෛයින් වයතු එන්නවාක ඉරුක්කුම්? අප්පටිච් චිල පිරතේචංකළිලේ ඉරන්තවර්කළින් වාක්කුකළෛකූට පයන්පටුත්තප්පටුකින්ර නිලෙමෙ ඉරුක්කින්රතු. ඉන්ත නිලෙමෙ මාර්රප්පට වේණ්ටුම්. එනවේ, උණ්ම෈යිල් චනනායකම් ඉන්ත නාට්ටිල් නිලෛපෙර වේණ්ටුම් එන්රාල් වාක්කුරිමෙ එන්පතු උරියමුරෙයිලේ පයන්පටුත්තප්පට වේණ්ටුම්. කුරිප්පාක යාළ්ප්පාණම්, මට්ටක්කළප්පු පෝන්ර පිරතේචංකළිල් එල්ලාම් වාක්කාළර් ඉටාප්පුක්කළ් උරිය මුරෙයිල් පතියප්පට්ටු, අංකුළ්ළ මක්කළුක්කු වාක්කළික්කුම් උරිමෙ වළංකප්පට වේණ්ටුම්. ඉතනෙච් චෙය්යාමල් නල්ල තලෛවර්කළෛ උරුවාක්කුවතෙන්පතු කේල්වික්කුරියතාකවේ ඉරුක්කුම්.

ඉන්රු එන්තවොරු නාට්ටිලුම්, කුරිප්පාක එමතු අණ්ටෛ නාටාකිය ඉන්තියාවෛ එටුත්තුක්කොණ්ටාලුങ්කූට, අංකු අවර්කළ් electronic වාක්කළිප්පු මුරෛයෛ අරිමුකප්පටුත්තියිරුක්කිරාර්කළ්. නමතු නාටු අන්ත නිලෛමෙමක්කුච් චෙල්ලාවිට්ටාලුම් චාතාරණ පතිවිල්කූට පාරිය කුළප්ප නිලෛ ඒන් ඒර්පටුකින්රතු? නාංකළ් එළුත්තරිවිල් අතිකූටිය ආට්රලුළ්ළවර්කළාක ඉරුක්කින්රෝම්. ඉලංකෛයිල් කටන්ත 30 වරුට කාලමාක ඒර්පට්ට යුත්තත්තින් පින්පුම් UNDP මතිප්පීට්ටින්පටි එළුත්තරිවිල් 96 ආවතු නාටාක ඉලංකෛ ඉරුක්කිරතු. ආනාල් ඉන්තියාවෛප් පාර්ත්තාල්, අතු 126 ආවතු නාටාකවේ ඉරුක්කිරතු. ඉන්තියාවිවේ තේර්තලිල් electronic වාක්කළිප්පුමුරෛ අරිමුකප්පටුත්තප්පට්ටිරුක්කිරතු. ආයිනුම්, 96 ආවතු නාටාක නිරල්පටුත්තප්පට්ටිරුක්කින්ර එමතු නාට්ටිලේ වාක්කළික්කුම් උරිමෙයාවතු චකල මක්කළුක්කුම් කිටෙක්කින්රතා එන්පතෙ ඉන්තච් චපෛ කවනික්ක වේණ්ටියතු අවචියමාකුම්.

මාණ්පුමිකු රවි කරුණානායක්ක අවර්කළ් චමර්ප්පිත්ත ඉන්තප් පිරේරණෛ මිකවුම් මුක්කියත්තුවම් වාය්න්තතාකුම්. ඒනෙනිල් වාක්කාළර්කළ් ඔරු කට්චියෛයෝ ඔරු තලෛවරෛයෝ චාර්න්තවර්කළෛවිල්ලර්. යාරුක්කු වාක්කළික්කප්පතු එන්පතෛත් තීර්මානික්කුම් උරිම෈යෛ නාංකළ් අවර්කළුක්කේ කොටුක්ක වේණ්ටුම්. මයිලින් කාලෛ උටෛත්ත පින්නර් අතනෛ ආටුම්පටි චොල්වතෛප් පෝන්රුම්, කුයිලින් කුරල්වළෛයෛ නෙරිත්ත පින්නර් අතනෛප් පාටුම්පටි චොල්වතෛප් පෝන්රතුමාන චෙයල්තාන්, ඉන්රු උරිය මුරෛයිලේ වාක්කාළර් පට්ටියලිල් මක්කළෛප් පතිවු චෙය්යාමල් අවර්කළෛ වාක්කළික්කුම්පටි චොල්වතෛ නටවටික්කෛයාකුම්. නටන්තුමුටින්ත තේර්තලෛ එටුත්තුප් පාර්ත්තාල්, මක්කළ් වාක්කළික්කුම් වීතම් ඉන්රු කුරෛන්තුකොණ්ටු වරුවතෛක් කාණලාම්. අතර්කුක් කාරණම් එන්න? මක්කළිල් පලරුක්කු තේර්තලිල් අක්කරෛයිල්ලාමල් ඉරුක්කින්රතු; පලරුක්කු අණ්මෛයිල් ඉරුක්කින්ර වාක්කුච්චාවටිකළිල් වාක්කළික්කුම් චන්තර්ප්පම්කූට ඉල්ලාමලිරුක්කින්රතු. එනවේ, ඉව්විටයත්තෛක් කවනත්තිර්කොළ්ළ වේණ්ටුමෙන ඉච්චපෛයිටම් කේට්ටුක්කොළ්කින්රේන්. නන්රි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
පිළිතුරු කථාව, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සභාව කල්තැබීමේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මා

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ස්තුතිවන්ත වනවා. ස්තුතිවන්ත වන්නේ, නිරතුරුව ජනතාවත්, මේ ගරු සභාවත් වැරැදි ලිපි ලේඛන සහ සංඛ්‍යා ලේඛන පදනම් කර ගනිමින් නොමඟ යවන අවස්ථාවන්හිදී එයට නිසි පිළිතුරු ලබා දීමට මේ සභා ගර්භය තුළදීම රජයට අවස්ථාවක් ලබා දීම ගැනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද එතුමා යම් යම් සංඛ්‍යා ලේඛන ගණනාවක් සභාගත කළා. ඒ සියල්ලම හැන්සාඩ් වාර්තාවට අනිවාර්යයෙන්ම ඇතුළත් කරන්නය කියලා මමත් ඉල්ලනවා. අද මවිසින් මේ රටේ ජනමාධ්‍ය සඳහාත්, ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැන ගැනීම සඳහාත් මැතිවරණ කොමසාරිස්තුමා විසින් සහතික කරන ලද සංඛ්‍යා ලේඛන ගණනාවක්ම ඉදිරිපත් කරනවා. ඒ සියලු ලේඛනවලින් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ ලේඛනවල තිබෙන වැරැදි බව ඉතාම පැහැදිලිව ප්‍රදර්ශනය කරනවා. එතුමාගේ යෝජනාවේ පළමුවන ඡේදය තමයි, 2010 ජූලි මස පළමුවන දින වන විට නව ඡන්ද හිමි නාම ලේඛනය සාදා නිම කළ යුතුය කියන එක. ඔව්. ඒක ඇත්ත. ඇයි, ඡන්ද හිමි නාම ලේඛනය හැදුවේ නැත්තේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාත් අපි සියලු දෙනාමත් දන්නවා මේ අවුරුද්දේ මැතිවරණ දෙකක් අපිට පවත්වන්නට සිදු වුණ බව. නමුත් මැතිවරණ දෙපාර්තමේන්තුවට කොපමණ වැඩ කටයුතු තිබුණත් 2010 මැයි දක්වා ඡන්ද හිමි නාම ලේඛනය සකස් කර අවසන් කර තිබෙනවා. එතකොට දැන් මොකක්ද මේ පමාව? ජූලි පළමුවන දා ඉඳන් අදට දවස් 20ක පමාවක් ගැන තමයි මේ කියන්නේ. ඒකට හේතුව අපට දන්වා තිබෙනවා. මැතිවරණ දෙපාර්තමේන්තුවේ සිටින සේවක ප්‍රමාණය පාවිච්චි කරලා මැතිවරණ පවත්වන ගමන්ම තමයි මේ ඡන්ද හිමි නාම ලේඛන සියල්ල සකස් කරන්නේ. ඒ වාගේම ඡන්ද හිමි නාම ලේඛන පිටපත් අට ගණනේ නිකුත් කරන්නට අපට සිදු වනවා. ඒ සඳහා කඩදාසි ream තිස්දහසක් අපි මුද්‍රණය කළ යුතු වනවා. ඔබතුමා අසා තිබෙනවා කවදාද මේවා අවසන් වන්නේ කියලා. අගෝස්තු මස පළමුවන දා වන කොට මේ ටික සකස් කරලා ඉවර කරනවා. ඊට අදාළ CD තැටි දේශපාලන පක්ෂවලට - [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
නීතිය අනුව ජූලි මාසයේ පළමුවන දා - [බාධා කිරීමක්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්. එහෙම තමයි.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මේක ලොකු විශිෂ්ට කාර්ය භාරයක් - rocket science - නොවෙයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට කෙස් පැළෙන නීති, තර්ක ගෙනෙන්න පුළුවන්. තිස්වන දිනට ගෙනාවේ නැහැයි කියලා එල්ලන්නද? ඔබතුමා දන්නවා, මහා මැතිවරණ දෙකක් පැවැත්වුණු බව. මැතිවරණ දෙපාර්තමේන්තුවට මේ කාර්යයට වෙනත් කාර්ය මණ්ඩලයක් හිටියේ නැහැ. මැතිවරණ කටයුතු අතරේ තමයි මේ වැඩ කටයුතුත් කළේ. මාසයක ප්‍රමාදයක් තිබෙනවා. CD තැටි ටික පහළොස්වන දාට දෙන බව මැතිවරණ දෙපාර්තමේන්තුව වාර්තා කරලා තිබෙනවා. ඒ නිසා මෙහි ප්‍රමාදයක් නැහැ. දැනටමත් ග්‍රාම සේවකවරුන් සඳහා ඔවුන්ගේ පිටපත් යවා අවසානයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට තවත් අසත්‍ය කරුණු රාශියක් එතුමා ප්‍රකාශ කළා. එතුමා කිව්වා, දැන් කොළඹ දිස්ත්‍රික්කයේත්, ගම්පහ දිස්ත්‍රික්කයේත් -ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා හැම දාම අසත්‍ය කරුණු කියන නිසා ඒක ප්‍රශ්නයක් නැහැ. - [බාධා කිරීමක්] එතුමා හැම දාම බොරුවක් කියලා තමයි ජය ගන්න හදන්නේ. [බාධා කිරීමක්]

ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා
(මාණ්පුමිකු වෛද්‍ය ජයලත් ජයවර්ධන)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
හරියට හරි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම කියන්නම්, ගම්පහ දිස්ත්‍රික්කයේ voters ලාගේ අඩු වීමක් වෙලා නැහැ. කොළඹ දිස්ත්‍රික්කයේ විතරයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. මම ඒකට හේතුව කියන්නම්. ඊ ළඟට ඔබතුමා කිව්වා -

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මම ඉදිරිපත් කළේ කොළඹ දිස්ත්‍රික්කයේ -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ. ඔබතුමාගේ කථාවේදී කිව්වා, කොළඹ පමණක් නොවෙයි ගම්පහත් වෙලා තිබෙනවා, ඒක ගැනත් ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා කියයි කියලා. ලංකාවේ අනෙක් පැතිවලත් ඇති වෙලා තිබෙනවාය කිව්වා. මම මේ Table iv කියන වගුව සභාගත කරන්නම්. 2008 වර්ෂය එක්ක සන්සන්දනය කරලා බැලුවාම කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද දායකයන් 18,868ක අඩු වීමක් තිබෙනවා. ඒක සියයට සෘණ 1.24යි. ගම්පහ දිස්ත්‍රික්කයේ සියයට 1.58ක වැඩි වීමක් තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කය ගැන කථා කළා. කළුතර දිස්ත්‍රික්කයේ සියයට 1.68ක වැඩි වීමක් තිබෙනවා. මහනුවර -

ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා
(මාණ්පුමිකු වෛද්‍ය ජයලත් ජයවර්ධන)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ජනගහනයට සාපේක්ෂවද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්.

ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා
(මාණ්පුමිකු වෛද්‍ය ජයලත් ජයවර්ධන)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ජනගහන වර්ධන වේගය ගැනත් කියන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ජනගහන වර්ධන වේගය සියයට 1.5යි. ඒක දන්නේ නැති දොස්තර කෙනෙක් මේ ඉන්නේ.

ගරු එස්.බී. දිසානායක මහතා
(මාණ්පුමිකු එස්.බී. දිසානායක්ක)
(The Hon. S.B. Dissanayake)
සියයට 1.1යි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඒක අද සියයට 1.1යි. ඒක දන්නේ නැහැ. මහ ලොකු දොස්තර. ජනගහන වර්ධන වේගය සියයට 1.1යි. ගම්පහ දිස්ත්‍රික්කයේ සියයට 1.58ක් වැඩි වෙලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ සියයට 1.68ක් වැඩි වෙලා තිබෙනවා. ඊ ළඟට මාතලේ දිස්ත්‍රික්කයේ සියයට 0.71යි, නුවරඑළියේ සියයට 1.67යි, මහනුවර සියයට 0.57යි, ගාල්ල සියයට 1.15යි, මාතර සියයට 1.51යි, හම්බන්තොට සියයට 1.77යි. බලන්න, යාපනයේ ජනගහන වර්ධන වේගය සියයට 13.12කින් වැඩි වෙලා තිබෙනවා. ඒවා අපට අවාසි ඡන්ද දායක දිස්ත්‍රික්ක. ඊ ළඟට වන්නි දිස්ත්‍රික්කය සියයට 1.40යි, මඩකලපුව සියයට 0.67යි, දිගාමඩුල්ල සියයට 1.26යි, ත්‍රිකුණාමලය සියයට 1.67යි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔය, වැඩි වීම ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඔව්, වැඩි වීම. කුරුණෑගල සියයට 0.81යි, පුත්තලම සියයට 1.06යි, අනුරාධපුරය සියයට 1.15යි, පොළොන්නරුව සියයට 1.41යි, බදුල්ල සියයට 1.25යි, මොනරාගල සියයට 2.52යි. මොකද, මොනරාගල දිස්ත්‍රික්කයේ ඵලදායීතාව ටිකක් වැඩියි. රත්නපුර සියයට 1.55යි, කෑගල්ල සියයට 1.00යි. සමස්ත ලංකාවේ votersලාගේ වැඩි වීම 1.61යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන්නේ 226,358කින් total number of votersලා වැඩි වෙලා තිබෙනවා. මේ බලන්න, මොන බොරුද මේ කියන්නේ? මේ මැතිවරණ කොමසාරිස්තුමා විසින් නිකුත් කරන ලද්දක්. මම මෙය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා. ඒ නිසා මේ කියන පරිදි- [බාධා කිරීම්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

උතුරු සහ නැගෙනහිර අනෙක් ප්‍රදේශවලත් ඒ විධියටම වෙනවාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

දැන් වෙනවා. ඒ විධියටම දැන් වෙනවා. [බාධා කිරීමක්] ඉන්න, ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ. මේවා ටිකක් ඉගෙන ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ විධියටයි වුණේ. රවි කරුණානායක මහත්මයලා බලයේ ඉන්න කාලවලදී ඡන්ද දායකයෝ එහේ මෙහේ double ලියාපදිංචි කරවලා තමයි කොළඹ නගරය, කොළඹ දිස්ත්‍රික්කය ජයග්‍රහණය කෙරෙව්වේ. දැන් එතුමන්ලාට ඒවා අමතක වෙලා තිබෙනවා. අද එහෙම කරන්න බැහැ. අපි මැතිවරණ කොමසාරිස්තුමාගෙන් ඉල්ලා සිටියා, හැඳුනුම් පත් අංකය දමලා, computer system එකක් දමලා මේ double ඡන්ද කපලා දමන්න කියලා. [බාධා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලා නොවෙයි කළේ, අපියි 2002 දී කළේ. අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඔබතුමන්ලා කරපු දෙයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2007 වන කොට කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද දායකයින් 17,310ක වැඩි වීමක් තිබුණා. ඊ ළඟට 2008 දී 38,739ක් අඩු වුණා. [බාධා කිරීමක්] ඔව්. කියපු එක හරි. ඉන්න කියන්න. 2009, 18,868යි. නමුත් වලිගය ටිකක් පැගුණා. මම කියන්නම්, මේ double ඡන්ද දායකයෝ අපි හෙව්වා; ද්විත්ව ඡන්ද එක්ක ලියා පදිංචි වෙලා තිබෙන ඡන්ද දායකයෝ අපි හෙව්වා.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
හොර ඡන්ද.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඒ අනුව 2008 දී මැතිවරණ කොමසාරිස්වරයා හොර ඡන්ද 51,538ක් කපලා දැම්මා. බලන්න, ඡන්ද පනස් එක්දහස් ගණනක් කැපුවා. මේ double ඡන්ද දායකයෝ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා නේ බලයේ හිටියේ.

ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ඔබතුමන්ලා හිටියේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, computer එකෙන් බලන කොට එකම හැඳුනුම් පත් අංකය තිබෙන ඡන්ද 51,538ක් තිබුණා. එතකොට ඡන්ද 38,739යි අඩු වුණේ. ඒ කියන්නේ, අනික් කොටස ජනගහනයේ වර්ධනයත් එක්ක එකතු වුණා. ඒ වාගේම 2009 දී ඒ විධියටම තවත් ඡන්ද 19,172ක් කපලා දැම්මා. එහෙනම් 2009 අඩු වුණු ඡන්ද ප්‍රමාණය 18,868යි. ඒක එක හේතුවක්. ඒ නිසා මේ හේතුව හංගා ගෙන, මේක හොඳින් දැන දැනම මේක යටපත් කරලා ආණ්ඩුවට මඩ ගහන්න විපක්ෂය අද මේ විධියේ යෝජනා ගේනවා. ඒවායේ කිසිම සත්‍යයක් නැහැ. [බාධා කිරීම්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ඡන්ද දායකයෝ ලියා පදිංචි වෙන්න ග්‍රාම නිලධාරි ළඟට තමන්ගේ form එක පුරවලා දෙන්න ඕනෑ බව ඔබතුමාත් දන්නවා. නමුත් මොකද වුණේ? එක්සත් ජාතික පක්ෂය 18 වතාවක්ම පරාජය වුණා. එක්සත් ජාතික පාක්ෂිකයන්ට ඡන්ද එපා වුණා. සමහර අය ඡන්ද form එකවත් ලියන්න කල්පනා කළේ නැහැ. "මේ පක්ෂයට ඡන්දය දීලා වැඩක් නැහැ. අපි එක්සත් ජාතික පාක්ෂිකයෝ. අපි කැපුවත් කොළ. ඒක හින්දා අපි නිහඬව ඉන්නවා." කියලා ඡන්දය ලියා පදිංචි කළේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලාට තිබෙන්නේ ඡන්ද දායකයෝ උනන්දු කිරීමේ වැඩ පිළිවෙළක් සකස්

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

කරන්නයි. එහෙම වැඩ පිළිවෙළක් එක්සත් ජාතික පක්ෂයට නැහැ. ඒ නිසා තමයි එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද අඩු වුණේ. ඇයි? ඡන්ද දායකයෝ ලියා පදිංචි වෙන්නේ නැහැ. ඡන්ද පොළට එන්නේ නැහැ. පක්ෂයේ නායකත්වයට ගුටි කෙළි; රණ්ඩු. එක දවසක කියනවා, නායකත්වය සඳහා අපි ඡන්ද විමසීම් තබනවා කියලා. ආයේ දවසක කියනවා ඡන්ද විමසීම් තබන්නේ නැහැ කියලා. මේ වාගේ මහා අර්බුදයක් තමුන්නාන්සේලාගේ පක්ෂය ඇතුළේ තබා ගෙන කොහොමද තමුන්නාන්සේලාගේ ගමේ ඉන්න ඡන්ද දායකයින්ට කියන්නේ ගිහිල්ලා ලියාපදිංචි වෙන්න කියලා? ග්‍රාම නිලධාරි එක්ක යන්න එක්සත් ජාතික පක්ෂයේ එක පර්ෂද නිලධාරියෙක් අද ඉන්නවාද? ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ඉන්නවාද? වෙනත් දේශපාලන නායකත්වයක් ග්‍රාමීය මට්ටමේ තිබෙනවාද? නැහැ. මෙන්න මේ අඩු පාඩුවත් තිබෙනවා. නමුත් අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, අපේ එක්සත් ජනතා නිදහස් සන්ධානය ඉතාම ජයග්‍රාහී ලීලාවෙන් ගමවලට යනවා; පාරට කොන්ක්‍රීට් දානවා; වැඩ කරනවා. ඡන්දයට ලියා පදිංචි වෙන්න කියලා අපේ ආධාරකරුවන්ට කියනවා. ඒ අය ඒ වැඩ කටයුතු කරනවා. අද ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කියන්නේ ඔස්ට්‍රේලියාවේ වාගේ ඡන්දය නොදෙන අයට ඩොලර් 200ක දඩයක් ගහන්න ඕනෑ කියලායි. ඒකෙන් බලන්නේ නිදා ගෙන ඉන්න එක්සත් ජාතික පාක්ෂිකයන්ව නැඟිටුවන්න. දඩ ගහලා හෝ ඒ ගොල්ලන්ව නැඟිටුවීමේ ක්‍රමයක් බලන්නේ. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ඒක නොවෙයි. ඔබතුමන්ලාගේ පක්ෂය හදා ගන්න. හොඳ නායකයකු පත් කර ගන්න. හොඳ ආකර්ෂණීය ජනතා හිතවාදී වැඩ පිළිවෙළක් ගෙන යන්න. පිට රට තියෙන මොකක් හෝ සංකල්පයක් ගෙනැල්ලා ඒක ලංකාවට ඔබන්න යනවා. හැම වෙලාවේම තමුන්නාන්සේලාට වැරදුණේ ඔතැන තමයි. ඇයි? ඒ අයගේ උපදේශකයෝ ඔක්කොම පිට රට අය නේ. දේශපාලන උපදේශකයෝත් පිට රට අය. ආර්ථික උපදේශකයෝත් පිට රට අය. නායකතුමා අඳින්නේත් පිට රට අයගේ උපදෙස් පරිදි. ගමන් කරන්නේත් පිට රට අයගේ උපදෙස් පරිදි. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා තමයි ඒ සංකල්පයෙන් ටිකක් හෝ මිදිලා මහින්ද චින්තනයට ළං වෙලා දැන් නායකත්වය ලබා ගැනීමේ ප්‍රයත්නයක යෙදී සිටින්නේ. අප ඔබතුමාට සුබ පතනවා. දැන් ඔබතුමාගේ වෙනසක් ඇති වෙලා. ඉස්සර ටයි කෝට් ගහපු ඔබතුමා දැන් ජාතික ඇඳුම අඳිනවා. බොහොම හොඳයි. අපට සතුටුයි. සමහර අය කියනවා ඒකත් පොඩි රංගනයක් කියලා. මා නම් එහෙම කියන්නේ නැහැ. මා කියන්නේ ඒක හොඳයි. නැෂනල් එකක් ඇඳ ගෙන පන්සලට ගිහිල්ලා, පල්ලියටත් ගිහිල්ලා, කෝවිලටත් ගිහිල්ලා, ඒ හැම තැනකම ගිහිල්ලා රංගනයක යෙදෙන එක හොඳයි. ඒක එක්සත් ජාතික පක්ෂයේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට එහෙම හොඳ ආදර්ශයක් වෙයි. ආර්ථික විශේෂඥයෙකු වුණාට හරි යන්නේ නැහැ. මේ රටේ ජනතාවගේ හද ගැස්ම, දහඩිය සුවඳ දැන ගන්න ඕනෑ. එම නිසා ඒ විධියට අඳින්න, කන්න, බොන්න. [බාධා කිරීමක්] නැහැ, නැහැ. එතුමන්ලා හැම දාම එහෙම හිටපු අය නේ. අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා හැම දාම මේ සූට් එක ඇන්දා. ළඟකදී වෙනස් කළේ නැහැ නේ.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(මාණ්පුමිකු අනුර පිරියදර්ෂන යාප්පා)
(The Hon. Anura Priyadharshana Yapa)
මම ගමේ මිනිහා නේ. [බාධා කිරීමක්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද දායකයින් අඩු වීම පිළිබඳව, ඊට අදාළ නියමිත - [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, කොළඹ නගර සභාව යටතේ ලක්ෂ එකොළහක් ජීවත් වනවා. ලක්ෂ පහහමාරයි ඡන්දය දාන්න ලියා පදිංචි වෙලා තිබෙන්නේ. ලක්ෂ පහක් නැහැ. [බාධා කිරීමක්] ඒකයි මම මේ කියන්නේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ඒක වැරදියි. ඒක වැරදියි. ඒක අමූලික අසත්‍යයක්. මා ඉදිරිපත් කරනවා Table iii. [බාධා කිරීමක්] නැහැ. නැහැ. මෙහෙමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමයි. [බාධා කිරීමක්] අසත්‍ය ප්‍රකාශ කරන්න එපා, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි. මේක අහන්න.

1997 වර්ෂයේ කොළඹ ඡන්ද දායකයින්ගේ සංඛ්‍යාව දහතුන්ලක්ෂ විසිහයදහස් හාරසිය අසූහතයි.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
කොළඹ දිස්ත්‍රික්කයේ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්. කොළඹ දිස්ත්‍රික්කයේ. 1997 වර්ෂයේ දහතුන්ලක්ෂ තිස්හත්දහස් අසූතුනයි. 1999 වර්ෂයේ දහතුන්ලක්ෂ අසූපන්දහස් පන්සිය හතළිස්හතයි. ඒ විධියට දිගටම ඇවිත් දැන් අද වන කොට ඉන්නවා පහළොස්ලක්ෂ දෙදහස් නවසිය අසූහයක්.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
උතුරු කොළඹ ගන්න. එක්ලක්ෂ පණස්හතර දාහක් ජීවත් වනවා. ලියා පදිංචි වෙලා තිබෙන්නේ අසූපන්දාහයි. ඒකයි තිබෙන ප්‍රශ්නය.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජීවත් වන ඔක්කොටම ඡන්දය නැහැ. අවුරුදු දහඅටෙන් පහළ අයට ඡන්දය නැහැ. ඡන්දයට ලියා පදිංචි වුණේ නැති අයට ඡන්දය නැහැ. රට ගිය අයට ඡන්දය නැහැ. මේ මූලික හරය දන්නේ නැහැ නේ. කොළඹ ජීවත් වුණා කියලා බැහැ. ඡන්ද දායකයකු වශයෙන් ලියා පදිංචි වන්න ඕනෑ. සමහර වෙලාවට මෙහෙමත් වෙනවා. ගම්පහ එක් කෙනෙක් ඇවිත් මෙහේ ජීවත් වනවා. ඔහුගේ ඡන්දය තියෙන්නේ ගම්පහට. තමුන්නාන්සේ උතුරු කොළඹ ඔක්කොම ඔළු ගෙඩි ගණන ගණන් ගත්තාට ඡන්ද ලැයිස්තුවේ තියෙන්නේ ඊට අඩුවෙන්. ඒක තේරුම් ගන්න. විවිධ කාර්යයන් සඳහා කොළඹට සංක්‍රමණය වන ජනතාවක් ඉන්නවා. බෝඩිංකාරයෝ ඉන්නවා. ඊ ළඟට Free Trade Zone එකේ කට්ටිය ඉන්නවා. ඒ අය ඡන්දය දමන්න බදුල්ලට යනවා; මොනරාගලට යනවා; වෙනත් පැතිවලට යනවා. එම නිසා ගමේ ඉන්න ඔළු ගෙඩි සංඛ්‍යාවෙන් ඡන්ද ගණන මනින්න බැහැ. ඡන්ද ලැයිස්තුවේ තියෙන ඡන්ද ප්‍රමාණයෙන් තමයි මනින්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බදුල්ලට යනවා ඡන්දය දාන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
බදුල්ලට යනවා. ඒ තරම් අපි ජනප්‍රියයි. [බාධා කිරීමක්] මෙහේ ඉන්න එක්සත් ජාතික පක්ෂයේ අය ඡන්දය දාන්න යන්නේත් නැහැ. එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලේඛන සියල්ලම මා **සභාගත***කරනවා.

මීට වඩා මේ පිළිබඳව යමක් කීම අවශ්‍යයි කියලා මා හිතන්නේ නැහැ.

ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා කථා කළා. එතුමා හැම දාම "යන්නේ කොහේද මල්ලෙ පොල්." ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ඉතාම නිවැරදිව මේ මාතෘකාවට අදාළව කථා කළා. නමුත් ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමාට හැම දාම කියන්න තිබෙන්නේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය -[බාධා කිරීමක්] ඊ ළඟට ඡන්ද දායකයන්ට පහර දීම.

ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ඔව්, රටේ නීතිය නැහැ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
තමුන්නාන්සේගේ ඡන්ද දායකයන්ට පහර දුන්නේ අපි නොවෙයි, තමුන්නාන්සේලාගේ ප්‍රදේශයේ අයමයි. ඒක දන්නවා. මොකද තමුන්නාන්සේට -

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මාලදිවයිනට ගිහින් බලන්න කියන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්. මාලදිවයිනට ගිහින් බලන්න කෝ කොමිෂන් සභා ක්‍රියාත්මක වෙලා, අද මොන විධියේ constitutional deadlock එකක් සිදු වෙලා තිබෙනවාද කියලා. මාල දිවයිනට කැනඩාවෙන් මහාචාර්යවරු ගෙනත්, ඒ අය දීපු උපදෙස් අනුව ව්‍යවස්ථා හැදුවා. අන්තිමට හිර වුණා. අපේ ජනාධිපතිතුමා ගිහින් තමයි ඒකත් බේරලා දුන්නේ.

ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ඒක කළේ ජී.එල්. පීරිස් අමාත්‍යතුමා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අයට තිබෙන්නේ මැතිවරණ ජයග්‍රහණය කරන්න බැරි වුණාම තිබෙන හිතේ අමාරුව. ඒ හිතේ අමාරුව මෙහෙම ඉදිරිපත් කරන යෝජනාවලින් නැති කර ගන්න පුළුවන්කමක් නැහැ. ඔබතුමන්ලා මනෝ ලෝකයක ජීවත් වනවා; මනඃකල්පිත ලෝකයක ජීවත් වනවා. "අයියෝ! කොම්පියුටර් ජිල්මාට්, අර ජිල්මාට් දැම්මා, ඒක නිසා තමයි අපි පැරදුණේ" කියනවා. කොහොම ගණන් කළත් ඔය වැටුණු ඡන්ද ටික තමයි තමුන්නාන්සේලාට තිබෙන්නේ. අපිටත් තිබෙන්නේ වැටුණු ඡන්ද ටික. ඒ නිසා ඒ කථා හොඳයි ඒ වෙලාවට තමන්ගේ හිත සතුටු කර ගන්න. ඒකත් හොඳයි. තමුන්නාන්සේලා දූකෙන්, කනගාටුවෙන් ඉන්නවා දකින්න අපි කැමැති නැහැ. "අපට ඡන්ද තිබුණා. ඒවා නැති වුණා. ඒවා හොරකම් කළා" කියලා ඒ මනෝ ලෝකයේ හැම දාම ජීවත් වන්න. නමුත් ජනතාව දන්නවා ඉතාම පිරිසිදු ඡන්දයෙන් බලයට ආපු ජනාධිපතිවරයෙක් ඉන්න බව. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මේ පාර්ලිමේන්තුවේ ආසන 144ක් ලබා ගෙන වාර්තාවක් තබන්නට එක්සත් ජනතා නිදහස් සන්ධානයට පුළුවන් වුණා. ඒ නිසා විපක්ෂය අතුගෑවිලා ගියා. අපි ඒක ගැන සතුටු නැහැ. ප්‍රබල විපක්ෂයක් අවශ්‍යයි. නමුත් ඉතින් ඔබතුමන්ලා කියන දේ අහන්නේ නැහැ නේ. ඔය අයගේ ඇතුළේ රණ්ඩු සරුවල්, එකිනෙකා විවේචනය කර ගැනීම්, එකිනෙකාට කේලාම් කියා ගැනීම් නේ තිබෙන්නේ. එහෙම සමඟියක් නැති පක්ෂයකට, විපක්ෂයකට මේ රටේ ජනතාව ඡන්දය දෙන්නේ නැහැ. ඒක මතක තබා ගන්න. අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් ඒ වාගේ කාලයක් තිබුණා. තමුන්නාන්සේලා අපේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය නැති කළාට පස්සේ අපේ පක්ෂයේත් ඔය වාගේ හැලහැප්පිලි තිබුණා. නමුත් අපි ඒකෙන් ගොඩ ආවා. ගොඩ ඇවිල්ලා, ශක්තිමත් පක්ෂයක් හැටියට අපි ප්‍රතිසංවිධානය වුණා. "ඡන්ද ජිල්මාට් දැම්මා, කොම්පියුටර් ජිල්මාට් දැම්මා" කියලා අපි එක්සත් ජාතික පක්ෂයට බැණ බැණ හිටියේ නැහැ. අපි පක්ෂය ප්‍රතිසංවිධානය කර ගනිමින්, ජනතාවාදී ප්‍රතිපත්ති ජනතාවට ඉදිරිපත් කරමින්, හොඳ නායකත්වයන් සපයමින් වැඩ කටයුතු කළා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා තමයි අපි ජයග්‍රහණය කළේ. ඒ නිසා ඔබතුමන්ලා අපේ දේශපාලන අතීතයෙන් පාඩම් ගන්න. අපෙන් පාඩම් අර ගෙන මේ විධියට අසත්‍ය වාර්තා, අසත්‍ය සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරලා මේ විධියේ කථා කියන්නේ නැතිව, යථාර්ථය තේරුම් අර ගෙන වැඩ කටයුතු කරන්න. අද තමුන්නාන්සේලාගේ මේ ප්‍රශ්නයට පූර්ණ උත්තරයක් ලබා දීමට මට හැකි වීම පිළිබඳව මම සතුටු වනවා.

මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුවට මම ස්තුති වන්ත වනවා මේ පිළිබඳව නිවැරදි සංඛ්‍යා ලේඛන මේ රටේ ජනතාවට සැපයීම සඳහා අප වෙත ලබා දීම පිළිබඳව. අපේ මැතිවරණ දෙපාර්තමේන්තුව ඉතාම දුෂ්කර කාල පරිච්ඡේදයක් තුළදී පිට පිටම මැතිවරණ ගණනාවක් පැවැත්වූවා. ඒ වුණත් මේ වන විටත් ඡන්ද ලේඛනය හදලා අවසානයි. අගෝස්තු 01 වන දා වන විට ඒවා ලැබෙනවා. ඒ නිසා මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුව ඉතාම හොඳ කාර්ය භාරයක් ඉෂ්ට කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම පිළිබඳව එක්සත් ජාතික පක්ෂයෙන් අපට පාඩම් අවශ්‍ය නැහැ. එක්සත් ජාතික පක්ෂයට තිබෙන්නේ ඉතා අඳුරු වූ අතීතයක්. එදා ලාම්පු - කළගෙඩි සෙල්ලමෙන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පාගා දමලා, මිරිකලා, කුඩු කරලා කළු පැල්ලම් තැබූ එක්සත් ජාතික පක්ෂයට ප්‍රජාතන්ත්‍රවාදය ගැන අපට උගන්වන්න පුළුවන්කමක් නැහැ කියන එක මම කියන්න කැමැතියි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඇයි එහෙම නම් එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාට සාකච්ඡාවට ආරාධනා කරන්නේ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාට සාකච්ඡාවට ආරාධනා කරන්නේ ව්‍යවස්ථා සංශෝධනය සඳහා. ඒ ආරාධනා කරන්නෙත් අපි ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන නිසා. අපි ඒකාධිපතිවාදයට නැඹුරු වුණු අය නම්, අපි සාකච්ඡා හා සම්මන්ත්‍රණවලට යන්නේ නැහැ. මා කියන්නේ, මේ වැරැදි ඔබතුමන්ලා තේරුම් ගන්නය කියලායි. ඔබතුමන්ලා කියන දේවල් ජනතාව විශ්වාස කරන්නේ නැත්තේ ඔය නිසයි. [බාධා කිරීමක්] ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කියන දේවල් ජනතාව විශ්වාස කරන්නේ නැහැ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මොකද, එතුමා සැම විටම අසත්‍ය කරුණු පදනම් කරගෙන විවේචනය කරන මන්ත්‍රීවරයකු හැටියට ප්‍රකටව තිබෙනවා. අදත් ඒක ඔප්පු වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] ඒ නිසා අද මේ ඉදිරිපත් කළ කල් තැබීමේ යෝජනාව එක්සත් ජාතික පක්ෂයටම පාරා වළල්ලක් වෙලා තිබෙන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

සභාමේසය මත තබන ලද ලේඛනය :
சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று:
Statement tabled:

Table iv

Number of Electors Registered Under Each Electorate in 2008,2009

Electorate number and name	Electors in 2008	Electors in 2009	Increase/ Descries	Increase/ Descries percentage
1 Colombo	1,521,854	1,502,986	(18,868)	-1.24%
2 Gampaha	1,474,464	1,497,805	23,341	1.58%
3 Kalutara	813,233	826,922	13,689	1.68%
4 Mahanuwara	970,456	976,010	5,554	0.57%
5 Matale	342,684	345,104	2,420	0.71%
6 NuwaraEliya	457,137	464,772	7,635	1.67%
7 Galle	761,815	770,563	8,748	1.15%
8 Matara	578,858	587,593	8,735	1.51%
9 Hambantota	421,186	428,636	7,450	1.77%
10 Jaffna	721,359	816,005	94,646	13.12%
11 Vanni	266,975	270,707	3,732	1.40%
12 Batticaloa	333,644	335,882	2,238	0.67%
13 Digamadulla	420,835	426,125	5,290	1.26%
14 Trincomalee	241,133	245,155	4,022	1.67%
15 Kurunegala	1,183,649	1,193,228	9,579	0.81%
16 Puttalam	495,575	500,833	5,258	1.06%
17 Anuradhapura	579,261	585,934	6,673	1.15%
18 Polonnaruwa	280,337	284,278	3,941	1.41%
19 Badulla	574,814	581,971	7,157	1.25%
20 Monaragala	300,642	308,230	7,588	2.52%
21 Ratnapura	734,651	746,029	11,378	1.55%
22 Kegalle	613,938	620,090	6,152	1.00%
Total	14,088,500	14,314,858	226,358	1.61%

Table i

Number of Electors of Polling Divisions in Colombo Electorate from the year 2007-2009

Polling Division	2007	2008	2009
A - Colombo North	103,050	95,385	84,646
B - Colombo Central	151,308	139,822	135,771
C - Borella	63,884	58,757	57,397
D - Colombo East	72,446	68,643	66,121
E - Colombo West	41,441	38,921	39,070
F - Dehiwala	63,115	61,194	59,298
G - Rathmalana	67,817	66,622	66,370
H - Kotte	75,555	73,009	71,550
I - Moratuwa	115,042	114,601	113,007
J - Kolonnawa	114,105	112,363	111,951
K - Kaduwela	159,596	158,736	159,979
L - Awissawella	107,093	108,138	108,655
M - Homagama	154,055	155,720	156,955
N - Maharagama	122,895	121,247	122,236
O - Kesbewa	149,191	148,696	149,980
TOTAL	**1,558,586**	**1,519,846**	**1,500,977**
Increase/Decrease	**17310**	**-38739**	**-18868**

Table ii

Numbering names deleted from each Polling Division of the Colombo Electorate at the revision of Electoral Register for the year 2008 and 2009 due to multiple registration

Name of the Polling Division	Number of names deleted due to multiple registration in 2008	Number of names deleted due to multiple registration in 2009
A - Colombo North	9,714	1,559
B - Colombo Central	9,865	3,613
C - Borella	3,911	1,104
D - Colombo East	3,363	738
E - Colombo West	1,332	393
F - Dehiwala	1,868	989
G - Rathmalana	1,837	736
H - Kotte	2,321	605
I - Moratuwa	1,901	716
J - Kolonnawa	3,344	999
K - Kaduwela	3,010	1,077
L - Awissawella	848	286
M - Homagama	2,702	731
N - Maharagama	2,612	828
O - Kesbewa	2,910	4,798
TOTAL	**51,538**	**19,172**

Table iii

Number Of Electors Registred In The Electorates From 1997 To 2009

	1997	1998	1999	2000	2001	2002	2003	2004	2005	2006	2007	2008	2009
1 Colombo	1,326,487	1,337,083	1,385,547	1,440,682	1,461,334	1,467,751	1,450,845	1,468,537	1,502,967	1,543,282	1,560,593	1,521,854	1,502,986
2 Gampaha	1,213,589	1,228,908	1,253,416	1,285,973	1,305,582	1,327,145	1,339,715	1,364,180	1,397,358	1,430,679	1,458,295	1,474,464	1,497,805
3 Kalutara	676,963	682,723	697,656	717,764	732,798	746,138	753,327	764,305	772,999	788,606	801,326	813,233	826,922
4 Mahanuwara	780,136	794,453	812,478	838,687	863,019	880,632	891,356	907,038	923,017	940,923	955,108	970,456	976,010
5 Matale	281,089	286,174	292,652	299,606	305,698	312,556	316,847	321,876	328,938	334,680	338,946	342,684	345,104
6 NuwaraEliya	391,585	397,711	405,414	417,264	424,513	436,236	439,861	447,225	449,539	450,390	452,395	457,137	464,772
7 Galle	652,734	660,585	678,509	698,558	708,430	716,608	723,080	732,289	736,813	747,190	753,172	761,815	770,563
8 Matara	510,310	515,847	524,651	534,694	543,205	550,503	555,929	562,987	568,125	573,833	576,208	578,858	587,593
9 Hambantota	342,347	350,809	360,026	369,073	377,428	384,361	389,998	396,595	401,540	408,240	414,112	421,186	428,636
10 Jaffna	622,957	612,770	622,331	633,457	637,066	644,279	651,361	701,938	707,309	710,174	716,435	721,359	816,005
11 Vanni	202,108	205,541	213,111	218,861	225,007	226,604	229,535	250,386	254,751	259,113	262,539	266,975	270,707
12 Batticaloa	268,200	270,197	275,485	282,079	291,730	303,928	310,172	318,728	324,387	330,950	331,269	333,644	335,882
13 Digamadulla	336,165	343,809	352,537	360,497	369,427	379,044	387,512	396,453	399,395	409,308	414,523	420,835	426,125
14 Trincomalee	197,620	201,808	206,884	212,280	217,572	224,307	229,315	238,755	242,112	242,463	240,632	241,133	245,155
15 Kurunegala	961,240	980,725	1,007,410	1,046,102	1,069,619	1,089,482	1,104,895	1,124,076	1,140,125	1,160,274	1,171,881	1,183,649	1,193,228
16 Puttalam	398,055	404,050	412,474	426,193	440,768	450,057	460,084	470,604	476,781	484,076	489,852	495,575	500,833
17 Anuradhapura	448,098	459,534	472,661	489,776	500,673	514,149	523,485	536,808	547,303	558,413	569,417	579,261	585,934
18 Polonnaruwa	217,318	220,903	229,434	240,444	247,513	254,061	259,039	263,609	266,652	272,634	277,056	280,337	284,278
19 Badulla	454,913	464,223	475,558	491,288	500,738	511,115	518,958	533,163	541,331	554,026	561,021	574,814	581,971
20 Monaragala	224,077	230,576	237,935	247,280	254,802	262,742	268,517	276,109	282,724	288,650	294,761	300,642	308,230
21 Ratnapura	584,998	595,791	609,655	623,506	634,843	647,035	655,248	668,217	684,529	701,379	713,205	734,651	746,029
22 Kegalle	528,107	534,980	545,238	554,698	562,123	570,299	574,917	583,282	589,676	599,435	605,626	613,938	620,090
Total	11,619,096	11,779,200	12,071,062	12,428,762	12,673,888	12,899,032	13,033,996	13,327,160	13,538,371	13,788,718	13,958,372	14,088,500	14,314,858
Increased %		1.38	2.48	2.96	1.97	1.78	1.05	2.25	1.58	1.85	1.23	0.93	1.61

Table iii

Number Of Electors Registred In The Electorates From 1997 To 2009

	1997	1998	1999	2000	2001	2002	2003	2004	2005	2006	2007	2008	2009
1 Colombo	1,326,487	1,337,083	1,385,547	1,440,682	1,461,334	1,467,751	1,450,845	1,468,537	1,502,967	1,543,282	1,560,593	1,521,854	1,502,986
2 Gampaha	1,213,589	1,228,908	1,253,416	1,285,973	1,305,582	1,327,145	1,339,715	1,364,180	1,397,358	1,430,679	1,458,295	1,474,464	1,497,805
3 Kalutara	676,963	682,723	697,656	717,764	732,798	746,138	753,327	764,305	772,999	788,606	801,326	813,233	826,922
4 Mahanuwara	780,136	794,453	812,478	838,687	863,019	880,632	891,356	907,038	923,017	940,923	955,108	970,456	976,010
5 Matale	281,089	286,174	292,652	299,606	305,698	312,556	316,847	321,876	328,938	334,680	338,946	342,684	345,104
6 NuwaraEliya	391,585	397,711	405,414	417,264	424,513	436,236	439,861	447,225	449,539	450,390	452,395	457,137	464,772
7 Galle	652,734	660,585	678,509	698,558	708,430	716,608	723,080	732,289	736,813	747,190	753,172	761,815	770,563
8 Matara	510,310	515,847	524,651	534,694	543,205	550,503	555,929	562,987	568,125	573,833	576,208	578,858	587,593
9 Hambantota	342,347	350,809	360,026	369,073	377,428	384,361	389,998	396,595	401,540	408,240	414,112	421,186	428,636
10 Jaffna	622,957	612,770	622,331	633,457	637,066	644,279	651,361	701,938	707,309	710,174	716,435	721,359	816,005
11 Vanni	202,108	205,541	213,111	218,861	225,007	226,604	229,535	250,386	254,751	259,113	262,539	266,975	270,707
12 Batticaloa	268,200	270,197	275,485	282,079	291,730	303,928	310,172	318,728	324,387	330,950	331,269	333,644	335,882
13 Digamadulla	336,165	343,809	352,537	360,497	369,427	379,044	387,512	396,453	399,395	409,308	414,523	420,835	426,125
14 Trincomalee	197,620	201,808	206,884	212,280	217,572	224,307	229,315	238,755	242,112	242,463	240,632	241,133	245,155
15 Kurunegala	961,240	980,725	1,007,410	1,046,102	1,069,619	1,089,482	1,104,895	1,124,076	1,140,125	1,160,274	1,171,881	1,183,649	1,193,228
16 Puttalam	398,055	404,050	412,474	426,193	440,768	450,057	460,084	470,604	476,781	484,076	489,852	495,575	500,833
17 Anuradhapura	448,098	459,534	472,661	489,776	500,673	514,149	523,485	536,808	547,303	558,413	569,417	579,261	585,934
18 Polonnaruwa	217,318	220,903	229,434	240,444	247,513	254,061	259,039	263,609	266,652	272,634	277,056	280,337	284,278
19 Badulla	454,913	464,223	475,558	491,288	500,738	511,115	518,958	533,163	541,331	554,026	561,021	574,814	581,971
20 Monaragala	224,077	230,576	237,935	247,280	254,802	262,742	268,517	276,109	282,724	288,650	294,761	300,642	308,230
21 Ratnapura	584,998	595,791	609,655	623,506	634,843	647,035	655,248	668,217	684,529	701,379	713,205	734,651	746,029
22 Kegalle	528,107	534,980	545,238	554,698	562,123	570,299	574,917	583,282	589,676	599,435	605,626	613,938	620,090
Total	11,619,096	11,779,200	12,071,062	12,428,762	12,673,888	12,899,032	13,033,996	13,327,160	13,538,371	13,788,718	13,958,372	14,088,500	14,314,858
Increased %		1.38	2.48	2.96	1.97	1.78	1.05	2.25	1.58	1.85	1.23	0.93	1.61

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. I would like to make an announcement. It has been brought to the notice of the Chair that certain media do not cover debates on Adjournment Motions. They could be kindly advised to cover same since the public should be made aware of the live proceedings of Parliament at the end of the day. Thank you.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.05 ට, අද දින සභා සම්මතිය අනුව, 2010 අගෝස්තු 03වන අහඹරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி மாலை 7.05 மணிக்கு பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2010 ஆகஸ்ட் 03 செவ்வாய்க்கிழமை

பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 7.05 p.m. until 1.00 p.m. on Tuesday, 03rd August, 2010, pursuant to the Resolution of Parliament of this Day.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

නමුණුකුල වතු සමාගම : විස්තර
நமுனுகுல பெருந்தோட்டக் கம்பனி: விபரம்
NAMUNUKULA PLANTATIONS COMPANY LIMITED : DETAILS

0153/'10

1. ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබෙන නමුණුකුල වතු සමාගමට අයත් වතු සංඛ්‍යාව සහ ඒවා නම් වශයෙන් කවරේද;

(ii) එම වතු, නමුණුකුල වතු සමාගමට පැවරුවේ කවදාද;

(iii) එම එක් එක් වතුවල කොපමණ කොටස් ප්‍රමාණයක් නමුණුකුල වතු සමාගමට හිමිව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගමට අයත් තේ කර්මාන්තශාලා සංඛ්‍යාව, ඒ අතුරින් ක්‍රියාත්මකව පවතින සංඛ්‍යාව සහ වසා දමා තිබෙන සංඛ්‍යාව කොපමණද;

(ii) සමාගමට අයත් එක් එක් වතුවල කොපමණ කම්කරුවන් සංඛ්‍යාවක් සේවය කරන්නේද;

(iii) එම වතු සමාගම කම්කරුවන් වෙනුවෙන් ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් නිසි පරිදි අදාළ ගිණුම් වෙත ගෙවා තිබේද;

(iv) නියමිත දින නියමිත පරිදි කම්කරු වැටුප් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2007 වර්ෂයෙන් පසු මෙම සමාගමට අයත් වතු, වෙනත් වැවිලි සමාගමකට බදු ක්‍රමයකට ලබා දී තිබේ නම් එසේ ලබාදුන් වතු කවරේද;

(ii) එසේ වෙනත් සමාගමකට බදු ක්‍රමයකට වතු ලබා දිය හැකිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

පෙරුන්තෝට්ටක් කෛත්තොළිල් අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) පදුළෙ මාවට්ටත්තිල් අමෛන්තුළ්ළ නමුනුකුල පෙරුන්තෝට්ටක් කම්පනික්කුච් චොන්තමාන පෙරුන්තෝට්ටංකළින් එණ්ණික්කෛයිනෛයුම් අවර්රින් පෙයර්කළෛයුම්,

(ii) අත්තෝට්ටංකළ් නමුනුකුල තෝට්ටක් කම්පනියිර්කු එප්පෝතු පොරුප්පළික්කප්පට්ටතු එන්පතෛයුම්,

(iii) මේර්පඩි ඔව්වොරු තෝට්ටත්තිලුම් නමුනුකුල තෝට්ටක් කම්පනික්කු එව්වළවු පංකුකළ් උරිමෛයාකවුළ්ළන එන්පතෛයුම්

අවර් ඉච්චපෛක්කු අර්විවිප්පාරා?

(ஆ) (i) මේර්කුර්පිප්පිට්ට කම්පනික්කුච් චොන්තමාන තේයිලෛත් තොළිර්චාලෛකළින් එණ්ණික්කෛයිනෛයුම් අවර්රුළ් තොළිර්පටුපවර්රින් එණ්ණික්කෛ මර්රුම් මූටප්පට්ටුළ්ළවර්රින් එණ්ණික්කෛ එව්වළවු එන්පතෛයුම්,

(ii) කම්පනික්කුච් චොන්තමාන ඔව්වොරු තෝට්ටත්තිලුම් තොළිල් පුරියුම් තොළිලාළර්කළින් එණ්ණික්කෛ එව්වළවු එන්පතෛයුම්,

(iii) මේර්පඩි පෙරුන්තෝට්ටක් කම්පනි තොළිලාළර්කළ් චාර්පිල් අවර්කළතු ඌළියර් චේමලාප නිතියිනෛ මුරෛප්පඩි කුර්පිප්පිට්ට කණක්කුකළිල් වරවු වෛත්තුළ්ළතා එන්පතෛයුම්,

(iv) කුර්පිප්පිට්ට තිනත්තිල් කුර්පිප්පිට්ට මුරෛයිල් තොළිලාළර්කළුක්කු චම්පළම් වළංකප්පට්ටුළ්ළතා එන්පතෛයුම්

අවර් ඉච්චපෛක්කු චමර්ප්පිප්පාරා?

(இ) (i) 2007 ආම් ආණ්ඩිර්කුප් පින්නර් ඉක්කම්පනික්කුච් චොන්තමාන පෙරුන්තෝට්ටංකළ් පිරිතොරු පෙරුන්තෝට්ටක් කම්පනික්කු කුත්තකෛ මුරෛයිල් වළංකප්පට්ටිරුප්පින්, අව්විතමාක වළංකප්පට්ට තෝට්ටංකළ් යාවෛ එන්පතෛයුම්,

(ii) අව්වාරාක පිරිතොරු කම්පනික්කු කුත්තකෛ මුරෛයිල් තෝට්ටංකළෛ වළංක මුඩියුමා එන්පතෛයුම්

අවර් ඉච්චපෛයිල් අර්විවිප්පාරා?

(ஈ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Plantation Industries:

(a) Will he inform this House of -

(i) the number of estates owned by the Namunukula Plantations Company Limited in Badulla Dis trict and their names;

(ii) the date on which those estates were transferred to the Namunukula Planta tions Company Limited; and

(iii) the number of shares held by the Na munukula Plantations Company Lim ited in each of these estates ?

(b) Will he submit to this House -

(i) the number of tea factories owned by the above company, and out of them, the number of factories in operation and the number of factories that have been closed down;

(ii) the number of workers employed in each of the factories owned by the Company;

(iii) whether the contributions to the Employees Provident Fund on behalf of the Workers have been duly paid to the relevant accounts by the aforesaid Company; and

(iv) whether the salaries of the workers have been duly paid by the due date ?

(c) Will he state -

(i) if the estates owned by this Company have been leased out to another Plantation Company after the year 2007, the names of those estates; and

(ii) whether estates could be leased out to another Company as mentioned above ?

(d) If not, why ?

ගරු මහින්ද සමරසිංහ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த சமரசிங்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Samarasinghe - Minister of Plantation Industries)

(අ) (i) වතු සංඛ්‍යාව 6කි. එනම්,

1. කනවරැල්ල
2. ගෝනකැලේ
3. හිඳගල
4. කන්දහේන
5. කිනලින්
6. පිංගරාව

(ii) 1992 ජූනි මස 22 වැනි දින.

(iii) මෙම සමාගම, වතු අනුව කොටස් නිකුත් කිරීමක් සිදුකර නැත. එසේ වුවද, බදු ගිවිසුම් අනුව ඒවායේ බදු අයිතිය නමුණුකුල වතු සමාගම සතුය.

(ආ) (i)

දිස්ත්‍රික්කය	තේ කර්මාන්ත ශාලා සංඛ්‍යාව	ක්‍රියාත්මක කර්මාන්ත ශාලා සංඛ්‍යාව	අක්‍රිය කර්මාන්ත ශාලා සංඛ්‍යාව
බදුල්ල	06	03	03
කළුතර	01	01	-
ගාල්ල	04	02	02
මාතර	05	03	02
එකතුව	16	09	07

(ii)

වත්තේ නම	සේවක සංඛ්‍යාව
කනවරැල්ල	956
හිඳගල	908
පිංගරාව	754
ගෝනකැලේ	879
කන්දහේන	569
කින්නලන්	239
පැලවත්ත	388
බද්දේගම	364
වල්පිට	192
අකුරැස්ස	302
බෙල්මන්ට්	40
පිල්ලගොඩ	401
හුලංදුව	391
යටදොල	371
තැන්නහේන	407
සිට්‍රස්	223
මිරිස්වත්ත	307
සිරිකඳුර	167
ඔලිම්පස්	03
එලදුව	371

(iii) කළුතර/ගාල්ල/මාතර දිස්ත්‍රික්කයන්හී ඇති වතුවල සේවකයන් වෙනුවෙන් අර්ථසාධක අරමුදල් නිසි පරිදි ගෙවා ඇත.

බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති වතුවල සේවකයන් වෙනුවෙන් 2006 ජූනි සිට 2008 නොවැම්බර් දක්වා ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ගෙවා නැත.

(iv) ගෙවා ඇත.

(ඇ) (i) ලබා දී නැත.

(ii) රජය සහ වැවිලි සමාගම් අතර අත්සන් තබන ලද බදු ගිවිසුමට අනුව, ස්වර්ණමය කොටස් හිමිකරුගේ අනුමතිය සහිතව උප බදු දීම් සඳහා වැවිලි සමාගම්වලට හැකියාව ඇත.

(ඈ) අදාළ නොවේ.

(அ) (i) ஆறு தோட்டங்கள் பின்வருமாறு,

I. கனவரெல்ல
II. கோனகெலே
III. ஹிந்தகல
IV. கந்தஹேன
V. கினலின்
VI. பிங்கராவ

(ii) 1992.06.22

(iii) இந்த கம்பனி, தோட்டம் படி பங்குகள் தருவதில்லை. ஆனால் குத்தகை ஒப்பந்தங்கள் படி அதில் குத்தகை சொந்தம் நமுணுகுல பெருந்தோட்டக் கம்பனி சொந்தமாகும்.

(ஆ) (i)

மாவட்டம்	தேயிலை தொழிற்சாலைகளின் எண்ணிக்கை	செயற்படுத்தப்பட்ட தொழிற்சாலைகளின் எண்ணிக்கை	தொழிற்படுத்தப்படாத தொழிற்சாலைகளின் எண்ணிக்கை
பதுளை	06	03	03
களுத்துறை	01	01	-
காலி	04	02	02
மாத்தறை	05	03	02

(ii)

தோட்டத்தின் பெயர்	பணியாளர் எண்ணிக்கை
கனவரெல்ல	956
ஹிந்தகல	908
பிங்கராவ	754
கோனகெலே	879
கந்தகேன	569
கினலின்	239
பெலவத்த	388
பத்தேகம	364
வல்பிட	192
அக்குரஸ்ஸ	302
பேல்மன்ட்	40
பில்லகொட	401
ஹலந்துவ	391
யட்டதொல	371
தென்னஹேன	407
சிற்றஸ்	223
மிரிஸ்வத்த	307
கிரிகந்துர	167
ஓலிம்பஸ்	03
எலதுவ	371

(iii) களுத்துறை, காலி, மாத்தறை மாவட்டங்களில் உள்ள தோட்டங்களில் சேவையாளர்களுக்காக ஊழியர் சேமலாப நிதி உரிய படி செலுத்தப்பட்டுள்ளது. பதுளை மாவட்டத்தில் உள்ள தோட்டங்களில் 2006 யூன் மாதத்திலிருந்து 2008 நவெம்பர் வரை அவர்களின் ஊழியர் சேமலாப நிதி செலுத்தப்படவில்லை.

(iv) செலுத்தப்பட்டுள்ளது.

(இ) (i) தருவதில்லை

(ii) அரசாங்கம் மற்றும் பெருந்தோட்டக் கம்பனிகளின் இடையிலே கையொப்பம் வைத்துள்ள குத்தகை ஒப்பந்தம் படி, தங்கப் பங்குகள் சொந்தக்காரரின் அங்கீகாரமுடன் உபகுத்தகை வழங்குவதற்காக பெருந்தோட்டக் கம்பனிகளுக்கு முடியும்.

(ஈ) சம்பந்தமில்லை.

(a) (i) The number of estates is 06. That is,

i. Cannavarella

ii. Gonakelle

iii. Hindagala

iv. Kandahena

v. Kinellan

vi. Pingarawa

(ii) On 22nd June 1992.

(iii) This Company has not issued shares estate wise. However, Namunukula Plantations Company Limited reserves the lease hold right in terms of the lease agreements.

(b) (i)

District	No. of Tea Factories	Operational	Non Operational
Badulla	06	03	03
Kalutara	01	01	-
Galle	04	02	02
Matara	05	03	02
Total	16	09	07

(ii)

Name of the Estates	No. of workers
Cannavarella	956
Hindagala	908
Pingarawa	754
Gonakelle	879
Kandahena	569
Kinnalen	239
Pelawatte	388
Baddegama	364
Walpita	192
Akuressa	302
Belmont	40
Pillegoda	301
Hulanduwa	391
Yatadola	371
Tennahena	407
Citrus	223
Miriswaththa	307
Sirikandura	167
Olympus	03
Eladuwa	371

(iii) Contributions to the Employees Provident Fund on behalf of the workers in the estates situated in the Districts of Kalutara / Galle / Matara have been duly paid.

Contributions to the Employees Provident Fund on behalf of the workers in the estates situated in Badulla District have not been paid from June 2006 to November 2008.

(iv) Have been paid.

(c) (i) Have not been leased out.

(ii) In terms of the lease agreement signed by and between the Government and the Plantation Companies, the Plantation Companies have ability for sub-leasing of the estates, with the approval of the Golden Share Holder.

(d) Not relevant.

බිත්තර වී නිෂ්පාදන ගොවිපොළ: බදු
விதை நெல் உற்பத்திப் பண்ணை: குத்தகை
SEED PADDY PRODUCING FARM : LEASE

0154/'10

2. ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි හිඟුරක්ගොඩ රජයේ බිත්තර වී නිෂ්පාදන ගොවිපොළ කෙදිනක ආරම්භ කරන ලද්දේද;

(ii) එය කවර අරමුණක් ඇතිව ස්ථාපනය කරන ලද්දේද;

(iii) මෙම ගොවිපොළ බදු දෙනු හෝ විකුණනු ලැබුවේ නම් ඒ කවදාද;

(iv) ඒ කවර ආයතනයකටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ගොවිපොළ බදු හෝ කුලී පදනමින් ලබා දී තිබේ නම් එසේ දී ඇති බිම් ප්‍රමාණය කොපමණද;

(ii) බදු දුන් වර්ෂයේ සිට එක් එක් වර්ෂයේදී රජයට ගෙවා ඇති බදු මුදල කොපමණද;

(iii) 2008 වර්ෂයේ මෙම ගොවිපොළෙන් එක් හෙක්ටයාරයකට ලැබුණු බදු ආදායම කොපමණද;

(iv) මෙය පවරා දෙන අවස්ථාවේ කොපමණ වංචල හා නිශ්චල දේපළ ප්‍රමාණයක් තිබුණේද;

(v) එම දේපළ කවර කාර්යයකට යොදවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ප්‍රමාණවත් බිත්තර වී ඇතුළු බීජ සැපයීමට ස්ථාපනය කළ මෙම ගොවිපොළ අහිමි වීමෙන් ගොවීන්ට අසාධාරණයක් සිදු වී ඇති බැවින්, මෙය නිවැරදි කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொலன்னறுவை மாவட்டத்தில் அமைந்துள்ள ஹிங்குரக்கொட அரசாங்க விதை நெல் உற்பத்திப் பண்ணை எத்தேதியில் ஆரம்பிக்கப்பட்டது,

(ii) அது எந்த நோக்கத்திற்காக ஸ்தாபிக்கப்பட்டது,

